319 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 319 - இல. 10
Volume 319 - No. 10

2025 ජූනි 03 වන අඟහරුවාදා
2025 யூன் 03, செவ்வாய்க்கிழமை
Tuesday, 03rd June, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය:**
මහජන ආරක්ෂක ප්‍රකාශනය[තීරුව 1651]

**නිවේදන:**
කථානායකතුමාගේ සහතිකය [තීරුව 1652 ]
ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [තීරුව 1652]
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කාර්යභාරය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන [තීරුව 1653]

**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 1653]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**[තීරුව 1656]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1657-1705]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
දේශීයව නිෂ්පාදිත සීනි සහ එහි අතුරු නිෂ්පාදන මත පනවන ලද වැට් බද්ද [තීරුව 1706]
කිලිනොච්චියේ ශ්‍රී ලංකා-ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනය ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක කිරීම [තීරුව 1716]

**ඖෂධ හිඟය නැති කිරීම සඳහා රජයේ වැඩ පිළිවෙළ:**
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1723]

**අලිමංකඩ ලුණු ලේවායේ ගැටලු:**
කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1734]

**ණය ගෙවීම සඳහා සාක්ෂාත් කරගත යුතු සාර්ව ආර්ථික ඉලක්ක:**
මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රකාශය [තීරුව 1738]

**වරප්‍රසාද:**
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා විසින් 2025.05.22 දින කරන ලද ප්‍රකාශය [තීරුව 1744]

**සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 1745]

**සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත් කෙටුම්පත::**
පළමුවන වර කියවන ලදී [තීරුව 1746]

**සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 1746]

**පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර කියවා පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවට පවරන ලදී [තීරු 1747-1835]

**කල්තැබීමේ යෝජනාව:**
කැලණි මිටියාවතේ ගංවතුර පාලනය සඳහා තිරසර විසඳුමක් [තීරු 1836-1848]


---

# பிரதான உள்ளடக்கம்


**சனாதிபதியிடமிருந்து வந்த செய்தி:**
பொதுசனப் பாதுகாப்புப் பிரகடனம் [ப: 1651]

**அறிவிப்புகள்:**
சபாநாயகரது சான்றுரை [ப: 1652]
இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 1652]
வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சினதும் இலங்கைத் தூதரகங்களினதும் வகிபாகம் தொடர்பான விழிப்புணர்வுச் செயலமர்வு [ப: 1653]

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 1653]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 1656]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1657- 1705]

**தனி அறிவித்தல் மூல வினா:**
உள்ளூர் சீனி உற்பத்தி மற்றும் அதன் துணைத் தயாரிப்புகளுக்கு விதிக்கப்படும் 'வற்' வரி [ப: 1706]
கிளிநொச்சியிலுள்ள இலங்கை-ஜேர்மன் தொழில்நுட்பப் பயிற்சி நிறுவனத்தைச் சுயாதீன நிறுவனமாக இயங்கச்செய்தல் [ப: 1716]

**மருந்து தட்டுப்பாட்டை நிவர்த்திப்பதற்கான அரசின் வேலைத்திட்டம்:**
சுகாதார மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று [ப: 1723]

**ஆனையிறவு உப்பளப் பிரச்சினைகள்:**
கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரினது கூற்று [ப: 1734]

**கடன் செலுத்துவதற்காக பேரினப் பொருளியல் இலக்குகளை அடைதல்:**
நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று [ப: 1738]

**சிறப்புரிமை:**
கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரினது 2025.05.22ஆம் திகதிய கூற்று [ப: 1744]

**வேலையாளர்களின் தேசிய குறைந்தபட்ச வேதனம் (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1745]

**வேலையாளர்களின் வரவுசெலவுத்திட்ட நிவாரணப்படி (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1746]

**வேலையாட்களின் வரவுசெலவுத்திட்ட நிவாரணப்படி (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1746]

**தனிப்பட்ட தரவுப் பாதுகாப்பு (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம் முறை மதிப்பிடப்பட்டு, முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்பட்டது [ப: 1747-1835]

**ஒத்திவைப்புப் பிரேரணை:**
களனிப் பள்ளத்தாக்கில் வெள்ளப்பெருக்கை கட்டுப் படுத்துவதற்கான நிலையான தீர்வு [ப: 1836-1848]

# PRINCIPAL CONTENTS


MESSAGE FROM THE PRESIDENT:
Public Security Proclamation [Col. 1651]

ANNOUNCEMENTS:
Speaker's Certificate [Col. 1652]

Sri Lanka Electricity (Amendment) Bill: Petition to the Supreme Court [Col. 1652]

Awareness Programme on the Role and Functions of Ministry of Foreign Affairs, Foreign Employment and Tourism and Sri Lankan Diplomatic Missions [Col. 1653]

AUDITOR-GENERAL'S REPORT [Col. 1653]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 1656]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1657-1705]

QUESTION BY PRIVATE NOTICE:
VAT Imposed on Locally Produced Sugar and Its By-products [Col. 1706]

Recognition of Sri Lanka-German Technical Training Institute, Kilinochchi As An Autonomous Institution [Col. 1716]

GOVERNMENT INITIATIVE TO ELIMINATE SHORTAGE OF DRUGS:
Statement by Minister of Health and Mass Media [Col. 1723]

ISSUES ARISEN AT ELEPHANT PASS SALTERN:
Statement by Minister of Industry and Entrepreneurship Development [Col. 1734]

MACROECONOMIC TARGETS TO BE ACHIEVED FOR DEBT PAYMENT:
Statement by Deputy Minister of Finance and Planning [Col. 1738]

PRIVILEGE:
Statement Made by Minister of Industry and Entrepreneurship Development on 22.05.2025 [Col. 1744]

NATIONAL MINIMUM WAGE OF WORKERS (AMENDMENT) BILL:
Read the First time [Col. 1745]

BUDGETARY RELIEF ALLOWANCE OF WORKERS (AMENDMENT) BILL:
Read the First time [Col. 1746]

BUDGETARY RELIEF ALLOWANCE OF WORKERS (AMENDMENT) BILL:
Read the First time [Col. 1746]

PERSONAL DATA PROTECTION (AMENDMENT) BILL:
Read the Second time and referred to a Committee of the Whole Parliament [Cols. 1747-1835]

ADJOURNMENT MOTION:
Sustainable Solution for Flood Control in Kelani Valley [Cols. 1836-1848]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

*2025 ජුනි 03 වන අඟහරුවාදා*
*2025 யூன் 03, செவ்வாய்க்கிழமை*
*Tuesday, 03rd June, 2025*

**පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு. ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## ජනාධිපතිතුමාගෙන් ලත් සන්දේශය
## சனாதிபதியிடமிருந்து வந்த செய்தி
## MESSAGE FROM THE PRESIDENT

### මහජන ආරක්ෂක ප්‍රකාශනය
### பொதுசனப் பாதுகாப்புப் பிரகடனம்
### PUBLIC SECURITY PROCLAMATION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පහත දැක්වෙන සන්දේශය ගරු ජනාධිපතිතුමාගෙන් මා වෙත ලැබී තිබෙනවා.

**ශ්‍රී ලංකා ජනාධිපති**
**இலங்கை சனாதிபதி**
**President of Sri Lanka**

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/7/IX/3/01

2025 මැයි මස 26 වන දින

**ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති



## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### I

### කථානායකතුමාගේ සහතිකය
### சபாநாயகரது சான்றுரை
### SPEAKER'S CERTIFICATE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2025 මැයි 23 දින මවිසින් "විදේශීය ණය (ඉවත් කිරීමේ)" නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

### II

### ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
### இலங்கை மின்சாரம் (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
### SRI LANKA ELECTRICITY (AMENDMENT) BILL: PETITION TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

### III

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දසවැනි පාර්ලිමේන්තුව සඳහා "තාරුණ්‍යය සඳහා වන පාර්ලිමේන්තු සංසදය" ස්ථාපනය කිරීම සඳහා 2025 මාර්තු 15 දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී හිමි වූ අනුමතිය අනුව, එහි සමාරම්භක රැස්වීම 2025 ජුනි 03 අඟහරුවාදා, එනම් අද දින අපර භාග 1.00ට කාරක සභා කාමර අංක 02 හිදී පැවැත්වීමට නියමිත බව දන්වන අතර, ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට එම රැස්වීම සඳහා සහභාගී වන ලෙස කාරුණිකව ආරාධනය කරනු කැමැත්තෙමි.

## IV

## විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කාර්යභාරය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන
வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சினதும் இலங்கைத் தூதரகங்களினதும் வகிபாகம் தொடர்பான விழிப்புணர்வுச் செயலமர்வு
AWARENESS PROGRAMME ON THE ROLE AND FUNCTIONS OF MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM AND SRI LANKAN DIPLOMATIC MISSIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබන "විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කාර්යභාරය" පිළිබඳව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2025 ජුනි 04 දින, එනම් හෙට දින අපර භාග 2.00 සිට අපර භාග 4.00 දක්වා පාර්ලිමේන්තුවේ කාරක සභා කාමර අංක 02හි දී පැවැත්වෙන අතර ඒ සඳහා සහභාගි වන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXIV කොටස; සහ
- 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLIII හා XLIV කොටස් සහ නවවැනි කාණ්ඩයේ XXV හා XXVI කොටස්

මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
Hon. Speaker, I present the -

(i) Order made by the Minister of Finance, Planning and Economic Development under Section 3 of the Stamp Duty (Special Provisions) Act, No. 12 of 2006 and published in Gazette Extraordinary No. 2429/39 of 27th March, 2025;

(ii) Regulations made by the Minister of Finance, Planning and Economic Development under Section 20 read with Sections 4(1) and 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 as amended by Act, No. 48 of 1985 and Act, No. 28 off 1987 and published in Gazette Extraordinary No. 2434/12 of 29th April, 2025; and

(iii) Regulations made by the Minister of Finance, Planning and Economic Development under Section 20 read with Sections 4(1) and 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 as amended by Act, No. 48 of 1985 and Act, No. 28 off 1987 and published in Gazette Extraordinary No. 2435/02 of 05th May, 2025.

I move that the Order and the Regulations be referred to the Committee on Public Finance.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

Order made by the Minister of Education, Higher Education and Vocational Education under Section 24A (1) of the Universities Act, No. 16 of 1978 in consultation with the University Grants Commission with regard to the establishment of the Institute of Allergology and Immunology of the University of Sri Jayewardenepura and assign the name and style to such Institute and published in Gazette Extraordinary No. 2424/58 of 20th February, 2025; and

Note on Supplementary Allocations from the Development Activities Programme appearing under Expenditure Head No. 240 of the Department of National Budget for the period from 28.03.2025 to 30.04.2025 in terms of Section 6(1) of the Appropriation Act, No. 3 of 2025 - [The Hon. (Dr.) Harini Amarasuriya.]

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, 2022/2023 වර්ෂය සඳහා බී.සී.සී. ලංකා ලිමිටඩ් හි වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු කථානායකතුමනි, 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3වන වගන්තිය සමඟ කියවිය යුතු 34වන වගන්තිය යටතේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අප්‍රේල් 03 දිනැති අංක 2430/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

මෙම නියෝග තරුණ කටයුතු සහ ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, 2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පනතේ 2(1) වගන්තිය යටතේ සහ 1(2) වගන්තිය යටතේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 මාර්තු 28 දිනැති අංක 2429/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන් මම ඉදිරිපත් කරමි.

මෙම නියමයන් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna

ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

Hon. Speaker, I present -

(1) A petition from Mr. K. A. Raja Shantha of Ranaviru Piyarathne Mawatha, Baddegama South, Baddegama; and

(2) A petition from Mr. M. K. Saman of Liyanagoda, Habaraduwa.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අජිත් පී. පෙරේරා මහතා. - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)
ගරු කථානායකතුමනි, මාතර, රාහුල පාර, පාසැල් මාවත, අංක 26 දරන ස්ථානයෙහි පදිංචි බන්දුල පතිරණ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නිශාන්ත පෙරේරා මහතා. *[සභා ගර්භය තුළ නැත.]*
ගරු අමිල ප්‍රසාද් මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹிருனி விஜேசிங்ஹ)
(The Hon. (Mrs.) Hiruni Wijesinghe, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මාදම්පේ, පැරණි නගරය, සෙනවිරත්න පාර, අංක 7/1 දරන ස්ථානයෙහි පදිංචි සී.ඒ.එන්.ආර්. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## රාජ්‍ය සහ පෞද්ගලික විශ්වවිද්‍යාල: විස්තර
## அரச மற்றும் தனியார் பல்கலைக்கழகங்கள்: விபரம்
## GOVERNMENT AND PRIVATE UNIVERSITIES: DETAILS

305/2024

**1. ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති රජයට අයත් විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් විශ්වවිද්‍යාලයේ ඇති පීඨ සංඛ්‍යාව සහ එක් එක් පීඨයේ සිටින සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රජයේ විශ්වවිද්‍යාලයක එක් සිසුවෙකු සඳහා වැය කරන සාමාන්‍ය වාර්ෂික පිරිවැය සහ එක් එක් විෂය ක්ෂේත්‍රයට අනුව උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම සඳහා වැය වන මුළු පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකාවේ ඇති පෞද්ගලික විශ්වවිද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(v) එක් එක් පෞද්ගලික විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එක් පෞද්ගලික විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු සඳහා වැය වන මුළු පිරිවැය සහ එක් එක් විෂය ක්ෂේත්‍රයට අනුව උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම සඳහා වැය වන මුළු පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එක් එක් රජයේ විශ්වවිද්‍යාලයේ සිටින මහාචාර්යවරුන් සංඛ්‍යාව සහ මහාචාර්ය-වරුන්ගේ මුළු සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් රජයේ විශ්වවිද්‍යාල පවත්වාගෙන යෑම සඳහා වැය වන මුළු පිරිවැය කොපමණද;

(iii) ඉහත එක් එක් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයකු සඳහා වැයවන මුළු පිරිවැය කොපමණද;

(iv) එක් එක් රජයේ විශ්වවිද්‍යාලයේ වත්කම්වල මුළු වටිනාකම කොපමණද;

(v) ලෝක ශ්‍රේණිගත කිරීම අනුව ඉහත එක් එක් විශ්වවිද්‍යාලයට හිමි ස්ථානය කවරේද;

යන්නත් එතුමිය වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள அரசாங்கத்திற்குச் சொந்தமான பல்கலைக்கழகங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) ஒவ்வொரு பல்கலைக்கழகத்திலும் உள்ள பீடங்களின் எண்ணிக்கை மற்றும் ஒவ்வொரு பீடத்திலும் உள்ள மாணவர்களின் எண்ணிக்கை யாதென்பதை வெவ்வேறாகவும்;

(iii) அரசாங்கப் பல்கலைக்கழக மாணவர் ஒருவருக்கான வருடாந்த சராசரிச் செலவு மற்றும் துறைவாரியாக வகைப்படுத்தப்பட்ட பட்டப் படிப்பு ஒன்றைப் பூர்த்திசெய்வதற்கான மொத்தச் செலவு யாதென்பதை வெவ்வேறாகவும்;

(iv) இலங்கையிலுள்ள தனியார் பல்கலைக் கழகங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(v) ஒவ்வொரு தனியார் பல்கலைக்கழகத்திலும் பதிவுசெய்யப்பட்ட மாணவர்களின் எண்ணிக்கை யாதென்பதை வெவ்வேறாகவும்;

(vi) தனியார் பல்கலைக்கழக மாணவர் ஒருவருக்கான மொத்தச் செலவு மற்றும் துறைவாரியாக வகைப்படுத்தப்பட்ட பட்டப் படிப்பு ஒன்றினைப் பூர்த்தி செய்வதற்கான மொத்தச் செலவு யாதென்பதை வெவ் வேறாகவும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) ஒவ்வோர் அரசாங்கப் பல்கலைக்கழகத்திலும் உள்ள பேராசிரியர்களின் எண்ணிக்கை மற்றும் மொத்தப் பேராசிரியர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) ஒவ்வோர் அரசாங்கப் பல்கலைக்கழகத்தையும் நடாத்துவதற்கான மொத்தச் செலவு யாதென்பதையும்;

(iii) மேலே குறிப்பிடப்பட்ட பல்கலைக்கழகங்கள் ஒவ்வொன்றிலும் உள்ள மாணவர் ஒருவருக்கான மொத்தச் செலவு யாதென்பதையும்;

(iv) ஒவ்வோர் அரசாங்கப் பல்கலைக்கழகத்தினதும் சொத்துக்களின் மொத்தப் பெறுமதி யாதென்பதையும்;

(v) மேலே குறிப்பிடப்பட்ட பல்கலைக்கழகங்கள் ஒவ்வொன்றினதும் உலகத் தரவரிசைப்படுத்தல் யாதென்பதையும்?

அவர் இச்சபைக்கு மேலும் வெவ்வேறாக அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of Government-owned universities in Sri Lanka;

(ii) number of faculties in each university and the number of students in each faculty, separately;

(iii) annual average cost for a government university student and the total cost to complete a degree categorized by discipline, separately;

(iv) number of private universities in Sri Lanka;

(v) number of students registered in each private university, separately; and

(vi) total cost for a private university student and the total cost to complete a degree categorized by discipline, separately?

(b) Will she also inform this House, separately, the -

(i) number of professors in each government university and total number of professors;

(ii) total cost of running each government university;

(iii) total cost for a student in each of the above universities;

(vi) total value of assets of each government university; and

(v) world ranking of each of the above universities?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ විශ්වවිද්‍යාල 17කි.

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය යටතේ විශ්වවිද්‍යාල 02කි. (ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය)

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ විශ්වවිද්‍යාල 17හි මුළු පීඨ සංඛ්‍යාව 122කි.

| විශ්වවිද්‍යාලය/උසස් අධ්‍යාපන ආයතනය | පීඨ සංඛ්‍යාව |
|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | 10 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 9 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 11 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 7 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 6 |
| යාපනය විශ්වවිද්‍යාලය | 12 |
| රුහුණ විශ්වවිද්‍යාලය | 10 |
| ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 6 |
| නැඟෙනහිර විශ්වවිද්‍යාලය | 6 |
| ත්‍රිකුණාමල මණ්ඩපය | 3 |
| අග්නිදිග විශ්වවිද්‍යාලය | 6 |
| රජරට විශ්වවිද්‍යාලය | 6 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 8 |
| වයඹ විශ්වවිද්‍යාලය | 6 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 5 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 4 |
| ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය | 4 |
| වවුනියා විශ්වවිද්‍යාලය | 3 |

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ විශ්වවිද්‍යාල 17 හි එක් එක් විශ්වවිද්‍යාලයේ පීඨ අනුව මුළු සිසුන් සංඛ්‍යාව ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

ඇමුණුම 01

එක් එක් විශ්වවිද්‍යාලයේ පීඨ/අධ්‍යයන පාඨමාලා අනුව සිටින මුළු සිසුන් සංඛ්‍යාව 2023

| විශ්වවිද්‍යාලය/උසස් අධ්‍යාපන ආයතනය | පීඨය/අධ්‍යයන පාඨමාලාව | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කලා | කළමනාකරණ හා වාණිජ්‍යය | නීති | වෛද්‍ය විද්‍යාව | දන්ත ශල්‍ය විද්‍යාව | පශු වෛද්‍ය විද්‍යාව | කෘෂි කර්මය | ඉංජිනේරු විද්‍යාව | වාස්තු විද්‍යාව හා ප්‍රමාණ සමීක්ෂණය | පරිගණක විද්‍යාව | සහ වෛද්‍ය | විද්‍යා | දේශීය වෛද්‍ය විද්‍යාව | තාක්ෂණය | එකතුව |
| කොළඹ විශ්වවිද්‍යාලය (2) | 3831 | 2700 | 1216 | 1120 | | | | | | | 590 | 2112 | 1084 | 1214 | **13867** |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 4460 | 681 | 263 | 1163 | 509 | 432 | 1180 | 1795 | | 159 | 778 | 1889 | | | **13309** |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 3840 | 4857 | | 915 | 61 | | 178 | 587 | | 423 | 680 | 2875 | | 1726 | **16142** |
| කැළණිය විශ්වවිද්‍යාලය | 5988 | 3747 | | 987 | | | | | | 948 | 384 | 2431 | | 710 | **15195** |
| මොරටුව විශ්වවිද්‍යාලය | | 565 | | 305 | | | | 4237 | 2119 | 1522 | | | | | **8748** |
| යාපනය විශ්වවිද්‍යාලය | 3256 | 1904 | 362 | 869 | | | 570 | 773 | | 308 | 745 | 1010 | 409 | 1147 | **11353** |
| රුහුණු විශ්වවිද්‍යාලය | 2628 | 2343 | | 1228 | | | 1046 | 1837 | | 332 | 896 | 2045 | | 1100 | **13455** |
| ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 8999 | 4553 | 3394 | | | | | 3495 | | 1777 | 3400 | 4706 | | | **30324** |
| නැගෙනහිර විශ්වවිද්‍යාලය (2) | 2959 | 1893 | | 470 | | | 298 | | | 322 | 174 | 830 | 293 | 382 | **7621** |
| අග්නිදිග විශ්වවිද්‍යාලය | 2772 | 1116 | | | | | | 410 | | 483 | | 976 | | 724 | **6481** |
| රජරට විශ්වවිද්‍යාලය | 1685 | 2001 | | 983 | | | 545 | | | 399 | | 895 | | 1331 | **7839** |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 1212 | 1717 | | 481 | | | 830 | | | 683 | | 1811 | | 832 | **7566** |
| වයඹ විශ්වවිද්‍යාලය | | 2322 | | 580 | | | 1425 | | | | | 586 | | 1331 | **6244** |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | | 1045 | | | | | 1234 | | | 717 | | 519 | | 1166 | **4681** |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 2837 | | | | | | | | | | | | | | **2837** |
| ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය | 99 | 87 | | | | | 48 | | | | 213 | | 477 | 214 | **1138** |
| වවුනියා විශ්වවිද්‍යාලය | | 1129 | | | | | | | | 441 | | 556 | | 578 | **2704** |
| මානව සම්පත් අභිවර්ධන ආයතනය | 504 | | | | | | | | | | | | | | **504** |
| කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය | | | | | | | | | | 1085 | | | | | **1085** |
| ස්වාමී විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය | 1288 | | | | | | | | | | | | | | **1288** |
| **එකතුව** | **46358** | **32660** | **5235** | **9101** | **570** | **432** | **7354** | **13134** | **2119** | **9599** | **7860** | **23241** | **2263** | **12455** | **172381** |

**Notes:**

(1) 2023 වර්ෂයේ සිට දේශීය වෛද්‍ය විද්‍යායතනය කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨයක් බවට පත්ව ඇත.

(2) ශ්‍රීපාලි මණ්ඩපය කොළඹ විශ්වවිද්‍යාලයට ද ත්‍රිකුණාමල මණ්ඩපය නැගෙනහිර විශ්වවිද්‍යාලයට ද ඇතුළත් කර ඇත.

- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පීඨ සංඛ්‍යාව 2කි. එම එක් එක් පීඨයේ සිසුන් ගණන පහත පරිදි වේ.

| පීඨ | සිසුන් ගණන |
|---|---|
| බෞද්ධ අධ්‍යයන පීඨය | 245 |
| භාෂා හා සංස්කෘතික අධ්‍යයන පීඨය | 225 |

- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පීඨ සංඛ්‍යාව 2කි. එම එක් එක් පීඨයේ සිසුන් ගණන පහත පරිදි වේ.

| පීඨ | සිසුන් ගණන |
|---|---|
| භාෂා අධ්‍යයන පීඨය | 272 |
| බෞද්ධ අධ්‍යයන පීඨය | 316 |

- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ පීඨ සංඛ්‍යාව 02කි. එම එක් එක් පීඨයේ සිසුන් ගණන ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත.
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ඇති පීඨ සංඛ්‍යාව 04කි. එම එක් එක් පීඨයේ සිසුන් ගණන ද ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 02

| ප්‍රශ්න අංකය | ප්‍රශ්නය | ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය | වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය |
|---|---|---|---|
| (අ) i | අදාල නොවේ. | | |
| ii | • පීඨ සංඛ්‍යාව | 02 | 04 |
| | • එක් එක් පීඨයේ සිසුන් සංඛ්‍යාව | 1. ධීවර හා සමුද්‍රීය විද්‍යා පීඨය - 775<br>2. ඉංජිනේරු හා කළමනාකරණ පීඨය - 1188 | 1. Faculty of Engineering Technology - 1573<br>2. Faculty of Industrial Technology - 1417<br>3. Faculty of Information Technology - 886<br>Faculty of Education - 663 |
| iii | • රජයේ විශ්වවිද්‍යාලයක එක් ශිෂ්‍යයෙකු සඳහා වැය කරන සාමාන්‍ය වාර්ෂික පිරිවැය | රු.167,000.00 | රු.140,316.74 |
| | එක් එක් විෂය ක්ෂේත්‍රයට අනුව උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම සඳහා වැයවන මුළු පිරිවැය | රු.668,000<br>(උපාධි පාඨමාලා 6 සඳහාම මෙම මුදල අදාල වේ.) | පාඨමාලාව අනුව පිරිවැය පහත පරිදි වෙනස් වේ<br>Bachelor of Technology in<br>1. Software Technology - 539,467<br>1. Network Technology - 563,221<br>2. Building Service Technology - 553,661<br>3. Manufacturing Technology - 571,275<br>4. Mechatronics Technology - 541,257<br>5. Multimedia & Web Technology - 553,995<br>6. Food Process Technology - 574,058<br>7. Film & Television Production Technology - 571,991<br>8. Industrial Management Technology - 591,816<br>9. Construction Technology & Resource Management - 507,226<br>10. Quantity Surveying - 547,532<br>11. Technology - 643,776<br>12. English Language Teaching - 560,263<br>13. Hotel Management - 526,510<br>14. Media Art Production Technology - 633,472<br>16.Bachelor of Translations Studies - 501,496 |
| Iv, v, vi | අදාල නොවේ. | | |
| (ආ) i | මහාචාර්යවරුන් සංඛ්‍යාව | 01 | 02 |
| ii | විශ්වවිද්‍යාලය පවත්වා ගෙන යාම සඳහා වැය වන මුළු පිරිවැය | රු.මි. 619.05 | රු.606,678,155 |
| iii | ඉහත එක් එක් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකු සඳහා වැය වන මුළු පිරිවැය | රු.668,000 | රු.561,313.43 |
| iv | විශ්වවිද්‍යාලයේ වත්කම්වල මුළු වටිනාකම | රු.බි. 23 | රු.2,272,791,638 |
| v | ලෝක ශ්‍රේණිගත කිරීම් අනුව හිමි ස්ථානය | 17861 | 2024 වර්ෂය - 19604<br>2025 වර්ෂය - 18681 |

- ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පීඨ සංඛ්‍යාව 11කි. එම එක් එක් පීඨයේ සිසුන් ගණන ඇමුණුම 03 මඟින් ඉදිරිපත් කර ඇත.
  ( 2019 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සිසුන්ගෙන් දැනට සක්‍රිය තත්ත්වයේ ඇති සිසුන් ගණන පදනම් කරගෙන ඇත.)

ඇමුණුම 03

| අනු අං | පීඨය | දේශීය හා විදේශීය කැඩෙට් නිලධාරීන් සංඛ්‍යාව | දේශීය හා විදේශීය දිවා විද්‍යාර්ථයින් සංඛ්‍යාව | මුළු සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (1) | පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | - | - | 843* |
| (2) | ආරක්ෂක සහ උපක්‍රමික අධ්‍යයන පීඨය | 54 | 200 | 254 |
| (3) | වෛද්‍ය පීඨය | 317 | 604 | 921 |
| (4) | ඉංජිනේරු පීඨය | 153 | 792 | 945 |
| (5) | නීති පීඨය | 13 | 654 | 667 |
| (6) | කළමනාකරණ සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨය | 203 | 929 | 1132 |
| (7) | සම සෞඛ්‍ය විද්‍යා පීඨය | - | 1189 | 1189 |
| (8) | නිර්මිත පරිසරය හා අවකාශ විද්‍යා පීඨය | 49 | 443 | 492 |
| (9) | පරිගණක පීඨය | 40 | 974 | 1014 |
| (10) | තාක්ෂණ පීඨය | 09 | 600 | 609 |
| (11) | අපරාධ යුක්ති පීඨය | 10 | 163 | 173 |
| | මුළු එකතුව | 848 | 6548 | 8239 |

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

(iii) • විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ විශ්වවිද්‍යාලයක එක් සිසුවෙකු සඳහා වැය කරන සාමාන්‍ය වාර්ෂික පිරිවැය (2022 වර්ෂය සඳහා) රුපියල් 405,313.00කි.

• විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ විශ්වවිද්‍යාලයක එක් එක් විෂය ක්ෂේත්‍රය අනුව උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම සඳහා වැය වන ඒකක

පුනරාවර්තන වියදම

| පීඨ/අධ්‍යයන පාඨමාලාව | ඒකක පුනරාවර්තන වියදම 2022 වර්ෂය සඳහා |
|---|---|
| කලා | 341,665.00 |
| අධ්‍යාපන | 492,344.00 |
| නීතිය | 273,037.00 |
| සෞන්දර්ය | 413,482.00 |
| කළමනාකරණ හා වාණිජ්‍යය | 260,967.00 |
| ඉංජිනේරු විද්‍යාව | 526,305.00 |
| වාස්තු විද්‍යාව | 371,669.00 |
| තොරතුරු තාක්ෂණය | 345,449.00 |
| වෛද්‍ය විද්‍යාව | 818,583.00 |
| දන්ත ශල්‍ය විද්‍යාව | 1,352,947.00 |
| පශු වෛද්‍ය විද්‍යාව | 1,372,710.00 |
| කෘෂිකර්මය | 579,495.00 |
| විද්‍යාව | 428,582.00 |
| සම සෞඛ්‍ය | 438,114.00 |
| තාක්ෂණවේදය | 267,054.00 |
| දේශීය වෛද්‍ය විද්‍යාව | 544,994.00 |
| සාමාන්‍යය | 405,313.00 |

• ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ එක් සිසුවෙකු සඳහා වැය කරන සාමාන්‍ය වාර්ෂික පිරිවැය (2024 වර්ෂය සඳහා) රුපියල් 1,075,981.00කි.

මෙය වැඩිවීමක් සිද්ධ වෙන්නේ ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවීමත් එක්කයි.

• ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ එක් එක් විෂය ක්ෂේත්‍රයට අනුව උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම සඳහා වැය වන මුළු පිරිවැය රුපියල් 2,960,013.00කි.

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2024 වර්ෂය සඳහා උපාධි පාඨමාලා සම්පූර්ණ කිරීම සඳහා එක් සිසුවෙකුට වැය වන පිරිවැය රුපියල් 927,257.00කි. (ක්ෂය හා සේවා පාරිතෝෂික දීමනා අඩු කළ පසු)

ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වසර තුනක සාමාන්‍ය උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමට එක් සිසුවෙක් සඳහා වැය වන මුදල රුපියල් 2,954,868.00කි. (ක්ෂය හා සේවා පාරිතෝෂික වෙන් කිරීම යනාදී මූල්‍ය නොවන වියදම් මෙම පිරිවැයට අන්තර්ග්‍රහණය කර ඇත.)

සාගර විශ්වවිද්‍යාලයේ එක් සිසුවෙකු සඳහා වැය කරන සාමාන්‍ය වාර්ෂික පිරිවැය රුපියල් 167,000.00ක් වන අතර වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ශ්‍රී ලංකා එක් සිසුවෙකු සඳහා වැය කරන සාමාන්‍ය වාර්ෂික පිරිවැය රුපියල් 140,316.74කි.

සාගර විශ්වවිද්‍යාලයේ හා වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ එක් එක් විෂය ක්ෂේත්‍රයට අනුව උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම සඳහා වැය වන මුළු පිරිවැය වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත.

ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ එක් සිසුවෙකු සඳහා වැය කරන සාමාන්‍ය වාර්ෂික පිරිවැය (2024 වර්ෂයට අනුව) රුපියල් 548,766.00කි.

එම විශ්වවිද්‍යාලයේ එක් එක් විෂය ක්ෂේත්‍රයට අනුව උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කිරීම සඳහා වැය වන මුළු පිරිවැය වෙන් වෙන් වශයෙන් ඇමුණුම 04 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 04

| අනු අං | විෂය ක්ෂේත්‍රය | වැය වන මුළු පිරිවැය* |
|---|---|---|
| (1) | ආරක්ෂක සහ උපක්‍රමික අධ්‍යයන පීඨය | 2,635,774.00 |
| (2) | වෛද්‍ය පීඨය | 6,421,828.00 |
| (3) | ඉංජිනේරු පීඨය | 3,520,500.00 |
| (4) | නීති පීඨය | 1,972,057.00 |
| (5) | කළමනාකරණ සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨය | 2,678,625.00 |
| (6) | සම සෞඛ්‍ය විද්‍යා පීඨය | 2,455,565.00 |
| (7) | නිර්මිත පරිසරය හා අවකාශ විද්‍යා පීඨය | 3,148,372.00 |
| (8) | පරිගණක පීඨය | 1,962,626.00 |
| (9) | තාක්ෂණ පීඨය | 1,544,842.00 |
| (10) | අපරාධ යුක්ති පීඨය | 1,906,305.00 |
| | මුළු එකතුව | 28,246,494.00 |

iv. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ ප්‍රතිපාදන අනුව 'විශ්වවිද්‍යාල' නාමය යොදා ගත හැක්කේ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මඟින් ස්ථාපිත කර ඇති රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා පමණි. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පිළිගත් පෞද්ගලික විශ්වවිද්‍යාල නොමැති අතර 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය යටතේ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා විසින් උසස් අධ්‍යාපන ආයතන, උපාධි පිරිනැමීමේ ආයතන ලෙස පිළිගනු ලැබීමට බලතල පවතින අතර, ඒ අනුව පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතන 28ක් මේ වන විට පවතී.

v. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය යටතේ දැනට පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතන 28හි දේශීයව ලියාපදිංචි වී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව ඇමුණුම 05 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 05

**The details of Student Enrolment for the Local Degree Programmes recognized under the provisions of section 25A of the Universities Act, No. 16 of 1978 year - 2024**

| S/N | Name of the Degree Awarding Institute | Year 2024 Total No of Students Enrollment |
|---|---|---|
| 01 | Institute of Surveying and Mapping (ISM) | 22 |
| 02 | Sri Lanka Institute of Information Technology (SLIIT) | 17578 |
| 03 | Sri Lanka Institute of Development Administration(SLIDA) | 16 |
| 04 | National Institute of Social Development (NISD) | 1295 |
| 05 | Aquinas College of Higher Studies | 405 |
| 06 | South Asian Institute of Technology and Medicine (SAITM) (Pvt) Ltd | Not Functioning |
| 07 | National School of Business Management Limited (NSBM) | 5656 |
| 08 | CINEC Campus (Private) Limited | 2917 |
| 09 | Sri Lanka International Buddhist Academy (SIBA) | 1295 |
| 10 | The Institute of Chartered Accountants of Sri Lanka (CASL) | 1876 |
| 11 | SANASA Campus Limited | 178 |
| 12 | Horizon College of Business & Technology (Pvt) Ltd | 2855 |
| 13 | KIU Campus (Private) Limited | 8796 |
| 14 | Nagananda International Institute for Buddhist Studies (Pvt) Ltd | 86 |
| 15 | Sri Lanka Technology Campus Private Limited | 4347 |
| 16 | Sri Lanka Institute of Nanotechnology (Private) Limited (SLINTEC) | Not Received |
| 17 | Saegis Campus (Private) Limited | 752 |
| 18 | ESOFT Metro Campus (Private) Limited | 212 |
| 19 | Institute of Chemistry Ceylon | 190 |
| 20 | International College of Business Technology Ltd | 150 |
| 21 | Benedict XVI Catholic International Institute of Higher Education | 361 |
| 22 | Royal Institute of Colombo (Pvt) Ltd | 01 |
| 23 | Business Management School (Pvt) Ltd | Not Received |
| 24 | International Institute of Health sciences (Pvt) Ltd | Not Received |
| 25 | Lanka Nippon Biztech Institute (Pvt) Ltd | 128 |
| 26 | Gateway College (Private) Limited | Not Received |
| 27 | The Lyceum Campus (Private) Limited | 30 |
| 28 | British School of Commerce Private Limited | 0 |
| | **Total** | **49,146** |

vi. මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මෙම උපාධි පිරිනැමීමේ ආයතන වෙත වෙන් කිරීමක් සිදු නොවන අතර උපාධි පිරිනැමීමේ ආයතන සඳහා අනුමැතිය ලබා දීමට අවම නිර්ණායක අමාත්‍යාංශය තීරණය කර ඇති අතර, අවම නිර්ණායක සපුරන ආයතන සඳහා උපාධි පිරිනැමීමේ බලය ලබා දෙයි. එසේ වුවද, එක් එක් ආයතන සිසුන් සඳහා ලබා දෙන පහසුකම් හා අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩල වැටුප් ප්‍රමාණයන් විවිධ මට්ටම්වල පවතින බැවින්, එක් ශිෂ්‍යයෙකු සඳහා ඔවුන් වැය කරන පිරිවැය ආයතනයෙන් ආයතනයට හා පාඨමාලාවෙන් පාඨමාලාවට වෙනස් අගයක් ගනී. ඔවුන්ගේ වාර්ෂික වාර්තා පමණක් අප අංශයේ අධීක්ෂණයට ලක් කරනු ලැබේ. එබැවින් විමසන ලද තොරතුරු අමාත්‍යාංශය සතු නොවේ.

(ආ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල සිටින මුළු මහාචාර්යවරු සංඛ්‍යාව 1,409කි. එම විස්තර වෙන් වෙන් වශයෙන් ඇමුණුම 06 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 06

**2023.12.31 දිනට එක් එක් විශ්වවිද්‍යාලයේ සිටින මාහාචාර්යවරුන් සංඛ්‍යාව**

| විශ්වවිද්‍යාලය | මහාචාර්යවරුන් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | 196 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 265 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 198 |
| කැළණිය විශ්වවිද්‍යාලය | 176 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 84 |
| යාපනය විශ්වවිද්‍යාලය | 67 |
| රුහුණු විශ්වවිද්‍යාලය | 117 |
| ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 32 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලය | 34 |
| අග්නිදිග විශ්වවිද්‍යාලය | 33 |
| රජරට විශ්වවිද්‍යාලය | 44 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 58 |
| වයඹ විශ්වවිද්‍යාලය | 40 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 15 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 12 |
| ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය | 3 |
| වවුනියා විශ්වවිද්‍යාලය | 3 |
| අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන | 32 |
| **මුළු එකතුව** | **1409** |

- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරු සංඛ්‍යාව 03කි.
- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරු සංඛ්‍යාව 14කි.
- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ සිටින මහාචාර්යවරු සංඛ්‍යාව 01කි.
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ සිටින මහාචාර්යවරු සංඛ්‍යාව 02කි.
- ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ සිටින මුළු මහාචාර්යවරු සංඛ්‍යාව 82කි. විස්තර ඇමුණුම 07 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 07

| අනු අං | මහාචාර්යය කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|---|
| (1) | මහාචාර්යය (ප්‍රධානී) | 07 |
| (2) | මහාචාර්යය (කුසලතා පදනම මත) | 13 |
| (3) | මහාචාර්යය (කොන්ත්‍රාත් පදනම මත) | 04 |
| (4) | මහාචාර්යය (වැඩ පැවරුම් පදනම මත) | 17 |
| | මුළු එකතුව | 41 |

(ii)

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාල පවත්වාගෙන යාම සඳහා වැය වන මුළු පිරිවැය:

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

| විශ්වවිද්‍යාලය | ප්‍රාග්ධන වියදම රුපියල් මිලියන (2023) | පුනරාවර්තන වියදම රුපියල් මිලියන (2023) |
|---|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | 1,196 | 7,186 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 773 | 9,560 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 3,168 | 6,954 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 2,974 | 6,157 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 634 | 4,409 |
| යාපනය විශ්වවිද්‍යාලය | 649 | 4,089 |
| රුහුණ විශ්වවිද්‍යාලය | 1,451 | 4,754 |
| ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 670 | 3,855 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලය | 281 | 2,434 |
| අග්නිදිග විශ්වවිද්‍යාලය | 273 | 1,906 |
| රජරට විශ්වවිද්‍යාලය | 481 | 2,565 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 900 | 2,697 |
| වයඹ විශ්වවිද්‍යාලය | 626 | 2,187 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 336 | 1,451 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 227 | 1,352 |
| ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය | 242 | 730 |
| වවුනියා විශ්වවිද්‍යාලය | 213 | 641 |

- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාම සඳහා වැය වන මුළු පිරිවැය:

  2024 - රුපියල් 505,711,057.00කි.

  2023 - රුපියල් 443,957,829.00කි.

- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාම සඳහා වැය වන මුළු පිරිවැය:

  පුනරාවර්තන වියදම් 2024 වර්ෂයට රුපියල් මිලියන 565කි.

- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාම සඳහා වැය වන මුළු පිරිවැය රුපියල් මිලියන 619.05කි.

- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාම සඳහා වැය වන මුළු පිරිවැය රුපියල් 606,678,155කි.

- ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය පවත්වාගෙන යාම සඳහා වැය වන මුළු පිරිවැය (2024 වර්ෂය) රුපියල් 3,426,922,583.00කි.

(iii)

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලයක ශිෂ්‍යයෙකු සඳහා වැය වන මුළු පිරිවැය.

| විශ්වවිද්‍යාලය/උසස් අධ්‍යාපන ආයතනය | ඒකක පුනරාවර්තන වියදම රුපියල් (2022 වර්ෂය සඳහා) |
|---|---|
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 714,662.00 |
| කොළඹ විශ්වවිද්‍යාලය | 450,438.00 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 404,072,00 |
| කැලණිය විශ්වවිද්‍යාලය | 363,907.00 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 416,704.00 |
| යාපනය විශ්වවිද්‍යාලය | 352,309.00 |
| රුහුණ විශ්වවිද්‍යාලය | 391,745.00 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලය | 352,741.00 |
| අග්නිදිග විශ්වවිද්‍යාලය | 300,679.00 |
| රජරට විශ්වවිද්‍යාලය | 299,821.00 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 338,021.00 |
| වයඹ විශ්වවිද්‍යාලය | 338,965.00 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 323,504.00 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 440,808.00 |
| ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය | 693,056.00 |
| වවුනියා විශ්වවිද්‍යාලය | 237,685.00 |
| කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතනය | 448,055.00 |
| දේශීය වෛද්‍ය විද්‍යායතනය | 620,248.00 |
| ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය | 304,277.00 |
| සාමාන්‍යය | 405,313.00 |

- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකු සඳහා වැය වන මුළු පිරිවැය:

  2024 - රුපියල් 1,075,981.00කි.

  2025 - රුපියල් 1,013,602.00කි.

- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකු සඳහා වැය වන මුළු පිරිවැය:

  2024 වර්ෂය සඳහා ඒක ශිෂ්‍ය පිරිවැය - රුපියල් 961,994.00කි.

- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකු සඳහා වැය වන මුළු පිරිවැය රුපියල් 668,000.00කි.

  වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකු සඳහා වැය වන මුළු පිරිවැය රුපියල් 561,313.43කි.

- ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙකු සඳහා වැය වන මුළු පිරිවැය රුපියල් 2,877,657.00කි.

(iv)

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල වත්කම්වල මුළු වටිනාකම ඇමුණුම 08 මඟින් දක්වා ඇත.

ඇමුණුම 08

**2023.12.31 දිනට මූල්‍ය තත්වය අනුව මුලු වත්කම්**

| විශ්වවිද්‍යාලය | ජංගම නොවන වත්කම් (Non Current Assets) | ජංගම වත්කම් (Current Assets) | මුලු වත්කම් (Total Assets) |
|---|---|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | 59932.4 | 2312.3 | 62244.7 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 28425 | 4123.8 | 32548.8 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 24648 | 8024.6 | 32672.6 |
| කැළණිය විශ්වවිද්‍යාලය | 24443.5 | 1402.355 | 25845.855 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 9549.118 | 3520.18 | 13069.298 |
| යාපනය විශ්වවිද්‍යාලය | 12789.9 | 1673 | 14462.9 |
| රුහුණු විශ්වවිද්‍යාලය | 14749.3 | 1137.3 | 15886.6 |
| ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 16740 | 2183 | 18923 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලය | 2916 | 1287 | 4203 |
| ත්‍රිකුණාමල මණ්ඩපය | 2385 | 141 | 2526 |
| අග්නිදිග විශ්වවිද්‍යාලය | 4867.594 | 494.243 | 5361.837 |
| රජරට විශ්වවිද්‍යාලය | 15595.4 | 671.4 | 16266.8 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 5801.944 | 485.825 | 6287.769 |
| වයඹ විශ්වවිද්‍යාලය | 10610.5 | 1347.944 | 11958.444 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 4525.9 | 356.3 | 4882.2 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 4703 | 125.286716 | 4828.286716 |
| ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය | 1321.2 | 171.1 | 1492.3 |
| වවුනියා විශ්වවිද්‍යාලය | 2037.3 | 137.05 | 2174.35 |

මූලාශ්‍රය: මූල්‍ය ප්‍රකාශන 2023

| | | |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | - | ඉඩම්, ගොඩනැගිලි ,උපකරණ ,ලී බඩු, වාහන ,ආයෝජන ,අස්පෘශ්‍ය වත්කම් ,කෙරීගෙන යන වැඩ (work in progress) ,පුස්තකාල පොත් සහ උපාධි ලෝගු |
| ජංගම වත්කම් | - | තොග ,ණයගැතියෝ, කාර්යමණ්ඩලය සඳහා ණය හා.අත්තිකාරම් ,අත්තිකාරම් හා පෙර ගෙවීම්, මුදල් හා මුදල් සමාන දේ |

- ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ වත්කම්වල මුළු වටිනාකම:

  2024 - රුපියල් 2,540,456,926.00කි.

  2023 - රුපියල් 2,555,862,145.00කි.

- ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වත්කම්වල මුළු වටිනාකම රුපියල් මිලියන 1,939කි.

- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වත්කම්වල මුළු වටිනාකම රුපියල් බිලියන 23කි.

- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ වත්කම්වල මුළු වටිනාකම රුපියල් 2,272,791,638කි.

- ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වත්කම්වල මුළු වටිනාකම රුපියල් 76,701,514,066.00කි.

(v)

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්වවිද්‍යාලවල ලෝක ශ්‍රේණිගත කිරීම අනුව ඉහත එක් එක් විශ්වවිද්‍යාලයට හිමි ස්ථානය ඇමුණුම 09 මඟින් දක්වා ඇත.

ඇමුණුම 09

**ලෝක ශ්‍රේණිගත කිරීම් අනුව එක් එක් විශ්වවිද්‍යාලයට හිමි ස්ථානය (Webometrics Ranks)**

| විශ්වවිද්‍යාලය | ලෝක ශ්‍රේණිගත කිරීම2024 (ජූලි මසට) |
|---|---|
| කොළඹ විශ්වවිද්‍යාලය | 1591 |
| පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 2017 |
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 2191 |
| රුහුණු විශ්වවිද්‍යාලය | 2667 |
| මොරටුව විශ්වවිද්‍යාලය | 2903 |
| කැළණිය විශ්වවිද්‍යාලය | 2967 |
| රජරට විශ්වවිද්‍යාලය | 3385 |
| යාපනය විශ්වවිද්‍යාලය | 3501 |
| සබරගමුව විශ්වවිද්‍යාලය | 4195 |
| වයඹ විශ්වවිද්‍යාලය | 4693 |
| නැගෙනහිර විශ්වවිද්‍යාලය | 5425 |
| විවෘත විශ්වවිද්‍යාලය | 5906 |
| අග්නිදිග විශ්වවිද්‍යාලය | 7942 |
| ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | 8066 |
| සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය | 16759 |

- ලෝක ශ්‍රේණිගත කිරීම අනුව ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - 21972

- ලෝක ශ්‍රේණිගත කිරීම අනුව ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය - 11604

- ලෝක ශ්‍රේණිගත කිරීම අනුව ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය - 17861

  2024 වර්ෂය - 19604

  2025 වර්ෂය - 18681

- ලෝක ශ්‍රේණිගත කිරීම අනුව ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - Times උසස් අධ්‍යාපන බලපෑම් ශ්‍රේණිගත කිරීම්හි, Times Higher Education Impact Rankingsහි - 601 - 800 කාණ්ඩයේ ශ්‍රේණිගත කර ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. උසස් පෙළ විභාගයෙන් පසුව සිසුන් 174,000ක් විශ්වවිද්‍යාලවලට සමත් වෙලා තිබෙන බව අපි සියලුදෙනාම දන්නවා. UGC එක විසින් එයින් 55,400ක් අපේ විශ්වවිද්‍යාල 22ට ඇතුළත් කර ගන්නවා කියලා මේ වන විට වාර්තා වෙලා තිබෙනවා.

ඒ අතරතුර මාධ්‍ය මඟින් පළ වෙලා තිබෙනවා, සාමාන්‍යයෙන් අවුරුද්දකට ලක්ෂයක විතර සිසුන් පිරිසක් උසස් අධ්‍යාපනය සඳහා රටින් පිටට යනවා කියලා. එතකොට ඒ එක්කෙනෙකුට අවුරුද්දකට රුපියල් මිලියන 7ක් හැටියට අරගෙන ඒ මුදල ලක්ෂයෙන් වැඩි කරලා ඇමෙරිකානු ඩොලර්වලින් ගත්තාම,

[ගරු රවී කරුණානායක මහතා]

ඔවුන් වෙනුවෙන් අවුරුද්දකට ඇමෙරිකානු ඩොලර් බිලියන 3ක වියදමක් දරන්න වෙනවා. 174,000ක් විභාගය සමත් වෙලා 54,000ක් රජයේ විශ්වවිද්‍යාලවලට යනවා නම්, අහිංසක දරුවන් 120,000කට අවස්ථාවක් නැහැ, ලංකාවේ විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපනය ලබන්න. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ලබා දුන් පිළිතුර අනුව පිළිගත් උපාධි පිරිනැමිය හැකි පෞද්ගලික ආයතන 28ක් තිබෙනවා. ඒවා ඔබතුමන්ලා පිළිගෙන තිබෙනවා. ඒ අනුව අපට බැරිද, මේ රටේ විදේශ විනිමය පිටට යන්න නොදී ලාංකික සිසුන්ට පුළුවන් තරම් දේශීය විශ්වවිද්‍යාලවල උපාධිය හදාරන්න අවස්ථාව සලසා දෙන්න? ඒ වාගේම අවට රටවලිනුත් ලංකාවට සිසුන් ගෙන්වාගෙන, educational tourism වශයෙන් කටයුතු කරන්න ඒ අවස්ථාව උපයෝගී කර ගන්න බැරිද? ඒ තුළින් රජයේ මුදල් ඉතිරි වෙනවා වාගේම විදේශ විනිමය උපයා ගන්නත් හැකි වෙනවා. ඒ වාගේම අපේ සිසුන්ටත් වැඩි අවස්ථාවක් සැලසෙනවා, රට තුළ සිටිමින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන්න. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ ආණ්ඩුවට තිබෙන ප්‍රතිපත්තිය මොකක්ද?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ඒ ප්‍රශ්නය ඇසීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා වාර දෙකකදී ඒ ප්‍රශ්නය පැන නැඟුවා. අපි සාකච්ඡා කරමින් ඉන්නවා, ඒ අවස්ථාව වැඩි කර දෙන්නේ කොහොමද කියන එක පිළිබඳව.

අපි මෙවර අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඔස්සේත් උසස් අධ්‍යාපනය විශ්වවිද්‍යාලයට පමණක් සීමා නොකර වෘත්තීය අධ්‍යාපනය කියන කොටසට සිසුන් විශාල පිරිසක් යොමු කරන අදහස සහ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරමින් පවතිනවා. පාසල් අධ්‍යාපනයට වෘත්තීය අධ්‍යාපනය එකතු කිරීම එහි එක කොටසක්. ඒකත් එක්කම වෘත්තීය අධ්‍යාපනය අඛණ්ඩව උසස් අධ්‍යාපනයට එකතු කිරීම තව කොටසක්. වෘත්තීය අධ්‍යාපනයට අවස්ථා වැඩි කිරීම තවත් කොටසක්. උසස් අධ්‍යාපනය කියන එකෙන් අදහස් වෙන්නේ සියලුම ආකාරයේ අධ්‍යාපන විධි. වෘත්තීය අධ්‍යාපනය කියන එක අපේ ප්‍රතිපත්තියක් වීමේ කාරණාව ඔස්සේ සහ අපි දැනට ක්‍රියාත්මක කරගෙන යන ආර්ථික ක්‍රියාවලිය ඔස්සේ අපට රැකියා අවස්ථා බිහි කිරීමට හැකියාව තිබෙන ක්ෂේත්‍රයක්. ඒක එක කාරණයක්. අනෙක් එක තමයි, අපි විශේෂයෙන් මෙවර අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට ව්‍යවසායකත්වය සහ තවත් විවිධාකාර කරුණු ඇතුළත් කර තිබීම. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අපි අවධානය යොමු කර තිබෙනවා.

ඊළඟට transnational education ගත්තාම, එතැනදී අපි රජයේ විශ්වවිද්‍යාල සහ අනෙකුත් විශ්වවිද්‍යාල අතර ඒකාබද්ධ හුවමාරු වැඩසටහන් සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. අනෙක් විශ්වවිද්‍යාල 28න් එහාට මෙවර අපි කරන කාර්යය තමයි, මේ සම්බන්ධයෙන් ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම. ඒ ඔස්සේ අවශ්‍යතා තිබෙන ශිෂ්‍යයන්, හැකියා තිබෙන ශිෂ්‍යයන් සහ යුනෙස්කෝව අනුගමනය කරන, කුසලතාව මත කියන ප්‍රතිපත්තියට අපි එකඟ විය යුතුයි. ඒ සඳහා අවස්ථා බිහි කරන්න ඒ විධියට කටයුතු කරමු කියන අදහස තමයි මෙහිදී අපට තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අද අගමැතිනියත්, සෞඛ්‍ය ඇමතිතුමාත් මෙතැන සිටිනවා. "කොතලාවල වෛද්‍ය පීඨ දොර දේශීය සිසුන්ට වැසීමට එරෙහිව සිසු පිරිසක් ශ්‍රේෂ්ඨාධිකරණයට" යනුවෙන් පුවතක් අද අපට අසන්නට ලැබුණා.

මට ආරංචියි, විශ්වවිද්‍යාලවල Vice Chancellorsලා අද උදේ 10.30ට මේ සම්බන්ධව සාකච්ඡා කරන්න ජනාධිපතිතුමාව හමුවෙනවා කියලා. ඒත් එක්කම සෞඛ්‍ය අමාත්‍ය නලින්ද ජයතිස්ස මැතිතුමා කියනවා, "Government planning to create doctors for overseas as medical professionals" කියලා. ඒ වාගේම KDU එකට Z-score එක තුළින් මේ වාගේ batches දෙකක් අරගෙන තිබෙනවා. දැන් තුන්වැනි කණ්ඩායම ගන්නේ නැතුව නවත්වලා තිබෙනවා. එම නිසා General Sir John Kotelawala Defence University එකේ තිබෙන වෛද්‍ය පීඨය තුළ මේ ප්‍රශ්නය මතුවෙලා තිබෙනවා. මීට කලින් සිසු පිරිසකට මේ අවස්ථාව හිමි වුණේ නැහැයි කියන කාරණය පාවිච්චි කරලා දැන් ඒ පීඨය අනෙක් දරුවන්ට වහන්නේ නැතුව ඒ සම්බන්ධයෙන් රජයට මැදිහත් වෙලා එය නැවත අනෙක් දරුවන්ට විවෘත කරන්න බැරි ඇයි? ඔබතුමන්ලාට මතකයි නේ, NCMC එකේ ප්‍රශ්නයක් ඇති වුණා. අපට මේ ප්‍රශ්නය විසඳන්න කටයුතු කරන්න බැරි ඇයි?

ඒ විතරක් නොවෙයි. අපේ රටේ cadre එකේ professorsලා 7,500ක් සිටියත්, අද එය 6,100 දක්වා අඩුවෙලා තිබෙනවා. ඒ අය මීට වැඩි ආදායමක් උපයන්න පුළුවන් රටවලට ගමන් කරනවා. විශ්වවිද්‍යාල වහගෙන යනකොට, බඳවා ගන්නා ප්‍රමාණය සීමා කරන්නේ ඇයි? ගරු කථානායකතුමනි, 120,000කට පමණ අවස්ථාව තිබෙනකොට විශ්වවිද්‍යාල විවෘත කරලා ලංකාව වශයෙන් අපේ ශිෂ්‍යයන්ට අවස්ථාව දෙන්න කටයුතු කරන්න බැරි ඇයි? ඔබතුමන්ලා මන්ත්‍රීවරුන් වුවත්, ඒ අයගේ දරුවනුත් මෙම විශ්වවිද්‍යාලවලට ගිහිල්ලා සමත් වෙලා විශිෂ්ට නාමයක් ලබාගෙන තිබෙනවා. අනෙක් අයටත් ඒ අවස්ථාව උදා කරන්න අපට බැරි ඇයි කියලා මම ඔබතුමාගෙන් ඉතා ඕනෑකමින් අහනවා.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සම්බන්ධ ගැටලුව පැනනඟින්නේ, මූලිකව ආරක්ෂක විශ්වවිද්‍යාලයක් විධියට පටන් ගැනීමෙන් පසුවයි. නමුත් එහි සිවිල් දෙමව්පියන්ගේ දරුවන් යම් කිසි ප්‍රමාණයකුත් ඉගෙන ගනිමින් සිටිනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මේකට මම යම් කරුණක් එකතු කළාට කමක් නැද්ද? දැන් යුද හමුදාවට සම්බන්ධ වන පිරිස අඩු වෙමින් යනවා. මට ආරංචියි, මේ වතාවේ නවදෙනායි ගිහිල්ලා තිබෙන්නේ කියලා. ඒක මම හිතන විධියට අපට උත්තරයක් ලෙස පාවිච්චි කරන්න පුළුවන්.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

මම උත්තරය සම්පූර්ණ කරන්නම්. මෙවර අපට එක් පාර්ශ්වයක් තිබෙනවා. ඒ තමයි, සෞඛ්‍ය අමාත්‍යාංශය. ලබන අවුරුද්ද වනකොට සීමාවාසික වෛද්‍යවරු සංඛ්‍යාව සම්පූර්ණයෙන්ම වාගේ රෝහල්වල පිරෙනවා. එතකොට ඒ අවශ්‍යතාව අපි සමාලෝචනය කළ යුතුයි. මේ කාලය ඇතුළත අපි

රජයේ විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨවලින් පිට වන සංඛ්‍යාව පිළිබඳවත් සමාලෝචනය කරමින් සිටිනවා. විශ්වවිද්‍යාල වැසීමක් කරන්නේ නැහැ. ඒක අපි අවධාරණය කළ යුතුයි. *[බාධා කිරීමක්]* නමුත්, මේ ක්‍රියාවලිය පිළිබඳව අපි යම්කිසි සමාලෝචනයක් කරනවා; මේ අවස්ථාවේදී බහුපාර්ශ්වීයව සමාලෝචනයක් කරන ගමන් අපි ඉන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අඩුපාඩුවක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. පිට රටවල අයත් ගෙනෙන්න පුළුවන් අවස්ථාව ඇති කරන්න. රජයට, රටට වටිනා විදේශ විනිමය මේ රටේම උපයන්න පුළුවන් මාර්ගයක් නිසායි මම මේ කාරණය අහන්නේ.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ඔබතුමා මතු කරන කාරණය නිශ්චිතයි. නමුත්, අපේ පැත්තෙන් අපි මතු කරන කාරණාව තමයි, වෛද්‍ය අධ්‍යාපනය සඳහා කොච්චර අවශ්‍යතාවක් තිබෙනවාද, මෙවර විශ්වවිද්‍යාලයෙන් පිට වන අයගෙන් කොච්චර ප්‍රමාණයක් වෛද්‍යවරු විධියට සෞඛ්‍ය සේවයට බඳවා ගන්න අපට පුළුවන්ද කියන එක. ඊළඟට, මේ සම්බන්ධයෙන් අපි සමාලෝචනයක ඉන්නවා. මේ සමාලෝචනය ඔස්සේ තමයි අපට,- *[බාධා කිරීමක්]* ඒක හරි. අනෙක් කාරණය මේකයි. මේක අපේ ආරක්ෂක අමාත්‍යාංශය සතු විශ්වවිද්‍යාලයක්.

මෙය විශ්වවිද්‍යාල කොමිෂන් සභාව සතු විශ්වවිද්‍යාලයක් නොවෙයි. නමුත් ඒ ක්‍රියාවලියට අපේ දායකත්වය තිබෙනවා. ඒක තමයි මේ සම්බන්ධයෙන් කියන්න තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සෞඛ්‍ය ඇමතිතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට සෞඛ්‍ය අමාත්‍යාංශය පැත්තෙනුත් මම යමක් එකතු කරන්නට කැමතියි. ගරු මන්ත්‍රීතුමනි, රජයේ විශ්වවිද්‍යාලවලින් හෝ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙන් හෝ විදේශීය රටකින් වෛද්‍ය උපාධිය ලබාගෙන ලංකාවට පැමිණ Act 16 Exam එක සමත් වෙන සියලුදෙනා ගැන රජයකට වගකීමක් පැවරෙනවා. ඒ නිසා තමයි අපට උපාධිය වාගේම internship එකත් වැදගත් වෙන්නේ. උපාධිය පමණක් ලබා දීලා ඒ අයව එළියට දාලා හරියන්නේ නැහැ, සීමාවාසික පුහුණුවත් වැදගත්. ඒ පුහුණුව ලබා දුන්නාට පසුව තමයි ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ වෛද්‍යවරයෙක් නිර්මාණය කළා කියලා අපට සහතික කරන්න පුළුවන්කම ලැබෙන්නේ. ඔබතුමා දන්නවා, මේ වෙලාවේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතින බව. විශේෂයෙන් Ward Certified Consultantsලාගේ හිඟයක් පවතිනවා. ඒ අයත් එක්ක තමයි මේ සීමාවාසික පුහුණුව කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

රජයේ විශ්වවිද්‍යාලවලින් එළියට එන උපාධිධාරින්, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙන් එළියට එන උපාධිධාරින් සහ විදේශ උපාධිධාරින් යන සියලුදෙනාට සීමාවාසික පුහුණුව ලබා දීම සම්බන්ධයෙන් ගැටලුවක් පැන නඟිමින් පවතින බව අපට පේනවා. ඒ නිසා මේකට අදාළ සියලු පාර්ශ්ව එක්ක සාකච්ඡා කරලා යම් විසඳුමකට පැමිණීම සඳහා අපි තාවකාලිකව මේ තීන්දුවට පැමිණ තිබෙනවා. අපි ඉතාම ඉක්මනට මේ සීමාවාසික පුහුණුව සම්බන්ධ ප්‍රශ්නය නිරාකරණය කරගන්න ඕනෑ. මොකද, මේ සියලු වෛද්‍යවරු රාජ්‍ය යන්ත්‍රණයට හෝ රටේ පෞද්ගලික ක්ෂේත්‍රයට ඇතුළත් නොවුණත්, ඒ අය විදේශ රැකියාවලට ගියත්, ඒ වෛද්‍යවරයාගේ උපාධිය සහ සීමාවාසික පුහුණුව සම්බන්ධයෙන් අපට වගකීමක් තිබෙනවා. මෙන්න මේ ගැටලුව තමයි අපි සාකච්ඡා කරමින් පවතින්නේ. මේ ගැටලුවට ස්ථිරසාර, හොඳ විසඳුමක් ලබා ගත්තාට පස්සේ අපට මේ තීන්දුව ප්‍රකාශයට පත් කරන්න පුළුවන්.

## ජාතික සහ පළාත් සභා පාසල්: විස්තර
## தேசிய மற்றும் மாகாண சபைப் பாடசாலைகள்: விபரம்
## NATIONAL AND PROVINCIAL COUNCIL SCHOOLS: DETAILS

381/2025

**2. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් පාසලේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව, ගුරුවරුන් සංඛ්‍යාව සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ ඇති පළාත් සභා පාසල් සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් පාසලේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව, ගුරුවරුන් සංඛ්‍යාව සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) පසුගිය රජය විසින් ජාතික පාසල් බවට පත් කර ඇති පළාත් සභා පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම පාසල් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள தேசியப் பாடசாலைகளின் எண்ணிக்கை ஒவ்வொரு மாகாணத்திற் கமைவாக வெவ்வேறாக யாதென்பதையும்;

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

(ii) அத்தகைய ஒவ்வொரு பாடசாலையிலும் கல்வி கற்கும் மாணவர்களின் எண்ணிக்கை, ஆசிரியர்களின் எண்ணிக்கை மற்றும் கல்வி சாராப் பணியாட்டொகுதி ஊழியர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(iii) இலங்கையிலுள்ள மாகாண சபைப் பாடசாலைகளின் எண்ணிக்கை ஒவ்வொரு மாகாணத்திற்கமைவாக வெவ்வேறாக யாதென்பதையும்;

(iv) அத்தகைய ஒவ்வொரு பாடசாலையிலும் கல்வி கற்கும் மாணவர்களின் எண்ணிக்கை, ஆசிரியர்களின் எண்ணிக்கை மற்றும் கல்வி சாரா பணியாட்டொகுதி ஊழியர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாதென்பதையும்;

(v) கடந்த அரசாங்கத்தினால் தேசிய பாடசாலைகளாக மாற்றப்பட்டுள்ள மாகாண சபைப் பாடசாலைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(vi) அத்தகைய பாடசாலைகளை அபிவிருத்தி செய்வதற்காக மேற்கொள்ளப்படும் நடவடிக் கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of National Schools in Sri Lanka in each province, separately;

(ii) number of students, the number of teachers and the number of members in the non-academic staff in each of those schools, separately;

(iii) number of provincial council schools under each of the provinces in Sri Lanka, separately;

(iv) number of students, the number of teachers and the number of members in the non-academic staff in each of those schools, separately;

(v) number of provincial council schools that have been transformed as National Schools by the previous Government; and

(vi) measures that will be taken to develop those schools?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත.

(ii) එම එක් එක් පාසලේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව, ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02 මඟින් ද,

ඒකාබද්ධ සේවයට අයත් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව ඇමුණුම 03 මඟින්ද,

ඒකාබද්ධ නොවන සේවයට අයත් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව ඇමුණුම 04 මඟින්ද,

ජාතික පාසල් වශයෙන් අනුමත කර ඇති නමුත් මේ දක්වා අනධ්‍යයන කාර්ය මණ්ඩලය අනුමත කර නොමැති, සේවා අවශ්‍යතාව මත කාර්ය මණ්ඩලය අනුයුක්ත කරන ලද ජාතික පාසල් ලැයිස්තුව ඇමුණුම 05 මඟින් ද ඉදිරිපත් කර ඇත.

(iii) ශ්‍රී ලංකාවේ ඇති පළාත් සභා පාසල් සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 06 මඟින් ඉදිරිපත් කර ඇත.

(iv) එම එක් එක් පාසලේ ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව, ගුරුවරුන් සංඛ්‍යාව සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් ඇමුණුම 07 මඟින් ඉදිරිපත් කර ඇත.

(v) පසුගිය රජය විසින් ජාතික පාසල් බවට පත් කර ඇති පළාත් සභා පාසල් සංඛ්‍යාව 23කි.

(vi) 01. සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ, ලෝක බැංකු ආධාර යටතේ, පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදාන යටතේ මෙම පාසල්වල ගොඩනැඟිලිවල සුළු අලුත්වැඩියා කටයුතු කිරීම.

02. අංක 54/2023 හා 2023.12.29 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ කරුණු අංක 8.0 ප්‍රකාරව ගුණාත්මක යෙදවුම් මිලදී ගැනීම සඳහා ප්‍රදාන ලබා දීම.

03. පාසල් පරිශ්‍රය තුළ අවදානම් තත්ත්වයේ පවතින ගොඩනැඟිලි කඩා ඉවත් කිරීමට නිර්දේශ ලබා දීම.

04. සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම යටතේ වැසිකිළි කැසිකිළි අලුත්වැඩියාව සඳහා මූල්‍ය ප්‍රදාන ලබා දීම හා නව වැසිකිළි පද්ධති ඉදිකිරීමට කටයුතු කිරීම.

05. ජාතික පාසල්වල අලුත්වැඩියා කිරීමෙන් නැවත ප්‍රයෝජනයට ගත හැකි මට්ටමේ පවතින යන්ත්‍ර සූත්‍ර, උපකරණ අලුත්වැඩියා කිරීමට මූල්‍ය ප්‍රදාන ලබා දීම.

06. අවදානම් තත්ත්වයේ පවතින ගස් ඉවත් කිරීම, අනාරක්ෂිත බැම් කඩා ඉවත් කිරීමට නිර්දේශ ලබා දීම.

07. විවිධ පාසල් ප්‍රජාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට කටයුතු කිරීම. (උදාහරණ: අලි වැට ඉදිකිරීම)

08. ඩෙස්ක් පුටු හා කාර්යාලයීය උපකරණ ලබා දීම.

09. ආරක්ෂිත පැති බැම් ඉදිකිරීමට කටයුතු කිරීම.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම් 01 සිට 07 දක්වා **සභාගත*** කරමි.

---

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන්. මම මේ කාරණය ගරු කථානායකතුමාගේත් අවධානයට යොමු කරනවා. ගරු අගමැතිතුමියනි, සමහර ප්‍රශ්නවලට දීර්ඝ පිළිතුරු තිබෙනවා. ඒ වාගේ පිළිතුරුවලදී ඇත්තවශයෙන්ම එම ලේඛන සභාගත කරන්න වෙනවා. නමුත් සමහර පිළිතුරුවලදී අපට ඒ සම්බන්ධයෙන් අතුරු ප්‍රශ්නයක් මතු කිරීමේදී ගැටලුවක් මතු වෙනවා. උදාහරණයක් හැටියට ගරු අග්‍රාමාත්‍යතුමියනි, පසුගිය රජය විසින් ජාතික පාසල් බවට පත් කර ඇති පළාත් සභා පාසල් ගණන ඔබතුමිය කිව්වා. මට ඒක ඇහුණේ නැහැ, කීයද කියලා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
23යි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඔබතුමිය සොයා බලන්න, පසුගිය රජය කාලයේ පළාත් සභා යටතේ තිබුණු පාසල් 1,000ක් ජාතික පාසල් බවට පත් කරලා, පළාත් සභා පාසල වෙනුවට ජාතික පාසල වශයෙන් නාම පුවරුවක් සවි කර, ඒ පාසල්වල විදුහල්පතිතුමා ඇතුළු ආචාර්ය මණ්ඩලයටත්, දරුවන්ගේ දෙමාපියන්ටත් මේක ජාතික පාසලක් යැයි කියලා යම් වැඩ පිළිවෙළක් කළා. අනතුරුව ඒ පාසල්වලින් කොටසක් විතරක් - සාමාන්‍යයෙන් අධ්‍යාපන කලාපයකට එක් පාසලක් විතරක්- ජාතික පාසල් බවට පත් කර තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, දැනට එම ජාතික පාසල් 1,000 සඳහා තෝරාගත් පාසල් ජාතික පාසල් හැටියටම තියනවාද, නැත්නම් ඒවා නැවත පළාත් සභාවලට පවරා ගන්නවාද? ඊයේ පෙරේදා එම පාසල් 1,000හි සිටින විදුහල්පතිවරුන්ට චක්‍රලේඛයක් යවා තිබෙනවා, යම් විධියකින් "ජාතික පාසල" යනුවෙන් ලිඛිතව හෝ පාවිච්චි කරන්න එපා, එහෙම පාවිච්චි කළොත් වගකියන්න වෙනවා කියලා. මේ සම්බන්ධයෙන් මට ඔබතුමියගෙන් පැහැදිලි කිරීමක් අවශ්‍යයි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම පාසල් නැවත පළාත් සභාවලට පවරන්න දැනට අදහසක් නැහැ. ගරු මන්ත්‍රීතුමාත් කියපු විධියට එම පාසල් ජාතික පාසල් හැටියට නම් කළාට ඒවා ජාතික පාසල් හැටියට දියුණු කරන්න කිසිම වැඩ පිළිවෙළක් තිබිලා නැහැ. ඒ පාසල් හඳුනාගෙන, ඒවා ජාතික පාසල් කියන තත්ත්වයට ගන්න තමයි අපි මේ අවස්ථාවේ මූලිකව මැදිහත් වෙමින් ඉන්නේ. ඒ සඳහා අය වැයෙන් මුදල් වෙන් කරලාත් තිබෙනවා. ඒ අනුව, මම විස්තර කළ විධියට ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු අගමැතිතුමියනි, මේ ජාතික පාසල් දහසේ වැඩ පිළිවෙළ පසුගිය රජය විසින් ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙළක් කියන එක ඔබතුමිය පිළිගන්නවා. ඒක හරිද, වැරදිද කියන එක නොවෙයි මම කියන්නේ. එසේ ජාතික පාසල් බවට පත් කළ බොහෝ පාසල්, පළාත් සභාවල තිබුණු ජනප්‍රියම පාසල්. බස්නාහිර පළාත ගත්තොත්, බස්නාහිර පළාතේ තිබුණු ජනප්‍රියම පාසල් ටික තමයි එසේ ජාතික පාසල් බවට පත් කළේ.

දැන් වෙලා තිබෙන්නේ අම්මා, තාත්තා නැති දරුවන් වාගේ, ඒවාට ජාතික පාසලකුත් නොවෙයි කියනවා, පළාත් සභා පාසලකුත් නොවෙයි කියනවා. ඒ නිසා ස්ථිර වශයෙන්ම මට ඔබතුමිය කියන්න, ඒ පාසල් 1,000ම ජාතික පාසල් බවටම පත් වෙනවා ද, එහෙම නැත්නම් ඒ තත්ත්වයට පත් වෙන්නේ ඔබතුමිය කියපු පාසල් 23 විතර ද?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
දැනට පාසල් 23යි. ඒ පාසල් 23 තමයි ජාතික පාසල් හැටියට නම් කරලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
පළාත් සභාවේ-

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
නැහැ, ඒ පිළිබඳව යම් සමාලෝචනයක් කරලා තමයි අපට ඒ තීරණය ගන්න වෙන්නේ. මොකද, අපි සූදානම් නැහැ, නිකම් බෝඩ් ලෑලි වෙනස් කරන තැනකට යන්න. ඒ පාසල් පළාත් සභාවෙන් හොඳට කරගෙන යනවා නම්, ඒ විධියට පවත්වා ගෙන යන එකට තමයි අපි මැදිහත් වෙන්නේ. ඒක තමයි අපි ශක්තිමත් කරන්නේ. පොදුවේ ගත්තොත්, මේ බෙදීම නිසා ප්‍රශ්න ගණනාවක් මතු වෙලා තිබෙනවා. හැබැයි, ඒ තත්ත්වයත් එක්ක නේ අපට වැඩ කරන්න වෙලා තිබෙන්නේ. ඒ සම්බන්ධයෙන් අපි ක්‍රමානුකූලව මැදිහත් වෙන්න තමයි බලාපොරොත්තු වෙන්නේ, ගරු කථානායකතුමනි.

## ප්‍රතිසංස්කරණය කළ යුතු වැව්: විස්තර
## புனரமைப்புச் செய்யப்படவேண்டிய குளங்கள்: விபரம்
TANKS IN NEED OF RENOVATION: DETAILS

513/2025

**3. ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති වැව් අතරින් මේ වන විට ප්‍රතිසංස්කරණය කළ යුතු තත්ත්වයේ පවතින වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සැලසුම් කර තිබේද;

(iii) එසේ නම්, එම ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள குளங்களில் தற்போது புனரமைப்புச் செய்யப்பட வேண்டிய நிலையிலுள்ள குளங்களின் எண்ணிக்கை எத்தனை;

[ගරු පද්මසිරි බණ්ඩාර මහතා]

(ii) மேற்படி குளங்களைப் புனரமைப்புச் செய்வதற்குத் திட்டமிடப்பட்டுள்ளதா;

(iii) அவ்வாறாயின், மேற்படி புனரமைப்பு நடவடிக்கைகள் ஆரம்பிக்கப்படும் திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the number of tanks that are currently in need of renovation, out of the tanks in Sri Lanka;

(ii) whether it has been planned to renovate the tanks referred to above; and

(iii) if so, the date on which the renovation work will be commenced?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i)

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් ප්‍රතිසංස්කරණය කළ යුතු තත්ත්වයේ වැව් | 101 | ඇමුණුම 01 - 06 දක්වා |
| වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ප්‍රතිසංස්කරණය කළ යුතු තත්ත්වයේ වැව් | 174 | ඇමුණුම 07 |
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ප්‍රතිසංස්කරණය කළ යුතු තත්ත්වයේ වැව් | 4,551 | ඇමුණුම 08 |
| එකතුව | 4,826 | |

සවිස්තරාත්මක පිළිතුරු ඇමුණුම් 01-06 දක්වා ලබා දී ඇත.

ඇමුණුම් 01 සිට 06 දක්වා **සභාගත*** කරමි.

ඇමුණුම් 07 සහ 08 පහත පරිදි වේ.

ඇමුණුම 07

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින ප්‍රතිසංස්කරණය කලයුතු ජලාශ**

| කලාපය | නවීකරණය කල යුතු ප්‍රධාන ජලාශය | නවීකරණය කලයුතු මධ්‍යම ප්‍රමාණයේ ජලාශ |
|---|---|---|
| අම්පාර | 7 | 5 |
| අනුරාධපුර | 8 | 37 |
| බදුල්ල | 7 | 6 |
| මඩකලපුව | 4 | 1 |
| කොළඹ | - | 5 |
| ගාල්ල | - | 3 |
| හම්බන්තොට | 10 | 9 |
| මහනුවර | 4 | 9 |
| කුරුණෑගල | 7 | 5 |
| මන්නාරම | 2 | 4 |
| මොණරාගල | 1 | 14 |
| පොළොන්නරුව | 2 | 1 |
| පුත්තලම | 2 | 13 |
| ත්‍රිකුණාමලය | 5 | 3 |
| එකතුව | 59 | 115 |

ඇමුණුම 08

**(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති වැව් අතරින් මේ වන විට ප්‍රතිසංස්කරණය කළ යුතු තත්ත්වයේ පවතින වැව් සංඛ්‍යාව කොපමණ ද?**

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රතිසංස්කරණය කළ යුතු බවට හඳුනාගෙන ඇති වැව් සංඛ්‍යාව | 2025 වර්ෂයේ දී වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය | |
|---|---|---|---|---|
| | | | ව්‍යාපෘති සංඛ්‍යාව | වෙන් කරනු ලබන මුදල රු.මිලියන |
| 1 | මොනරාගල | 91 | 5 | 36,000,000.00 |
| 2 | කෑගල්ල | 2 | 15 | 12,900,000.00 |
| 3 | ගම්පහ | 31 | 10 | 16,300,000.00 |
| 4 | බදුල්ල | 182 | 5 | 21,000,000.00 |
| 5 | යාපනය | 800 | 6 | 17,500,000.00 |
| 6 | පුත්තලම | 567 | 10 | 20,900,000.00 |
| 7 | ත්‍රිකුණාමලය | 347 | 4 | 27,360,000.00 |
| 8 | රත්නපුර | 61 | 5 | 9,600,000.00 |
| 9 | කළුතර | 0 | 17 (ඇල/අමුණු) | 20,100,000.00 |
| 10 | කිලිනොච්චිය | 604 | 3 | 13,000,000.00 |
| 11 | කොළඹ | 3 | 5 | 10,100,000.00 |
| 12 | ගාල්ල | 0 | 21 (ඇල/අමුණු) | 19,475,000.00 |
| 13 | මුලතිව් | 37 | 1 | 15,000,000.00 |
| 14 | නුවරඑළිය | 39 | 4 | 19,100,000.00 |
| 15 | මඩකලපුව | 225 | 3 | 17,000,000.00 |
| 16 | පොළොන්නරුව | 94 | 3 | 15,000,000.00 |
| 17 | මාතර | 0 | 20 (ඇල/අමුණු) | 20,050,000.00 |
| 18 | අනුරාධපුර | 532 | 4 | 45,000,000.00 |
| 19 | හම්බන්තොට | 11 | 14 | 34,200,000.00 |
| 20 | කුරුණෑගල | 495 | 21 | 45,350,000.00 |
| 21 | මහනුවර | 27 | 16 | 22,200,000.00 |
| 22 | මාතලේ | 60 | 6 | 19,500,000.00 |
| 23 | වව්නියාව | 203 | 4 | 15,500,000.00 |
| 24 | මන්නාරම | 94 | 1 | 15,000,000.00 |
| 25 | අම්පාර | 46 | 6 | 24,000,000.00 |
| එකතුව | | 4551 | 209 | 531,135,000.00 |

---

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

(ii) • ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර ඇති වැව් සංඛ්‍යාව 42යි.

• වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ජලාශ 23ක් සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ වැව්, අමුණු සහ ඇළ මාර්ග ව්‍යාපෘති 209ක් ප්‍රතිසංස්කරණය කරන්න අපි වැඩකටයුතු සකස් කර තිබෙනවා.

(iii) අපි දැනටමත් මේ වාරි ප්‍රතිසංස්කරණ වැඩකටයුතු ආරම්භ කර තිබෙනවා.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට අදාළව තිබෙන සවිස්තරාත්මක පිළිතුර මා **සභාගත*** කරනවා.

**ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මහවැලි කලාපවල පවතින ප්‍රධානම ගැටලුවක් තමයි ඉඩම් සම්බන්ධ ප්‍රශ්නය. පසුගිය කාලයේ පමණක් නොවෙයි, දැනටත් එම ගැටලුව පවතිනවා. අපි දන්නවා, විශේෂයෙන්ම නළුවන්ට, ක්‍රිකට් ක්‍රීඩකයන්ට සහ හිටපු ඇමතිවරුන්ට මහවැලි කලාපවලින් අක්කර 100, 200, 300 විතරක් නොවෙයි, සමහර අවස්ථාවල අක්කර 500 වාගේ විශාල ප්‍රමාණවලිනුත් ඉඩම් පෞද්ගලිකව බෙදා දී තිබෙන බව. හැබැයි, එසේ බෙදා දීපු සමහර ඉඩම්වල මේ වන විටත් කිසිදු වගාවක් සිදු කරලා නැහැ. දැනටමත් මහවැලි "බී" කලාපයේ සහ "ඩී" කලාපයේ ඉඩම්වල අයිතිය වෙනත් අයට පවරමින් මුදල් ලබා ගැනීමක් සිදු වන බව අපි දන්නවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය හැටියට ගනු ලබන හෝ ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා එම ප්‍රශ්නයෙන් ඇහුවේ මහවැලි ඉඩම් සම්බන්ධයෙන්; විශේෂයෙන්ම ව්‍යාපෘති සඳහා ලබා දීලා තිබෙන ඉඩම් සම්බන්ධයෙන්. මම පසුගිය දවසකත් මහවැලි අධිකාරිය යටතේ තිබෙන ඉඩම් සම්බන්ධයෙන් පිළිතුරක් ලබා දුන්නා. අපි මහවැලි අධිකාරිය යටතේ ලබා දීලා තිබෙන ඉඩම් සම්බන්ධයෙන් යම් විමර්ශනයක් ආරම්භ කර තිබෙනවා. ඒ අනුව, ව්‍යාපෘති සඳහා මුදල් ලබා දීලා තිබෙන්නේ මොන විධියටද, කොච්චරක් දීලා තිබෙනවාද, දැන් ඒවායේ තත්ත්වය මොකක්ද සහ ඒ සම්බන්ධයෙන් ගන්න පුළුවන් ක්‍රියාමාර්ග මොනවාද කියන කාරණා සම්බන්ධයෙන් තොරතුරු එකතු කරන්න බලාපොරොත්තු වෙනවා.

මම ගරු මන්ත්‍රීතුමාගෙන් වාගේම සියලු දෙනාගෙන් ඉල්ලීමක් කරනවා. ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී, තීරණ ගැනීමේදී ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සාමූහික තීරණයි වැදගත්. ඒ නිසා මේ නිශ්චිත ප්‍රශ්නයට අදාළව, ඒ කියන්නේ මහවැලි ඉඩම් සම්බන්ධයෙන් ගැටලු තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් පළමුවෙන්ම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කරන්න. ඒ තීරණය, ඒ තොරතුරු අපට -අමාත්‍යාංශයට- වාර්තා කරන්න. ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න අපි ලැහැස්තියි. ඊට අමතරව මහවැලි අධිකාරියත්, කෘෂිකර්ම අමාත්‍යාංශයත් මේ සම්බන්ධයෙන් කටයුතු කරමින් ඉන්නවා.

**ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පසුගිය කාලය පුරාම මහවැලි කලාපවලට නිලධාරින් පත් කරද්දී, තමන්ට හිතවත් අයට තමයි එම කලාපවලට අදාළව පත්වීම් ලබා දී තිබෙන්නේ; විශේෂයෙන්ම දේශපාලන හිතවත්කම් මතයි. ඒ හිතවත්කම් මත මහවැලි කලාප තුළ විවිධ වූ අයථා ගනු දෙනු, වංචා, දූෂණ, හොරකම් ඕනෑ තරම් සිදු වෙලා තිබෙනවා. හැබැයි, අපට තවමත් දැන ගන්නට ලැබී නැහැ, ඒවාට අදාළව නීතිමය ක්‍රියාමාර්ග ගන්නවා ද කියන එක පිළිබඳව. පසුගිය කාලයේ මේ කලාපවලට RPM මහත්වරුන් බඳවා ගැනීම සඳහා අමාත්‍යාංශයෙන් ගැසට් කිරීමක් කර තිබෙනවා මම දැක්කා. හැබැයි, ඊට පසුව ඊළඟ නිලධාරි කණ්ඩායම බඳවා ගැනීම සඳහා දැනට ක්‍රියාමාර්ගයක් ගනිමින් තිබෙනවාද කියන එක තමයි මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, එතුමාගේ මුල් ප්‍රශ්නය අසා තිබෙන්නේ වාරි ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන්. අපි කෘෂිකර්ම අමාත්‍යාංශය විධියට වාරි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියක් ආරම්භ කර තිබෙනවා, "වාරි මහිම අපේ උරුමය" කියලා. අපි අපේ මංගල අය වැයෙන් වාරිමාර්ග අංශයේ දියුණුව සඳහා රුපියල් මිලියන 78,000ක් වෙන් කරලා තිබෙනවා. මේ පිළිතුරේදී මම සඳහන් කළා මහවැලි සංවර්ධන අධිකාරියට, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් වැව් 275ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අපි වැඩ කටයුතු සලස්වා තිබෙන බව. එය මේ අවුරුද්දේ කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, එතුමා දෙවැනි අතුරු ප්‍රශ්නයෙන් ඇහුවේ මහවැලි සංවර්ධන අධිකාරියට නිලධාරින් පත් කිරීම ගැනයි. මහවැලි අධිකාරියේ නිලධාරින් පත් කිරීම, මාරු කිරීම සම්පූර්ණයෙන් අවුල් කරලායි තිබෙන්නේ. ඒවා දේශපාලන හිතවත්කම් මත, වෙනත් ගේම් මත තමයි පසුගිය කාලයේ සිද්ධ වෙලා තිබෙන්නේ. මේක විධිමත් කරන එක අමාරුයි. නමුත්, අපි රජය භාර ගත්තාට පස්සේ, කෘෂිකර්ම අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරියේ නිලධාරින් පත්කිරීම්, උසස් කිරීම් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියා පටිපාටියක් අනුගමනය කරමින් තිබෙනවා. කිසිදු කෙනෙකුට අසාධාරණයක් නොවෙන්න. ඒ වැඩ කටයුතු සම්පූර්ණ වෙමින් තිබෙනවා. බඳවා ගැනීම් සම්බන්ධයෙන් කියනවා නම්, දැනට රජයේ ක්‍රියාත්මක වන ප්‍රතිපත්තිය මත තමයි කටයුතු කරන්න වෙන්නේ. අපි අනෙකුත් කටයුතු සම්පූර්ණ කරමින් සිටිනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## කල්පිටියේ ගොවිබිම්වල හානි වූ බෝග: වන්දි
கற்பிட்டியிலுள்ள விவசாய நிலங்களில் பாதிக்கப்பட்ட பயிர்கள்: இழப்பீடு
DAMAGED CROPS IN FARMLANDS IN KALPITIYA: COMPENSATION

585/2025

**4.** ගරු අජිත් ගිහාන් මහතා
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අයහපත් පාරිසරික තත්ත්වයන් යටතේ වුවද, එළවලු හා පලතුරු නිෂ්පාදනය කරනු ලබන කලාපයක් ලෙස කල්පිටිය හැඳින්විය හැකි බවත්;

(ii) වර්ෂා කාලවලදී ගොවිබිම් ජලයට යට වී, අස්වනු විනාශයට පත්වීම හේතුවෙන් එම ප්‍රදේශයේ ගොවි ජනතාව විශාල ලෙස අපහසුතාවට පත් වන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) එසේ නම්, වර්ෂාව හේතුවෙන් විනාශයට පත් වන අස්වනු වෙනුවෙන් එම ගොවීන්ට වන්දි ලබා දීමට පියවර ගෙන තිබේද;

(ii) කල්පිටියේ එළවලු සහ පලතුරු ගොවීන්ට පොහොර සහනාධාරය ලබා දීම සඳහා වැඩ පිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சீரற்ற சுற்றாடல் நிலைமைகள் காணப்பட்டபோதும் மரக்கறி மற்றும் பழ உற்பத்திகளை மேற்கொள்கின்றதொரு வலயமாகக் கற்பிட்டியை அடையாளப்படுத்த முடியும் என்பதையும்;

(ii) மழைக் காலங்களில் விவசாய நிலங்கள் நீரில் மூழ்கிப் பயிர்ச்சேதம் ஏற்படுவதால் அப்பிரதேச மக்கள் பெருமளவில் சிரமங்களுக்கு ஆளாகின்றார்கள் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) ஆமெனில், மழை காரணமாக ஏற்படும் பயிர்ச்சேதங்களுக்காகக் குறித்த விவசாயிகளுக்கு இழப்பீடுகளை வழங்குவதற்கு நடவடிக்கை மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(ii) கற்பிட்டியில் மரக்கறி மற்றும் பழச்செய்கையில் ஈடுபட்டுள்ள விவசாயிகளுக்கு உர மானியம் வழங்குவதற்கு வேலைத்திட்டமொன்று உள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், அவ்வேலைத்திட்டம் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Is he aware that -

(i) Kalpitiya can be identified as a region where vegetables and fruits are produced even under adverse environmental conditions; and

(ii) the farmers in the said area are greatly inconvenienced due to the inundation of farmlands and the destruction of crops during the rainy season?

(b) Will he inform this House -

(i) if so, whether steps have been taken to pay compensation to the aforesaid farmers for their crops destroyed due to rain;

(ii) whether there is any arrangement in place to provide the fertilizer subsidy to vegetable and fruit farmers in Kalpitiya; and

(iii) if so, the said arrangement?

(c) If not, why?

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම සහ පශු සම්පත් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i), (ii) ඔව්. විශේෂයෙන්ම භූගත ජල මට්ටම පොළොව මතුපිට ආසන්නයට පැමිණ තිබෙන නිසා ඒ කලාපය ජලයෙන් යට වෙනවා. යට වෙලා මේ වනකොට විශේෂයෙන්ම එළවලු, පලතුරු වගා කරන ගොවීන්ට පසුගිය කාලයේ හානි සිද්ධ වුණා. දැනටත් ඒ හානිය සිදු වෙනවා.

(ආ) (i) නැත. වන්දි ලබා දීමේ ක්‍රියාවලිය සිද්ධ වෙන්නේ මෙහෙමයි. දැනට හඳුනා ගත්තු භෝග 6ක් තිබෙනවා. ඒ භෝග 6 සඳහා නොමිලේ -රජය ගණනේ- ඒ අදාළ ගොවීන්ට වන්දි ලබා දීමේ ක්‍රමවේදයක් තිබෙනවා. අනෙකුත් ගොවීන්ට, විශේෂයෙන්ම කෘෂි රක්ෂණ මණ්ඩලය හරහා වන්දි ලබා ගැනීමට අදාළව රක්ෂණය වීමේ වැඩසටහනක් -ගොවියාත් දායක වෙලා රක්ෂණය ලබා ගන්නා වැඩසටහනක්- මේ වනකොට හඳුන්වා දීලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

ඉදිරියේදී මෙම ගොවීන්ටත් ඒ සඳහා දායක වීමේ හැකියාව, ඉඩ කඩ තිබෙනවා.

(ii) 2025 යල පොහොර සහනාධාර වැඩසටහන යටතේ වී වගාවට හා කුඹුරුවල අතිරේක භෝග වගාවට පමණක් සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක වෙනවා. එම ක්‍රියාවලිය ඉදිරියට යනවා. ඔබතුමා එම කොටසින් අහන කාරණයට අදාළව ගත්තොත්, එළවලු සහ පලතුරු භෝග වගා ඉන් ආවරණය වන්නේ නැහැ.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, ඉහතින් අසන ලද ප්‍රශ්නයට අදාළ සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කල්පිටිය කලාපය කියන්නේ විශේෂයෙන් ගොවි කලාපයක් බව අපි දන්නවා. එය, කුමන කාලගුණික, දේශගුණික තත්ත්වයක් යටතේ වුවත් මේ රටට ආහාර සපයන, එළවලු සහ පලතුරු සපයන කලාපයක්.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පුත්තලම ගත්තොත්, එහි ලූණු නිෂ්පාදනය පිළිබඳ ප්‍රශ්නයක් ඇති වුණු බව අපි දන්නවා. වියළි දේශගුණික තත්ත්වයක් යටතේ පැවැති එම කලාපය දැන් තෙත් කලාපයක් බවට පත් වෙමින් තිබෙනවා. එම නිසා මේ රටට එළවලු, පලතුරු සපයන එම කලාපයේ ගොවිතැන් කරන සියලු ගොවි බිම් දැන් වැසි ජලයෙන් යට වන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ ගොවි බිම් මාස ගණනක් තිස්සේ වැසි ජලයෙන් යට වෙලා තිබෙන නිසා ඒ ගොවීන්ට තමන්ගේ ගොවිතැන් කර ගන්න බැරි වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, 2024 වර්ෂයේදී ඒ ප්‍රදේශයෙන් පමණක් රුපියල් කෝටි 10කට වැඩි වගා හානියක් සිදු වෙලා තිබෙනවා. ඒ නිසාම ඒ ගොවි ජනතාවගේ නිෂ්පාදන කටයුතු දැන් අඩාල වෙමින් තිබෙනවා. එම වගා කටයුතු කර ගන්න බැරි තැනට දැන් පත් වෙලා තිබෙනවා. යෙදවුම් පිරිවැය අපතේ යැමත් එක්ක ඒ ප්‍රදේශයේ ගොවිතැන අකර්මණ්‍ය වෙලා තිබෙනවා. ඒ ගොවි බිම් වැසි ජලයෙන් යට වීම, ඒවා හානියට පත් වීම සම්බන්ධයෙන් ඒ ගොවි ජනතාව දැන් සහන බලාපොරොත්තු වෙනවා. ඒ නිසාම තමයි අප යෝජනා කරන්නේ, අපේ රටේ සිටින අනෙකුත් ගොවි ජනතාවට වාගේම එම ප්‍රදේශයේ ගොවි ජනතාවටත් යම් සහන වැඩ පිළිවෙළක් අවශ්‍යයි කියලා.

ඒ ප්‍රදේශයේ එළවලු වර්ග 10කට වඩා වගා කරනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. විශේෂයෙන්ම උඩරට, පහතරට එළවලු වගා කරනවා. ලීක්ස්, කැරට් හැරෙන්න අනෙකුත් සියලු එළවලු වර්ග නිෂ්පාදනය කරන්නේ, ඊට අදාළ ගොවිතැන් කරන්නේ ඒ කල්පිටිය කලාපයේ. ඒ නිසා මම ඔබතුමාගෙනුත්, විෂය භාර ගරු අමාත්‍යතුමාගෙනුත් විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා, කල්පිටිය ප්‍රදේශයේ වගා කරන එළවලු වර්ග කිහිපයක් හෝ නම් කරලා, රටේ ආහාර නිෂ්පාදනයට අවශ්‍ය එළවලු වගා කරන ගොවීන්ට සිය වගා හානි වෙනුවෙන් වන්දි ලබා දෙන්න කියලා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)
ගරු කථානායකතුමනි, එතුමා කියපු කාරණය පිළිගන්නවා. විශේෂයෙන්ම කල්පිටිය, නොරොච්චෝලේ, තලවිල, දලුව, නාරක්කල්ලිය, මාම්පුරිය ඇතුළු මේ ප්‍රදේශවල දළ වශයෙන් අක්කර 16,000ක බිම් ප්‍රමාණයක ගොවියෝ එළවලු වගා කරනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එක්කම මම ඔය ගොවිබිම් හැම එකකටම ඇවිල්ලා තිබෙනවා. වාර ගණනාවක් ඇවිල්ලා තිබෙනවා. ඔය ගොවි බිම් වතුරෙන් යට වෙච්ච අවස්ථාවලදීත් ඔබතුමා, නිමල් පතිරණ ඇතුළු කට්ටිය එක්ක අපි ගිහිල්ලා ඒවා බලලා තිබෙනවා. ඒ නිසා මට පෞද්ගලිකව මේ පිළිබඳව අදහසක් තිබෙනවා. ඔබතුමා කියන කාරණය මා පිළිගන්නවා. විශේෂයෙන්ම පොහොර සඳහා වන්දි ලබාදීමේ ක්‍රියාවලියට අදාළව ගත්තොත්, දැනටත් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය අලුත් වැඩසටහන් කිහිපයක්ම හඳුන්වා දීලා තිබෙනවා. ඒ වැඩසටහන්වලට මේ ගොවීන්ටත් සම්බන්ධ වෙන්න පුළුවන්කම තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මට මතක විධියට ලබන 12වෙනි දා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමා ඇතුළු අපේ නිලධාරි කණ්ඩායමක් ඔය ප්‍රදේශයට එන්න නියමිතයි. ඒ, ඔය ප්‍රදේශත් බලලා, ඒ රක්ෂණ ක්‍රමයට කොහොමද ගොවීන් දායක වෙන්නේ කියන කාරණය පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම සඳහා. ඒ නිර්ණායක අනුව ඉදිරියට අපට වැඩකටයුතු කරගෙන යන්න පුළුවන් වෙයි කියන කාරණය මම මතක් කරනවා.

විශේෂයෙන්ම මා පිළිගන්නවා, අපේ රටේ සමස්ත මිරිස් නිෂ්පාදනයෙන් සියයට 16කට වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්නේ කල්පිටිය ප්‍රදේශයේ බව. ඒ වාගේම තමයි රතු ලූනු, කොළ ලූනු සහ අල ලූනු නිෂ්පාදනයෙන් සියයට 30කට ආසන්න ප්‍රමාණයක් කල්පිටිය ආශ්‍රිත ඔය ගොවි බිම්වලින් නිෂ්පාදනය කරනවා. ඒ වාගේම ඒ ගොවි ජනතාව විශාල දුෂ්කරතා මධ්‍යයේ මේ වැලි පොළොව ඉතාම සශ්‍රීක බිමක් බවට පත් කරලා තිබෙනවා. කැරට් සහ ලීක්ස් හැර උඩරට එළවලු හැම එකක්ම එහි වගා කරනවා. පහත රට එළවලුත් වගා කරන්න පුළුවන්. පලතුරුත් වගා කරනවා. ඒ වැලි පොළොව ඉතාම සශ්‍රීක බිමක් බවට පත් කරපු ඒ ගොවි ජනතාවට ඊට අදාළ ගෞරවය තිබෙනවා. ඒ සියල්ල සැලකිල්ලට අරගෙන ඉදිරියේදී අපි ඊට අදාළ රක්ෂණ ක්‍රම කොයි විධියටද මේ කලාපයේ ක්‍රියාත්මක විය යුත්තේ කියන කාරණය සාකච්ඡා කරලා වැඩ පිළිවෙළක් සකස් කර ගනිමු.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු කථානායකතුමනි, ඒ ප්‍රදේශයේ අක්කර 16,000කට වැඩි බිම් ප්‍රමාණයක ජනතාව ගොවිතැන් කරනවා. පසුගිය කාලයේ ඇති වුණු පොහොර හිඟය හා මිල ඉහළ යෑම නිසා එම ගොවි ජනතාවත් දැඩි අපහසුතාවකට පත් වුණා. එම ප්‍රදේශයේ විශේෂයෙන්ම කුඩා සහ මධ්‍ය පරිමාණ ගොවි ජනතාවත් ඉන්නවා. ඔවුන්ට පොහොර සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා. ඔවුන් අඛණ්ඩව වගාවේ යෙදෙන නිසාම පොහොර සහනාධාරයක් බලාපොරොත්තු වනවා.

පසුගිය කාලයේ පැවති ආණ්ඩුවලින් ගත් තීරණ මත පොහොර මිල වැඩිවීම සහ හිඟ වීම නිසාම ජනතාව වෙනත් දේවල්වලට යොමු වුණා. අපි දන්නවා ගොම සහ කාබනික පොහොර දාලා සුදු වැලි ප්‍රදේශයක් තමයි ඒ සශ්‍රීක කරන්නේ. ඒ විධියට පොළොව හදලා තමයි කාබනික පොහොර යොදා ගොවිතැන් කරගෙන යන්නේ. හැබැයි, පොහොර ප්‍රශ්නය නිසාම ඒ අයට සිදු වුණා කුකුළු පොහොර භාවිත කරන්න. පොහොර වෙනුවට වෙනත් ආදේශ පාවිච්චි කරන්න ගිහිල්ලා දැන් මුළු කල්පිටිය අර්ධද්වීපයේම මැස්සන් වසංගතයක් බවට පත් වෙලා තිබෙනවා. මැස්සන් විශාල කරදරයක් බවට පත් වෙලා තිබෙනවා. තලවිල සාන්ත ආනා කියන්නේ ප්‍රදේශයේ තිබෙන ප්‍රධාන දේවස්ථානයක්. අවුරුද්දට දෙවතාවක් එම දේවස්ථානයේ මංගල්‍යය පවත්වනවා. දැන් ඒ ප්‍රදේශයම මැස්සන්ගේ ග්‍රහණයට නතු වෙලා තිබෙනවා. ඒක නිසා ලෙඩ රෝග බොහොමයක් ඇතිවෙලා තිබෙනවා. ඒ තත්ත්වයෙන් මුදා ගන්න නම් කුකුළු පොහොර යෙදීම අයින් කරලා ඒ ගොවි ජනතාවට අවශ්‍යතාව මත පොහොර සහනාධාරයක් ලබා දීමට කටයුතු කරන්න ඕනෑ. මේ තත්ත්වය මත ප්‍රශ්න කිහිපයක් ඇති වෙලා තිබෙනවා.

[ගරු අජිත් ගිහාන් මහතා]

පොහොර සහනාධාර ක්‍රමයක් ක්‍රියාත්මක විය යුතුයි. අපි දන්නවා වී වගාවට වාගේම අනෙකුත් අතුරු භෝගවලටත් පොහොර සහනාධාර ලබා දෙන බව. ඔවුන් වගා කටයුතු කරන්නේ අඛණ්ඩව. ඒ කියන්නේ, කන්න ක්‍රමයට නොවෙයි. ඔවුන් යල සහ මහ කන්නයට නොවෙයි ගොවිතැන් කරන්නේ. අවුරුද්දට හතර වතාවක්වත් ගොවිතැනේ යෙදෙනවා. ඔවුන් හැම එළවලුවක්ම සිටුවනවා. එම ගොවිබිම්වල අඛණ්ඩව ගොවිතැන් කරනවා. වර්ෂා කාලයත් එනවා. වර්ෂා කාලයේත් විවිධ ප්‍රශ්න ඇති වනවා. මේ තත්ත්වය පාලනය කර ගන්න ඇත්තටම අවශ්‍ය යෙදවුම් ටික සාධාරණ මිලකට ලබා ගන්න අවශ්‍ය වෙලාත් තිබෙනවා.

ඒ සම්බන්ධවත් රජයේ අවධානය යොමු කරලා එම ගොවි ජනතාවට පොහොර සහනාධාරයක් ලබා දෙයි කියලා අපි බලාපොරොත්තු වනවා.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය පිළිගන්නවා. ඒ ගොවි ජනතාව අනුරාධපුරය, මන්නාරම සහ වවුනියාව වාගේ ප්‍රදේශවලින් ගොම පොහොර අරගෙන එනවා. ඒ වාගේම එළු පොහොර අරගෙන එනවා. අරගෙන ඇවිල්ලා මුලින්ම වැලි පොළව සකස් කරලා, ඉන් පසුව රසායනික පොහොරත් පාවිච්චි කරලා තමයි වගා කටයුතු කරන්නේ. ඒ ක්‍රමය පසුගිය කාලයේ කඩා වැටුණා. එම නිසා ඒ ගොවි ජනතාව කුකුළු පොහොර පාවිච්චි කරන්න පටන් ගත්තා. කුකුළු පොහොර පාවිච්චි කිරීමත් එක්ක ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන ඔය ගැටලුව ඇති වෙලා තිබෙනවා. ඒ පිළිබඳව අපි අදහසක, අවබෝධයක ඉන්නවා. ඊට අදාළව අපේ දෙපාර්තමේන්තුව මැදිහත් වෙමින් ඉන්නවා.

ගරු මන්ත්‍රීතුමනි, පොහොර සහනාධාරය සම්බන්ධයෙන් ගත්තොත්, අපි ආණ්ඩුව ගත්තාට පස්සේ පොහොර සහනාධාරය සම්බන්ධයෙන් පියවර 2ක් ඉදිරියට තැබුවා. පොහොර සහනාධාරය වශයෙන් ගොවි ජනතාවට මෙතෙක් ලැබුණේ හෙක්ටෙයාර 2ක් සඳහා රුපියල් 30,000ක් පමණයි. හැබැයි, අපි ගිය මහ කන්නයේ සිට හෙක්ටෙයාර 2ක් සඳහා රුපියල් 50,000ක් ගෙව්වා සහ දැනුත් ගෙවනවා. ඒ අනුව අපි එක පියවරක් ඉස්සරහට තියලා තියෙනවා. හෙක්ටෙයාර 2ක් සඳහා සහනාධාරය රුපියල් 20,000කින් වැඩි කරලා තිබෙනවා.

ඊළඟට අපි තවත් පියවරක් ඉස්සරහට තැබුවා. වී වගා කරන ඉඩම්වල කන්න රැස්වීමේ තීන්දුවක් අනුව අතුරු භෝග -එළවලු, ධාන්‍ය වර්ග, පලතුරු වර්ග- වගා කරන ගොවීන්ටත් හෙක්ටෙයාර 2ක් සඳහා රුපියල් 30,000ක සහනාධාරයක් ලබා දීමේ වැඩ පිළිවෙළ අපි ආරම්භ කළා. මේ වෙනකොට - මේ යල කන්නයේ- ඒ සහනාධාරය ගොවි ජනතාව ලබා ගනිමින් ඉන්නවා. කොටසක් ලබා ගෙන තිබෙනවා. ඒ විධියට පොහොර සහනාධාරය සම්බන්ධයෙන් අපි පියවර 2ක් ඉදිරියට තබා තිබෙනවා. ඒ වාගේම තවත් පියවරවලට අපට යන්න පුළුවන්ද කියන කාරණයත් සාකච්ඡාවට භාජන වෙලා තිබෙනවා. ඒ පොදු කාරණය තුළ කල්පිටිය කියන සුවිශේෂී එළවලු කලාපයේ ගොවි ජනතාව සම්බන්ධයෙනුත් ඉදිරියේදී සාකච්ඡා කරලා ඊට අදාළ තීන්දු, තීරණවලට එළඹෙන්න පුළුවන්. සාකච්ඡා කරලා විසඳුමක් ලබා ගැනීමට අපි අපේක්ෂා කරනවා.

## මහව,වෙලංගොල්ල වත්ත ඉඩම: විස්තර
### மஹவ, வெலங்கொல்லவத்த காணி: விபரம்
### WELANGOLLA ESTATE, MAHAWA: DETAILS

791/2025

**5. ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි වෙලංගොල්ල වත්ත (හාමුගේ වත්ත) යන රජයේ ඉඩමේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එම ඉඩමේ විශාලත්වය අක්කරවලින් කොපමණද;

(iii) එම ඉඩම කර්මාන්ත සඳහා ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම කර්මාන්ත කවරේද;

(v) කර්මාන්ත සඳහා ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(vi) එම කර්මාන්තවල සේවක ධාරිතාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மஹவ பிரதேச செயலாளர் பிரிவில் அமைந்துள்ள வெலங்கொல்லவத்த (ஹாமுகே வத்த) எனப்படும் அரச காணியின் தற்போதைய நிலை யாது என்பதையும்;

(ii) அந்தக் காணியின் விஸ்தீரணம் ஏக்கர்களில் எவ்வளவு என்பதையும்;

(iii) அந்தக் காணி கைத்தொழில்களுக்காக வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) அவ்வாறெனில், அத்தகைய கைத்தொழில்கள் யாவை என்பதையும்;

(v) கைத்தொழில்களுக்காக வழங்கப்பட்டுள்ள காணிகளின் அளவு ஏக்கர் அடிப்படையில் எவ்வளவு என்பதையும்;

(vi) அத்தொழிற்சாலைகளின் பணியாளர் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Entrepreneurship Development:

(a) Will he inform this House-

(i) the present status of the government land known as Welangolla Estate ("Hamuge Waththa") located in Maho Divisional Secretary's Division;

(ii) the extent of the said land in acres;

(iii) whether the land has been allocated for any industries;

(iv) if so, those industries;

(v) the extent of land that has been allocated for such industries in acres; and

(vi) the number of employees of those industries?

(b) If not, why?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මෙම ඉඩම ඇඟලුම් ආශ්‍රිත කර්මාන්තයක් සඳහා වෙන් කර ඇති අතර එම ආයතනය විසින් අදාළ ව්‍යාපෘතියේ මූලික කටයුතු සිදු කරමින් පවතී.

වෙලංගොල්ල වත්ත - හාමුගේ වත්ත - කියන රජයේ ඉඩමේ දැනට රිදීබැදීඇල්ල කියන කර්මාන්තපුරය පවත්වා ගෙන යනවා. ඒ සඳහා මූලික ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙනවා.

(ii) අක්කර 17 පර්චස් 32.19ක් කර්මාන්තපුරය සඳහා වෙන් කර ඇත.

(iii) ලබා දී ඇත.

(iv) ඇඟලුම් ආශ්‍රිත කර්මාන්තයක් සඳහා රිට්ස් ක්ලෝතින් (පුද්) සමාගම වෙත ලබා දී ඇත.

(v) අක්කර 17 පර්චස් 32.19

(vi) 1135 (යෝජිත)

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නයේ පිළිතුරට අමතරව මේ කාරණයත් මම කියන්න ඕනෑ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් අපි දැනටමත් හඳුනා ගෙන තිබෙනවා -හඳුනා ගැනීමේ කටයුතු කරමින් පවතිනවා- වගා නොකරන භූමි මොනවාද කියලා. ඒ, මෙවැනි ව්‍යවසායයන් සහ කර්මාන්ත සඳහා ලබා දෙන්න. ඒ නිසා ගරු මන්ත්‍රීතුමන්ලාගෙනුත් ඒ සඳහා සහයෝගය ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)|

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ හෙරළියාවල, මාවතගම, පන්නල, කිරිවුල්ල, තුල්හිරිය වාගේ ප්‍රදේශවල මහා පරිමාණ කර්මාන්ත සහ කර්මාන්තපුර තිබෙනවා. නමුත් යාපහුව ප්‍රදේශයේ ඉදිකරන්න හදන කර්මාන්තපුරය හැරෙන්නට වෙනත් ප්‍රදේශවල - නිකවැරටිය, යාපහුව, ගල්ගමුව, වාරියපොළ වාගේ ප්‍රදේශවල - මහා පරිමාණ කර්මාන්ත හෝ කර්මාන්තපුර නැහැ. ඒ නිසා මම අපේ කර්මාන්ත අමාත්‍යතුමාගෙන් අහනවා, ඒ ආරම්භ කරන්න යන කර්මාන්තය තනි ව්‍යවසායකයෙකුගේ කර්මාන්තයක්ද, නොඑසේ නම් ව්‍යවසායකයන් සමූහයක් එකතු කර ගත්ත කර්මාන්තයක්ද කියලා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

දැනට ඒ කර්මාන්තපුරය යෝජිත වෙලා තිබෙන්නේ එක කර්මාන්තකරුවාටයි. ඒ ව්‍යාපෘතිය ඉල්ලුම් කරලා තිබෙන්නේ එක කර්මාන්තකරුවායි. ඇත්තටම ඒ ප්‍රදේශවල තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි සේවකයන් බඳවා ගැනීම සහ ප්‍රවාහනය. ඒ ප්‍රශ්න නිසා මහා පරිමාණ මට්ටමෙන් කර්මාන්ත සඳහා ආයෝජනය කරන්න කර්මාන්තකරුවන් ඉදිරිපත් වෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ඒ නිසා අපි දැන් තවත් කර්මාන්තකරුවන් ඒ සඳහා කැඳවා ගන්න අනෙකුත් chambers එක්ක කථා කරමින් සිටිනවා. දැනට යෝජිත එකේත් ප්‍රශ්න විශාල ප්‍රමාණයක් තිබෙනවා. නමුත් එක කර්මාන්තකරුවායි දැනට ඉදිරිපත් වෙලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා දිස්ත්‍රික් කර්මාන්ත ප්‍රවර්ධන සභා පිහිටුවා, දිස්ත්‍රික්ක මට්ටමෙන් ආයෝජනය කරන්න පුළුවන් කර්මාන්තකරුවන් හඳුන්වා දෙනවා නම් අපට ඒ ප්‍රශ්නය නිරාකරණය කර ගන්න පුළුවන්. දැනට හදන්න යන එකට යෝජනා වෙලා තිබෙන්නේ එක කර්මාන්තකරුවායි.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය ජාතික වශයෙන් වැදගත් ප්‍රශ්නයක්. අපේ දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, මුළු ලංකාවේම තිබෙන සම්ප්‍රදායික කර්මාන්තයක් තමයි මැටි කර්මාන්තය. මැටි කර්මාන්තය අවුරුදු 125,000කට එහා අතීතයක් තිබෙන කර්මාන්තයක්. ආගමික වශයෙන්, ජාතික වශයෙන් විවිධ උත්සවවලට පහන්, හට්ටි, මුට්ටි, ඇතිළි -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, මුල් ප්‍රශ්නයට අදාළව තමයි අතුරු ප්‍රශ්න අහන්න ඕනෑ.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

හොඳයි.

ගරු ඇමතිතුමනි, මැටි කර්මාන්තය ආශ්‍රිත කර්මාන්තකරුවන්ට මැටි ලබා ගැනීම සම්බන්ධයෙන් ලොකු ගැටලුවක් තිබෙනවා. විශේෂයෙන්ම වැව් ආශ්‍රිතව මැටි ලබා ගැනීමට ඔවුන් යම් උත්සාහයක් දරනවා. නමුත් පසුගිය චක්‍රලේඛ තුළින් ඒ හා සම්බන්ධව යම් නීතිමය ගැටලුවක් පැන නැඟිලා තිබෙනවා. ඒ නිසා, ඒ ගැටලුව නිරාකරණය කරලා මැටි කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය ඉඩප්‍රස්තා සලසා දෙනවාද කියලායි මම ඔබතුමාගෙන් අහන්නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මැටි ලබා ගැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන්ට තමයි බලපත්‍ර නිකුත් කිරීමට බලය තිබෙන්නේ. ප්‍රාදේශීය ලේකම්තුමා මැටි ලබා ගැනීම සඳහා බලපත්‍ර ලබා දෙනවා නම්, කර්මාන්තකරුවන් මුහුණ දෙන ඊළඟ ප්‍රධාන ප්‍රශ්නය වෙන්නේ මැටි ප්‍රවාහනය කර ගැනීම. ඒ නිසා මැටි ප්‍රවාහනය කර ගැනීම සඳහා ජාතික ශිල්ප සභාවෙන් ප්‍රවාහන බලපත්‍ර ලබා දෙනවා. ජාතික ශිල්ප සභාවේ ලියාපදිංචි කර්මාන්තකරුවන්ට සහ කර්මාන්ත සමිතිවලට ඒ ප්‍රවාහන බලපත්‍රය පාවිච්චි කරන්න

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

පුළුවන්. මූලික ප්‍රශ්නය වන මැටි ලබා ගැනීමේ කටයුත්තේදී ප්‍රාදේශීය ලේකම්වරු මැදිහත් වෙන්න ඕනෑ. ප්‍රාදේශීය ලේකම්වරුන්ට තමයි මැටි ලබා ගැනීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමට බලය තිබෙන්නේ. අපට බලය තිබෙන්නේ කර්මාන්තකරුවන්ට මැටි ප්‍රවාහනය කර ගැනීම සඳහා බලපත්‍ර ලබා දීමටයි. ඒක ජාතික ශිල්ප සභාවේ නිලධාරින් විසින් ප්‍රාදේශීය මට්ටමෙන් සිදු කරනවා.

## කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලයේ උත්සව ශාලාවක් ඉදිරීම: නිම නොකිරීම
குளியாபிட்டிய மத்திய மகா வித்தியாலய விழா மண்டப நிர்மாணம்: முடிவுறாமை
CONSTRUCTION OF FUNCTION HALL AT KULIYAPITIYA CENTRAL COLLEGE: NON-COMPLETION

801/2025

**6. ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) "දැයට කිරුළ" වැඩසටහන යටතේ කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලය තුළ ඉදි කිරීම් ආරම්භ කරන ලද විශාල උත්සව ශාලාවේ ඉදි කිරීම් අර්ධ වශයෙන් නිම කර, අතරමග නවතා ඇති බව දන්නේද;

(ii) එම ගොඩනැඟිල්ල සඳහා මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iii) කුලියාපිටිය ප්‍රදේශයේ ජනතාවට ප්‍රයෝජනවත් වන ඉහත උත්සව ශාලාවේ ඉදි කිරීම් කටයුතු අවසන් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iv) ඒ සඳහා වැයවන මුදල ගණනය කර තිබේද;

(v) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) "தேசத்திற்கு மகுடம்" நிகழ்ச்சித்திட்டத்தின்கீழ் குளியாபிட்டிய மத்திய மகா வித்தியாலயத்தில் ஆரம்பிக்கப்பட்ட பாரிய விழா மண்டபத்தின் நிர்மாணப் பணிகள் பகுதியளவு பூர்த்தி செய்யப்பட்டு, இடைநடுவில் நிறுத்தப் பட்டுள்ளது என்பதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி கட்டிடத்திற்கு இதுவரையில் செலவு செய்யப்பட்டுள்ள பணத்தொகை எவ்வளவு என்பதையும்;

(iii) குளியாபிட்டிய பிரதேச மக்களுக்குப் பயன்மிக் கதான இவ்விழா மண்டபத்தின் நிர்மாணப் பணிகளை நிறைவுசெய்வதற்காக எடுக்கும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) அதற்காகச் செலவாகும் பணத்தொகை கணிப்பீடு செய்யப்பட்டுள்ளதா என்பதையும்;

(v) ஆமெனில், அப்பணத்தொகை எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) whether she is aware that the construction of the large function hall at Kuliyapitiya Central College commenced under the "Deyata Kirula" programme has been completed only partially and stopped halfway;

(ii) the amount that has been spent so far on the construction of the said building;

(iii) the steps that will be taken to complete the construction of the function hall concerned, which will benefit the people of the Kuliyapitiya area;

(iv) whether the cost for the above-mentioned construction has been estimated; and

(v) if so, the estimated cost of the said construction?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්, (මෙම පාසලේ ඉදි කරන ලද්දේ විශාල උත්සව ශාලාවක් නොව ශ්‍රවණාගාරයකි)

(ii) අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් වැය කර ඇති මුදල රුපියල් 206,177,622.83කි.

(iii) "ළඟම පාසල, හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරන ලද අර්ධ වශයෙන් වැඩ අවසන් කරන ලද නීතිමය ගැටලු පැන නැඟී ඇති මෙවැනි කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් යොමු කර, අමාත්‍ය මණ්ඩල තීරණයක් ලබා ගැනීමටත්, ඉන් අනතුරුව මේ පිළිබඳ ඉදිරි තීරණ ගැනීමටත් සැලසුම් කර ඇත.

(iv) මෙම ඉතිරි වැඩ සඳහා වැය වන මුදල සම්බන්ධව ඇස්තමේන්තු සකස් කළ හැකි වන්නේ මුල් කොන්ත්‍රාත්තුව අවසන් කිරීම පිළිබඳව තීරණයක් ගැනීමෙන් පසුවය. ඒ අනුව, මුල් කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු නිරාකරණය කර විශේෂයෙන් මෙම ශ්‍රවණාගාරයට සවි කරන ලද වායු සමීකරණවල ක්‍රියාකාරීත්වය පිළිබඳව විශේෂඥ සහායද ලබා ගෙන ඒවා යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය මුදල ගණනය කිරීමෙන් අනතුරුව ඉතිරි වැඩ සඳහා වැය වන මුදල ගණනය කළ යුතු වේ.

(v) මෙතෙක් ගණනය කර නොමැත.

(ආ) අදාළ නොවේ.

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු අග්‍රාමාත්‍යතුමියනි, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය මධ්‍ය මහා විද්‍යාලය සම්බන්ධ මේ ගැටලුවේදී "දැයට කිරුළ" වැඩසටහන ක්‍රියාත්මක කරන කාල සීමාව තුළ අපි දන්නා විධියට රාජ්‍ය මුදල් විශාල ලෙස අවභාවිතයක්, නාස්තියක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා මේ ව්‍යාපෘතිය අවසන් කරන්නේ නැතිව දැන් වසර ගණනාවක් ගත වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් - ලැබුණු මුදලට අදාළව වැඩ නොකිරීම සම්බන්ධයෙන්- රජයක් විධියට අපි විගණනයක් කරනවාද කියන එක මම ඔබතුමියගෙන් විමසනවා. මොකද, ඒ සිදු වූ මුදල් විනාශය නිසා තමයි මේක අතරමඟ නැවතිලා තිබෙන්නේ කියලා අපි විශ්වාස කරනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මෙවැනි ව්‍යාපෘති ගණනාවක් පිළිබඳව අපට සොයන්න තිබෙනවා. ඇත්තවශයෙන්ම මේ විධියට ආරම්භ කළ ව්‍යාපෘති දහස් ගණනක් තිබෙනවා. හරියට සිද්ධ නොවුණු, භාගෙට වැඩ ඉවර කළ, වැඩ ඉවර කරපු නැති, කොන්ත්‍රාත්තුව අතරමඟ නැවතුණු එවැනි ප්‍රශ්නකාරී ව්‍යාපෘති දහස් ගණනක් පාසල් පද්ධතිය තුළ තිබෙනවා.

ඇත්තවශයෙන්ම මේවා එකින් එක විගණනය කිරීම නොවෙයි කළ යුත්තේ. මේක සමස්ත අධ්‍යාපන පද්ධතිය තුළ පසුගිය කාලය පුරාම සිදු වුණු දෙයක්. මේ විධියට භාගෙට වැඩ අවසන් කර තිබෙන ව්‍යාපෘති හේතුවෙන් එම පාසල්වල දරුවන්ටත් යම් කිසි අවදානමකට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙනවා. ඒ නිසා ඒවායේ වැඩ කුමන හෝ විධියකට අවසන් කරන්න තමයි අපි මේ වෙලාවේ ප්‍රමුඛතාව දීලා තිබෙන්නේ. මොකද, දරුවන්ගේ පැත්ත ගැන හිතලා අපි පාසල් පද්ධතිය ඉදිරියට අරගෙන යන්න ඕනෑ. ඒ වාගේම සමස්ත පද්ධතිය තුළම සිදුවෙලා තිබෙන මුදල් නාස්තිය සහ එම ව්‍යාපෘති හරියට ක්‍රියාත්මක නොවීම පිළිබඳව ක්‍රියාමාර්ග ගන්න සිදු වෙනවා.

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

කුලියාපිටිය ආසනයට, නැත්නම් කුලියාපිටිය නගරයට මේ විධියේ ශාලාවක අවශ්‍යතාව දැඩිව පවතින කාල සීමාවක්, මේක. මේ වෙනකොට එම ශාලාවේ වැඩ සියයට 75ක් පමණ අවසන් කර තිබෙනවා. එහි ඉතිරි කටයුතු හැකි ඉක්මනින් අවසන් වෙනවා නම්, අධ්‍යාපන දෙපාර්තමේන්තුවටත්, ඒ වාගේම එම විද්‍යාලයටත් මේකෙන් ලොකු මුදලක් ලබා ගන්න පුළුවන් වෙනවා. එම ප්‍රදේශය තුළ රංගන ශාලාවක අවශ්‍යතාව දැඩිව තිබෙනවා. එම නිසා එහි වැඩ අවසන් කිරීමට ගතවන කාලය කොපමණද කියලා අපට නිශ්චිතව දැන ගන්න පුළුවන්ද, ගරු අග්‍රාමාත්‍යතුමියනි?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, මගේ පිළිතුරේ සඳහන් විධියට, කොන්ත්‍රාත් එකේ ප්‍රශ්නයක් තිබෙන නිසා ඒ පිළිබඳව පැනනැඟී තිබෙන ප්‍රශ්න නිරාකරණය කරලා මේ සඳහා කැබිනට් අනුමැතියක් ගන්න ඕනෑ. ඒ සඳහා යම් කාලයක් ගතවෙනවා. මම මීට කලින්ුත් කියපු විධියට, මෙවැනි ව්‍යාපෘති ගණනාවක් තිබෙනවා. අපේ target එක තමයි, පුළුවන් තරම් ඉක්මනට - මේ වසර තුළ - ඒ සියල්ලේම වැඩ අවසන් කිරීම. ඒක තමයි අපේ බලාපොරොත්තුව.

## උතුරු මැද මහ ඇළ ව්‍යාපෘතිය: විස්තර
வட மத்திய மஹா எல கருத்திட்டம்: விபரம்
NORTH-CENTRAL GREAT CANAL PROJECT: DETAILS

836/2025

**7.** **ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) උතුරු මැද මහ ඇළ ව්‍යාපෘතිය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;
(ii) එම ව්‍යාපෘතිය සමන්විත වන අදියර සංඛ්‍යාව කොපමණද;
(iii) එම ව්‍යාපෘතියෙන් ආවරණය කරනු ලබන දිස්ත්‍රික්ක කවරේද;
(iv) එම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම ව්‍යාපෘතිය නියමිත කාලය තුළ අවසන් කිරීමට නොහැකි වූ බව පිළිගන්නේද;
(ii) එම ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතව තිබූ වර්ෂය කවරේද;
(iii) නියමිත කාලය තුළ එම ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි වීමට හේතු කවරේද;
(iv) මේ වනවිට එම ව්‍යාපෘතියේ භෞතික සහ මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வட மத்திய மஹா எல கருத்திட்டம் ஆரம்பிக் கப்பட்ட வருடம் யாதென்பதையும்;
(ii) மேற்படி கருத்திட்டம் எத்தனை கட்டங்களைக் கொண்டுள்ளதென்பதையும்;
(iii) மேற்குறிப்பிட்ட கருத்திட்டத்துக்குள் உள்வாங் கப்படுகின்ற மாவட்டங்கள் யாவை என்பதையும்;
(iv) மேற்படி கருத்திட்டத்தால் எதிர்பார்க்கப்படும் நன்மைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அக்கருத்திட்டத்தை உரிய காலப்பகுதிக்குள் நிறைவுசெய்ய முடியாமல் போனதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;
(ii) மேற்படி கருத்திட்டம் நிறைவு செய்யப்பட வேண்டிய வருடம் யாதென்பதையும்;
(iii) உரிய காலப்பகுதிக்குள் மேற்படி கருத் திட்டத்தை நிறைவுசெய்ய முடியாமல் போனமைக்கான காரணங்கள் யாவையென்பதையும்;
(iv) இன்றளவில் அக்கருத்திட்டத்தின் பௌதிக மற்றும் நிதி முன்னேற்றம் வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු සුසන්ත කුමාර නවරත්න මහතා]

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House the -

(i) year in which the North-central Great Canal Project was initiated;

(ii) number of phases that comprise the said project;

(iii) districts that will be covered by the said project; and

(iv) expected benefits of the said project?

(b) Will he also inform this House -

(i) whether he admits that the project concerned could not be completed within the scheduled time;

(ii) the year in which the project was scheduled to be completed;

(iii) the reasons for not been able to complete the project within the scheduled time; and

(iv) the present physical and financial progress of the said project, separately?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) එම ව්‍යාපෘතිය ආරම්භ කර තිබෙන්නේ 2015 ඔක්තෝබර් මාසයේදීයි.

(ii) අදියර 06ක් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා.

1. මොරගහකන්ද සිට කෝන්ගැටිය දක්වා (කිලෝමීටර 0+100 සිට කිලෝමීටර 3+980 දක්වා) ඉදිකිරීම UEC-ICB-1

2. කෝන්ගැටිය සිට මාදැත්තාව වැව දක්වා (කිලෝමීටර 3+980 සිට කිලෝමීටර 17+718 දක්වා) උතුරු මැද පළාත් මහ ඇළ ඉදිකිරීම NCPCP-3

3. මාදැත්තාව සිට කෝඳුරුවැව ප්‍රධාන පිවිසුම් උමඟ දක්වා (කිලෝමීටර 17+718 සිට කිලෝමීටර 27+509 දක්වා) උතුරු මැද පළාත් මහ ඇළ NCPCP-4

4. 27+509 km - 55+600 km සිට උමං මාර්ගය ඉදිකිරීම. (UEC-ICB-2A)

5. උතුරු මැද පළාත් මහ ඇළට පිටමුව (outlet) සහිතව නාමල්පුර සිට යකල්ල දක්වා (කිලෝමීටර 55+600 සිට කිලෝමීටර 65+500 දක්වා) උතුරු මැද පළාත් මහ ඇළ ඉදිකිරීම. යකල්ල සිට මාමිනියා ඔය දක්වා හුවමාරු ඇළ ඉදිකිරීම (කිලෝමීටර 0+000 සිට කිලෝමීටර 6+131 දක්වා) මාමිනියා ඔය වැඩිදියුණු කිරීම. (කිලෝමීටර් 0+000 සිට කිලෝමීටර 13+309 දක්වා) NCPCP-5

6. ඒරු වැව දකුණු ඉවුරු ඇළ සිට කනදරා ඔය දක්වා වැඩිදියුණු කිරීම (කිලෝමීටර 0+000 සිට කිලෝමීටර 10+941 දක්වා) NCPCP-6

සිතියම ඇමුණුම වශයෙන් ඉදිරිපත් කරමි. ඇමුණුම **සභාගත*** කරමි.

(iii) මෙම ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන්නේ, මාතලේ, පොළොන්නරුව, අනුරාධපුර යන දිස්ත්‍රික්ක වේ.

(iv) 1. හුරුළු වැව, මාන්නක් කට්ටිය වැව, ඒරු වැව, මහකනදරාව වැව, නාච්චදූව වැව, නුවර වැව සහ තිසා වැව කියන වැව්වලට අඛණ්ඩ ජල සැපයුමක් ලබා දීම මඟින් හෙක්ටෙයාර 12,300ක ගොවිබිම්වලට හිඟයකින් තොරව යල මහ කන්න වගා කිරීම සඳහා ජලය ලබා දීම එක අරමුණක්.

2. ඉහත (i) යටතේ ගොවි පවුල් 25,000ක ආදායම් තත්ත්වය ඉහළ නැංවීම.

3. පානීය ජලය මිලියන කියුබික් මීටර් 40ක් වාර්ෂිකව ලබා දීම මඟින් පවුල් 150,000කට ප්‍රතිලාභ ලැබීම.

4. භූගත ජල මට්ටම වැඩි වීම සහ ප්‍රදේශයේ අනෙකුත් පහසුකම් වැඩිවීම මඟින් සිදු වන ආර්ථික ප්‍රතිලාභ.

(ආ) (i) ඔව්.

(ii) 2025 ජූනි 24.

(iii) ඒකට හේතු කිහිපයක් දක්වන්න පුළුවන්. දේශපාලනික කාරණා මම සඳහන් කරන්නේ නැහැ. රටේ තිබුණු ආර්ථික තත්ත්වය, කොවිඩ් - 19 වසංගත තත්ත්වය නිසා ඇති වුණු තත්ත්වයන්, ණය වාරික ලබා ගැනීම සඳහා තිබුණු ගැටලු - මේ සඳහා ණය ලබා දී තිබුණේ ආසියානු සංවර්ධන බැංකුවෙන්- සහ ලංසු කැඳවීම්වලට අදාළව තිබුණු ගැටලු රාශියක් නිසා මෙම ව්‍යාපෘතිය කල් ඇදිලා; අවුරුදු 10ක් පැනලාත් තවම සම්පූර්ණ කරගන්න බැරි වෙලා තිබෙනවා.

- මෙම ඇළ මාර්ගයේ ප්‍රධානම සහ සංකීර්ණ වූ ඉදිකිරීම් කොටස වන කිලෝමීටර 27.7ක දිගින් යුතු උමං මාර්ගය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2017වර්ෂයේදී ලංසු කැඳවීමට සූදානම් වුවද, උමා ඔය සංවර්ධන ව්‍යාපෘතියේ ඇති වූ ජල කාන්දුව හේතු කොටගෙන සමාලෝචනය කිරීම සඳහා තාවකාලිකව නතර කරන ලදී. එම සමාලෝචනයෙන් අනතුරුව වසර 2 1/2කට පසු, එනම් 2019 වර්ෂයේදී ප්‍රසම්පාදනව ක්‍රියාවලිය අවසන් කර 2020 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කරන ලදී.

- 2020-2021 කාල සීමාව තුළදී රටේ පැවති COVID-19 pandemic තත්ත්වය.

- 2022 වර්ෂයේදී රටේ පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය මත ඉදිකිරීම් අමුද්‍රව්‍ය/යකඩ කම්බි (reinforcement)/ඉන්ධන සහ පුපුරණ ද්‍රව්‍ය

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

හිඟතාව සහ එම ද්‍රව්‍යවල මිල අධික ලෙස ඉහළ යාම යන කරුණු කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය සඳහා වූ බලපෑම.

- 2023දී ලැබීමට නියමිත වූ ණය වාරික තුන ලබා දීම 2024 ඔක්තෝබර් මස දක්වා ප්‍රමාද වීම හේතුවෙන් ගෙවීම ප්‍රමාද වීම ප්‍රගතිය සඳහා සෘජුවම බලපාන ලදී.

(iv) (1) භෞතික ප්‍රගතිය - සියයට 20.5

( 2) මූල්‍ය ප්‍රගතිය - රුපියල් මිලියන 40,600

(ඈ) අදාළ නොවේ.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මෙම ව්‍යාපෘතිය ප්‍රතිලාභීන් වෙනුවෙන් දිස්ත්‍රික්ක 6ක් ආවරණය කරනවා. මෙහි අවසානය තිබෙන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහකනදරාව වැවෙන්. උතුරු මැද මහ ඇළ ව්‍යාපෘතියෙන් ජලය ලබා දෙනවා කියන පොරොන්දුව මත මේ වෙනකොට පානීය ජල ව්‍යාපෘතියක් ආරම්භ කර තිබෙනවා. හැබැයි, තවමත් මේ ව්‍යාපෘතිය නිම වෙලා නැහැ. ඒක බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. මෙම ව්‍යාපෘතිය අවසන් නොවීම නිසා මහකනදාරාව ව්‍යාපාරයේ ජනතාව සමහර අවස්ථාවල යල, මහ දෙකන්නයේ වැඩ කරගන්න බැරුව ප්‍රශ්නයකට මුහුණ දෙනවා. ඒ නිසා මෙම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, උතුරු මැද මහ ඇළ ව්‍යාපෘතියයි, වයඹ මහ ඇළ ව්‍යාපෘතියයි දෙකම එක ව්‍යාපෘතියක් යටතේ තිබෙන්නේ. මේක දැවැන්ත ව්‍යාපෘතියක්. ආසියානු සංවර්ධන බැංකුවෙන් තමයි මේකට මූල්‍යාධාර සපයන්නේ. විවිධ හේතුන් නිසා අවුරුදු 10ක් ගිහිල්ලාත්, ඩොලර් මිලියන 500ක් වියදම් කරලාත්, ව්‍යාපෘතියේ සැලකිය යුතු ප්‍රගතියක් ලබාගන්න බැරි වෙලා තිබෙනවා.

නමුත්, අපි රජය භාර ගත්තාට පස්සේ මේකට උත්තරයක් හොයන්න ඕනෑ. අපි අය වැයෙන් වාරි පුනරුත්ථාපනය සඳහා වෙන් කර තිබෙනවා, රුපියල් මිලියන 78,000ක්. අපි වාරි පුනරුත්ථාපනය සහ නව වාරි ඉදිකිරීම් සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කර තිබෙනවා, "වාරි මහිම අපේ උරුමය" කියලා. ඒ "වාරි මහිම අපේ උරුමය" ව්‍යාපෘතිය යටතේ, උතුරු මැද මහ ඇළ ප්‍රයෝජනයට ගත හැකි මට්ටමට ගෙනෙන්න රුපියල් මිලියන 32,500ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම තමයි පසුගිය දා කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබුණා, නැවත ආසියානු සංවර්ධන බැංකුවත් එක්ක සාකච්ඡා කරලා මේ සඳහා මූල්‍ය පහසුකම් ලබා ගන්න. ඒ නිසා මේ ව්‍යාපෘතිය සාර්ථක කරලා ගොවි ජනතාවට ජලය ලබා දීම සහ කෘෂි කර්මාන්තය සඳහා ප්‍රයෝජනයට ගත හැකි මට්ටමට එය ගෙන ඒම සඳහා අපි වෙහෙස මහන්සි වී කටයුතු කරමින් ඉන්නවා.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සහ භෞතික ප්‍රගතිය විමසනකොට පෙනී යනවා, මෙහි සැලකිය යුතු ප්‍රමාණයකින් ප්‍රගතිය අත්පත් කරගෙන නැහැ කියලා. මෙහි බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. අපට වාර්තා වන තොරතුරු අනුව මෙහි මුදල් වෙන වෙන ව්‍යාපෘති සඳහා පාවිච්චි කරලාත් තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, අපි මේ අමාත්‍යාංශවලට ඇවිල්ලා මෙහි වගකීම භාර ගන්නකොට මම කලිනුත් කිව්වා වාගේම මේකේ අවුල් ගොඩක් හදලා තිබුණා. එකක් තමයි, කිලෝමීටර 28ක් දිග උමඟක් තිබෙනවා. ඒ උමඟ හෑරීම සඳහා උමං හෑරීමේ යන්ත්‍රයක් - TBM එකක් - යොදාගෙන තිබෙනවා. නමුත් පසු කාලයක සැලසුම් කර තිබෙනවා, තවත් යන්ත්‍රයක් මේකට ගෙනැල්ලා දාලා මේ කටයුතු ඉක්මන් කරන්න ඕනෑය කියලා. මෙතැනින් තමයි එක ප්‍රශ්නයක් ඇවිල්ලා තිබෙන්නේ. ඒ දෙවෙනි යන්ත්‍රය ගෙන ඒම සඳහා වූ නිසි වැඩ පිළිවෙළක් නැතිව මේ තීරණය ගැනීම නිසා ඩොලර් මිලියන 50ක් නාස්ති වෙලා තිබෙනවා. ඊට පස්සේ තව වෙනත් කටයුතු සඳහා මේ ව්‍යාපෘතියෙන් ඩොලර් මිලියන 50ක් අරගෙන තිබෙනවා. ඒ වාගේම මම කලිනුත් කිව්වා වාගේ විවිධ හේතු නිසා මේ ව්‍යාපෘතිය අසාර්ථක වෙලා තිබෙනවා. අවුරුදු 10ක් ගිහිල්ලාත්, loan එකේ period එක ඉවර වෙලාත් මේකේ යම් ප්‍රගතියක් හෝ අත්කර ගන්න බැරි වෙලා තිබෙනවා.

ඒ නිසා මෙහි ගැටලු ගොඩක් තිබෙනවා. එකක්, තාක්ෂණික පැත්තෙන් අකටයුතුකම් සිද්ධ වුණා. ඒ වාගේම මෙහි දුර්වලතා තිබෙන බවට වාර්තා වනවා. බොහෝදෙනෙකු අපට මේ සම්බන්ධව කථා කරනවා. ඒ නිසා තාක්ෂණික ඇගැයීම් වාර්තාවක් ලබා ගන්න ඕනෑ. ඒ සඳහා අපි කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම තමයි මූල්‍යමය ඇගැයීම් වාර්තාවක් -අපි භාර ගන්නකොට තිබුණු තත්ත්වය, මොකක්ද වුණේ කියන එක සම්බන්ධයෙන් හොයලා බලන්න- ලබා ගන්නත් අපි කටයුතු කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -869/2025- (1), ගරු ටී.කේ. ජයසුන්දර මහතා.

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු කථානායකතුමනි, එතුමා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් සම්බන්ධයෙන් තමයි ප්‍රශ්නය අහලා තිබෙන්නේ. ඒක ටිකක් සංකීර්ණ ප්‍රශ්නයක්. ඒ නිසා කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ගාල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන: නිශ්චල දේපළ

காலி மாவட்ட உள்ளூர் அதிகாரசபைகள்: அசையாச் சொத்துகள்

LOCAL AUTHORITIES IN GALLE DISTRICT: IMMOVABLE PROPERTIES

871/2025

**9. ගරු නිශාන්ත පෙරේරා මහතා**

(மாண்புமிகு நிஷாந்த பெரேரா)

(The Hon. Nishantha Perera)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන විසින් භුක්ති විඳිනු ලබන නිශ්චල දේපළ එක් එක් පළාත් පාලන ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම දේපළ අතරින් පළාත් පාලන ආයතනය විසින් නීත්‍යානුකූලව භුක්ති විඳින නිශ්චල දේපළ ප්‍රමාණය සහ නීත්‍යානුකූල නොවන ආකාරයට භුක්ති විඳින නිශ්චල දේපළ ප්‍රමාණය එක් එක් පළාත් පාලන ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත පළාත් පාලන ආයතන විසින් නීත්‍යානුකූල නොවන ආකාරයට භුක්ති විඳින නිශ්චල දේපළ තිබේ නම්, ඒවා නීත්‍යානුකූල කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காலி மாவட்டத்தில் உள்ளூர் அதிகாரசபைகளால் இருப்பாட்சி செய்யப்படுகின்ற அசையாச் சொத்துக்கள், ஒவ்வோர் உள்ளூர் அதிகார சபைக்கும் ஏற்ப வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) அச்சொத்துக்களில், உள்ளூர் அதிகாரசபைகளால் சட்டரீதியாக இருப்பாட்சி செய்யப்படுகின்ற அசையாச் சொத்துக்களின் அளவு மற்றும் சட்டரீதியற்ற முறையில் இருப்பாட்சி செய்யப்படுகின்ற அசையாச் சொத்துக்களின் அளவு ஒவ்வோர் உள்ளூர் அதிகாரசபைக்கும் ஏற்ப வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி உள்ளூர் அதிகாரசபைகளில் சட்டரீதியற்ற முறையில் இருப்பாட்சி செய்யப்படுகின்ற அசையாச் சொத்துக்கள் காணப்படின், அவற்றைச் சட்டபூர்வமாக்க நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) the extent of immovable properties possessed by each of the local authorities in the Galle District, separately;

(ii) the extent of such immovable properties possessed legally and the extent possessed in a manner which is not legal by each of the local authorities concerned, separately; and

(iii) whether action will be taken to legalize the properties which are possessed in an illegitimate manner by the local authorities referred to above, if there are any such properties possessed in such manner?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**

(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)

(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

- ගාල්ල දිස්ත්‍රික්කය තුළ පළාත් පාලන ආයතන 20ක් පවතින අතර එම එක් එක් පළාත් පාලන ආයතන විසින් භුක්ති විඳිනු ලබන නිශ්චල දේපළ ප්‍රමාණය විස්තරාත්මකව ඇමුණුමෙහි සඳහන් කර ඇත. ඇමුණුම **සභාගත*** කරමි.
- එම එක් එක් පළාත් පාලන ආයතන භුක්ති විඳින නිශ්චල දේපළ ප්‍රමාණය පිළිබඳ කෙටි විස්තරයක් පහත දැක්වේ.

| අනු අංකය | පළාත් පාලන ආයතනය | භුක්ති විඳිනු ලබන නිශ්චල දේපළ සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ගාල්ල මහ නගර සභාව | 133 |
| 02 | අක්මීමන ප්‍රාදේශීය සභාව | 72 |
| 03 | අම්බලන්ගොඩ නගර සභාව | 85 |
| 04 | අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව | 44 |
| 05 | ඇල්පිටිය ප්‍රාදේශීය සභාව | 109 |
| 06 | ඉමදුව ප්‍රාදේශීය සභාව | 60 |
| 07 | කරන්දෙණිය ප්‍රාදේශීය සභාව | 72 |
| 08 | තවලම ප්‍රාදේශීය සභාව | 07 |
| 09 | නෙළුව ප්‍රාදේශීය සභාව | 22 |
| 10 | බද්දේගම ප්‍රාදේශීය සභාව | 178 |
| 11 | බලපිටිය ප්‍රාදේශීය සභාව | 84 |
| 12 | බෙන්තොට ප්‍රාදේශීය සභාව | 51 |
| 13 | බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාව | 49 |
| 14 | යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව | 45 |
| 15 | රජගම ප්‍රාදේශීය සභාව | 82 |
| 16 | වැලිවිටිය-දිවිතුර ප්‍රාදේශීය සභාව | 43 |
| 17 | හබරාදුව ප්‍රාදේශීය සභාව | 58 |
| 18 | හික්කඩුව ප්‍රාදේශීය සභාව | 44 |
| 19 | නියාගම ප්‍රාදේශීය සභාව | 32 |
| 20 | නාගොඩ ප්‍රාදේශීය සභාව | 60 |

(ii) පළාත් පාලන ආයතන නීත්‍යානුකූල අයිතිය පවරාගෙන භුක්ති විඳින නිශ්චල දේපළ හා මෙතෙක් නීත්‍යානුකූල අයිතිය පවරාගෙන නොමැතිව භුක්ති විඳිනු ලබන නිශ්චල දේපළ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | පළාත් පාලන ආයතනය | භුක්ති විඳිනු ලබන නිශ්චල දේපළ සංඛ්‍යාව | නීත්‍යානුකූල අයිතිය පවරාගෙන භුක්ති විඳිනු ලබන නිශ්චල දේපළ සංඛ්‍යාව | මෙතෙක් නීත්‍යානුකූල අයිතිය පවරා ගෙන නොමැතිව භුක්ති විඳිනු ලබන නිශ්චල දේපළ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ගාල්ල මහ නගර සභාව | 133 | 33 | 100 |
| 02 | අක්මීමන ප්‍රාදේශීය සභාව | 72 | 55 | 17 |
| 03 | අම්බලන්ගොඩ නගර සභාව | 85 | 85 | - |
| 04 | අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව | 44 | 14 | 30 |
| 05 | ඇල්පිටිය ප්‍රාදේශීය සභාව | 109 | 39 | 70 |
| 06 | ඉමදුව ප්‍රාදේශීය සභාව | 60 | 47 | 13 |
| 07 | කරන්දෙණිය ප්‍රාදේශීය සභාව | 72 | 09 | 63 |
| 08 | තවලම ප්‍රාදේශීය සභාව | 07 | 02 | 05 |
| 09 | නෙළුව ප්‍රාදේශීය සභාව | 22 | 11 | 11 |
| 10 | බද්දේගම ප්‍රාදේශීය සභාව | 178 | 162 | 16 |
| 11 | බලපිටිය ප්‍රාදේශීය සභාව | 84 | 47 | 37 |
| 12 | බෙන්තොට ප්‍රාදේශීය සභාව | 51 | 50 | 01 |
| 13 | බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාව | 49 | 49 | - |
| 14 | යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව | 45 | 41 | 04 |
| 15 | රජගම ප්‍රාදේශීය සභාව | 82 | 69 | 13 |
| 16 | වැලිවිටිය-දිවිතුර ප්‍රාදේශීය සභාව | 43 | 19 | 24 |
| 17 | හබරාදූව ප්‍රාදේශීය සභාව | 58 | 58 | - |
| 18 | හික්කඩුව ප්‍රාදේශීය සභාව | 44 | 27 | 17 |
| 19 | නියාගම ප්‍රාදේශීය සභාව | 32 | 04 | 28 |
| 20 | නාගොඩ ප්‍රාදේශීය සභාව | 60 | 34 | 26 |

(iii) • අදාළ පළාත් පාලන ආයතන විසින් මෙතෙක් නීත්‍යානුකූල අයිතිය පවරාගෙන නොමැතිව භුක්ති විඳිනු ලබන දේපළ, ඒවායේ හිමිකාරිත්වය නීත්‍යානුකූල කර ගැනීම සඳහා අදාළ පාර්ශ්ව වෙතින් දීර්ඝ කාලීනව ඉල්ලීම් සිදු කර ඇත.

• ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත්, පළාත් පාලන ආයතන විසින් භුක්ති විඳිනු ලබන මෙතෙක් එම ආයතන වෙත පවරා දී නොමැති ඉඩම්, එම ඉඩමේ වටිනාකමෙන් සියයට 25ක මුදලක් අයකර අදාළ පළාත් පාලන ආයතන වෙත පවරා දීමට අදාළව ලිඛිත ඉල්ලීමක් යොමු කරන ලෙස රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ 2025.03.05 දින පැවති සාකච්ඡාව අනුව තීරණය කරන ලද බැවින්, ඒ බැව් මා විසින් යොමු කරන ලද අංක PL/6/8/8/137 හා 2025.05.09 දිනැති ලිපිය මඟින් දකුණු පළාත් සභාව දැනුවත් කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඉතිහාසයේ පෞද්ගලික අයිතිකරුවන්ගෙන් ගත් සමහර දේපළ දැන් පළාත් පාලන ආයතනවලට නැතිව යනවා. දැනට ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය පැත්තෙන් ගන්නා ක්‍රියාමාර්ග මොනවාද කියලා දැනගන්න මම කැමැතියි. ගාල්ල දිස්ත්‍රික්කය ගත්තාම, අපි පෞද්ගලිකව දන්නා විශාල දේපළ ප්‍රමාණයක් තිබෙනවා.

ඒවා 1980 ගණන්වල වාගේ අරගෙන තිබෙනවා. හැබැයි, ඒවා නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කරලා නැහැ, ගරු කථානායකතුමනි. වාණිජමය වටිනාකමක් තිබෙන තැන්වල නීත්‍යානුකූලව ගත්තේ නැති දේවල්, ඒ කියන්නේ දේශපාලන බලය පාවිච්චි කරලා ගත් දේපළ නීත්‍යානුකූල කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඒ අයගේ තුන්වැනි පාර්ශ්වයන් විසින් අරගෙන තිබෙනවා. ගරු කථානායකතුමනි, දැවැන්ත ජාතික ධනයක් ඒ සඳහා වැය කරලා තිබෙනවා. දැන් ඒවා අපතේ යනවා, රජයට පවරා ගැනීමට අවශ්‍ය නීත්‍යානුකූල පසුබිම හදපු නැති නිසා. ගරු කථානායකතුමනි, අන්න ඒවාට මොකක්ද වෙන්නේ කියන එක තමයි ගරු ඇමතිතුමාගෙන් අහන මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, එතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය නිවැරැදියි. අම්බලන්ගොඩ නගර සභාව, බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාව සහ හබරාදූව ප්‍රාදේශීය සභාව හැරුණු කොට අනෙකුත් පළාත් පාලන ආයතන 17ම මේ විධියට නීත්‍යානුකූලව අයිතිය පවරා ගෙන නොමැතිව දේපළ භුක්ති විඳිනවා. කලින් සඳහන් කරපු ආකාරයට රාජ්‍ය ආයතනවලට අදාළ දේපළ පවරා දෙන්න කියන ඉල්ලීම තමයි අපි කරලා තිබෙන්නේ. එතුමා සඳහන් කරපු ආකාරයට පෞද්ගලික දේපළ තිබෙනවා නම්, ඒ දේපළ සම්බන්ධව විධිමත් විමර්ශනයක් කරලා ඒවා පවරා ගැනීමට හෝ අදාළ පාර්ශ්ව වෙත නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු කරන්න පුළුවන්.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. යම් යම් වකවානුවල නීත්‍යනුකූලව මේ දේපළ පවරා ගන්නේ නැතුව ඒවායේ ඉදිකිරීම් කරලා තිබෙනවා, රජයේ මුදල්, ජනතාවගේ මුදල් භාවිත කරලා. ගරු කථානායකතුමනි, දේශපාලන තීන්දු එක්ක ඒ සඳහා වියදම් කරලා තිබෙන්නේ පෞද්ගලික මුදල් නොවෙයි නේ. ඒ තීන්දු ගත් උදවිය සම්බන්ධයෙන් වර්තමානයේ ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද? ඇල්පිටිය ප්‍රාදේශීය සභාව 1984දී "ඥානප්‍රදීප" කියලා පුස්තකාලයක් පටන් අරගෙන තිබෙනවා. ඒ පුස්තකාලය සම්බන්ධයෙන් මේ වෙනකොට කිසිදු නීත්‍යනුකූල කටයුත්තක් කරලා නැහැ. දැන් නඩු දාලා තිබෙනවා. ගරු කථානායකතුමනි, 1984 ඉඳලා එහි නඩත්තු කටයුතු සඳහා වියදම් කරන්නේ ජාතික ධනය. හැබැයි අපට කියන්න බැහැ, හෙට දවසේ මේක රජයට, ජනතාවට අයිති වෙයිද, නැද්ද කියලා. එවකට දේශපාලන තීන්දු ගනිපු උදවිය මේ වනකොට ජනතාවගේ දැවැන්ත මුදලක් විනාශ කරලා තිබෙනවා. ඒවා සම්බන්ධව ගන්නා තීන්දු තීරණ මොනවාද?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, එතුමා ඉදිරිපත් කරපු දෙවැනි අතුරු ප්‍රශ්නය සම්බන්ධයෙන් රටේ පවතින නීතිය අනුව කටයුතු කරන්න පුළුවන්. අපි රජය හැටියට ඒ අනුව කටයුතු කිරීමට අපේක්ෂා කරනවා. අයථා ලෙස ඒ දේපළ පරිහරණය කරලා තිබෙනවා නම් සහ මහජන මුදල් අනීතික ලෙස වැය කරලා තිබෙනවා නම්, ඒවා කරපු අයට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට නීත්‍යනුකූලව කටයුතු කිරීමට අපි පියවර ගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 10 -874/2025- (1), ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### දේශීයව නිෂ්පාදිත සීනි සහ එහි අතුරු නිෂ්පාදන මත පනවන ලද වැට් බද්ද
### உள்ளூர் சீனி உற்பத்தி மற்றும் அதன் துணைத் தயாரிப்புகளுக்கு விதிக்கப்படும் 'வற்' வரி
### VAT IMPOSED ON LOCALLY PRODUCED SUGAR AND ITS BY-PRODUCTS

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ඌව-වෙල්ලස්ස ඓතිහාසික පුරවරයේ දෙලක්ෂ පනස්දාහක පමණ ජනතාවට බලපාන ප්‍රශ්නයක් තමයි මා අද ස්ථාවර නියෝග 27(2) යටතේ යොමු කරන්නේ.

ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය දිගු කාලයක් තිස්සේ පවත්වාගෙන යනු ලබන දේශීය වාණිජ කර්මාන්තයක්. විශේෂයෙන්ම මෙම කර්මාන්තය ආශ්‍රිතව සිය ජීවනෝපාය සකසා ගත් පවුල් විශාල සංඛ්‍යාවක් සිටිනවා; අපි හිතන ආකාරයට, දෙලක්ෂ පනස්දාහකට වැඩි ප්‍රමාණයක් ඉන්නවා. එහෙත් වර්තමානයේ පවතින බදු ප්‍රතිපත්තිවල අසමානතා හේතුකොටගෙන දේශීය සීනි නිෂ්පාදන අළෙවි කර ගැනීමේ දැඩි අභියෝගයන්ට ඒ කර්මාන්තය මුහුණ දී ඇති බව වාර්තා වෙනවා.

එබැවින්, දේශීය සීනි නිෂ්පාදනයේ වත්මන් තත්ත්වය, ආනයන, බදු ප්‍රතිපත්ති හා රජයේ ක්‍රියාමාර්ග සම්බන්ධව ප්‍රශ්න කිහිපයක් මම රජයට යොමු කරනවා.

1. ලංකා සීනි සමාගමට අයත් ලංකාවේ දැනට ක්‍රියාත්මක වන සීනි කර්මාන්තශාලා ගණන කොපමණද? ඒ එක් එක් කර්මාන්තශාලාවලින් වාර්ෂිකව නිෂ්පාදනය කරන සීනි ප්‍රමාණය කොපමණද? එම සම්පූර්ණ නිෂ්පාදනය මෙරට වාර්ෂික සීනි අවශ්‍යතාවෙන් කොපමණ ප්‍රතිශතයක්ද?

2. දැනට වාර්ෂිකව ආනයනය කරනු ලබන සීනි ප්‍රමාණය කොපමණද? ආනයනය කරනු ලබන සීනි කිලෝවක් මත පනවන බදු මොනවාද? ඒ කොපමණද?

3. දේශීයව නිෂ්පාදනය කරනු ලබන සීනි කිලෝවක් සඳහා පනවන බදු ප්‍රමාණය කොපමණද? ආනයනික සීනි වැට් බදුවලින් නිදහස් කිරීමටත්, දේශීයව නිෂ්පාදනය කරන සීනි සඳහා වැට් බදු පැනවීමටත් හේතු මොනවාද?

ඇත්තවශයෙන්ම අපට ආරංචි විධියට ආනයනය කරන සීනි කිලෝවකට අය කරන්නේ රුපියල් 50ක් පමණයි. හැබැයි, දේශීය නිෂ්පාදනවලට සියයට 18ක VAT එකක් පනවා තිබෙනවා. ඒ නිසා සීනි කිලෝවක නිෂ්පාදිත පිරිවැය රුපියල් 238යි. නමුත්, එය වෙළෙඳ පොළේ ලබා දෙන්නේ රුපියල් 175කට. ලොකු අලාභයක් විඳිමින් ඒක ක්‍රියාත්මක වෙන්නේ. ගරු අමාත්‍යවරයාගෙන් අපි අහන්න කැමැතියි, මෙවන් තත්ත්වයක් තිබියදීත් තවදුරටත් දේශීය නිෂ්පාදනයට මේ සියයට 18ක VAT එක ක්‍රියාත්මක කරන්නේ ඇයි කියලා.

4. ලංකා සීනි සමාගමට අයත් සීනි කර්මාන්තශාලා දැනට පාඩු ලබන තත්ත්වයේ පවතින බව රජය පිළිගන්නේද?

   අපට ලැබී තිබෙන තොරතුරු අනුව ගල්ඔය රුපියල් බිලියන 17ක්, ඇතිමලේ රුපියල් බිලියන 7ක්, පැල්වත්ත

රුපියල් බිලියන 10ක් පාඩුයි. අපට ආරංචි විධියට, සෙවනගල කර්මාන්තශාලාව සම්පූර්ණයෙන්ම හදන්නට වෙලා තිබෙනවා. මොකක්ද, මේවායේ ඇත්ත තත්ත්වය? ඒ පාඩු ලබන තත්ත්වය පිළිබඳව රජය සතු දත්ත සහ තොරතුරු කවරේද?

එම කර්මාන්තශාලා ලාභ ලබන ආයතන බවට පත් කිරීම සඳහා මේ වනවිට රජයේ අවධානය යොමු වී තිබේද? ඒ සඳහා යෝජිත වැඩ පිළිවෙළ කුමක්ද?

මම මේ ගැන විශේෂයෙන්ම කථා කරන්නේ මේ නිසා. රජයේ අයිතිය තිබෙන ආයතන ගැන ලොකු වගකීමක් තිබෙනවා. ඒවා ලාභ ලබන තත්ත්වයට ගෙන එන්නට රජය ගන්නා පියවර මොකක්ද?

5. සීනි නිෂ්පාදනයේ අතුරු ඵලයක් වන එතනෝල් අළෙවියෙන් පාඩු ලැබීමට හේතු කවරේද? එම පාඩු ලැබීම අවම කිරීමට රජය ගන්නා පියවර කවරේද?

මම හිතන විධියට ගරු විෂය භාර ඇමතිතුමා දන්නවා, අද එතනෝල් ලීටරයකට පවතින ඉල්ලුම රුපියල් 450ත්, 475ත් අතර මිලක් බව. හැබැයි, නිෂ්පාදන පිරිවැය තිබෙනවා, රුපියල් 628ත්, 750ත් අතර. අඩුම ගණනේ එතනෝල් ලීටරයකට රුපියල් 800ක්වත් අවශ්‍ය වෙනවා. ගිය අවුරුද්දේ රුපියල් 1,500ක මුදලක් ලැබුණා. මම මේ එතනෝල් ප්‍රවර්ධනය සඳහා උනන්දු කරවනවා නොවෙයි. නමුත්, සමස්ත නිෂ්පාදන ක්‍රියාවලිය තුළ මේ එතනෝල් අළෙවිය ඉතාම වැදගත්. මොකද, ඌව-වෙල්ලස්ස පුරවරයේ අපේම පුරවැසියන් 250,000කගේ ජන ජීවිතය ඒ මත පදනම් වන නිසා.

6. දේශීයව නිෂ්පාදනය කරන සීනි සහ එතනෝල් මත පනවා ඇති වැට් බදු ඉවත් කිරීම හරහා ලංකා සීනි සමාගමට අයත් කර්මාන්තශාලා මුහුණ දෙන පාඩු ලැබීම අවම කර ගත හැකි බව රජය පිළිගන්නේද? ඉදිරියේදී දේශීයව නිෂ්පාදනය කරන සීනි සහ එතනෝල් මත පනවා ඇති වැට් බදු ඉවත් කිරීමට රජය කටයුතු කරන්නේද? නොඑසේ නම්, ඒ මන්ද?

මම විශේෂයෙන්ම ගරු ඇමතිතුමාට තවත් අමතර කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි.

විශේෂයෙන්ම ලාභයෙන් සියයට 30ක් බදු වශයෙන් ගන්නවා. මම මේ කථා කරන්නේ සීනි සම්බන්ධයෙන්. ඒ වාගේම එතනෝල්වල ලාභයෙන් සියයට 45ක් බදු වශයෙන් ගන්නවා. ඊට අමතරව molasses මෙට්‍රික් ටොන් එකකින් 10,000ක් බදු වශයෙන් ගන්නවා. මේ බදු බර තුළ ඇත්තවශයෙන්ම අවසානයේ පීඩාවට පත් වෙන්නේ ගොවි ජනතාව; සීනි කර්මාන්තයේ නියැළෙන ගොවි ජනතාව, සාමාන්‍ය ජනතාව තමයි පීඩාවට පත් වෙන්නේ. විශේෂයෙන්ම පසුගිය දවස්වල ලොකු ආන්දෝලනයක් ඇති වුණා, උක් දඬු මෙට්‍රික් ටොන් එකකට දෙන රුපියල් 10,000 අඩු වෙයි කියලා. ඒ වාගේ කථාවක් ඇති වුණා. මේ කරුණු කාරණාත් එක්ක මම ගරු ඇමතිතුමාගෙන් මේ ප්‍රශ්න ටික අහන්න කැමැතියි. මම හිතන විධියට, ඔබතුමාම පත් කරපු ප්‍රධාන මෙහෙයුම් නිලධාරි නුවන් ධර්මරත්නම පැහැදිලි කර දුන්නා, මේ කර්මාන්තය මුහුණ දෙන අභියෝග සහ ගැටලු ගැන. විශේෂයෙන්ම ඌව-වෙල්ලස්සේ සිටින 250,000කට වැඩි ඒ වීරෝදාර ගොවි ජනතාව වෙනුවෙන් මම රජයෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකර මේ අභියෝග ටික හඳුනා ගෙන මේවාට ඉක්මන් පිළියම් යොදන්නට කටයුතු කරන්න කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුනිල් හඳුන්නෙත්ති අමාත්‍යතුමා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, අපේ විපක්ෂ නායකතුමාට මේ දවස්වල පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් පත් කිරීම්, ආසන සංවිධායකයින් ඉවත් වීම් වාගේ ප්‍රශ්න තිබියදීත් මේ කර්මාන්තය ගැන අවධානය යොමු කරලා, මේ විශේෂ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, ඒ නිසා මට අවස්ථාවක් ලැබී තිබෙනවා, මේ ප්‍රශ්නවලට අදාළව ඔබතුමාට වාගේම පාර්ලිමේන්තුවටත් පැහැදිලි කිරීමක් කරන්න. ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු මෙසේයි.

1. කර්මාන්තශාලා 2කි. ඒ, පැල්වත්ත ඒකකය හා සෙවනගල ඒකකයයි. ඊට අමතරව ඇතිමලේ පෞද්ගලික කර්මාන්තශාලාවක් තිබෙනවා. ගල්ඔය රජයට සියයට 51ක සහ පෞද්ගලික අංශයට සියයට 49ක අයිතිය තිබෙන රාජ්‍ය-පෞද්ගලික ඒකාබද්ධ කර්මාන්තශාලාවක් තිබෙනවා.

| කර්මාන්ත ශාලාවේ නම | වාර්ෂික නිෂ්පාදිතය (මෙට්‍රික් ටොන්) | | | | |
|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| පැල්වත්ත ඒකකය | 23,582 | 30,381 | 24,110 | 28,077 | 27,791 |
| සෙවනගල ඒකකය | 16,105 | 17,796 | 12,628 | 13,784 | 11,930 |
| එකතුව | 39,687 | 48,177 | 36,738 | 41,861 | 39,721 |

2025 වර්ෂයට අදාළව දැනට කටයුතු කෙරෙනවා.

2024 වර්ෂයේ මෙරට සීනි අවශ්‍යතාව මෙට්‍රික් ටොන් 658,678කි. වාර්ෂික සීනි අවශ්‍යතාවෙන් සියයට 6.03ක් සීමාසහිත ලංකා සීනි සමාගම නිෂ්පාදනය කරයි.

2. වාර්ෂිකව ආනයනය කරනු ලබන සීනි ප්‍රමාණය පහත දැක්වේ.

**MINISTRY OF INDUSTRY - SUGAR IMPORT STATISTICS (2022 to February 2025)**

| විස්තරය | HS CODE | YEAR | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2022 | | 2023 | | 2024 | | 2025 JAN, FEB | |
| | | QUANTITY Kg | VALUE Rs. | QUANTITY Kg | VALUE Rs. | QUANTITY Kg | VALUE Rs. | QUANTITY Kg | VALUE Rs. |
| ශුද්ධ කළ සීනි (උක්) | 17019910 | 249,112,885 | 42,882,478,994 | 296,367,389 | 69,735,688,535 | 444,996,852 | 88,900,256,475 | 96,411,782 | 17,187,046,020 |
| | 17019920 | 186,206,094 | 32,962,022,560 | 337,615,208 | 66,215,638,379 | 48,409,004 | 9,382,337,801 | 20,166,000 | 3,303,330,141 |
| ශුද්ධ කළ සීනි (බීට්) | 17019930 | 1,127 | 191,593 | 7,606,275 | 1,934,502,758 | 72,421,800 | 13,948,552,228 | `24,487,050,994 | 4,267,762 |

Statistics Division- Sri Lanka Customs

Note: Bulk sugar imports are included. The sugar imports for special purposes are not included.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ශුද්ධ කළ සුදු සීනි පිළිබඳ 2022 සිට 2025 ජනවාරි, පෙබරවාරි දක්වා වූ දත්ත මෙහි ඇතුළත් කර තිබෙනවා. 2024දී ආනයනය කර තිබෙනවා, කිලෝ මිලියන 564ක්. 2025දී කිලෝ මිලියන 140ක් ආනයනය කර තිබෙනවා. සුදු සීනි තමයි ආනයනය කරන්නේ. දුඹුරු සීනි ආනයනය කරන්නේ නැහැ. නමුත් සුදු සීනි අස්සේ දමලා දුඹුරු සීනි ගෙනෙන අවස්ථාත් තිබෙනවා.

ආනයනය කරනු ලබන සීනි සඳහා විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද -SCL එක- පනවනවා. ඔබතුමා කියපු ආකාරයටම එහිදී කිලෝග්‍රෑමයකට රුපියල් 50ක බද්දක් පනවා තිබෙනවා.

3. දේශීයව නිෂ්පාදනය කරන සීනි සඳහා සියයට 18ක එකතු කළ අගය මත බද්ද - VAT - පනවනවා. ඒ වාගේම සියයට 2.5ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්දක් පනවා තිබෙනවා. මේ දෙකේ එකතුව ගත්තාම, දළ වශයෙන් සියයට 20.5ක බද්දක් පැනවෙනවා.

ආනයනික සීනිවලට VAT පැනවෙන්නේ නැහැ. ආනයනික සීනිවලට පැනවෙන්නේ රුපියල් 50ක විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද. ඒක සංයුක්ත බද්දක්. ඒක ආනයනික වෙනත් භාණ්ඩවලට අයත් වෙන්නේ නැහැ. ඒ අනුව ආනයනයේදී VAT අය කරන්නේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, මම ඇහුවේ නැහැ, ආනයනික සීනිවල VAT ඉවත් කරන එක ගැන. මම ඇහුවේ දේශීය නිෂ්පාදනයට VAT එක පනවන්නේ ඇයි කියලායි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

දේශීයව නිෂ්පාදනය කරන සීනි 2024 අවුරුද්දේ ජනවාරි පළමුවැනි දා තෙක් VAT එකෙන් නිදහස්ව තිබුණා. කෙසේ වෙතත්, 2024 ජනවාරි 01වන දා සිට ක්‍රියාත්මක වන පරිදි බද්දෙන් ලැබෙන ආදායම ඉහළ නැංවීම, VAT එකේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා අඩු ආදායම්ලාභී කුටුම්භ, අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහනය වැනි අංශවලට බදුවල බලපෑමක් ඇති කරන වඩාත් සම්මත නිදහස් කිරීම් එලෙසම පවත්වා ගනිමින් ඔබතුමන්ලාගේ ආණ්ඩු ක්‍රියාවලිය තිබෙන කාලයේ VAT එක නිදහස් කිරීම්වලින් බහුතරයක, - ඒ කියන්නේ ප්‍රධාන අයිතම 137කින්, ප්‍රධාන අයිතම 95ක - VAT නිදහස් කළා. ඒ VAT එක නිදහස් කරන වෙලාවේදී තමයි 2024 ජනවාරි 01 වන දා ඉඳලා බලපවත්වන පරිදි දේශීයව නිෂ්පාදනය කරන සීනි VAT එකට යටත් කළේ.

ඇත්තටම VAT එක නිසා අපේ නිෂ්පාදන පිරිවැය වැඩි වෙලා තිබෙන බව ඇත්ත. ඒ නිෂ්පාදන පිරිවැය වැඩිවීම නිසා ඔබතුමා කියන විධියට අපිට රුපියල් 175ට මිල කරලා වෙළෙඳ පොළේ සීනි නැහැ. දැන් ඔබතුමාගේ පැහැදිලි කිරීමේදී කිව්වා, කිලෝ එක රුපියල් 175ට තිබෙනවා කියලා. රුපියල් 175ට දුඹුරු සීනිත් නැහැ, සුදු සීනිත් නැහැ. අපි ආණ්ඩුව ගන්නකොට වෙළෙඳ පොළේ දුඹුරු සීනි කිලෝ එක රුපියල් 360ටයි තිබුණේ. සුදු සීනි කිලෝව රුපියල් 220ට තිබුණේ. අදත් සුදු සීනි රුපියල් 220ට තිබෙන්නේ. දුඹුරු සීනි රුපියල් 360ට තිබුණු එක අපි ගොවීන්ට කිසිම දෙයක් අඩු කරන්නේ නැතිව, රුපියල් 260 දක්වා **අඩු කළා.** ඔබතුමා කිව්වා නේ උක් දඬු මෙට්‍රික්ටොන් එකට රුපියල් 10,000ක් ලැබෙන එක අඩු වේදැයි කියා කථා බහක් තිබෙනවා කියලා. පසුගිය දවස්වල එවැනි කථා බහක් යැව්වා. නමුත්, ගොවීන් කිසි කෙනෙකුගේ රුපියලක්වත් අඩු කරලා නැහැ.

ඒ වාගේම සේවකයෝ ගැනත් කියන්න ඕනෑ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ දයා ගමගේ මහත්තයා ඉන්න කාලයේත් මේක විකුණන්න හැදුවා. ඒ පෞද්ගලිකව දුන්න කාලයෙත් සේවකයෝ බඳවා ගෙන තිබෙනවා. ජගත් පුෂ්පකුමාර මහත්මයාගේ නමට කට්ටිය ඇවිල්ලා ඉන්නවා. ඒ පැත්තේ ඉන්න ඔක්කෝම මන්ත්‍රීවරුන්ගේ නම්වලට කට්ටිය ඇවිල්ලා ඉන්නවා. එවැනි විශාල සේවක පිරිසක් ඉන්නවා. පැල්වත්ත, සෙවනගල කර්මාන්තශාලාවල සේවකයෝ 5,400ක් ඉන්නවා. අපි ඒ එක්කෙනෙක්වත් අයින් කරලා නැහැ. කොන්ත්‍රාත් පදනමෙන් ඉන්නවා. දීමනා පදනමෙන් ඉන්නවා. දෛනික පදනමෙන් ඉන්නවා. වැඩ පුහුණු වෙන්න ඇවිල්ලා ඉන්නවා. මේ ආදී වශයෙන් විවිධ පදනම්වලින් ඉන්නවා. ඒ හැමෝගෙම කිසි දෙයක් අඩු කරලාත් නැහැ. මම ඒ ගැන වෙනම කියන්නම්. එහෙම තිබියදී අපි පසුගිය දවස්වල වෙළෙඳ පොළේ දුඹුරු සීනි කිලෝවක මිල රුපියල් 260 දක්වා අඩු කළා. ඒ ගැන කවුරුත් කථා කළේ නැහැ. රුපියල් 175ට නම් ලොවෙත් නැහැ, සීනි. ඔබතුමා කිව්ව ආකාරයට රුපියල් 175ට සීනි නැහැ. මේකෙදි VAT ඉවත් කිරීමෙන් විතරක් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ඔබතුමා අහලා තිබෙනවා නේ, එතනෝල් මත පනවපු බද්ද ඉවත් කිරීම ගැන. එය ඉවත් කිරීමෙන් විතරක් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. මේකට තවත් ගොඩක් හේතු තිබෙනවා.

ඊළඟට, ඔබතුමා අහනවා ඇත්තටම දේශීය වශයෙන් සීනි නිෂ්පාදකයාව ආරක්ෂා කර ගන්න ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද කියලා. ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයක්ම තිබෙනවා. අපි ඒවා යෝජනා කරලා තිබෙනවා. අපි දැනට මේ පිළිබඳව නිලධාරි මට්ටමේ වාර්තාවක් හදලා තිබෙනවා. ඒ වාර්තාවත් අපි ගරු ජනාධිපතිතුමාට ඉදිරියේදී ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම අපේ දුඹුරු සීනි organic සීනි හැටියට දැනට ලෝකයේ ලොකු ඉල්ලුමක් තිබෙනවා. මොකද, අපේ දුඹුරු සීනි නිෂ්පාදනයට පොහොර යොදනු ලබන්නේ ඉතා අඩු ප්‍රමාණයක්. Ammonium percentage එක ඉතා අඩු අගයක ප්‍රමාණයක් යොදවන්නේ. ඒ නිසා අපිට දුඹුරු සීනි අපනයනයේදී විශාල ආදායමක් ලබන්න පුළුවන්. අපි දැනට චීනයත් එක්ක, ඉරානයත් එක්ක, අප්‍රිකානු රටවල් කිහිපයක් එක්ක සාකච්ඡා කරලා තිබෙනවා. අපි දුඹුරු සීනි අපනයනය කිරීමේ සැලැස්මක් හදලා තිබෙනවා. ඒ වාගේම සුදු සීනිත් එක්ක කලවම් කරලා දුඹුරු සීනි ලංකාවට ගෙනෙනවා. අපි ඒ ගැන උක් පර්යේෂණ ආයතනයත් එක්ක කථා කරලා තිබෙනවා, ඒවා ගැන පර්යේෂණ කරලා ප්‍රමිතිගත කරන්න කියලා. ඒ වාගේම මම ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව එක්ක විශේෂ සාකච්ඡාවක් කරලා තිබෙනවා මේ පිළිබඳ අවස්ථාවක් දෙන්න කියලා.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා කිව්ව කාරණය හරි. අපි පසු ගිය කාලයේ එතනෝල්වලට බඩඉරිඟු වැඩිපුර පාවිච්චි කරපු නිසා මොලෑසස් හැටියට; උක් සීනි හැටියට පාවිච්චි කරන ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. එතනෝල් ලීටරයක් නිෂ්පාදනය කරන්න රුපියල් 1,500ක්, රුපියල් 1,700ක් විතර ගිය එක අද රුපියල් 475යි. ඒක ඉතින් වෙළෙඳ පොළ තත්ත්වයක්; ඉල්ලුම සැපයුම පිළිබඳ තත්ත්වයක්. මොකද, එතනෝල් පාවිච්චි කරන අයට උක්වලින් හදන මොලෑසස් එතනෝල් පාවිච්චි කරන්නත් පුළුවන්; බඩඉරිඟුවලින් හදන එතනෝල් පාවිච්චි කරන්නත් පුළුවන්. බඩඉරිඟුවලින් හදන එතනෝල් ලීටරයක් අද රුපියල් 230යි. ඉතින් රුපියල් 230ට අරගෙන, අරක්කු හදන එක ඒගොල්ලන්ට ලාභයි. ඒ නිසා මේ සිද්ධිය සාකච්ඡා වෙන වෙලාවේදී මම ගල්ඔය, ඇතිමලේ සහ පැල්වත්ත, සෙවනගල කර්මාන්තශාලාවල නිලධාරීන් ඔක්කෝම කැඳවලා එකට කථා කරලා අපි තීරණයක් ගත්තා. මීට පස්සේ අරක්කු නිෂ්පාදන ආයතනවලට අපේ ආයතන තුන එතනෝල් ලබා දෙන්නේ - මොකද, අපේ ආයතන තුන තමයි ලංකාවේ උක් වවන්නේ- ලීටරයක් රුපියල් 800ට කියලා තීරණයක් ගත්තා.

රුපියල් 800ක ස්ථාවර මිල අපට ලබා දෙන්න ඕනෑ. ගරු විපක්ෂ නායකතුමනි, අපි එසේ නොකළොත් අපට සිද්ධ වෙනවා ගොවීන්ට දෙන්න තිබෙන ප්‍රතිලාභ අඩු කරන්න. ගොවීන්ට දෙන්න තිබෙන ප්‍රතිලාභ අඩු කරනවා ද, නැත්නම් එතනෝල්වල මිල වැඩි කරනවා ද කියන තීරණ දෙකෙන්, එතනෝල්වල මිල වැඩි කරනවා කියන තීරණය අපට ගන්න සිද්ධ වෙලා තිබෙනවා. අපට වෙන උත්තරයක් නැහැ. මොකද, ඔබතුමන්ලා 2020දී ගොවීන්ට දුන්නේ උක් දඬු හොණ්ඩරයට රුපියල් 5,000යි. 2021දී ඔබතුමන්ලා උක් හොණ්ඩරයට දුන්නේ රුපියල් 5,550යි. 2023දී දුන්නේ රුපියල් 7,850යි. 2024දී ජානක වක්කුඹුර මැතිතුමන්ලා තීරණයක් අරගෙන, එය එකපාර වැඩි කළා රුපියල් 10,000 දක්වා; හොණ්ඩරය රුපියල් 7,850ට තිබුණු එක රුපියල් 10,000 කළා. අපට ඒ රුපියල් 10,000 අඩු කරන්නත් බැහැ; අපේ වියදම අඩු කරන්නත් බැහැ; මේ ඉන්න සේවකයන් ඉවත් කරන්නත් බැහැ. එහෙම නම් අපට තිබෙන එකම උත්තරය තමයි, එතනෝල්වලට තිබෙන ස්ථාවර මිල හදා ගන්න එක. එම නිසා දැනට අපේ උක් නිෂ්පාදනය කරන ආයතන තුනම පසුගිය දවසක තීරණයක් ගත්තා, එතනෝල් ලීටරයක් ලබා දෙන්නේ රුපියල් 800ට කියලා. ඒක, එක කාරණයක්.

දෙවැන්න තමයි, අපි සීනිවලට ස්ථාවර මිලක් හදන්න ඕනෑ. ඒ නිසා අපි දැන් තීරණය කර තිබෙනවා, දුඹුරු සීනි රුපියල් 200 plus VAT අගයට තමයි දෙන්නේ කියලා. අවම මිල රුපියල් 200යි. රුපියල් 200 plus VAT කියන්නේ රුපියල් 236යි. එතකොට වෙළෙඳ පොළේ රුපියල් 260ට, 270ට දෙන කෙනාට දෙන්න ප්‍රශ්නයක් නැහැ. මොකද, මෙතැන වෙළෙඳ මාෆියාවක් සිද්ධ වෙනවා. ඒ වෙළෙඳ මාෆියාවේ උදවිය කරන්නේ අපේ ආයතනයේ ඔබතුමා කියපු ප්‍රධාන මෙහෙයුම් නිලධාරියාගෙන් තොරතුරු අරගෙන වෙළෙඳ පොළට ඉක්මනින්ම දෙන එකයි. නුවන් ධර්මරත්න කියන්නේ අපේ ආයතනයේ හිටපු COO. ඔහු මිල කමිටුවේ හිටියා. මිල කමිටුවේ සිටියදී ඒ තොරතුරු එළියට දුන්නා. ඒ වාගේම ඔහු ෆේස් බුක් හරහා මාධ්‍ය කිහිපයක් අල්ලාගෙන ප්‍රචාරය කළා, පසුගිය දවස්වල සෙවනගල සීනි මෙට්‍රික්ටොන් 17,200ක් විකුණා ගන්න බැරිව තිබෙනවා කියලා. ඔබතුමා දන්නවා, මේ ව්‍යාපාර කරනකොට ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා එළියට කිව්වොත් සීනි විකුණා ගන්න බැරිව තිබෙනවා කියලා, ඒක බොරුවක්. හැබැයි, ඒක නිසා වෙළෙඳ පොළේ shut down වෙනවා. එතකොට වෙළෙඳ පොළ කල්පනා කරනවා, හරි එහෙම නම් අඩු මිලට ගන්න පුළුවන් කියලා. ඒ කාරණාව සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. මෙට්‍රික්ටොන් 33,000ක් විකුණා ගන්න බැරිව තිබියදී තමයි අපේ ආණ්ඩුව මේ ආයතනය බාර ගත්තේ. අපි මේ ආණ්ඩුව බාර ගන්නකොට එතනෝල් ලීටර් මිලියන 5.5ක් තිබුණා. එතකොට කවුරුවත් එළියට ගිහිල්ලා කිව්වේ නැහැ, මේවා විකුණා ගන්න බැරිව ඉන්නවා කියලා. හැබැයි, සීනි මෙට්‍රික්ටොන් 17,200ක් කියන්නේ විකුණන්න බැරි ප්‍රමාණයක් නොවෙයි. ඒ මෙට්‍රික්ටොන් 17,200 කියන්නේ මේ නිෂ්පාදන වාරේ ප්‍රමාණය. දැන් සීනි හදන කාලේ. මෙට්‍රික්ටොන් 17,200 කියන්නේ මේ නිෂ්පාදන එළියට යවන්න තිබිච්ච ප්‍රමාණය. එහෙම නැතිව වෙනත් ප්‍රශ්නයක් නොවෙයි. ඒකත් සෙවනගල ඒවා නොවෙයි. සෙවනගල තිබුණේ මෙට්‍රික්ටොන් 1,000යි. ඔය කියන මෙට්‍රික්ටොන් 17,000 තිබුණේ පැල්වත්තේ. ඒක නිසා අපි ඒ නිලධාරියාව ඉවත් කළා. මම කිව්වා, එයාව ඉවත් කරන්න කියලා. මම එදාම කිව්වා, ඔයා අයින් වෙන්න කියලා. මොකද, අහේ ඉඳන් කන කන උදවියට අපි ඉඩක් දෙන්නේ නැහැ. අපි ඔහුව ඉවත් කළා. ඒ වෙනුවට අපි අලුතින් නිලධාරින් බඳවා ගන්නවා. ඒක නිසා විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, මෙතැන මේ ප්‍රශ්නය අලුතින් හදපු එකක් බව. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ සමගි ජන බලවේගය නියෝජනය කරන එහේ ඉන්න නායකයා තමයි ඔය ගොවි උද්සෝෂණය කළේ. පොදුජන පෙරමුණේත් තව මන්ත්‍රීවරයෙක් හිටියා. ඒගොල්ලන්ට සීනි ප්‍රශ්නයක් නැහැ. එතැන සුගත් කියලා ගල්කොරි කරන කෙනෙකුත් ඉන්නවා. මේ උදවිය තමයි මේක කළේ. ඒක කරන්න උදව් කළේ නුවන් ධර්මරත්න. එයා සේවයෙන් ඉවත් කරපු දවසට පසුවදා තමයි උද්සෝෂණය තිබුණේ. එහෙම නැතිව උද්සෝෂණයක් තියන්න හේතුවක් නැහැ. මොකද, සෙවනගල වහලාත් නැහැ; වහන්නේත් නැහැ.

සෙවනගල plant එකක පොඩි gadget එකක් කැඩුණා. එදා ඒක හැදුවා. අදත් ඔබතුමාට ගිහිල්ලා බලන්න පුළුවන්, සෙවනගල වහලා නැහැ. මේ ඔක්කෝම දේවල්වලින් කරන්නේ මොකක්ද? අපි මේක විකුණනවා කියලා කිව්වා නම් කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි මුකුත් කරන්නේ නැතිව, රජය මේ ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ නැහැ, හෙට විකුණනවා කිව්වා නම් ඕනෑ තරම් උදවිය ඉන්නවා. එච්චරයි ප්‍රශ්නය. ඒක නිසා මේක විකුණන්නේ නැහැ. හරි පැහැදිලිව කියනවා, මේක විකුණන්නේ නැහැ කියන එක. විපක්ෂ නායකතුමා කිව්වා වාගේ 250,000කගේ ජීවිත සම්බන්ධයෙන් වන කාරණයක්, මේක.

විශේෂයෙන්ම අපි දැනට පාඩු ලබන තත්ත්වයේ තිබෙන්නේ. අපි ඒක පිළිගන්නවා. හැබැයි, මේක ලාභ ලබන තත්ත්වයට පත් කරන්න අපි සැලැස්මක් හදලා තිබෙනවා. එහිදී පළමුවැනි කාරණය තමයි, සීනි හැටියට උක් අපනයනය කරන එක. දෙවැනි කාරණය මේකයි. ගල්ඔය, පැලවත්ත, සෙවනගල කියන්නේ හොඳ සංචාරක potential එකක් තිබෙන තැන්. ඒ නිසා අපි සංචාරක කර්මාන්තය මෙතැනට ගේන්න බලාපොරොත්තු වෙනවා. ඔබතුමා දන්නවා, මේ තැන්වල ඉඳන් ඇල්ලට යන්න ගත වන්නේ විනාඩි 35යි කියලා. යාල border එකක් තිබෙනවා, කතරගමට මායිම් වෙලා තිබෙන්නේ. මේ පැල්වත්ත, බුත්තල කියන්නේ සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධයෙන් හොඳම විභවයක් තිබෙන තැන්. ස්වාභාවික වැව් 16ක් තිබෙනවා. Helicopter pad එකක් තිබෙනවා. මේකේ golf ground එකක් තිබෙනවා. ඔබතුමා දන්නවා, බුකර් කියන කොම්පැනිය තමයි මීට කලින් මේක පවත්වාගෙන ගියේ. ඒගොල්ලන් මේක ලස්සනට හදාගෙන ආවා. පසුව මේකට ආවා ආරියශීල වික්‍රමනායක මහත්මයා. මම දන්නේ නැහැ, එයාට පැල්වත්තේ මැදම කිරි කර්මාන්තශාලාවකට ඉඩ හම්බ වුණේ කොහොමද කියලා. රජයට අයිති ඉඩම පැල්වත්තේ මැද තිබෙන්නේ. එයා ඒකේ කිරි කර්මාන්තශාලාවක් දැම්මා. ඒක හොඳයි. මම ඒක නරකයි කියනවා නොවෙයි. හැබැයි, ඒ ඉඩමේ අයිතිය සම්බන්ධයෙන් අදටත් ප්‍රශ්නයක් තිබෙනවා.

ඊළඟට ඉන්නවා, දයා ගමගේ මහත්මයා. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා දන්නවා. එතුමා ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ඇමතිවරයෙක් බව. එතුමා මේක අරගෙන ඉතිරි ටික ශුද්ධ කළා. එයා කරපු ටික සම්බන්ධයෙන් වෙනම වාර්තාවක් ඕනෑ නම් මම ඒක පසුව දෙන්නම්. මෙතැනදී ඔබතුමා ඒ ගැන ප්‍රශ්නයක් අහලා නැහැ. ඒ නිසා මම ඉතා පැහැදිලිව කියනවා, මේක අපි හදනවා කියලා. මේක අපි හදනවා.

අපේ බලාපොරොත්තුව තමයි ගොවියාට ලැබෙන මුදල රුපියලක්වත් අඩු කරන්නේ නැතුව, සේවකයින්ගේ ප්‍රශ්නත් විසඳලා සාධාරණ මිලකට පාරිභෝගිකයන්ට සීනි ටික ලබා දෙන එක.

ගරු කථානායකතුමනි, මම අවසාන වශයෙන් කෙටියෙන් හෝ කියන්න ඕනෑ, සේවකයින්ට දීපු ප්‍රතිලාභ ගැන. පැල්වත්ත කර්මාන්තශාලාවට අදාළව සෘජු රැකියා කරන සේවකයින් 3,907ක් ඉන්නවා; වක්‍රව දායක වන පවුල් 5,500ක් ඉන්නවා; indirect සේවකයෝ 3,500ක් ඉන්නවා. එතැනම ඉන්නවා, 7,100ක් පමණ. ඒ ප්‍රදේශයේ පාසල් සහ පෙර පාසල් නඩත්තු කරන්න අපි රුපියල් මිලියන 14.9ක් වෙන් කරනවා. Medical

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

Centres' expenditure හැටියට අපි අවුරුද්දකට රුපියල් මිලියන 42ක් වියදම් කරනවා. Preschoolsවලට -පෙර පාසල්වලට- රුපියල් ලක්ෂ 65ක් වියදම් කරනවා. Elephant fence එකේ distance එකට - කිලෝමීටර් 207ක අලි වැටක් අපි නඩත්තු කරනවා - අපි අවුරුද්දකට වියදම් කරනවා, රුපියල් මිලියන 483ක්. ඒ එකක්වත් සුදු සීනි ආනයනය කරන මුදලාලිලා කරන්නේ නැහැ. ලංකාවට සුදු සීනි ගෙන්වන කට්ටිය මේ රටේ මිනිසුන්ට වහ කවනවා විතරයි. නමුත් අපි ඒ ප්‍රදේශයේ මේ කියන ඔක්කෝම කටයුතු කරනවා. ඒ වාගේම අපි අර්ථසාධක මුදල් සඳහා රුපියල් මිලියන 585ක් වෙන් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, සෙවණගල කර්මාන්තශාලාවට අදාළව ගත්තත් එහෙමයි. සෙවණගලට සෘජුව දායක වන සේවකයෝ 1,332යි; වක්‍රව දායක වන සේවකයෝ 1,680යි; ඔක්කෝම පවුල් 3,922යි. එහෙත් අපි transportවලට ළමයින් වෙනුවෙන් රුපියල් මිලියන 3ක් වියදම් කරනවා. ඒ වාගේම අර්ථසාධක මුදල් සඳහා රුපියල් මිලියන 40ක් වියදම් කරනවා. මේවා සේවකයන් වෙනුවෙන් කරන්නේ. Preschools පවත්වාගෙන යනවා. ඒ ළමයින්ගේ අධ්‍යාපනය ගැන සොයනවා. Medical පහසුකම් ලබා දීලා තිබෙනවා. ඒ අලි වැට සංරක්ෂණය කරනවා. සෙවණගලත් අලි වැට සංරක්ෂණය කරන්නේ අපි, ගරු කථානායකතුමනි. ඒ සියල්ලම කරමින් තමයි ඒ ආයතනය පවත්වාගෙන යන්නේ. බොහොම ස්තුතියි, ඔබතුමාගේ වැදගත් ප්‍රශ්නය ඉදිරිපත් කළාට, ගරු විපක්ෂ නායකතුමනි.

විශේෂයෙන් මම ඔබතුමාට කියනවා, මෙවැනි ප්‍රශ්නවලට අවධානය යොමු කරනවා වාගේම ඔබතුමාගේ පළාත් පාලන ආයතනවල ප්‍රශ්න ටිකත් විසඳා ගන්න කියලා. ඒ සඳහා ඔබතුමාට හැකියාව, ධෛර්යය ලැබේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, පිළිතුරේ ඉතිරි කොටස මම **සභාගත*** කරනවා. බොහොම ස්තුතියි.

***සභාමේසය මත තබන ලද පිළිතුරේ ඉතිරි කොටස:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட விடையின் எஞ்சிய பகுதி:*
*Rest of the Answer tabled:*

4. ඔව්.

දේශීය සීනි කර්මාන්තය වර්තමානයේ මුහුණ දී තිබෙන ගැටලුකාරී තත්ත්වය පරීක්ෂා කර, නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තාවක් ලබා ගැනීම සඳහා මේ වන විට නිලධාරි කමිටුවක් පත් කර ඇත. එම නිලධාරි කමිටුව විසින් අදාළ වාර්තාව ලබා දුන් පසුව, එය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.

5. සීනි නිෂ්පාදනයේ අතුරු ඵලයක් වන එතනෝල් භාවිතයෙන් සාදන ඇල්කොහොල්වලට වඩා බඩඉරිඟු හා අනෙකුත් ධාන්‍ය වර්ගවලින් සාදන ඇල්කොහොල්වල නිෂ්පාදන පිරිවැය අඩු ය. එබැවින් සීනි නිෂ්පාදනයේ අතුරු ඵලයක් ලෙස සෑදෙන එතනෝල්වල වෙළෙඳ පොළ ඉල්ලුම අඩුය.

දේශීය සීනි කර්මාන්තය වර්තමානයේ මුහුණ දී තිබෙන ගැටලුකාරී තත්ත්වය පරීක්ෂා කර, නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තාවක් ලබා ගැනීම සඳහා මේ වනවිට නිලධාරි කමිටුවක් පත් කර ඇත. එම නිලධාරි කමිටුව විසින් අදාළ වාර්තාව ලබා දුන් පසුව එය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.

6. ඔව්.

දේශීය සීනි කර්මාන්තය වර්තමානයේ මුහුණ දී තිබෙන ගැටලුකාරී තත්ත්වය පරීක්ෂා කර, නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තාවක් ලබා ගැනීම සඳහා මේ වන විට නිලධාරි කමිටුවක් පත් කර ඇත. එම නිලධාරි කමිටුව විසින් අදාළ වාර්තාව ලබා දුන් පසුව, එය අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, කාරණයක් කියන්න මට අවසර තිබෙනවා ද? මොකද, මා අහපු මූලික ප්‍රශ්නයකට ගරු ඇමතිතුමා පිළිතුර දුන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, පුළුවන්ද ඔබතුමාගෙන් ඒ ගැන විමසන්න? *[බාධා කිරීමක්]* මම ඔබතුමාගෙන් ඇහුවා, ඇයි දේශීය සීනි නිෂ්පාදනයට අදාළව සියයට 18ක VAT එකක් ගහලා, ආනයනික සීනි සඳහා රුපියල් 50ක බද්දක් ගහන්නේ කියලා. මම ඔබතුමාගෙන් ඒක අහන්න හේතුවක් තිබෙනවා. මොකද, ඔබතුමාම ප්‍රකාශ කරලා තිබෙනවා, "කරන්න දෙයක් නැහැ, ඒක IMF කොන්දේසියක්" කියලා. ඇත්ත වශයෙන්ම මම මේක පුන පුනා මේ සභාවේ කියලා තිබෙනවා. ඔබතුමන්ලා මැතිවරණ වේදිකාවක් වේදිකාවක් පාසා යෝජනා කළේ ජනතාවට හිතවාදී ගිවිසුමකට, සංශෝධිත ගිවිසුමකට ප්‍රවේශ වෙනවා කියලායි. ඉතින් මම අහන්න කැමැතියි, ඒ ජනවරමට ගරු කරමින් IMF එකත් එක්ක සාකච්ඡා කරලා මේ දේශීය සීනි කර්මාන්තයට ගහන සියයට 18 VAT එක ඉවත් කරන්න ඇයි ඔබතුමන්ලාට බැරි කියලා. ඇයි, ඒ වෙනුවෙන් සාකච්ඡා ආරම්භ කරලා යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක නොකරන්නේ?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

එම ප්‍රශ්නය ඇහුවාට බොහොම ස්තුතියි, ගරු විපක්ෂ නායකතුමා.

ඇත්තටම එතැන තිබෙන ප්‍රශ්නය මේකයි. IMF එකේ පරාමිතීන්වල අපි ඉන්නවා. IMF එකේ පරාමිතීන්වල ඉන්න අතරේ අපි සාකච්ඡා කරලා තමයි පසුගිය දවස්වල ළමා කිරිපිටි, යෝගට් ආදියට අවශ්‍ය සහයෝගය ලබා ගත්තේ. නමුත් මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. එක කර්මාන්තයක් වෙනුවෙන් විතරක් විශේෂ කරලා VAT එක සංශෝධනය කරන්න බදු නීතියක් නැහැ. පාර්ලිමේන්තුව විශාල කාලයක් නියෝජනය කරපු, අද්දැකීම් සහිත මන්ත්‍රීවරයෙකු හැටියට ඒක ඔබතුමා දන්නවා ඇති කියලා මම හිතනවා. එක කර්මාන්තයකට විතරක් VAT නිදහස් කළොත් අනික් කර්මාන්තවලටත් ඒක විශේෂයක් හැටියට කරන්න පුළුවන් කියන වැරදි පූර්වාදර්ශය ලැබෙනවා. ඒක නිසා තමයි අපි ඒක එහෙම කරන්නේ නැත්තේ. මොකද, කර්මාන්තයෙන් කර්මාන්තයට VAT සංශෝධනය කරන ප්‍රතිපත්තියක් බදු ප්‍රතිපත්තියේ නැහැ. ඔබතුමා VAT පනත බලන්න. ඒකේ තිබෙන්නේ අගය එකතු කළ බද්ද කියලා. හැබැයි, අපට එහි සාකච්ඡා කරන්න දෙයක් තිබෙනවා, මෙන්න මෙහෙම. ගොවියා උක් ගස කපලා අපේ factory එක ළඟට ගෙනෙන කල් වියදම අපි දරනවා, රුපියල් 207ක්. ගොවීන්ට මෙට්‍රික්ටොන් එකට රුපියල් 10,000ක් දෙනවා; ප්‍රවාහන වියදම් දරනවා. අන්න එතැන අගය එකතු කිරීමේ ප්‍රමාණය ඉතාම අඩුයි. හැබැයි, අපි ඒ රුපියල් 207ටත් VAT අය කරනවා. අය කරන්න වෙනවා. එතැන ගැටලුවක් තිබෙනවා. කර්මාන්තශාලාවේදී අගය එකතු වන ප්‍රමාණයට විතරක් VAT අඩු කර ගන්න පුළුවන්ද කියන එක පිළිබඳව අපි අපේ අර යෝජනා මාලාවේ ඇතුළත් කරලා තිබෙනවා. ඒ, එකක්. අපි කිව්වා නේ, යෝජනා මාලාවක් ඉදිරිපත් කරනවා කියලා, ජනාධිපතිතුමාට. මුදල් අමාත්‍යාංශය, සුරාබදු දෙපාර්තමේන්තුව, අපේ අමාත්‍යාංශවල සියලු දෙනා ඒ පිළිබඳව සාකච්ඡා කරමින් සිටිනවා. මොකක් පිළිබඳව ද? VAT එක කර්මාන්තශාලාව ඇතුළට විතරක් ඒකාබද්ධ කර ගැනීම පිළිබඳව.

දෙවන එක තමයි, අපෙන් අය කරන VAT එක නැවත රජයෙන්, භාණ්ඩාගාරයෙන් reimburse කර ගන්න පුළුවන්ද කියන කාරණය. අපි එහෙම reimburse කරන්න ගියොත්, අපට අවුරුද්දකට රුපියල් බිලියන 1.3ක් නැවත ගන්න වෙනවා, reimburse කරලා.

හැබැයි, එහෙම reimburse කර ගන්නවා නම් ඒ ප්‍රමාණයට හරියන්න අපි සැලැස්මක් ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ මොකක්ද? අප ඒක නැවත අය කර ගන්නේ කොහොමද කියන එක පිළිබඳ සැලැස්ම. මොකද අපි තවත් ප්‍රශ්නයක ඉන්නවා. ඒ තමයි, අපි අවුරුද්දට සියයට 15.5ක ආදායම් පෙන්වීමක් කරන්න ඕනෑ. එම ආදායම් ඉලක්කය අපට තිබෙනවා. අපි ප්‍රාථමික ගිණුමේ සියයට 2.5ක ශේෂයක් පවත්වාගෙන යන්න ඕනෑ. අපි ආදායම් හොයන්න ඕනෑ. ආදායම් හොයන ඉලක්කය අපට තිබෙනවා. අපි රජයක් හැටියට 2025දී අතිරේකව රුපියල් බිලියන 1,000ක ආදායමක් හොයන්න ඕනෑ. ආණ්ඩුව එහෙම reimburse කරනවා නම්, VAT එක ඒ ආයතනවලට විශේෂයක් කරලා ගෙවනවා නම්, අපි මොකක්ද කරන්න ඕනෑ? අපි ආදායම් සැලැස්මක් ඉදිරිපත් කරන්න ඕනෑ. අපි නැවත හදන මේ වාර්තාවේ එය -අපි අතිරික්ත ආදායම කොහොම හොයනවා ද කියලා- ඉදිරිපත් කරලා තිබෙනවා. අපි අපනයනය කරලා කොච්චර හොයනවා ද, අපේ සංචාරක ව්‍යාපාරයෙන් කොච්චර හොයනවා ද, අපි organic හැටියට, කාබනික පොහොරවලින් උක් වගා කරලා සීනි නිෂ්පාදනය කරලා කොච්චර හොයනවා ද කියලා සඳහන් කරලා තිබුණා. අපි අලුත් සැලැස්මකට යනවා. ඒක තමයි අපේ යෝජනාව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27 (2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක්-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔය කාරණය point of Order එකක් නොවෙයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමා උත්තර දෙනවා නම් ප්‍රශ්නයක් නැහැ නේද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, එය point of Order එකක් නොවෙයි.

ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

## II

## කිලිනොච්චියේ ශ්‍රී ලංකා-ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනය ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක කිරීම

கிளிநொச்சியிலுள்ள இலங்கை-ஜேர்மன் தொழில்நுட்பப் பயிற்சி நிறுவனத்தைச் சுயாதீன நிறுவனமாக இயங்கச்செய்தல்

RECOGNITION OF SRI LANKA-GERMAN TECHNICAL TRAINING INSTITUTE, KILINOCHCHI AS AN AUTONOMOUS INSTITUTION

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ சபாநாயகர் அவர்களே! பாராளுமன்ற நிலையியற் கட்டளை 27(2)இன்கீழ், கிளிநொச்சியிலுள்ள இலங்கை ஜேர்மன் தொழில்நுட்பப் பயிற்சி நிறுவனத்தின் இயங்குநிலையை உறுதிசெய்வதற்கான கேள்விகளை நான் கௌரவ பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரிடம் கேட்க எண்ணுகின்றேன். முதலில், கடந்த 30 ஆண்டுகளுக்கும் மேலாக நாட்டில் நடந்தேறிய யுத்தத்தினால் கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்டங்களில் பாதிக்கப்பட்ட இளைஞர், யுவதிகளின் எதிர்காலம் கருதியும், அவர்களுக்கான தொழிற் பயிற்சிகளை வழங்கும் நோக்கிலும் ஜேர்மன் அரசாங்கத்தின் 800 மில்லியன் ரூபாய் நிதி உதவியுடன், கிளிநொச்சி அறிவியல் நகரில் ஆரம்பிக்கப்பட்ட இலங்கை ஜேர்மன் தொழில்நுட்பப் பயிற்சி நிறுவனத்தின் - SLGTTI தற்போதைய இயங்குநிலை குறித்து கீழ்வரும் விடயங்களைத் தங்களின் மேலான கவனத்திற்குக் கொண்டுவர விரும்புகின்றேன்.

கிளிநொச்சி மாவட்டத்தில் இயங்கிவரும் இலங்கை ஜேர்மன் தொழில்நுட்ப பயிற்சி நிறுவனம் இன்றுவரை இலங்கை அரசாங்க வர்த்தமானிமூலம் அங்கீகரிக்கப் படவில்லை. இந்நிறுவனம் கிளிநொச்சி மாவட்டத்தில் ஆரம்பிக்கப்பட்டபோது 96 பேராக இருந்த நிரந்தரப் பணியாளர்களின் எண்ணிக்கையானது தற்போது 77ஆகக் குறைக்கப்பட்டுள்ளதுடன், 2017ஆம் ஆண்டு முதல் இன்றுவரை எந்தவொரு நிரந்தரப் பணியாளரும் நியமிக்கப்படாது, ஆளணித் தேவைப்பாட்டின் 24% மட்டுமே தற்போது நிரப்பப்பட்டுள்ளது.

இந்நிறுவனம் 2016 - 2020 வரை தேசிய பயிலுநர் கைத்தொழிற் பயிற்சி அதிகாரசபையின் கீழ் - NAITA - இயங்கிவந்த நிலையில், தற்போதும் இதனை ஒரு சுயாதீன நிறுவனமாக இயங்கவிடாது, CGTTI நிறுவனத்தின் கிளை நிறுவனமாக அதனை மாற்றும் முயற்சிகள் மேற்கொள்ளப் படுகின்றது. இது பயிற்சிநெறிகளை முறைமைப் படுத்துவதிலும், அவற்றுக்கான சான்றிதழ்களைக் குறித்த காலப்பகுதிக்குள் வழங்குவதிலும் நிர்வாக இடர்பாட்டினைத் தோற்றுவிக்கும் என்பதால் அது நிறுவனம் மீதான அபிமானத்தைப் பாதிப்பதாகவே அமையும். குறிப்பாக, SLGTTI நிறுவனத்தின் முதல்வரும், துணை முதல்வரும் CGTTI நிறுவனத்தின் பணியாளர் தொகுதியிலிருந்து தெரிவுசெய்யப் பட்டு ஒப்பந்த அடிப்படையிலேயே நியமிக்கப்படுவதால், அந்த நியமனங்களின்போது உரிய தகைமைகளோ, ஆளுமைத் திறமைகளோ கருத்திற் கொள்ளப்படாமை நிறுவனத்தின் நிர்வாக ஆளுமையையும், சுயாதீன இயங்குநிலையையும் மிக மோசமாகப் பாதிப்படையச் செய்கின்றது.

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

கொழும்பு மாவட்டத்தில் இயங்கி வருகின்ற ஜேர்மன் தொழில்நுட்ப பயிற்சி நிறுவனம் சர்வதேச தரத்திலான பயிற்சிநெறிகளையும், சான்றிதழ்களையும் வழங்குகின்ற உயர்தர நிறுவனமாக உள்ளபோதும், போரின் பாதிப்புகளை எதிர்கொண்ட கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்ட இளைஞர், யுவதிகளுக்காக ஆரம்பிக்கப்பட்ட இந்த தொழிற் பயிற்சி நிறுவனம் வளப் பற்றாக்குறைகளுடனேயே தொடர்ச்சியாக இயங்கி வருகிறது. யாரை இலக்குவைத்து இந்த நிறுவனம் ஜேர்மன் அரசாங்கத்தால் ஆரம்பிக்கப்பட்டதோ, அந்த இலக்குக் குழு நிராகரிக்கப்பட்டு வேறு பிரதேசங்களைச் சார்ந்தவர்களே இந்த நிறுவனத்தின்மூலம் தொழிற் கல்வியை நுகரக்கூடிய சூழல் உருவாக்கப்பட்டுள்ள அதேவேளை, இந்த மாவட்டத்தைச் சேர்ந்த மாணவர்களுக்கும், உத்தியோகத்தர் களுக்கும் முன்னுரிமை வழங்கப்படாமையும் இந்த நிறுவனத்தின் பின்னடைவுக்கு ஒரு காரணமாகும்.

2021ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்ட மாணவர் விடுதி நிர்மாணப் பணிகள், உரிய நிதி ஒதுக்கீடின்மையால் இன்றளவும் முழுமைப்படுத்தப்படவில்லை. தற்போது 180 வரையான மாணவர்கள் அந்த விடுதிக் கட்டடத்திலேயே தங்கவைக்கப்பட்டுள்ள நிலையில், மாணவர்களது பாதுகாப்பை உறுதிசெய்ய முடியாத நிலையும் ஏற்பட்டுள்ளது. ஆளணிப் பற்றாக்குறைக்கான உடனடித் தீர்வாக, சகோதர மொழி தெரியாத தமிழ் - சிங்களப் பயிற்சி ஆசிரியர்கள் தற்காலிகமாக நியமிக்கப்பட்டுள்ள நிலையில், அது பிற மொழி பேசும் மாணவர்களிடையே பாடங்களில் புரிதலற்ற தன்மையையும், கற்கைநெறியில் திருப்தியீனங்களையும் ஏற்படுத்தியுள்ளதுடன், அதன் காரணமாகச் சில மாணவர்கள் கற்கைநெறியைக் கைவிட்டு வெளியேறும் சந்தர்ப்பங்களும் ஏற்பட்டுள்ளன. கடந்த 2025.04.29ஆம் திகதி, SLGTTI நிறுவனத்தில் நடைபெற்ற புத்தாண்டு நிகழ்வுகளின்போது, முறையான மேலாண்மை இன்மையால் ஏற்பட்ட உள்ளக முரண்பாடுகள் இன ரீதியான மோதல்களாக மடைமாற்றப்பட்டு, CGTTIஆல் நியமிக்கப்பட்ட ஆசிரியர் ஒருவரால் தமிழ் மாணவர்கள் மூர்க்கத்தனமாகத் தாக்கப்பட்டுள்ளனர்.

மேற்படி விடயங்கள் சார்ந்து தங்களின் உயர்ந்த கரிசனையைக் கோருவதோடு, இந்நிறுவனத்தின் செயற்பாடுகளும் சேவையும் எமது மாவட்டத்திற்குத் தேவையான நிலையில் கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்ட இளைஞர், யுவதிகளின் தொழிற்திறன் விருத்தியைக் கருதிப் பின்வரும் வினாக்களைக் கேட்கின்றேன்:

01. இந்நிறுவனத்தில் எத்தனை தமிழ், சிங்கள முஸ்லிம் மாணவர்கள் தற்போது பயிற்சி பெறுகின்றார்கள் என்பதையும், அவர்கள் எந்த அடிப்படையில் பயிற்சிநெறிகளுக்கு உள்வாங்கப்படுகின்றார்கள் என்பதையும், தற்போது என்னென்ன பயிற்சிநெறிகள் நடைமுறையில் உள்ளன என்பதையும்;

02. வளத்திலும், தரத்திலும் மிகவும் தாழ்நிலையிலுள்ள கிளிநொச்சி மாவட்ட SLGTTI நிறுவனத்தை அங்கீகரிப்பதற்கான அரசாங்க வர்த்தமானி ஏன் இதுவரை வெளியிடப்படவில்லை என்பதையும்;

03. இந்நிறுவனத்தில் நீண்ட காலமாக நிலவிவரும் பௌதிக வள மற்றும் ஆளணிப் பற்றாக்குறை எப்போது நிவர்த்தி செய்யப்படும் என்பதையும்;

04. இந்நிறுவனம் உருவாக்கப்பட்ட நோக்கத்தின் அடிப்படையில் அது தொடர்ந்தும் கிளிநொச்சி மாவட்டத்தில் சுயாதீனமாகவும், தனித்தன் மையோடும் இயங்குவதற்கான அடிப்படை வசதிகள் எப்போது ஏற்படுத்திக் கொடுக்கப்படும் என்பதையும், இந்நிறுவனத்தை அங்கீகரிப்பதற்கான அரசாங்க வர்த்தமானி அறிவித்தல் எப்போது வெளியிடப்படும் என்பதையும் கௌரவ அமைச்சர் இந்த உயரிய சபைக்கு அறிவிப்பாரா?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

කිලිනොච්චි අරිවියල් නගරයේ ආරම්භ කරන ලද ශ්‍රී ලංකා ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනයේ ස්වාධීනත්වය අහිමි වීමක් සිදු නොවන අතර, කොළඹ පිහිටි ශ්‍රී ලංකා ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනය යටතේ ශාඛාවක් ලෙස ක්‍රියාත්මක වීම තුළින් එම ආයතනයට ද කොළඹ පිහිටි ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනයට හිමිව ඇති පිළිගැනීම හා සමාන උසස් පිළිගැනීමක් ලැබෙනු ඇත. එමෙන්ම වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවකට පිළිගත් පාඨමාලා සහතිකයක් ලබා ගැනීමට අවස්ථාව හිමි වී ඇත. අපි සියලුදෙනා දන්නවා "ජර්මන් ටෙක්" කියන ආයතනයට ඉහළ පිළිගැනීමක් තිබෙන බව. ඒ නිසා අපි හිතනවා, මේ සම්බන්ධතාව තුළින් කිලිනොච්චියේ පිහිටි ආයතනයටත් එම පිළිගැනීම අපට ලබා ගන්න පුළුවන් කියලා. මෙන්ම වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවකට පිළිගත් සහතිකයක් ලබා ගැනීමේ අවස්ථාව හිමි වෙනවා.

01. එම ආයතනයේ දැනට ඉගෙනුම ලබන දෙමළ, සිංහල හා මුස්ලිම් සිසුන් සංඛ්‍යාව මෙසේයි.

The number of Tamil students studying NVQ Level 4 is, 63 and NVQ Level 5 and 6, 114 students. So, a total of 177 Tamil students are currently studying there. The number of Sinhalese students studying NVQ Level 4 is, 186 and NVQ Level 5 and 6, 40 students. Therefore, the total number of Sinhalese students is 226. The number of Muslim students studying NVQ Level 4 is, 21 and NVQ Level 5 and 6, 25students. So, the total number of Muslim students is 46.

Admission to this Institute is based on calling for applications. For each course offered, students are admitted according to the placements that are available. Also, when not enough students have applied for courses, further interviews are called for and students are admitted. When the number of students who have applied for the courses exceeds the number of placements available, an entrance test as well as an interview are conducted. The courses that are currently offered include:

- Automobile Technology

  Automobile Technician

  Agricultural Machinery and Equipment Mechanic

- Construction Technology - Site Supervisor

  Draft Person

  Quantity Surveying Assistant

- Food Technology

  Baker

  Laboratory Assistant

- Mechanical Technology

  Machinist

  Welder

- Electrical and Electronic Technology

  Electrician

  Sewing Machine Mechanic

- Information and Communication Technology

  Computer Hardware and Network Technology

  ICT Technician

- Renewable Energy

- Production Technology

02. Initially, when this Institute was set up, the intention was to have it as a separate autonomous institute, but it was set up under the existing Act, No. 15 of 2017, under which the CGTTI was also established. At the time when the SLGTI in Kilinochchi was set up, there was advice from the Attorney-General's Department that the Act needs to be amended, if it is to be established as a separate autonomous institute. So, it required an amendment to the Act. But, that has not happened. It was in 2020 that the Institute was initiated and subsequently in 2022, the then Cabinet took a decision that it should be set up as a separate institute, but the necessary legal amendments were not made and the revisions had not happened. So, that is the current status and we are looking into whether that is feasible and whether amendment to the Act has to be made.

03. Sir, I went and paid a site visit to this SLGTI in Kilinochchi along with the Ministry officials. I, too, observed that there are several issues there, especially with regard to student welfare. There is equipment and possibility for expanding this Institute. However, student welfare facilities are not up to the standard, hostel facilities are not enough and there are many problems that the students are facing. So, consequent to that site visit, we have allocated funds from the Budget, 2025 to upgrade hostel facilities and student welfare facilities. Those are really a difficult issues because the site is relatively isolated.

So, there are no services around for students to access either. Therefore, we are looking into that.

We are also planning to allocate funds from the Budget, 2026 to complete the construction of the hostel in 2026. Also, there is a long-standing problem about recruitment to this Institute in Kilinochchi. That also, we are addressing, and we have, currently, submitted the required cadre to the committee that looks into recruitment. We hope to get a favorable response from it soon and to recruit the cadre that is necessary to keep this institution going and to ensure that the services offered are appropriate.

04. So, as mentioned, we are fully aware that this Institute has the capacity to do much more than it is currently doing. There are problems with regard to physical infrastructure as well the human resources and we are taking several steps right now to address those. Hopefully, by next year, we would be able to get the Institute upgraded to the required standard.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ சபாநாயகர் அவர்களே, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ பிரதம அமைச்சர் அவர்களே, நீங்கள் இந்த விடயங்கள் தொடர்பாகச் சரியான முறையில் செவிசாய்த்து இப்பதில்களை வழங்கியமைக்கு முதலில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இந்த நிறுவனத்தைத் தனித்துவமான நிறுவனமாக மாற்றுவதற்காக என்னென்ன முயற்சிகள் மேற்கொள்ளப்படுகின்றன? அது எவ்வளவு நாட்களுக்குள் நடைபெறும்? என்பது பற்றி உங்களது பதில் உரையில் சரியாகச் சொல்லாதுவிட்டாலும்கூட, அதற்கான முயற்சிகள் மேற்கொள்ளப்படுவதாகச் சொன்னது வரவேற்கத்தக்கது.

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

இப்பொழுது அந்த ஜேர்மன் தொழில்நுட்பப் பயிற்சி நிறுவனத்திற்கான அதிபரை நியமிப்பதற்கான முயற்சிகள் மேற்கொள்ளப்படுகின்றது. அங்கிருக்கின்ற அதிபர் தற்காலிகமானவராக இருக்கின்றார். ஆனால், அந்த நியமனத் திற்காக நீங்கள் வெளிப்படையாக விண்ணப்பங்களைக் கோருங்கள்! அங்கு பணியாற்றிக் கொண்டிருக்கின் றவர்களுக்கு அல்லது உள்ளகரீதியாக அப்பதவியை வழங்குவதைத் தவிர்த்து, வெளிப்படையாகத் தகுதிவாய்ந்தவர்களிடமிருந்து விண்ணப்பத்தைக் கோரி, அப்பதவியை வழங்குவதுதான் நல்ல விடயம் என்பதை நான் இந்த இடத்தில் பதிவுசெய்கின்றேன்.

அதுபோல், கௌரவ பிரதம அமைச்சர் அவர்களே, National Institute of Education, Maharagama - தேசிய கல்வி நிறுவகம், மகரகம - இலங்கையில் காணப்படுகின்ற ஒரேயொரு தேசிய கல்வி நிறுவனமாக காணப்படுவது உங்களுக்குத் தெரியும். ஆனால், நாடளாவிய ரீதியில் முகாமைத்துவம் அல்லது diploma கற்கைநெறிகளை அங்கு வழங்குகின்றபொழுது வடக்கு, கிழக் கிலே உள்ளவர்கள் பல பாதிப்புகளைச் சந்திக்கின்றார்கள்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, you can ask a small clarification, not a detailed one.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
Sir, one minute, please.

ஆகவே, அந்த ஜேர்மன் தொழில்நுட்பப் பயிற்சி நிறுவனம் தனித்துவமான நிறுவனமாக இயங்குவதற்குரிய வழிமுறைகளைச் செய்வதற்கான உங்களுடைய செயற்பாடுகளுக்கு எவ்வளவு நாட்கள் செல்லுமென்றாவது தயவுசெய்து குறிப்பிட முடியுமா?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Hon. Speaker, we need to get clearance from the Department of Management Services also about new recruitments. We have made that request and that discussion is under way.

With regard to making it a separate, autonomous institution, I would like to say that the original plan was not only to set up an institute in Kilinochchi, but in other parts of the country as well. So, we need to look at whether each of these institutions are going to be made autonomous or whether they are going to be affiliated to the Ceylon German Technical Training Institute. And, there is an advantage as well as a disadvantage to this. Because the GTZ certification and the GTZ name are well recognized, there is an advantage of it being affiliated to the CGTTI. But, at the same time, if there are going to be other institutions also set up, then, it might be easier to run them as autonomous institutions. But, we do not want to just take an *ad hoc* decision on this because though this was set up in Kilinochchi, there are lots of inadequacies, as the Hon. Member also pointed out. So, we want to make sure that whatever decision we take serves the interests of the students and also of that area adequately.

So, I cannot give an exact timeline on this because if we are to make them autonomous institutions, then, there is an amendment to the Act that has to be made. We are seeking the opinion of the Attorney-General on this. We are also having discussions and looking at both the advantages and the disadvantages, we will take the best decision and that decision has to be presented to the Cabinet also.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Speaker, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I am seeking a clarification under Standing Order No. 26(1), (2) and (3). Today, the Hon. Prime Minister presented a Note on Supplementary Allocations under Head No. 240 into relevant areas, which is permissible. But, there is something that has not been done here. Normally, under Head 240, the Suspense Account of the Ministry of Finance is used to move allocations around. But, you must give the total available for Capital Expenditure and the Recurrent Expenditure, the deduction and the final available total. Here, it is not given. You cannot move allocations from Capital Expenditure to Recurrent Expenditure, but from Recurrent Expenditure to Capital Expenditure, you can. But, the total is missing here. ඒ වැය ශීර්ෂයේ තිබෙන ප්‍රමාණය ගැන අපට දැනගන්නට අවශ්‍යයි. මම හිතන විධියට ඒක විතරයි අඩුපාඩුවක් වශයෙන් තිබෙන්නේ. එය ඉදිරියේදී අවශ්‍ය වෙයි කියන එක මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් සොයා බලා කරුණු වාර්තා කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, අමාත්‍යාංශ නිවේදනය ඉදිරිපත් කරන්න.

## ඖෂධ හිඟය නැති කිරීම සඳහා රජයේ වැඩ පිළිවෙළ: සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## மருந்து தட்டுப்பாட்டை நிவர்த்திப்பதற்கான அரசின் வேலைத்திட்டம்: சுகாதார மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று
## GOVERNMENT'S INITIATIVE TO ELIMINATE SHORTAGE OF DRUGS: STATEMENT BY MINISTER OF HEALTH AND MASS MEDIA

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් 2025.05.09 වන දින ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්නයට මම පිළිතුරු ලබා දෙනවා.

1. රජය government-to-government ක්‍රමවේදය යටතේ ඖෂධ ආනයනය කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට මේ වන විට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. එලෙස ගිවිසුම්ගත වීමට අදහස් කරන රටවල් වන්නේ, ඉන්දියාව, බංග්ලාදේශය, පාකිස්තානය, චීනය, තායිලන්තය, මලයාසියාව සහ ඉන්දුනීසියාවයි. මේ වන විට මේ රටවල් සමඟ විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා අපේ තානාපති කාර්යාල මට්ටමින් සාකච්ඡා ආරම්භ කරලා තිබෙනවා.

රෝගීන්ගේ ජීවිත ආරක්ෂා කර ගැනීමට අත්‍යවශ්‍ය වන සහ සැපයීම ප්‍රමාද වන මෙන්ම සැපයුම්කරුවන් සීමිත සංඛ්‍යාවක් සිටින ඖෂධ මේ යටතේ මිලදී ගැනීමට සාකච්ඡා කරමින් පවතී. ඒ සම්බන්ධයෙන් ලැයිස්තුවක් සියලු තානාපති කාර්යාල හා ඒ රටවලට මේ වෙනකොට ඉදිරිපත් කර තිබෙනවා. විස්තර ඇමුණුම 01හි සඳහන් කර ඇත.

*ඇමුණුම 01*

**List of the Pharmaceuticals for G to G arrangements**

**Date** : 10.04.2025
**Venue** : Office of the DGHS
**Chaired By** : DGHS
**Subject** : Review list of Pharmaceuticals which has to be supplied through G to G arrangements.
**Total items Reviewed** :313+Supply issues(3-Inj.Verapamil 5mg, Pirfenidone tab. 200 mg, Inj.Colistimethate 1Mn IU)
**Total Items Selected** : 108 + 3 = 111

| No | SR No. | Item | UOM | Monthly Requirement | Quantity Required | Pending Order status |
|---|---|---|---|---|---|---|
| 1 | 00101502 | Cefotaxime for Inj. 1g Vial | VIAL | 110,000 | 660,000 | 265,000 - Goods ready.(25 % awarded quantity) |
| 2 | 00101602 | Ceftazidime for Inj. 1g Vial | VIAL | 30,000 | 180,000 | 350,000 - 1st week of May 2025.(LM)Pre shipment(25%) |
| 3 | 00101704 | Ceftriaxone for Inj. 1g Vial | VIAL | 250,000 | 1,500,000 | 500,000-LC to be established.(2024), 900,000 -LC to be established(2025) |
| 4 | 00102001 | Imipenem+Cilastatin for Inj.500mg | VIAL | 10,000 | 60,000 | Registration expired./ LC to be established. Batch withhold. |
| 5 | 00102301 | Doxycycline Cap. 100mg | CAP | 1,133,333 | 6,800,000 | Underevaluation |
| 6 | 00102603 | Amikacin Inj. 500mg/2mL Vial | VIAL | 21,333 | 256,000 | No solution for next 03 months. |
| 7 | 00103501 | Vancomycin Inj. 500mg Vial | VIAL | 23,333 | 140,000 | 75,000 - end May 2025 |
| 8 | 00103602 | Teicoplanin Inj. 400mg Vial | VIAL | 13,000 | 78,000 | (20,000) - LC to be established. |
| 9 | 00101102 | Sulbactam + Cefoperazone Inj.2g Vial | VIAL | 2,000 | 12,000 | Underevaluation |
| 10 | 00106501 | Sodium Stibogluconte Inj.10g/100mL | VIAL | 100 | 600 | No solution for next 03 months. |
| 11 | 00107102 | Fluconazole Inj. 200mg in100mL Vial | VIAL | 5,000 | 30,000 | ETA(Verbaly confirmed)10,500 - end April 2025. |
| 12 | 00107103 | Fluconazole Cap. 200mg | CAP | 15,000 | 90,000 | No solution for next 03 months. |
| 13 | 00107401 | Amphotericin Inj. 50mg Vial | VIAL | 625 | 3,750 | No solution for next 03 months. |
| 14 | 00107501 | Nystatin Tab. 500,000IU | TAB | 50,000 | 600,000 | No solution for next 03 months. |
| 15 | 00108401 | Colistimethate for Injection | VIAL | 18,167 | 109,000 | File at MPC. |
| 16 | 00112201 | Ketoconazole Tab 200mg | TAB | 5,000 | 30,000 | File at PC. |
| 17 | 00200601 | Adenosine Inj. 6mg/2mL Vial | AMP | 1,250 | 7,500 | 2,200 - expecting 1.75 months stock. 2025 order file at PC. |
| 18 | 00200701 | Amiodarone Tab. 100mg | TAB | 175,000 | 1,050,000 | 1.3 M tabs - end May 2025. |
| 19 | 00200702 | Amiodarone Inj. 150mg/3mL Amp. | AMP | 5,833 | 35,000 | LC to be established for nine months stock. |
| 20 | 00201602 | Metoprolol Inj. 5mg/5mL Amp. | AMP | 167 | 1,000 | File at TEC. |

[ගරු නලින්ද ජයතිස්ස මහතා]

| No | SR No. | Item | UOM | Monthly Requirement | Quantity Required | Pending Order status |
|---|---|---|---|---|---|---|
| 21 | 00202001 | Sodium Nitroprusside Inj. 50mgVial | VIAL | 42 | 250 | No solution for next 03 months. |
| 22 | 00203002 | Glyceryl Trinitrate(Nitroglycerin) Inj. 50mg/10mL Vial or Amp. | VIAL | 4,500 | 27,000 | 11,250 - Indent to be issued. |
| 23 | 00203702 | Verapamil Injection 5mg in 2mL | AMP | 1,750 | 10,500 | Registration expired. |
| 24 | 00204101 | Isoprenaline Inj. 2mg/2mL Amp. | AMP | 900 | 5,400 | Re-tender |
| 25 | 00204401 | Noradrenaline Inj. 4mg/2mL Amp | AMP | 125,000 | 750,000 | 290,000 - LC established. Enhancement not procced. |
| 26 | 00204501 | Phenylephrine Inj. 10mg/1mLVial | VIAL | 350 | 2,100 | File at PU. |
| 27 | 00205201 | Protamine Sulphate Inj.50mg/5mL | VIAL | 1,000 | 6,000 | Underevaluation |
| 28 | 00205902 | Tranexamic Acid Tab/Cap 500mg | TAB | 200,000 | 1,200,000 | Indent to be issued. |
| 29 | 00206105 | Factor VIII 200-350IU Vial with vW | VIAL | 750 | 4,500 | ETA 9000 - In August 2025. |
| 30 | 00206114 | Dried Recombinant Factor VIII Fraction 200IU-350IU Vial | Vial | 1,666 | 9,996 | File at Procurement Unit. |
| 31 | 00206115 | Dried Recombinant Factor VIII Fraction 500IU Vial | Vial | 2,500 | 15,000 | Awaiting WOR.(L order) |
| 32 | 00207002 | Papaverine HCl Inj.60mg/2mL Amp. | AMP | 270 | 3,200 | Re-tender |
| 33 | 00300506 | Triclofos Oral Solution 500 mg/5 mL in 30 mL Bottle | Bot | 667 | 8,000 | No solution for next 03 months. |
| 34 | 00303307 | Paracetamol Infu. 10mg/mL,100mL | VIAL | 12,667 | 76,000 | 70,000 - LC established.. |
| 35 | 00304601 | Ethosuximide Cap 250mg | CAP | 14,167 | 85,000 | Tender close on 01.04.2025 |
| 36 | 00304702 | Flunarizine HClTab. 5mg | TAB | 1,250,000 | 7,500,000 | 2021 order and 2025 awarded to same supplier. Supplier requsted to cancel 2025 order. Therefore, 2021 order questionable. |
| 37 | 00305402 | Disulfiram Tab. 250mg | TAB | 16,667 | 100,000 | Underevaluation |
| 38 | 00305904 | Levetiracetam Inj. | VIAL | 5,250 | 31,500 | Re-tender. |
| 39 | 00402103 | Fat emulsion Inj. 20%,100mLBot. | BOT | 850 | 5,100 | File at PC. |
| 40 | 00402201 | Amino acid solution for intravenous infusion, 100mL Bottle | BOT | 800 | 4,800 | Offerd 200ml volume instead of 100ml does not comply with item specification |
| 41 | 00402704 | Thiamine Tab.100mg | TAB | 115,000 | 690,000 | Re-tender |
| 42 | 00404002 | Epoetin Inj. 4000IU PFS | PFSY | 133,333 | 800,000 | Awaiting renewal of registration.(00403802) |

| No | SR No. | Item | UOM | Monthly Requirement | Quantity Required | Pending Order status |
|---|---|---|---|---|---|---|
| 43 | 00404801 | Desferrioxamine Inj. 500mg | VIAL | 45,000 | 270,000 | 112,500- PO issued.LC to be established. File at MPC. |
| 44 | 00405301 | Human Albumin Sol. 20%, 50mLBot. | BOT | 33,333 | 200,000 | File at MPC. |
| 45 | 00406501 | Phosphate Tab. 500 mg | TAB | 13,000 | 156,000 | No registered sources. |
| 46 | 00407201 | Total Parenteral Nutrition in500mL-1,500mL Collap. Bag | BAG | 2,500 | 15,000 | 17,440- end April 2025. |
| 47 | 00500109 | Salbutamol Respiratory Sol.0.5%,15mL | VIAL | 45,833 | 275,000 | Non responsive supplier. |
| 48 | 00502501 | Pirfenidone Tablets 200mg | TAB | 91,667 | 550,000 | MRP exceeded. |
| 49 | 00600204 | Rabies Vaccine (Human use)0.5mL/1mL-Inactivated | DOSE | 250,000 | 1,500,000 | 400,000 - 2nd week April 2025.File at MPC. |
| 50 | 00600501 | Pneumococcal Vaccine SingleDose Vial (PPSV-23) | VIAL | 750 | 4,500 | 2025 Order - Delivery within 4 months (if batch release not required) within 6 months (if batch release required) supplier verbally confirmed.<br>2021 Order - Awarded qty completed on DEC/2024, balance qty of 11,000 vials to be awarded. |
| 51 | 00601101 | Varicella Vaccine 0.5mL Vial | VIAL | 75 | 450 | Awarded. |
| 52 | 00602401 | Anti Rabies Serum Inj. 1,000I.U./5mL | VIAL | 4,000 | 24,000 | 12,500 - Received. |
| 53 | 00602501 | Anti Rabies HumanImmunoglobulin 300IU Vial | VIAL | 200 | 1,200 | PO to be issued. |
| 54 | 00700601 | Biphasic Isophane Insulin(Human) Inj. 30/70 Vial | VIAL | 183,333 | 2,200,000 | 400,000 - mid April 2025 |
| 55 | 00700701 | InsulinIsophane (human) | VIAL | 6,000 | 36,000 | 30,017 - end May 2025. |
| 56 | 00700801 | Insulin Soluble (Human) Inj.1,000IU/10mL Vial | VIAL | 12,000 | 72,000 | 60,000 Vials - In April 2025 |
| 57 | 00701001 | Glucagon HCl Inj. 1 IU Vial | VIAL | 100 | 1,200 | No solution for next 03 months. |
| 58 | 00701603 | Dexamethasone Tab. 4 mg | TAB | 45,000 | 270,000 | all the pending orders and re-tendered |
| 59 | 00702401 | Hydroxyprogesterone Inj.250mg/1mL | AMP | 1,500 | 9,000 | No solution for next 03 months. |
| 60 | 00703001 | Tetracosactrin Inj.250mcg/1mL Amp. | AMP | 217 | 1,300 | 2023 Order - awaitng WOR.<br>2025 Order - file at PC |
| 61 | 00703202 | Somatropin for Inj. 2IU-30IU | IU | 37,333 | 224,000 | 109,998 - LC to be established. |

| No | SR No. | Item | UOM | Monthly Requirement | Quantity Required | Pending Order status |
|---|---|---|---|---|---|---|
| 62 | 00703301 | Desmopresin Tab. 100mcg | TAB | 10,000 | 60,000 | DPC decided to testing pre-shipment sample test report from WHO pre-qualified lab. But, supplier has submitted pre-shipment test report from Indian Analytical Laboratory, which is an NABL- accredited lab. Hence file sent to PC on 19/3/25 |
| 63 | 00703304 | Desmopressin acetate NasalSpray 10mcg/metered spray( 50 MS) | VIAL | 700 | 4,200 | Indent to be issued. |
| 64 | 00704502 | Triamcinolone Acetonide Inj (preser. free) 40mg/mLVial | VIAL | 250 | 1,500 | Underevaluation |
| 65 | 00705501 | Diazoxide tab. 50mg | TAB | 1,000 | 12,000 | Awaiting WOR. |
| 66 | 00706201 | Dutasteride Cap. 0.5 mg | CAP | 5,000 | 30,000 | File at PU. |
| 67 | 00706601 | Estradiol Valerate Tab. 1mg | TAB | 3,000 | 18,000 | Re-tender |
| 68 | 00800501 | Metoclopramide Tab. 10mg | TAB | 183,333 | 1,100,000 | 2025 Order - re tendered, File at PC for decision. 2024 Order - re tendered, New tender to be called |
| 69 | 00800502 | Metoclopramide Inj.10mg/2mLAmp. | AMP | 183,333 | 1,100,000 | Withhold the Product. |
| 70 | 00800701 | Ranitidine Inj. 50mg/2mL Amp. | AMP | 108,333 | 650,000 | Indent to be issued |
| 71 | 00801001 | Mesalazine tab. 400mg | TAB | 25,000 | 150,000 | Not awarded yet. |
| 72 | 00802402 | Macrogol 3350/4000 (10g-13.125g of PEG) Oral powder sachets (with or without electrolytes) | Sach | 1,583 | 9,498 | SR change.New item.File at PU. |
| 73 | 00802501 | Terlipressin Acetate Inj.1mg Vial/Amp. | VIAL | 3,500 | 21,000 | 2025 Order - Tender closed, File at PU. |
| 74 | 00902101 | Fluorescein Sodium Inj.10%, 2mL-5mL | VIAL | 483 | 2,900 | Fiel at TEC. |
| 75 | 00904501 | Olopatadine HCl Eyedrops 1mg/mL, 5mL Dropper Bot. | BOT | 3,000 | 18,000 | Award only 10% from the order. |
| 76 | 01200201 | Chlorambucil Tab. 2mg | TAB | 2,500 | 15,000 | Awaiting WOR |
| 77 | 01200301 | Cyclophosphamide Tab. 50mg | TAB | 17,500 | 105,000 | File at PU. |
| 78 | 01201202 | Epirubicin HCl Inj.50mg/25mL Vial | VIAL | 750 | 4,500 | 2025 Order - Indent to be issued |
| 79 | 01201401 | Mitomycin for Inj. 2mg Vial | VIAL | 1,000 | 6,000 | File at Evaluation. |
| 80 | 01201701 | Cytarabine Inj. 100mg/5mL Vial(Not for Intrathecal use) | VIAL | 170 | 1,020 | 3 tenders have been called. No responsive bidders. File under evaluation. |

| No | SR No. | Item | UOM | Monthly Requirement | Quantity Required | Pending Order status |
|---|---|---|---|---|---|---|
| 81 | 01201702 | Cytarabine Inj. 100mg/mLVial ,Preservative free | VIAL | 183 | 1,100 | 3 tenders have been called. No responsive bidders. File at PU award/other decision. |
| 82 | 01201902 | Fluorouraci Inj. 250mg/10mLVial | VIAL | 100 | 600 | File at evaluation. |
| 83 | 01202001 | Gemcitabine HClInj. 200mg Vial | VIAL | 500 | 3,000 | 2025 Order - file submitted to PC on 04.11.2024 after completion of evaluation, File sent to legal office on 16/01/2025 |
| 84 | 01202204 | Methotrexate Inj. 1g/10mL Vial | VIAL | 1,100 | 13,200 | 2024 additonal order - Awarded, Awaiting WOR to issue PO. |
| 85 | 01202701 | Etoposide Cap.100mg | CAP | 400 | 2,400 | 2025 Orders - Po to be issued |
| 86 | 01202703 | Etoposide Cap. 50mg | CAP | 150 | 900 | 2022, 2023, 2024 orders - file at PU. 2025 - 1st tender cancelled, 2nd tender closing on 06.05.2025 ( No registered suppliers for the item. |
| 87 | 01203401 | Temozolomide Cap. 100mg | CAP | 1,600 | 9,600 | Underevaluation |
| 88 | 01203601 | Carboplatin inj.150mg/15mLVial with Diluent | VIAL | 375 | 2,250 | 25-under evaluation 24 ADD-not recommended the sole bidder.Tender to be re-called |
| 89 | 01203602 | Carboplatin Inj. 450mg/45mLVial | VIAL | 2,100 | 12,600 | 24-LC to be established. Contract pending from SPC. ETA - 2 months from LC |
| 90 | 01203901 | Procarbazine Cap. 50mg | CAP | 200 | 2,400 | ile at evaluation. |
| 91 | 01204401 | Imatinib Mesilate Tab/Cap100mg | CAP | 60,000 | 360,000 | 2025 Order - awarded, awaiting bond verification. 2021 Order - file sent to PC on 25.02.2025 |
| 92 | 01206101 | Filgrastim Inj 300mcg in0.5mL-1mL, PFS/Vial | VIAL | 22,500 | 135,000 | 2025 additonal order - RQ tender closing on 27.03.2025, underevluation |
| 93 | 01206802 | Tamoxifen Tab. 20mg | TAB | 150,000 | 900,000 | LC to be established. |
| 94 | 01207301 | Goserelin Acetate Implant3.6mg | IMPL | 1,900 | 11,400 | Underevaluation. |
| 95 | 01208501 | Abiraterone Acetate Tab.250mg | TAB | 50,000 | 300,000 | Indent to be issued. |
| 96 | 01210101 | Mesna Inj. 200mgin 2mL | VIAL | 3,000 | 18,000 | File at Evaluation. |
| 97 | 01301201 | Clotrimazole Pessaries 100mg | PESS | 17,000 | 102,000 | PO to be issued. |

| No | SR No. | Item | UOM | Monthly Requirement | Quantity Required | Pending Order status |
|---|---|---|---|---|---|---|
| 98 | 01301802 | Tolterodine SR Cap. 2mg | CAP | 10,000 | 60,000 | PO to be issued. |
| 99 | 01301901 | Solifenacin Tab. 5mg | TAB | 4,000 | 24,000 | No solution for next 03 months. |
| 100 | 01302001 | Oxybutynine Tab. 2.5mg | TAB | 30,000 | 180,000 | MRP exceeded. No offers for 2025. |
| 101 | 01500401 | Etomidate Inj. 20mg/10mLVial/Amp. | VIAL | 300 | 1,800 | File at PU. |
| 102 | 01501001 | GlycopyrrolateInj. 200mcg/mL Vial | AMP | 4,000 | 24,000 | Underevaluation |
| 103 | 01501701 | Flumazenil Inj. 500mcg/5mLVial/Amp. | VIAL | 110 | 660 | File at PU. |
| 104 | 01501801 | Naloxone Inj. 400mcg/mL Amp. | AMP | 1,000 | 6,000 | Tender cancelled. |
| 105 | 01501901 | Dantroline Sodium Inj. 20mg Vial | VIAL | 29 | 350 | No registered supplier. To be PU. |
| 106 | 01502104 | Lidocaine Topical aerosol10%, 50mL | BOT | 450 | 2,700 | Awaiting WOR. |
| 107 | 01502105 | Lidocaine HCl Gel 2%,30g Tube | TUBE | 40,000 | 240,000 | 2025 Order - Awarded, Indent to be issued. |
| 108 | 01502201 | Lidocaine 2% + Adrenalin1:80,000 Inj. 30mL Vial | VIAL | 35,000 | 210,000 | LC to be established. |
| 109 | 01503001 | Dexmedetomidine HCl | VIAL | 400 | 2,400 | Clarification to be obtained from supplier to issue PO. |
| 110 | 00000803 | Morphine Tab. 30mg | TAB | 25,000 | 150,000 | No solution for next 03 months. |
| 111 | 00000810 | Morphine Sulphate Oral solu.2mg/1mL, 100mL Bott. | BOT | 125 | 750 | Re - tender, No registeres sources |

සම්මත තරගකාරී ප්‍රසම්පාදන ක්‍රමවේදයක් තිබියදී මේ government-to-government ගිවිසුම හරහා ඖෂධ ආනයනය කරන්නට රජයට සිදු වෙන්නේ ඇයි කියන කාරණය ගැන කථා කළොත්, අපේ සැපයුම්දාමයේ බරපතළ ප්‍රශ්න තිබෙන බව ඔබතුමාත් දන්නවා ඇති, ගරු විපක්ෂ නායකතුමනි. සමහර ඖෂධ තත්ත්වයෙන් අසමත් වීම මත භාවිතයෙන් ඉවත් කරන්නට සිදු වෙනවා. ඒ වාගේම නියමිත කාලයට සැපයුම් කිරීමේ නොහැකියාව නිසා සැපයුම්කරුවන්ට සම්පූර්ණයෙන්ම සැපයුම් නතර කරන්නට සිදු වෙනවා. ඖෂධ 37කට ලියාපදිංචි සැපයුම්කරුවන් නැහැ. සමහර වෙලාවට ලියාපදිංචි සැපයුම්කරුවන් ලංසු තැබීමට ඉදිරිපත් වෙන්නේත් නැහැ. සැපයීමේ සහ සැපයුම්දාමයේ පවතින ගැටලු නිසා වෛද්‍ය සැපයුම් අංශයේ අත්‍යවශ්‍ය ඖෂධ සහ වෛද්‍ය උපාංගවල තොග තත්ත්වයන්ගේ ඌනතා මතු වෙමින් පවතින බව නිරීක්ෂණය වුණා. ඒ නිසා ඖෂධ හදිසියේ මිලදී ගැනීම සඳහා රජයන් අතර සම්බන්ධීකරණයෙන් ක්‍රමවේදයක් සකස් කිරීම සුදුසු බව තමයි නිරීක්ෂණය වුණේ.

ඒ අනුව නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් හා දේශීය නිෂ්පාදකයින්ට ප්‍රමුඛතාව ලබා දෙමින් කටයුතු කරන අතරම, රට තුළ ඖෂධ හිඟයක් යළි ඇති වීම වළක්වා ගැනීමේ අරමුණින් විකල්ප ක්‍රමවේදයක් ලෙස සහ buffer stock එකක් පවත්වා ගැනීම සඳහා තමයි මේ කටයුත්තට අපට යන්න සිද්ධ වෙන්නේ.

2. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශය මඟින් හිඟ ඖෂධ සම්බන්ධ යාවත්කාලීන තොරතුරු ලබා ගැනීම සඳහා "ස්වස්ථ" නමින් තොරතුරු පද්ධතියක් පවත්වා ගෙන යන අතර, එය දිනපතා යාවත්කාලීන පද්ධතියක් ලෙස සකස් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මධ්‍යම ඖෂධ ගබඩාවේ තිබෙන සමහර හිඟ ඖෂධ වාගේම ප්‍රාදේශීය මට්ටමින් පවතින හිඟ ඖෂධ පිළිබඳවත් අපි නිරන්තරයෙන් තොරතුරු වාර්තා කරනවා. ඒ ප්‍රමාණය, ඒ ඖෂධය විටින් විට වෙනස් වන නිසා මම දැනට පවතින ලැයිස්තුවකුත් ඉදිරිපත් කරන්නම්.

දේශීය වශයෙන් ඖෂධ නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා රජය දේශීය නිෂ්පාදනය වෙනුවෙන් buyback guarantee ලබා දී ඇති අතර, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිෂ්පාදන ධාරිතා වැඩි කර ඇත. රජයේ රෝහල් සඳහා අවශ්‍ය වන සියලුම ඖෂධ දේශීය වශයෙන් නිෂ්පාදනය දැනට ප්‍රායෝගික නොවන බව සඳහන් කරන අතර, නිෂ්පාදනය කළ යුතු ඖෂධ වර්ග සහ ඒවායේ ප්‍රමාණ ඉහළ නැංවීම සඳහා හැකි සෑම පියවරක්ම ගනිමින් පවතිනවා.

මේ අවස්ථාවේදීත් අපි SPMC එක හරහා වැඩි ඖෂධ ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්න උත්සාහ කරනවා. ඒ වාගේම SPMC එක දේශීය නිෂ්පාදකයන් සමඟ හවුලේත් මේ කටයුත්තට එළඹිලා තිබෙනවා. ඊට අමතරව දේශීය නිෂ්පාදකයන් තනිව ඉදිරියට ගැනීමට කටයුතු කරන අතර, ඔවුන්ට සහනයක් සහ වගකීමක් හැටියට තමයි මේ buyback guarantee එක සපයා තිබෙන්නේ.

3. හැකි සෑම අවස්ථාවකදීම දේශීය ඖෂධ නිෂ්පාදනය ඉහළ නැංවීමට කටයුතු කිරීම රජයේ අපේක්ෂාව වන අතර, දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන ඖෂධ මිලදී ගැනීම නවතාලීමක් හෝ සීමා කිරීමක් මෙම G2G එකඟතාව මඟින් සිදු නොවන බව සඳහන් කරන්න කැමැතියි. එමෙන්ම කර්මාන්තයේ යෙදෙන අය සහ ආනයනකරුවන් අධෛර්යවත් කිරීමේ අරමුණක් මෙහි නැහැ. මේ සම්බන්ධයෙන් මම අවස්ථා ගණනාවකදීම මෙයට අදාළ ආනයනකරුවන්, දේශීය නිෂ්පාදකයන් වාගේම joint ventures කරන අයගේ chambers ගෙන්වලා වෙන වෙනම සාකච්ඡා කළා; එකට සාකච්ඡා කළා. හිඟ විය හැකි ඖෂධ පිළිබඳව ලැයිස්තුවක් ඒ අයට ලබා දුන්නා. ඔවුන්ගේ ප්‍රායෝගික ගැටලු පිළිබඳව සාකච්ඡා කළා. ඔවුන්ට අපි සහතික කර කියනවා, පවතින තාවකාලික තත්ත්වය මත තමයි අපට මේ G2G එකඟතාවට යන්න සිද්ධ වුණේ කියලා.

ඔවුන්ට හෙටත් තමන්ගේ ක්‍රියාවලිය කඩිනම් කරලා ඖෂධ ආනයනය කරන්න පුළුවන්කම තිබෙනවා නම්, ඖෂධ සැපයීම කඩිනම් කරන්න පුළුවන්කම තිබෙනවා නම්, අපට මේ ක්‍රියාවලියට යෑමේ වුවමනාවක් ඇති වෙන්නේ නැහැ. ඒ නිසා අපි ඔවුන්ට ඒ සහතිකය ලබා දීලා තිබෙනවා. ඔවුන්ගේ පැත්තෙන් ඒ ක්‍රියාවලිය කඩිනම් වන තරමටම අපට මේ G2G එක balance කරන්න පුළුවන්.

4. මේ සඳහා පහත සඳහන් අමාත්‍යාංශ නියෝජනය වන පරිදි ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීමට 2025 මැයි 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇත. අමාත්‍ය මණ්ඩල තීරණය සහ ඊට අදාළ අනෙකුත් ලේඛන ඇමුණුම 02 වශයෙන් **සභාගත*** කරමි.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

එම කමිටුව විසින් අනුමත කරනු ලබන වඩාත් විනිවිද ක්‍රමවේදයක් හරහා මෙම ඖෂධ මිලදී ගැනීමට හා අදාළ ක්‍රියාවලිය අවසන් වීමෙන් පසුව ඒ පිළිබඳව නැවත අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කරනවා.

කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

i. මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.

ii. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

iii. කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය.

iv. වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය.

v. විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යාංශය.

vi. නීතිපති දෙපාර්තමේන්තුව විසින් නම් කරනු ලබන නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු.

ඒ සියලු අංශ ආවරණය වන හැටියට රාජ්‍ය නිලධාරින්ගෙන් සමන්විත කමිටුවක් විසින් තමයි ක්‍රමවේදය තීන්දු කරනු ලබන්නේ.

G2G ක්‍රමවේද ඔස්සේ ඖෂධවල ගුණාත්මකභාවය ජාතික ඖෂධ නියාමන අධිකාරිය - NMRA එක - මඟින් සහතික කර ගැනීමට කටයුතු සිදු කරන අතර, ඖෂධ මිලදී ගැනීමේ ක්‍රියාවලිය රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව - SPC - මඟින් සිදු කරනවා. ඒ නිසා කිසිවෙකු මේ ඖෂධ සම්බන්ධව බිය විය යුතු නැහැ. NMRA එකේ ලියාපදිංචි ඖෂධම තමයි අපි මේ හරහාත් ගෙන්වා ගැනීමට කටයුතු කරන්නේ.

5. ගරු විපක්ෂ නායකතුමනි, ඖෂධ සැපයීම සම්බන්ධ ප්‍රශ්නයට අමතරව මේ යටතේ ඔබතුමා අසා තිබෙනවා, Elekta Infinity පිළිකා විකිරණ ප්‍රතිකාර යන්ත්‍ර මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සම්බන්ධයෙන්. ඒක වෙනමම ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමනි, 2013 වර්ෂයේ ඉඳලා අදියර දෙකක් යටතේ Elekta Limited ආයතනයෙන් ඒ යන්ත්‍ර මිලදී ගන්න කටයුතු කරනවා. පළමුවැනි අදියර යටතේ මහරගම අපේක්ෂා රෝහල, මහනුවර ශික්ෂණ රෝහල, කරාපිටිය ශික්ෂණ රෝහල, යාපනය තෙලිප්පලෙයි මූලික රෝහල, මඩකලපුව ශික්ෂණ රෝහල සඳහා ඒ යන්ත්‍ර ලබා දෙන්නත්, දෙවැනි අදියර යටතේ කුරුණෑගල ශික්ෂණ රෝහල, හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහල, අනුරාධපුර ශික්ෂණ රෝහල, බදුල්ල ශික්ෂණ රෝහල, රත්නපුර ශික්ෂණ රෝහල යන රෝහල්වලටත් ඒ යන්ත්‍ර ලබා දෙන්න කටයුතු කරනවා. එතැනදී පළමුවැනි අදියර ක්‍රියාත්මක වෙමින් පවතින වෙලාවේදී ගැටලුවක් පැන නැඟුණා. ඒ යන්ත්‍රවල ගුණාත්මක තත්ත්වය, තාක්ෂණය ඉහළ නැංවීම සම්බන්ධයෙන් ඒ ක්ෂේත්‍රයට සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරුන් අතර යම් යම් මත තිබුණා. ඒ නිසා ඇත්තටම දෙවැනි අදියර ප්‍රමාද වුණා.

දෙවැනි අදියරේ ගිවිසුම අපි අත්සන් කළා. ඒ අනුව හම්බන්තොට, බදුල්ල සහ රත්නපුර කියන රෝහල්වලට Elekta Infinity Linear Accelerator යන්ත්‍ර ස්ථාපනය කරන්න අවශ්‍ය කරන බංකර් හදන්න 2025 අය වැයෙන් අපි මුදල් වෙන් කළා. ඒ අනුව ඉදිරි මාස 4 ඇතුළතදී ඒ වැඩ කටයුතු අවසන් කරලා, මේ වසර අවසන් වෙන්න ප්‍රථම හම්බන්තොට, බදුල්ල සහ රත්නපුර යන රෝහල් තුනෙහි ඒ යන්ත්‍ර තුන ස්ථාපනය කරන්න බලාපොරොත්තු වෙනවා.

අනුරාධපුරය සහ කුරුණෑගල ශික්ෂණ රෝහල්වල බංකර් දෙක 2025 අවුරුද්ද අවසානයේදී තමයි හදලා ඉවර කරන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ අනුව 2026 පළමුවැනි මාස 4 අවසන් වෙන්න කලින් එම යන්ත්‍ර ස්ථාපනය කරන්න පුළුවන්කම ලැබේවි. දැනට ඒ Elekta Infinity Linear Accelerator යන්ත්‍ර 5 ලබා ගැනීම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ලියාපදිංචි ක්‍රියාවලිය ආරම්භ වෙලා තිබෙන්නේ. ඇත්තටම ඒ registration එකට කාලය ගත වන නිසා අපි WOR එකක් දීලා ඒ යන්ත්‍ර නියමිත කාලයේදී - බංකර්වල වැඩ අවසන් වෙන්න නියමිත කාලයට සමගාමීව - ගෙන්වා ගන්න බලාපොරොත්තු වෙනවා.

6. මේ සඳහා දීර්ඝ විස්තරයක් ඇමුණුම 03හි දක්වා තිබෙනවා.

ඇමුණුම 03

**ශ්‍රී ලංකාවේ පිළිකා රෝගීන් සඳහා ඉහළ ගුණත්මකභාවයකින් යුත් අධි ශක්ති විකිරණ චිකිත්සක උපකරණ හා අදාළ යටිතල පහසුකම් සැපයීම සඳහා වූ ව්‍යාපෘතියෙහි වත්මන් තත්ත්වය**

01. 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද අදියර 02ක් යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය යටතේ ඉහළ ගුණත්වයකින් යුත් අධි ශක්ති විකිරණ චිකිත්සක උපකරණ සැපයීම මහ බ්‍රිතාන්‍යයේ ඉලෙක්ටා සමාගම (ELEKTA LIMITED) විසින් සිදුකරනු ලබයි.

පළමු අදියර යටතේ
- ❖ මහරගම අපේක්ෂා රෝහල
- ❖ මහනුවර ශික්ෂණ රෝහල
- ❖ කරාපිටිය ශික්ෂණ රෝහල
- ❖ තෙලිප්පලෙයි මූලික රෝහල (යාපනය)
- ❖ මඩකලපුව ශික්ෂණ රෝහල

ආවරණය වේ.

දෙවන අදියර යටතේ
- ❖ කුරුණෑගල ශික්ෂණ රෝහල
- ❖ හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහල
- ❖ අනුරාධපුර ශික්ෂණ රෝහල
- ❖ බදුල්ල ශික්ෂණ රෝහල
- ❖ රත්නපුර ශික්ෂණ රෝහල

ආවරණය වේ.

02. ව්‍යාපෘතියෙහි පළමු අදියර යටතේ රෝහල් හි අධි ශක්ති විකිරණ චිකිත්සක උපකරණ ස්ථාපනය කිරීම සඳහා වන කොන්ක්‍රීට් බංකර් ඉදිකිරීම අවසන් කර පහත සඳහන් පරිදි අදාල යන්ත්‍ර ස්ථාපනය කර ඇත.

| සැපයුම්කරු /කොන්ත්‍රාත්කරු | අංක | අධි ශක්ති විකිරණ චිකිත්සක උපකරණ විස්තරය | අදියර 1 | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | 1 | 2 | 3 | 4 | 5 | |
| | | | මහරගම අපේක්ෂා රෝහල | මහනුවර ශික්ෂණ රෝහල | කරාපිටිය ශික්ෂණ රෝහල | තෙලිප්පලෙයි මූලික රෝහල | මඩකලපුව ශික්ෂණ රෝහල | එකතුව |
| ඉලෙක්ටා සමාගම | 1 | Triple Energy linear Accelerator | 1 | -- | -- | -- | -- | 1 |
| | 2 | Dual Energy linear Accelerator | -- | 1 | 1 | 1 | 1 | 4 |
| | 3 | Fixed Energy linear Accelerator | 3 | 1 | -- | -- | -- | 4 |
| ලබා දී ඇති මුළු අධි ශක්ති විකිරණ චිකිත්සක උපකරණ | | | 4 | 2 | 1 | 1 | 1 | 9 |

03. මෙම ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ හම්බන්තොට, බදුල්ල හා රත්නපුර රෝහල්වල නවීන තාක්ෂණයෙන් යුත් ELEKTA Infinity Linear Accelerator යන්ත්‍ර ස්ථාපනය සඳහා වන බංකර් නවීකරණ කටයුතු 2025 අයවැය ප්‍රතිපාදන යටතේ ආරම්භ කොට ඇති අතර, තවත් මාස 04කින් ඒවායේ වැඩ අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව එම රෝහල් 03 සඳහා Infinity Linear Accelerator යන්ත්‍ර මෙම වර්ෂය අවසන් වීමට ප්‍රථම ස්ථාපනය කිරීමට නියමිතය.

04. තවද, අනුරාධපුර සහ කුරුණෑගල රෝහල්වල බංකර් දෙකෙහි වැඩ 2025 වසර අවසාන වීමට ප්‍රථම නිම කිරීමට අපේක්ෂිත අතර ඒ අනුව Infinity Linear Accelerator යන්ත්‍ර එම රෝහල් දෙකෙහි ස්ථාපනය කිරීම 2026 අප්‍රේල් මාසය තුළ අවසන් කිරීමට හැකිවනු ඇත.

05. ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ ELEKTA Infinity Linear Accelerator යන්ත්‍ර 05 ලබා ගැනීම සඳහා 2025.01.20 දින අදාළ සැපයුම්කාර සමාගම සමග ගිවිසුම් ගතවී තිබුණ ද එම යන්ත්‍ර ආනයනය සඳහා අවශ්‍ය වන ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) ලියාපදිංචිය මෙතෙක් ලැබී නැති අතර එම ලියාපදිංචිය ලැබුණු වහාම අවශ්‍ය ණයවර ලිපි විවෘත කිරීම සිදු කිරීමට නියමිතය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට පොඩි scenario එකක් කියන්නම්. නමුත් මේක ඔබතුමා යටතේ සිදු වෙනවාය කියලා මම කියන්නේ නැහැ. මේක එහෙම කථාවක් නොවෙයි. ගරු ඇමතිතුමනි, ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ ඖෂධ ලබා ගැනීම කරන්න පුළුවන්. නමුත්, ඒක කුමක් හෝ හේතුවකින් කුමක් හෝ කෘත්‍රිම හස්තයක් තුළින් නතර වෙනවා. නතර වුණාට පස්සේ ඒ අදාළ රෝහලේ ප්‍රධාන වෛද්‍යවරුන්ට පුළුවන්, direct එම ඖෂධ ලබා ගන්න. ඒ කියන්නේ, ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව. මම මේ ඔබතුමාට කියන්නේ ඒ ගැන සොයා බලන්න කියලායි. මම චෝදනා මුඛයෙන් කථා කරනවා නොවෙයි. මේක සෞඛ්‍ය සමාජයේ කථා වන දෙයක්.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

එතකොට හිතාමතාම ප්‍රසම්පාදන ක්‍රමවේදය හිර කරලා, විශේෂයෙන්ම drugs registration ක්‍රමවේදය තුළ යම් යම් ප්‍රශ්න ඇති කරලා, ප්‍රසම්පාදන ක්‍රමවේදය බැහැර කරලා තමන්ගේ අභිමතයට මිලදී ගැනීමේ - purchase කිරීමේ - ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමක් පිළිබඳව මේ කාලයේ විතරක් නොවෙයි, පසුගිය කාලය පුරාවටම කථා වුණා. මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, මේ කථාවේ සත්‍යයක් තිබෙනවාද, මෙහෙම දෙයක් වෙනවාද කියලා. විශේෂයෙන්ම අපි විශ්වාස කරනවා, ප්‍රසම්පාදන ක්‍රමවේදය තුළින්ම ඖෂධ මිලදී ගැනීම ක්‍රියාත්මක වීම රටටත්, ජනතාවටත් වඩාත් යෝග්‍යයි කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නයට උත්තරයක් දෙන්නම්. ඇත්තටම මේ මොහොතේ රෝහල් මුහුණපාන ඖෂධ හිඟයට හේතු වෙලා තිබෙන්නේ පසුගිය මාස කිහිපයේ ඇති වුණු අර්බුදයක් නොවෙයි. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා කියපු registration එකේ, procurement එකේ ප්‍රශ්න වාගේම මම කිව්වා වාගේ ඖෂධ 37ක් ලියාපදිංචි නොවීම, ලියාපදිංචි වී සිට ටෙන්ඩරයට ඉදිරිපත් නොවීම, ටෙන්ඩරය අරගෙන නියමිත කාලයේදී ලබා නොදීමත් එයට බලපා තිබෙනවා. පසුගිය දවස්වල ඉන්සියුලින් ප්‍රශ්නය ආවේ ටෙන්ඩරය ලබා ගත් පුද්ගලයා නියමිත කාලයේ, නියමිත ප්‍රමාණයෙන් එම ඖෂධය ලබා නොදීම නිසායි. ඒ නිසා අපට ලක්ෂ 2ක් enhance කරලා ගෙන්වන්න සිද්ධ වුණා. ගරු කථානායකතුමනි, මේ වසරේ අඛණ්ඩව රෝහල්වලට ඖෂධ සපයන්න නම් ගිය අවුරුද්දේ මුල් මාස කිහිපය තුළ ඒ ටෙන්ඩර් ක්‍රියාවලිය අවසන් කරලා තිබෙන්න ඕනෑ. මම ඔබතුමාට කියන්න ඕනෑ, SPC එකෙන් ටෙන්ඩර් කරන්න ඕනෑ ඖෂධ 462න් ගිය අවුරුද්දේ මුල් මාස 5 ටෙන්ඩර් ක්‍රියාවලිය අවසන් කරලා තිබුණේ ඖෂධ 67ක පමණයි කියන එක. මේ මුල් මාස 5 අපි සමත් වෙලා තිබෙනවා, ඖෂධ 267ක ටෙන්ඩර් ක්‍රියාවලිය අවසන් කරලා ඒ ඇණවුම් නිෂ්පාදනය සඳහා ලබා දෙන්න. මොකද, නිෂ්පාදනයටත් දවස් 60ත්, 90ත් අතර කාලයක් ගත වෙනවා. Registration එකේ තිබුණු ප්‍රශ්නය සැලකිය යුතු මට්ටමකින් නිරාකරණය කර ගනිමින් පවතිනවා, NMRA එක හරහා. ඒ නිසා මේ ක්‍රියාවලිය විධිමත් වෙමින් පවතිනවා,

ගරු විපක්ෂ නායකතුමනි. අන්න ඒ අතරමැදි කාලයේදී තාවකාලික විසඳුමක් හැටියට තමයි අපට මේ G2G ක්‍රියාවලියට යන්න සිද්ධ වෙන්නේ. එහිදී අපි විනිවිදභාවය ආරක්ෂා කරනවා. මේ වෙනකොටත් ආණ්ඩු-ආණ්ඩු අතර - government-to-government - කෙරෙන කටයුත්තට ඒ සමහර රටවල් එකඟතාව පළ කරලා තිබෙනවා, අඩු මිල ගණන්වලට නියමිත කාලයට ඒ ඖෂධ ලැයිස්තුව සපයන්න පුළුවන් කියලා. ඒ කියන්නේ, තවදුරටත් අපි මේකේ පාරදෘශ්‍යභාවය ආරක්ෂා කරමින් යනවා. කිසිසේත්ම අපේ දේශීය නිෂ්පාදකයන් බිය විය යුතු නැහැ. මම ආනයනකරුවන්ටත් කියන්න ඕනෑ, ඔවුන්ගේ සැපයුම් ඉක්මන් කරන්න-කරන්න අපට මේ government-to-government ක්‍රියාවලියේ දිගටම යන්න ඕනෑ වෙන්නේ නැති බව.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා.

## අලිමංකඩ ලුණු ලේවායේ ගැටලු: කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## ஆனையிறவு உப்பளப் பிரச்சினைகள்: கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரினது கூற்று
## ISSUES ARISEN AT ELEPHANT PASS SALTERN: STATEMENT BY MINISTER OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා පසුගිය පාර්ලිමේන්තු සතියේ -2025.05.23 දින- මතු කළ ප්‍රශ්නයට මා පිළිතුරු ලබා දෙනවා.

1. ගරු කථානායකතුමනි, එය කොහෙත්ම දෙමළ ජනතාව මත කරන සැලසුම් සහගත මර්දනයක ස්වරූපයක් නොවෙයි.

   ජාතික ලුණු සමාගම නිපදවන ලුණු සඳහා භාවිත කරන සන්නාමය වනුයේ "රජ ලුණු" යන්නයි. එකම සන්නාමයක් භාවිත කර ශ්‍රී ලංකාව තුළ වෙළෙඳ පොළ අත්පත් කර ගැනීම ජාතික ලුණු සමාගමේ අරමුණ වේ. කෙසේ වෙතත්, අනෙකුත් අදහස්ද සලකා බලා - විශේෂයෙන් උතුර නියෝජනය කරන අනෙකුත් මන්ත්‍රීතුමන්ලාගේත් අදහස් අහලා; ශ්‍රීකාන්තන් හිටපු මන්ත්‍රීතුමාත් මට කථා කළා - අලිමංකඩ ලුණු ලේවායෙන් නිපදවන ලුණු වෙනුවෙන් "අලිමංකඩ ලුණු" - "Elephant Pass Salt" - නමින් විශේෂ සන්නාමයක් භාවිත කිරීමට ජාතික ලුණු සමාගම තීරණය කර තිබේ.

2. කොරෝනා වසංගත තත්ත්වයෙන් අනතුරුව සාර්ථක නිෂ්පාදනයක් අත්කර ගත හැකි වූයේ 2024 වර්ෂයේදීයි. නමුත්, අධික වර්ෂාපතනය සහිත අහිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් අලිමංකඩ ලුණු ලේවායේ යල කන්නයේ ලුණු නිෂ්පාදනය පහත වැටී ඇත. මෙම තත්ත්වය මෙම කන්නයේ සිට යථා තත්ත්වයට පත් කර ගැනීමට අපේක්ෂා කරනවා.

3. මෙය අසත්‍ය ප්‍රකාශයකි. මීට ඉහතදී අලිමංකඩ ලුණු ලේවායේ සේවය කළ කළමනාකරු 2024.08.03 දින සේවයෙන් ඉල්ලා අස් වී තිබෙනවා. ඒ අනුව කඩිනමින් නව කළමනාකරුවකු බඳවා ගැනීමට අයදුම්පත් කැඳවන ලදී. අයදුම්පත් කැඳවීමෙන් පසු ශ්‍රී ලංකාව තුළ තීරණාත්මක මැතිවරණයක් පැවැත්වීමට යෙදුණා. ඒ හේතුවෙන් උක්ත බඳවා ගැනීම් සඳහා යම් ප්‍රමාදයක් සිදු වූ නමුත් එම මැතිවරණ කාලය නිමවීමත් සමඟ පැවති සේවා අවශ්‍යතාව සලකා 2024.10.24 දින බඳවාගැනීමේ පටිපාටියට අනුකූලව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසු අයදුම්කරුවෙකු තෝරා ගන්නා ලදී.

   මෙම බඳවා ගැනීම සඳහා කිසිදු ආකාරයේ දේශපාලන මැදිහත් වීමක් සිදු නොවූ අතර, මෙම බඳවා ගැනීම අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුගමනය කර සිදු කර ඇත.

මීට අමතරව මෑතකදී අලිමංකඩ ලුණු ලේවාය සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරයෙකු ලෙස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකු බඳවා ගැනීමට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූවා. ඒ අනුව නුදුරේදීම මෙම ලුණු ලේවාය සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකු පත් කිරීමට නියමිතයි.

4. ඉහත සඳහන් කළ පරිදි අලිමංකඩ ලුණු ලේවායේ කළමනාකාරිත්වයේ ස්ථාන මාරුවක් සිදු කර නොමැත. කෙසේ වෙතත්, අලිමංකඩ ලුණු ලේවායේ සේවය කරන කම්කරුවන් පිරිසක් ඉල්ලීම් කිහිපයක් මුල් කරගෙන 2025.05.14 දින සිට විරෝධතාවක් ආරම්භ කරන ලදී. ඔවුන්ගේ මූලික ඉල්ලීම වූයේ, අලිමංකඩ නිෂ්පාදිත ලුණු දිවයිනේ අනෙකුත් පළාත්වලට බෙදා නොහරින ලෙසයි. තවද, ජාතික ලුණු සමාගමේ කළමනාකරණයට බාධා ඇති කර, කළමනාකරු ඉවත් කිරීමට ඔවුන් උත්සාහ ගන්නා ලදී. මෙම ඉල්ලීම් කිසිසේත් පිළිගත නොහැකි ඉල්ලීම් වේ. මේ වනවිට අලිමංකඩ ලුණු ලේවායේ නිෂ්පාදන කටයුතු සාමාන්‍ය පරිදි සිදු වෙමින් පවතී.

5. ඔව්.

මෑතකදී පැවැති අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් ලුණු නිෂ්පාදනය අඩුවීම නිසා ඉදිරි පරිභෝජනයට ලුණු ප්‍රමාණවත් නොවන බැවින් ලුණු ආනයනය සඳහා 2025.03.24 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත.

6. මෙය සම්පූර්ණ අසත්‍ය ප්‍රකාශයකි. පාලන අධිකාරිය විසින් සේවයෙන් බැහැර වන ලෙස කිසිදු කම්කරුවෙකුට දැනුම් දී නොමැත. 2025.05.16 දින ජාතික ලුණු සමාගමේ සාමාන්‍යාධිකාරි ප්‍රමුඛ කළමනාකාරිත්වය හා විරෝධතාවයේ නියුතු සියලු කම්කරුවන් සමඟ සාකච්ඡා කරන ලදී. එහිදී එම සේවකයන් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් 10කට කඩිනම් විසඳුම් ලබා දීමට ජාතික ලුණු සමාගමේ කළමනාකාරිත්වය එකඟ වීමත් සමඟ කම්කරුවන් පිරිසක් සේවයට වාර්තා කරන ලද අතර, කම්කරුවන් කොටසක් පමණක් දේශපාලන අරමුණු මූලික කරගෙන තවදුරටත් විරෝධතාවේ යෙදී සිටින ලදී. කෙසේ වෙතත්, මේ වනවිට එම විරෝධතාවත් සම්පූර්ණයෙන්ම අවසන්ව ඇත.

කම්කරුවන් සමඟ ඇති කර ගත් එම එකඟතා 10 මම ඉදිරිපත් කරනවා.

2) The following maters have been discussed at the meeting.

| # | Demands | Clarification and action taken | Decision |
|---|---|---|---|
| 01 | Name change of the Brand Name | It was explained that the Brand Name "RAJA" is used as a brand name of National Salt since 2012 at Mannar Saltern. That is why the same brand name is proposed to "Table salt" also to keep one brand for our company. Anyhow as per the request of many well-wishers it was changed as " Elephantpass Salt" The model pouch design placed at the table for view. | Agreed by Both Parties. |
| 02 | Transferring Salt to other part of the Country. | It was Explained that Elephantpass saltern is a National Asset. since the operation started on 2016 onward, we sold the raw materials to the outsiders and earned income to develop the saltern infrastructure and commissioned a TSP plant. Once the plant properly taken over by end of this month, the raw salt will be used for powder process and will be distributed for Island wide sale. Meanwhile any over stock of the raw salt in future will be issued for other producers to satisfy the country needs. At the moment NSL is only supplying salt everywhere to mitigated the unbearable scarcity. Hence it was requested not to do obstacle for the distribution work. | Agreed by Both Parties. |
| 03 | Employment opportunity for everyday (except holiday) | GM explained that the working days has been an issue due to the production loss by the unfavorable climate situation. Anyhow he agreed to start the renovation works under capital allocation from Next Monday and to occupy labours as much as possible. Also promised to give more opportunity for workers who are working for more than 5 years. | Agreed by Both Parties. |
| 04 | Treat Employees decently | GM said that the same complaint he received from staff as well in vise-versa that Labours are not listening to them. Hence GM said that set of norms will be provided for both on the behavioral pattern to ensure the employees are respected mutually | Agreed by Both Parties. |

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

| | | | |
|---|---|---|---|
| 05 | Request to allow medical leave clime if some injuries happened in duty time. | GM said if any accident /injury taken place at the duty time the labours can submit the medical leave certificate from Government Hospital . in such a case the salary will be paid during the hospitalized or resting time. Also, the injured person will be transferred to hospital by company or hired vehicle under company cost. | Agreed by Both Parties. |
| 06 | Use "Backhoe"/JCP only to Salt Collection not for Development work. | GM explained that the Backhoe was purchased for both salt collection and renovation work. we have to maximum utilized, then only we can get return of investment. Otherwise, it we be an audit issue. Hence, Back hoe will be used where ever needed, meanwhile work will be allocated for manpower as well. | Agreeable when giving adequate works for Manpower. |
| 07 | Double shift payment. It was requested to pay equally when they do 2nd shift work | GM agreed to do necessary action to justify and pay the equal payment for 2nd shift work. | Agreed by Both Parties. |
| 08 | Facilitation for Funeral visit and Banner | GM Agreed to print banner at the company cost for the funeral of the employee. Meanwhile he agreed to facilitate the transport if the company hired vehicle is available at the saltern. | Agreed by Both Parties. |
| 09 | Uniform | It was said that the uniform to the labours ware delayed. And GM agreed to ensure to provide uniform in advance by advancing the procurement and also said that the management has planned to give CAP for the worker. | Agreed by Both Parties. |
| 10 | Filter water at the site | It was said by the labours that the filter water facilities are located at the front office place and they are carrying water by the can to the site. GM Said the tap water facility is available at the saltern site. Further, It was agreed by GM to make arrangement to set a small tank at the site and fill the filter water at saltern site for easy consumption. | Agreed by Both Parties. |

7. මේ වනවිටත් අලිමංකඩ ලුණු ලේවායේ මෙහෙයුම් කටයුතු බාධාවකින් තොරව අඛණ්ඩව සිදු වෙමින් පවතී. මේ වැඩ වර්ජන හේතුවෙන් ලුණු ලේවායේ සාමාන්‍ය නිෂ්පාදන ක්‍රියාවලියට කිසිදු හානියක් සිදු නොවිණි. ඉහත සඳහන් කළ පරිදි මේ වනවිට විරෝධතාව සම්පූර්ණයෙන් අවසන්ව ඇත.

8. සංඛ්‍යා දත්ත අනුව කාලගුණික විපර්යාසය හේතුවෙන් 2024 වර්ෂයේ සිට ලුණු නිෂ්පාදනයේ අඩු වීමක් දක්නට ඇත. එසේ වුවද, අලිමංකඩ ලුණු ලේවායේ මෙහෙයුම් කටයුතු සාමාන්‍ය පරිදි සිදු වෙමින් ඇත. 2024/2025 වසරේ අලිමංකඩ ලුණු ලේවායේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 12,000ක් වන අතර, 2025/2026 වසරේ මෙට්‍රික් ටොන් 18,000ක පමණ නිෂ්පාදන ඉලක්කයක් සකස් කොට ඇත.

9. අලිමංකඩ ලුණු ලේවායේ සේවය කරන කම්කරුවන් වෙත අවශ්‍ය පහසුකම් සලසා දී ඇත. පසුගිය කාල පරිච්ඡේදය පුරාවටම අලිමංකඩ ලුණු ලේවායේ කම්කරුවන්ගේ මූලික හා සුබසාධන අවශ්‍යතා යථා පරිදි සපුරාලීමට සමාගම කටයුතු කර ඇත. එමෙන්ම ඔවුන්ගේ සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් වෙනුවෙන්ද කිසිදු ප්‍රමාදයකින් තොරව දායක වී ඇත. තවද, එම කම්කරුවන් වෙනුවෙන් පිරිසිදු පානීය ජලය ඇතුළු අනෙකුත් සනීපාරක්ෂක අවශ්‍යතා සපුරා ගැනීමට පහසුකම් සලසා දී තිබේ. මෙයට අමතරව තේ පානය සඳහා වන දීමනාවක්, වසර අවසාන ප්‍රසාද දීමනා ගෙවීම්, නිල ඇඳුම් සපයා දීම, වාර්ෂික විනෝද චාරිකාවක් සහ සිය පවුලේ සාමාජිකයන් සමඟ එක්ව සුහද හමු පැවැත්වීම වැනි අවස්ථා සලසා දී තිබේ. තවද, පසුගිය වසරේ අලිමංකඩ ලුණු ලේවායේ සියලුම සේවකයන් හා ඔවුන්ගේ පවුලේ අයවලුන් සඳහා සමාගමේ වියදමෙන් වෛද්‍ය කඳවුරක්ද සංවිධානය කරනු ලැබීය.

ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා.

## ණය ගෙවීම සඳහා සාක්ෂාත් කරගත යුතු සාර්ව ආර්ථික ඉලක්ක: මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රකාශය

## கடன் செலுத்துவதற்காக பேரினப் பொருளியல் இலக்குகளை அடைதல்: நிதி, திட்டமிடல் பிரதி அமைச்சரினது கூற்று

## MACROECONOMIC TARGETS TO BE ACHIEVED FOR DEBT PAYMENT: STATEMENT BY DEPUTY MINISTER OF FINANCE AND PLANNING

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා (මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Harshana Suriyapperuma - Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් 2025.05.23 දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. 2025 මාර්තු 31 දින වනවිට ද්විපාර්ශ්වීය ණය හිමිකරුවන් සහ ජාත්‍යන්තර ස්වෛරී ණය හිමිකරුවන් වෙත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම් අනුව ගෙවීමට ඇති සම්පූර්ණ මුදල ඇමෙරිකානු ඩොලර් මිලියන 20,853.70කි.

2. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම් අනුව එම ණය සඳහා ගෙවිය යුතු ණය වාරිකය (ඇමෙරිකානු ඩොලර් මිලියන) ඇමුණුමෙහි සඳහන් වේ.

**ද්විපාර්ශ්වික ණයහිමියන් හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වෙත වාර්ෂිකව ගෙවීමට ඇති ණය ප්‍රමාණය (ඇ.එ.ජ. ඩොලර් මිලියන) (Outstanding Balance)**

| වර්ෂය | ප්‍රතිව්‍යුහගතකරණ ගිවිසුම් අනුව ගෙවීමට ඇති ප්‍රමාණය | | |
|---|---|---|---|
| | ද්විපාර්ශ්වික | ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | එකතුව |
| | **10,537.70** | **875.47** | **11,413.17** |
| 2025 | 88.32 | 329.55 | 417.87 |
| 2026 | 45.09 | 329.55 | 374.64 |
| 2027 | 44.72 | 329.55 | 374.27 |
| 2028 | 348.08 | 543.75 | 891.84 |
| 2029 | 348.34 | 633.62 | 981.95 |
| 2030 | 376.37 | 633.62 | 1,009.99 |
| 2031 | 376.43 | 800.83 | 1,177.26 |
| 2032 | 336.43 | 800.83 | 1,137.25 |
| 2033 | 335.33 | 845.89 | 1,181.21 |
| 2034 | 446.48 | 855.01 | 1,301.50 |
| 2035 | 603.83 | 855.01 | 1,458.84 |
| 2036 | 729.28 | 1,134.34 | 1,863.63 |
| 2037 | 729.28 | 1,134.76 | 1,864.05 |
| 2038 | 896.51 | 1,089.70 | 1,986.21 |
| 2039 | 1,014.47 | | 1,014.47 |
| 2040 | 1,110.48 | | 1,110.48 |
| 2041 | 1,110.48 | | 1,110.48 |
| 2042 | 1,110.47 | | 1,110.47 |
| 2043 | 462.40 | | 462.40 |
| 2044 | 2.38 | | 2.38 |
| 2045 | 2.29 | | 2.29 |
| 2046 | 2.19 | | 2.19 |
| 2047 | 2.19 | | 2.19 |
| 2048 | 2.19 | | 2.19 |
| 2049 | 2.19 | | 2.19 |
| 2050 | 2.13 | | 2.13 |
| 2051 | 2.07 | | 2.07 |
| 2052 | 1.95 | | 1.95 |
| 2053 | 1.82 | | 1.82 |
| 2054 | 1.66 | | 1.66 |
| 2055 | 1.49 | | 1.49 |
| 2056 | 0.11 | | 0.11 |
| 2057 | 0.11 | | 0.11 |
| 2058 | 0.11 | | 0.11 |
| එකතුව | 10,537.70 | 10,316.00 | 20,853.70 |

සටහන

චීන ආනයන අපනයන බැංකුව, චීන සංවර්ධන බැංකුව, ඉන්දියාව, ජපානය යන ප්‍රතිව්‍යුහගතකරණ ගිවිසුම් අත්සන් කර අවසන් ද්විපාර්ශ්වික ණයහිමියන්ගේ ගෙවීම් සටහන් පමණක් දක්වා ඇත.

අනෙකුත් ද්විපාර්ශ්වික ණයහිමියන්ගේ ගෙවීම් සටහන් ණය ප්‍රතිව්‍යුහගතකරණ ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු ලබා දිය හැකිය. (ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට නියමිත ණයවල 2025.03.31 දිනට පවතින ණය ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 2,831)

3.
- වසර දෙකක් පුරා පැවති දරුණු ආර්ථික අර්බුදයෙන් අනතුරුව 2024 වසරේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය විවිධ අභියෝග හා ගැටලුවලට සාර්ථකව මුහුණ දීමට හැකි තරම් ශක්තිමත් විය.
- 2023 වසරේ මාර්තු මාසයේ සිට ආරම්භ වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සිව් අවුරුදු විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ සහාය ද ඇතුළුව හඳුන්වා දී ඇති පුළුල් ප්‍රතිසංස්කරණ හේතුවෙන් ශ්‍රී ලංකාවේ ණය බර ක්‍රමයෙන් අවම කර ගැනීමටත්, අපේක්ෂිත වර්ධන ඉලක්ක කරා ළඟාවීමටත් දැනටමත් හැකියාව ලැබී තිබේ.
- මෙම ප්‍රතිසංස්කරණ සැලසුම් කර ඇත්තේ රාජ්‍ය පාලනය ශක්තිමත් කරමින් ආර්ථික වර්ධනය ඉහළ නංවන අතරතුර ව්‍යුහාත්මක දුර්වලතා සඳහා විසඳුම් සෙවීම, සාර්ව ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම හා දිගුකාලීන රාජ්‍ය මූල්‍ය ණය තිරසාරභාවය සහතික කිරීම සඳහාය.
- වර්තමානයේ ක්‍රියාත්මක වන සමස්ත වැඩ පිළිවෙළ තුළ එම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට විනිවිදභාවය හා දූෂණ විරෝධී ක්‍රියාමාර්ග ද ඇතුළත්ව වගවීම් ක්‍රියාවලිය ශක්තිමත් කර ඇත.
- ණය ගෙවීම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා රටක් වශයෙන් සපුරා ගත යුතු සාර්ව ආර්ථික ඉලක්ක තීරණය කිරීම සඳහා වන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය මේ වනවිටත් රජය විසින් හඳුනාගෙන ඇති අතර, ඒ සඳහා මූලික වී ඇත්තේ ආදායම පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ දක්වා ඇති රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රමාණාත්මක ඉලක්ක හා රාජ්‍ය කළමනාකරණ පනත යටතේ නියම කර ඇති රාජ්‍ය මූල්‍ය රීති මඟින් ණය තිරසාරභාවය ඇති කිරීම සඳහා වන සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීමට අධිතාලම යොදා තිබේ.
- ඒ අනුව, බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සහ බදු පරිපාලනය ශක්තිමත් කිරීම තුළින් 2025 වසර හා ඉන් ඔබ්බට රාජ්‍ය ආදායම, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 15ක මට්ටමේ තබා ගැනීමට අපේක්ෂා කෙරේ.
- රාජ්‍ය ආදායම ඉහළ නැංවීමේ ස්ථාවර ප්‍රයත්නයන් සහ රාජ්‍ය වියදම් තාර්කිකරණය කිරීම තුළින් 2025 වසර හා ඉන් ඔබ්බට ප්‍රාථමික අතිරික්තය, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2.3ක මට්ටමේ පවත්වා ගැනීම.
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුව මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව යටතේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13ට වඩා පහළ මට්ටමක ප්‍රාථමික වියදම් සීමාවට පහළින් ප්‍රාථමික වියදම් කළමනාකරණය කිරීම.
- 2025 හා ඉන් ඔබ්බට රාජ්‍ය ආයෝජන දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4කට වඩා පවත්වා ගැනීම.
- මෙකී සාර්ව රාජ්‍ය මූල්‍ය ඉලක්ක සපුරා ගන්නා ලද අතරතුර පහත දැක්වෙන සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීමට ද රජය අපේක්ෂා කරනු ලබයි.
  - ✓ ආර්ථික වර්ධන වේගය ඉහළ නංවා ගැනීම.
  - ✓ උද්ධමනය 2025න් ඔබ්බට සියයට 5ක මට්ටමේ පවත්වා ගැනීම.
  - ✓ දළ නිල සංචිත ප්‍රමාණය 2025 වසරේ ඇමෙරිකානු ඩොලර් බිලියන 7.2 සිට 2029 වනවිට ඇමෙරිකානු ඩොලර් බිලියන 15.3 දක්වා ශක්තිමත් කිරීම.
  - ✓ ඍජු විදේශ ආයෝජන ගලා ඒම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අවම වශයෙන් 2ට වැඩියෙන් පවත්වා ගැනීම.

[ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා]

✓ 2024 වසරේ ළඟා කරගත් අයුරින්ම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස විදේශ අංශයේ ජංගම ගිණුමේ ශේෂය ධනාත්මක අගයක් කරා ළඟා කර ගැනීම.

මෙම ඉලක්ක සපුරා ගැනීම මඟින් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය 2029 වසර වනවිට සියයට සියයක මට්ටමට වඩා පහළ මට්ටමේ තබා ගැනීම රජයේ අරමුණයි.

4. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යනුවෙන් වන අපගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් වූ ණය තිරසරභාවය ඇති කර ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පමණක් නොව අනෙකුත් ණය හිමියන් සමඟ ද රජය විසින් මේ වනවිටත් අවශ්‍ය සියලු සාකච්ඡා සහ කටයුතු සිදු කරමින් පවතී. ජන වරමට අනුගතව එම වැඩසටහන් සාර්ථකව මේ වනවිටත් ක්‍රියාත්මක වෙමින් පවතී.

5. ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ස්ථාවරත්වය හා ණය තිරසාරභාවය පවත්වා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් ක්‍රියාත්මක විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ සපුරා ගත යුතු මූලික එකඟතාවන් ප්‍රධාන කරුණු 7ක් මත රඳා පවතින අතර ඒවා කොන්දේසි නොවේ.

i. මූල්‍ය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කරනු ලබන හා මූල්‍ය විනය ශක්තිමත් කිරීම අරමුණ කරගත් රාජ්‍ය මූල්‍ය ආයතනික ප්‍රතිසංස්කරණ සහ පිරිවැය ආවරණය වන බලශක්ති මිලකරණය ආදියෙන් සමන්විත ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක් ඇති කිරීම.

ii. වඩාත්ම අවදානමට ලක් විය හැකි පුද්ගලයන් සඳහා ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක් ස්ථාපනය කිරීම.

iii. රාජ්‍ය ණය තිරසරභාවය යළි ගොඩනැඟීම සඳහා ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රමෝපායයන් ස්ථාපනය කිරීම.

iv. අඛණ්ඩව විනිමය අනුපාතික නම්‍යශීලීව පවත්වා ගැනීම යටතේ මිල ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම හා ජාත්‍යන්තර සංචිත නැවත ගොඩනැඟීම සඳහා බහුපාර්ශ්වික උපාය මාර්ගයන් ක්‍රියාත්මක කිරීම.

v. මූල්‍ය පද්ධති ස්ථාවරත්වය ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.

vi. පාලන හා දූෂණ අවදානම් පිටුදැක්ම සඳහා වන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම.

vii. ශ්‍රී ලංකාවේ ආර්ථිකය වර්ධනය වීමේ විභවතාව පුළුල් කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම.

මේ සඳහා සමස්ත ණය වාරික සංඛ්‍යාව 9යි. ඒ වාගේම, මිලියන 254 බැගින් වාරික 9ක් තුළින් විශේෂ ගැනුම් හිමිකම්වල මුළු එකතුව මිලියන 2,286ක්.

වාරිකවලදී හිමි වන ණය මුදල වෙන් වෙන් වශයෙන් පහත දැක්වේ.

| | වාරික | ලැබුණු දිනය | විශේෂ ගැනුම් හිමිකම් (SDR) මිලියන | ආසන්න වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන |
|---|---|---|---|---|
| දැනටමත් ලැබී ඇති වාරික | 1වන වාරිකය | 2023 මාර්තු 22 | 254 | 333 |
| | 2වන වාරිකය | 2023 දෙසැම්බර් 14 | 254 | 337 |
| | 3වන වාරිකය | 2024 ජූනි 14 | 254 | 336 |
| | 4වන වාරිකය | 2025 මාර්තු 04 | 254 | 334 |
| | ලැබී ඇති එකතුව | | **1,016** | **1,340** |
| ඉදිරියේදී ලැබීමට නියමිත වාරික | 5 වන වාරිකය | 2025 | 254 | |
| | 6 වන වාරිකය | 2025 | 254 | |
| | 7 වන වාරිකය | 2026 | 254 | |
| | 8 වන වාරිකය | 2026 | 254 | |
| | 9 වන වාරිකය | 2027 | 254 | |
| | මුළු එකතුව | | **2,286** | |

6. ජනතාව විසින් අප බලයට පත් කරන ලද්දේ ජනතාව මත පැටවී ඇති බර අවම කර මහජන මුදලින් වියදම් කරන සෑම රුපියලකින්ම ආර්ථික හා සමාජයීය ප්‍රතිලාභයක් අත්කරදීමේ දැඩි අධිෂ්ඨානයකින් යුතුවයි.

ඒ අනුව නව රජය යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රථම අය වැය තුළින්ම ජනතාවට සහන රැසක් ලබා දීමට රජය කටයුතු කර තිබේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ වුවද, අදාළ බලධාරීන් සමඟ මනා සම්බන්ධීකරණයකින් යුතුව වත්මන් රජය කටයුතු කර ජනතාවට එල්ල වී ඇති බදු බර අවම කරන අතරම, වැඩි සහන ලබා දීම සඳහා 2025 අය වැය යෝජනා රාශියක් ක්‍රියාත්මක කර තිබේ.

✓ 2025 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක පුද්ගල ආදායම් බදු සංශෝධනය මඟින් වාර්ෂික පුද්ගල ආදායම් බදු සීමාව රුපියල් මිලියන 1.2 සිට රුපියල් මිලියන 1.8 දක්වා වැඩි කර ඇත.

✓ රාජ්‍ය සේවයේ මූලික වැටුප් සංශෝධනයක් සිදුකොට දශකයකට ආසන්න කාලයක් ගෙවී තිබූ අතර, මෙම රජය බලයට පත්වීමෙන් අනතුරුව රාජ්‍ය සේවයේ

අවම මාසික වැටුප රුපියල් 24,250 සිට රුපියල් 40,000 දක්වා රුපියල් 15,750කින් එනම් සියයට 65කින් පමණ වැඩි කිරීමට කටයුතු කර තිබේ. ඒ අනුව, 2025 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක රාජ්‍ය සේවකයින්ගේ වැටුප් සංශෝධනය මඟින් රාජ්‍ය සේවකයින්ට සහන සලසා දී තිබේ.

- ✓ දියර කිරි සහ යෝගට් සඳහා එකතු කළ අගය මත බද්ද නිදහස් කිරීම.
- ✓ අවදානමට ලක් විය හැකි ප්‍රජාවන් මත පැටවී ඇති බර ලිහිල් කිරීම සඳහා සමාජ ප්‍රතිලාභ ලේඛනයේ සිටින පුද්ගලයින් වෙනුවෙන් මුදල් ප්‍රදාන වැඩි කිරීමට කටයුතු කිරීම. ඒ අනුව, 2025 වසරේදී සමාජ ආරක්ෂණ වියදම් සඳහා රුපියල් බිලියන 232.5ක් ශුද්ධ වියදම් වැඩි කර තිබේ. එපමණක් නොව තිරසර වෙනසක් සිදු කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ සහ ලෝක බැංකුවේ සහාය ද ඇතිව සවිබලගැන්විය යුතු පවුල් 25,000ක් තෝරාගෙන තිබෙන අතර සවිබලගැන්වීම සඳහා ඉතුරු පවුල් ක්‍රමානුකූලව දේශීය අරමුදල් යොදා ගනිමින් සවිබලගන්වනු ලබයි.
- ✓ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වෙළෙඳ පොළේ පවතින පොලී අනුපාතයට වඩා සියයට 3ක අතිරේක පොලියක් ලබා දීමට කටයුතු කෙරේ.
- ✓ අස්වැසුම ප්‍රතිලාභ ලබන සහ දැනට අස්වැසුම ප්‍රතිලාභ නොලබන පාසැල් ළමුන් සඳහා පාසැල් උපකරණ ලබා ගැනීමට රුපියල් 6,000ක මුදලක් ලබා දීමට රජය විසින් කටයුතු කර ඇත.

ඒ අනුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ එකඟතාවන් අතරතුර පවා ජනතාවට උපරිම සහන ලබා දෙන අන්දමේ වැඩ පිළිවෙළක් දියත් කිරීමට රජය සමත්ව තිබේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මට පුංචි පැහැදිලි කර ගැනීමක් කරගන්න අවශ්‍යයි. ලැබෙන ආරංචි අනුව විස්තීර්ණ ණය පහසුකමේ ඊළඟ වාරිකය ලබා ගැනීම සඳහා විදුලි බිල සියයට 18කින් වැඩි කිරීමේ කොන්දේසිය සපුරාලීම අත්‍යවශ්‍ය වී තිබෙනවාය කියනවා. ඒක සත්‍යයක්ද? විදුලි බිල වැඩි වෙනවාද, සියයට 18කින්? ඒ වාගේම, විස්තීර්ණ ණය වාරිකය ලැබෙන්නේ කවදාද?

**ගරු (ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷண சூரியப்பெரும)
(The Hon. (Dr.) Harshana Suriyapperuma)

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමන්ලාට ආරංචි ලැබෙනවා ඇති. ඒ සමහර ඒවා වැරදි ආරංචි වෙන්න පුළුවන්, කොහෙන් හරි leak කරලා එවනකොට. නමුත් රජයක් විදියට, රටක් විදියට අපේ යුතුකමක්, වගකීමක් තිබෙනවා, cost recovery pricing mechanism එකක් තුළින්, එහෙම නැත්නම් පිරිවැය අය කර ගැනීමට අදාළ ක්‍රමවේදයක් තුළින් රජය විසින් සේවා සැපයීමේදී සාධාරණ මිලකට ජනතාවට අවශ්‍ය ඒ පහසුකම් ලබා දීමට. ඒ වැඩකටයුතු සහ ඒ මූලධර්මයන්ට අනුව ඒ අදාළ ආයතනවලින් ඉදිරිපත් කරන දත්ත සහ වාර්තා පරිශීලනය කරමින් ඒ සඳහා ස්වාධීන ආයතන පත් කර තිබෙනවා. එම ආයතන විසින් දීලා තිබෙන ඒ දත්ත පදනම් කරගෙන අවසන් තීරණය ගනු ඇතැයි අපි බලාපොරොත්තු වනවා. ඒ වැඩි කරන ප්‍රමාණය කොපමණද යනාදිය සම්බන්ධයෙන් රජය මැදිහත් වෙලා තීරණය කරනවාට වඩා, ඊට අදාළ මහජන උපයෝගිතා කොමිෂන් සභාව - Public Utilities Commission එක - විසින් ඒ පිළිබඳ විමසා බලා තීරණය කරනු ලබනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය, ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා.

## වරප්‍රසාද: කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා විසින් 2025.05.22 දින කරන ලද ප්‍රකාශය
## சிறப்புரிமை: கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரினது 2025.05.22ஆம் திகதிய கூற்று
## PRIVILEGE: STATEMENT MADE BY MINISTER OF INDUSTRY AND ENTREPRENEURSHIP DEVELOPMENT ON 22.05.2025

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Good morning! Thank you very much, Hon. Speaker, for granting me this opportunity to raise a matter of Privilege.

Sir, I raise this matter of Privilege calling for an impartial inquiry regarding statements made by the Hon. Sunil Handunnetti, Minister of Industry and Entrepreneurship Development. I submitted it to you, Sir, formally requesting to raise this matter of Parliamentary Privilege and for initiating an impartial inquiry into a serious incident that occurred during the Parliamentary Sitting held on 22$^{nd}$ May, 2025.

During his speech, the Hon. Sunil Handunnetti, Member of Parliament and Minister of Industry and Entrepreneurship Development made false, baseless and defamatory allegations against me. He claimed that I had requested that salt produced in the Northern Province, particularly from the Elephant Pass Saltern, be not transported to the Sinhala community. Furthermore, he alleged that I was promoting racism in connection with this issue of salt production.

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

I categorically and unequivocally deny those statements. I have never made such a request or propagated any from of racial sentiment regarding the matter. These allegations are entirely fabricated and malicious, intended to damage my reputation as a Representative of the Tamil minority and to incite communal disharmony.

The Hon. Sunil Handunnetti's actions constitute a clear breach of the Code of Conduct for Members of Parliament as well as a violation of the Standing Orders of Parliament. Moreover, by spreading false and defamatory statements under the protection of Parliamentary Privilege, he has violated the Parliament (Powers and Privileges) Act, misusing the platform of Parliament to tarnish the image of a fellow Member of Parliament.

Sir, I respectfully urge your office to:

1. Raise this issue as a matter of Privilege in the House at the earliest opportunity.
2. Institute an impartial inquiry into the conduct and statements made by the Hon. Sunil Handunnetti.
3. Take appropriate disciplinary action in accordance with the Parliament (Powers and Privileges) Act and the Standing Orders to uphold the dignity and integrity of Parliament.

This is not only an issue of personal defamation, but also a matter concerning the credibility of Parliamentary Proceedings and the trust the public places in our democratic institution. Such unfounded allegations cannot be allowed to set a precedent in the hallowed chambers of Parliament. I am available to provide further clarification or submit any required documentation, if necessary.

Thank you, Sir, for giving attention to this serious matter. I trust in your impartiality and commitment to uphold integrity of Parliament.

The second thing I wish to mention, Sir, is that I have raised another Privilege issue earlier. You told me that it will be forwarded to the Committee on Ethics and Privileges. That was regarding the Hon. Bimal Rathnayake, but that has not yet been forwarded to the Committee. Please forward that Privilege matter along with this to the Committee on Ethics and Privileges, Sir.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත
### வேலையாளர்களின் தேசிய குறைந்தபட்ச வேதனம் (திருத்தம்) சட்டமூலம்
### NATIONAL MINIMUM WAGE OF WORKERS (AMENDMENT) BILL

"2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ කම්කරු අමාත්‍යතුමා වෙනුවට ගරු බිමල් රත්නායක මහතා විසිනි.***

***2025 ජුනි 17 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*தொழில் அமைச்சர் சார்பாக மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2025 யூன் 17, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கல்வி, ஊழியப்படை மற்றும் மனித மூலதனம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Bimal Rathnayake, on behalf of the Minister of Labour; to be read a Second time upon Tuesday, 17th June, 2025 and to be printed; and to be referred to the Committee on Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.*

### සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන) පනත් කෙටුම්පත
### வேலையாளர்களின் வரவுசெலவுத்திட்ட நிவாரணப்படி (திருத்தம்) சட்டமூலம்
### BUDGETARY RELIEF ALLOWANCE OF WORKERS (AMENDMENT) BILL

"2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ කම්කරු අමාත්‍යතුමා වෙනුවට ගරු බිමල් රත්නායක මහතා විසිනි.***

***2025 ජුනි 17 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*தொழில் அமைச்சர் சார்பாக மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2025 யூன் 17, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கல்வி, ஊழியப்படை மற்றும் மனித மூலதனம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Bimal Rathnayake, on behalf of the Minister of Labour; to be read a Second time upon Tuesday, 17th June, 2025 and to be printed; and to be referred to the Committee on Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.*

### සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන) පනත් කෙටුම්පත
### வேலையாட்களின் வரவுசெலவுத்திட்ட நிவாரணப்படி (திருத்தம்) சட்டமூலம்
### BUDGETARY RELIEF ALLOWANCE OF WORKERS (AMENDMENT) BILL

"2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ කම්කරු අමාත්‍යතුමා වෙනුවට ගරු බිමල් රත්නායක මහතා විසිනි.***

***2025 ජුනි 17 වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*தொழில் அமைச்சர் சார்பாக மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2025 யூன் 17, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கல்வி, ஊழியப்படை மற்றும் மனித மூலதனம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Bimal Rathnayake, on behalf of the Minister of Labour; to be read a Second time upon Tuesday, 17th June, 2025 and to be printed; and to be referred to the Committee on Sectoral Oversight Committee on Education, Manpower and Human Capital.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම.

විවාදය ආරම්භ කිරීම, ගරු අනුර කරුණාතිලක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

## පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත
## தனிப்பட்ட தரவுப் பாதுகாப்பு (திருத்தம்) சட்டமூலம்
## PERSONAL DATA PROTECTION (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

[මධ්‍යාහ්න 12.00]

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)
ගරු කථානායකතුමනි, ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, අද අපි ඇත්තටම ජීවත් වෙන්නේ තොරතුරු පිළිබඳ විප්ලවීය යුගයක. සාමාන්‍යයෙන් තොරතුරු කිව්වාම, සමාජයීය, ආර්ථික තොරතුරු ද තිබෙනවා. අද දවසේ විශේෂයෙන් සාකච්ඡාවට බඳුන් වන්නේ පෞද්ගලික දත්ත පිළිබඳවයි. ජීවිතය පුරාම කෙනෙකුගේ හැසිරීම, අදහස්, වාණිජ කටයුතු, සෞඛ්‍ය, තොරතුරු වාගේම ව්‍යායාම කිරීම, දුරකථනය භාවිත කිරීම, සමාජ මාධ්‍ය භාවිත කිරීම යනාදී මේ සියලු දේවල් අද දත්ත බවට පත් වෙලා තිබෙනවා; පෞද්ගලික දත්ත බවට පරිවර්තනය වෙලා තිබෙනවා. මේ දත්ත පිළිබඳ අවධානයත්, දත්ත පිළිබඳ විද්‍යාවත් අද වනකොට ලෝකය තුළ අලුත් ප්‍රවණතාවකට ඇවිල්ලා ඒ පිළිබඳ සමාජ අවධානයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම මේ දත්තවල තිබෙන වටිනාකම ක්‍රම ක්‍රමයෙන් වැඩි වෙලා ඒක සම්පතක් බවට පරිවර්තනය වෙමින් පවතිනවා. සමහරු විශ්වාස කරනවා, ඊළඟ යුගය වනකොට දත්තවලට සමහර වෙලාවට අපි කථා කරන රත්තරන් හෝ වෙනත් වටිනාකම්වලට වඩා වැඩි වටිනාකමක් එයි කියලා. ඒ නිසා තමයි data mining වාගේ දේවල්, වචන, අලුත් අදහස් ඒ academia එක තුළ සාකච්ඡාවට බඳුන් වෙන්නේ. නමුත්, මේ දත්තවල තිබෙන වටිනාකම වාගේම ඒ හා සමාන අවදානමක් මේ තොරතුරු සම්බන්ධයෙන් ඇවිල්ලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ දත්ත පිළිබඳ අවදානමත් එක්ක විශේෂයෙන් පෞද්ගලික දත්තවල දත්තදායකයාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැන නැඟිලා තිබෙනවා. මේ සාකච්ඡාව පැන නැඟෙනකොට, විශේෂයෙන් මේ දත්ත සමාජයට මුදා හරින එක වළක්වනවා වෙනුවට, ඒ ඒ අවශ්‍යතාවලට ගැළපෙන විධියට, දත්ත පරිශීලකයන්ට මේ දත්ත මුදා හරින අතරේම දත්තදායකයාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් යම් යම් නීති, ඒ නීති නියාමනය කරන අධිකාරි පිළිබඳ සාකච්ඡාවක් ලෝකය තුළ ඇති වෙලා තිබෙනවා.

ජාත්‍යන්තර උදාහරණ ගත්තොත්, යුරෝපයේ General Data Protection Regulation අනුව දත්ත එකතු කිරීමේ සෘජු අවසරය ලබා ගන්න ඕනෑ, කෙනෙකුගේ දත්ත එකතු කරනවා නම්. ඒ දත්ත පිළිබඳ තොරතුරු ලබා දෙන කෙනාගේ අවසරය මත විතරයි දත්ත එකතු කරන්න ඕනෑ. ඒ වාගේම, the right to be forgotten කියන concept එකත් එක්ක පුද්ගලයෙකුට තමන්ගේ දත්ත කිසියම් අවශ්‍යතාවක් වෙනුවෙන් කිසියම් ආයතනයකට ලබා දුන්නාට පසුව, ඒ දත්ත මකා දැමීමට ඉල්ලීමක් කිරීමට පුළුවන් විධියට අවශ්‍ය ප්‍රතිපාදන ඒ GDPRහි සඳහන් වෙලා තිබෙනවා. ඒ වාගේම කිසියම් දත්ත පද්ධතියක් කඩා වැටුණොත්, ඒ වාගේම දත්ත hacker කෙනෙකු අතට හෝ වෙනත් කණ්ඩායමක් අතට පත් වුණොත්, ඒ පිළිබඳ තොරතුරු වහාම දැන්වීමටත් අවශ්‍ය ප්‍රතිපාදන යුරෝපයේ තිබෙන GDPRහි, ඒ දත්ත සම්බන්ධයෙන් තිබෙන අණ පනත්වල සඳහන් වෙනවා.

ඒ වාගේම බ්‍රසීලයේත් LGPD කියලා GDPR ආකෘතියට සමාන ආකෘතියක් තමයි ක්‍රියාත්මක වෙන්නේ. මේ තුළ දත්ත භාවිත කිරීම සඳහා පුද්ගලයාගේ අවසරය, දත්ත විස්තර ලබා දීමේ වගකීම සහ නීති විරෝධී භාවිතයට එරෙහිව දඬ පැනවීම වැනි ප්‍රතිපාදන සඳහන් වෙලා තිබෙනවා.

ලංකාව තමයි දකුණු ආසියානු කලාපයේ පළමුවැනි වතාවට පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සම්බන්ධයෙන් කටයුතු කළේ. ඒ, 2022දී. ඉන්දියාව 2023දී මේ පනත ඉදිරිපත් කරන්නේ Digital Personal Data Protection Act නමින්. ඉන්දියාව මේ නව නීතිය මඟින් දත්ත සුරක්ෂිත භාවිතය, අවසර රීති සහ ව්‍යාපාර ආරක්ෂාව, සමතුලිතතාවක් ඇතිවීම වැනි කාරණා සම්බන්ධයෙන් කටයුතු කරන්න පෙලඹිලා තිබෙනවා.

ඒ වාගේම මේ දත්ත සම්බන්ධයෙන් කටයුතු කරනකොට තිබෙන ජාත්‍යන්තර ප්‍රවණතාව ගැන කිව්වොත්, මේ සම්බන්ධයෙන් තිබෙන regulations මොනවාද, ඒ සම්බන්ධයෙන් තිබෙන ආයතන පිළිබඳ ඒ ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද, පැනවිය යුතු නීති මොනවාද, මේවා නියාමනය කළ යුත්තේ මොන ආයතන මඟින්ද කියන කරුණු සම්බන්ධයෙන් දීර්ඝ සාකච්ඡාවකින් පස්සේ තමයි අදාළ අණපනත් සහ ඒ අධිකාරීන් කටයුතු කරන්න බලාපොරොත්තු වෙන්නේ. උදාහරණයක් හැටියට මම කිව්වා, 2023දී ඉන්දියාව DPDP කියන පනත මඟින් තමයි දත්ත සම්බන්ධ පනත ඇතුළත් කරලා තිබෙන්නේ කියලා.

[ගරු අනුර කරුණාතිලක මහතා]

නමුත් ඒ නියාමන අධිකාරින් සහ implementation part එක සම්බන්ධයෙන් තවමත් සාකච්ඡාවක් තිබෙනවා. ඒවා සම්පූර්ණ කරන්න කටයුතු කරලා නැහැ.

පෞද්ගලික දත්ත සම්බන්ධයෙන් කටයුතු කරනකොට ප්‍රධාන පියවර තුනක් අනුගමනය කළ යුතුයි කියලා දත්ත විශ්ලේෂකයන්, දත්ත පිළිබඳ කටයුතු කරන අය කියනවා. නීතිමය වශයෙන් ගත්තොත්, දත්ත ආරක්ෂණ නීතියක්, - ලංකාවේ ගත්තොත් Personal Data Protection Act එක - ඒ වාගේම රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා අනිවාර්යයෙන් මේක ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියන එක, නීති උල්ලංඝනය කිරීම් සඳහා දැඩි දඬුවම් පමුණුවන්න ඕනෑ කියන නීතිමය සංකල්ප, නීතිමය අවස්ථා පැනවිය යුතුයි කියන එක ගැන සමාජය තුළ සාකච්ඡා වෙලා තිබෙනවා.

ඒ වාගේම ආයතනික වශයෙන් ගත්තොත්, ලංකාවේ වාගේ Data Protection Authority එකක් පිහිටුවලා ඒ නීති හරියට ක්‍රියාත්මක වෙනවාද කියන එක සම්බන්ධයෙන් කටයුතු කරන්න නීතිමය අධීක්ෂණය සිදු කළ යුතුයි. ඒ වාගේම දත්තදායකයන්ට දැනුම් දීම, ඔවුන්ගේ හිමිකම් පිළිබඳ සමාජ මට්ටමේ දැනුවත් කිරීම් සඳහා ආයතනික වශයෙන් ගත යුතු පියවර සම්බන්ධයෙනුත් සමාජය තුළ සාකච්ඡාවක් තිබෙනවා. ඒ වාගේම තාක්ෂණික වශයෙන් දත්ත සංග්‍රහණය කිරීමේදී, end-to-end encryption ගැන, ඒ කියන්නේ දත්තදායකයාට සහ දත්ත පරිශීලකයාට පමණක් තොරතුරු ලබා ගන්න පුළුවන් වන විධියට මේ දත්ත හුවමාරුව සිදුවෙන්න ඕනෑ.

ඒ වාගේම, ඒ දත්ත සඳහා තිබෙන ප්‍රවේශයට අදාළව control එකක් තිබෙන්න ඕනෑ. අන්න ඒ වාගේ තාක්ෂණික ආරක්ෂණ ක්‍රම හඳුන්වා දිය යුතුයි කියන එක අද වන කොට ලෝකයේ පිළිගත් සංකල්පයක්.

තවත් එකක් තමයි, Privacy by Design කියන සංකල්පය. තොරතුරු පද්ධතියේ නිර්මාණය ආරම්භයේ සිටම පෞද්ගලිකත්වය ආරක්ෂා කරන විධියට සැලසුම් කළ යුතුයි කියන සංකල්පයත් මේකත් එක්ක සාකච්ඡාවට ඇවිල්ලා තිබෙනවා.

පාර්ලිමේන්තුවේ අද සාකච්ඡා වන මේ පනත් කෙටුම්පත පිළිබඳව අවධානය යොමු කළොත්, මා කලින් සඳහන් කළා වාගේ 2022 වර්ෂයේදී තමයි මෙහි ප්‍රධාන පනත පනත් කෙටුම්පතක් හැටියට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරුණේ. ඒ අනුව පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත 2025 මාර්තු 18වන දා විට සම්පූර්ණයෙන් ක්‍රියාත්මක විය යුතුයි කියන අදහසේ තමයි ඒ වන විට හිටියේ.

මේ ඩිජිටල් ක්‍රමෝපායයන් අනුගමනය කිරීමේදී පෞද්ගලික අංශය වාගේම රාජ්‍ය අංශයත් මේ ක්‍රියාවලිය අනුගමනය කරන්න ඕනෑ. ඒ අනාගත පාලන ක්‍රමවේද පිළිබඳ වැදගත්කම හඳුනා ගනිමින් ඒ දත්ත දායකයාගේ අයිතීන් අර්ථවත්ව, සුවිශේෂීව ආරක්ෂා කිරීමේ හැකියාවෙන් යුක්තව කටයුතු කළ යුතු බව කියනවා. සමාජය තුළ මෙන්න මේ වාගේ විශාල සාකච්ඡාවක් ඇති වුණා. ඒ සාකච්ඡාවත් එක්ක අංග සම්පූර්ණ නියාමන ආයතනයක් පිහිටුවීමට සහය වීම සඳහා, ඒ අවශ්‍යතාව සලකා බලා මේ පනත සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට පෙර ඒ අවශ්‍ය සංශෝධනය ගෙන ඒම කළ යුතුයි කියන එක අවධාරණය කරමින් ඩිජිටල් ආර්ථික අමාත්‍යවරයා වශයෙන් ගරු ජනාධිපතිතුමා අමාත්‍ය මණ්ඩලයට සංදේශ දෙකක් ඉදිරිපත් කළා. එහි ප්‍රතිඵලයක් හැටියට තමයි අද දවසේ සාකච්ඡා කරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට අදාළ සංශෝධන අපි පාර්ලිමේන්තුව තුළ මෙසේ සාකච්ඡාවට ගන්නේ.

මේ පනත සංශෝධනය කිරීමේ මූලික හරයන් ගැන මා කියන්නම්. විශේෂයෙන් artificial intelligence හෙවත් AI තාක්ෂණය කියන එක අද වන කොට දත්ත එක්ක බැඳී තිබෙන ක්‍රියාවලියක්. පුද්ගලික දත්ත සහ artificial intelligence ක්‍රියාවලිය සම්බන්ධ කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රවේශයන් පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට ගෙන එන මේ සංශෝධන තුළින් අද වන කොට යෝජනා වනවා.

මෙම පනත් කෙටුම්පතේ 5වන වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18වන වගන්තිය සංශෝධනය වනවා. ඒ වගන්තිය සංශෝධනය වීමේ අවශ්‍යතාව පැන නඟින්නේ ඇයි? කිසියම් දත්ත දායකයකුට තමන්ගේ අයිතිවාසිකම් සහ නිදහසට බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇති ස්වයංක්‍රිය දත්ත සැකසීම මත පදනම් වූ පාලකවරයකුගේ තීරණයක් -දත්ත පාලනය කරන අයගේ, දත්ත use කරන අයගේ තීරණයක්- සමාලෝචනය කිරීම සඳහා පාලකවරයාගෙන් ඉල්ලා සිටීමට දත්ත දායකයාට අවස්ථාව සැලසෙනවා.

මේ සංශෝධන පනත් කෙටුම්පතේ 6වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 19වන වගන්තිය සංශෝධනය වනවා. අලුත් පනත් කෙටුම්පතේ 6වන වගන්තිය අනුව පුද්ගලික දත්ත වෙත ප්‍රවේශය ලබා දීම ප්‍රතික්ෂේප කිරීමක් සම්බන්ධයෙන් අධිකාරිය වෙත අභියාචනයක් කිරීම, ඒ වාගේම 14(1) වගන්තිය යටතේ ස්වකීය කැමැත්ත ඉල්ලා අස්කර ගැනීම වැනි දේට ඉඩ සලසනවා. මා කලින් කිව්වා වාගේ යුරෝපීය GDPR Act එක අනුව තමන්ගේ දත්ත කිසියම් පරිශීලකයෙකුට දුන්නාට පසුව නැවත වරක් ඒ දත්ත මකා දැමීම සඳහා ඉල්ලා සිටින්න අවස්ථාව තිබෙනවා. අන්න ඒ යුරෝපීය framework එකට, ඒ ජාත්‍යන්තර framework එකට අනුරූපී වන විධියට පනත සංශෝධනය කිරීම තමයි එහි 19වන වගන්තිය සංශෝධනය කිරීමෙන් බලාපොරොත්තු වන්නේ.

මෙහි ප්‍රධාන වශයෙන් වැදගත් වන තවත් සංශෝධනයක් තිබෙනවා. මෙම පනත් කෙටුම්පතේ 10වන වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම සිදු වනවා. ලෝකය කියන්නේ අද වන කොට තනි ගම්මානයක්. දත්ත කියන එක මේ දේශ සීමාවට විතරක් සීමා වෙන්නේ නැහැ. දේශ සීමා හරහා තමයි මේ දත්ත හුවමාරු වෙන්නේ. විශේෂයෙන් online system එක හරහා හෝ වෙනත් ක්‍රම හරහා හෝ අපේ තොරතුරු කිසියම් අවශ්‍යතාවක් වෙනුවෙන් ඉදිරිපත් කළාම, අද අප මෙහේ ඉදිරිපත් කරන ඒ තොරතුරු ගබඩා වෙන්නේ Cloud system එක තුළ වෙන්න පුළුවන්.

ඒ Cloud system එක ලංකාවේ නොව, වෙනත් රටක තිබෙන්න පුළුවන්. අන්න ඒ වාගේ වෙලාවකදී දේශ සීමා හරහා පෞද්ගලික දත්ත සංචලනය වනකොට - cross-border data flow එකක් සිදු වනකොට - එම දත්ත සංචලනය කිරීමේ යෙදී සිටින කෙනා, එහෙම නැත්නම් දත්ත සකසන්නා පිළිපැදිය යුතු නියමයන් නිශ්චිතව තහවුරු කිරීම තමයි ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීමෙන්; ප්‍රතියෝජනය කිරීමෙන් බලාපොරොත්තු වන්නේ. මේ වගන්තියේ නීතිමය බලපෑම විතරක් නොවෙයි මෙහි තිබෙන වැදගත් කාරණය. එය සෘජුවම අන්තර්ජාතික රාජ්‍ය තාන්ත්‍රික සබඳතා හා විදේශීය ප්‍රායෝගිකතා සමඟ ගැට ගැසී තිබෙනවා. අපි උදාහරණයක් ගනිමු. විදේශීය රාජ්‍යයක තිබෙන දත්ත ආරක්ෂණ නීතිය අපේ රටේ තිබෙන දත්ත ආරක්ෂණ නීතියත් එක්ක ගෙන බලද්දී ප්‍රමිතියට අනුකූල වන්නේ නැත්නම්; ඒකට සමපාත වන්නේ නැත්නම් එවැනි අවස්ථාවලදී අප ඒ රටත් එක්ක කරන වෙළෙඳ, තාක්ෂණික ගනුදෙනුවලට සමහර වෙලාවට බාධා ඇති වෙන්න පුළුවන්. අන්න ඒ බාධා ඉවත්

කරලීම සඳහා මේ වගන්තිය තුළින් අප රටට හැකියාව ලැබෙනවා. ඒ වාගේ අවස්ථාවක ව්‍යවස්ථානුකූලව සාධාරණ ආකෘතියක් ගොඩනගලා, තෘප්තිමත් adequacy determination ක්‍රියාවලියක් හැදෑරීම අත්‍යවශ්‍ය වෙනවා. අන්න ඒ සඳහා අවකාශය සැලසෙන විධියට තමයි ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය වන්නේ. ඒ වාගේම, මේ නව වගන්තියට අනුකූල වීමට සූදානම් වීමේදී විශේෂයෙන් රාජ්‍ය අංශය ඇතුළු සමාජයේ බොහෝ පාර්ශ්වකරුවන් මානව සම්පත්, තාක්ෂණික යටිතල පහසුකම්, ආරක්ෂණ ක්‍රම ආදිය සවිමත් කිරීමට අවශ්‍යයි කියන සාකච්ඡාව සමාජය තුළ තිබුණා. අන්න ඒ අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා යෝජිත සංශෝධනය මඟින් කටයුතු සැලැස්වීමට සහ විධිමත් ක්‍රමෝපායයන් හැදෑරීමේ අවස්ථාවකට ඉඩ සලසා තිබෙනවා. විශේෂයෙන් රාජ්‍ය අංශයත්, ඒ වාගේම රාජ්‍ය අංශයට තාක්ෂණික කාර්යයන් සිදු කරන විට පෞද්ගලික අංශයත් සමාන නම්‍යශීලීත්වයෙන් යුතුව කටයුතු කිරීමේ වැදගත්කම තහවුරු කිරීමට පනත නවීකරණය කිරීම හරහා අවස්ථාව සැලසී තිබෙනවා.

අපි දන්නවා දැනටමත් අනන්‍ය ඩිජිටල් හැඳුනුම්, ඒ වාගේම අන්තර් ක්‍රියාකාරී වේදිකා සහ කලාපීය Cloud පහසුකම් පිළිබඳව ලෝකය තුළත්, ලංකාව තුළත් අවධානය යොමු වෙලා තිබෙන බව. මේ පනත සංශෝධනය හරහා මේ සියල්ල අරමුණු කර ගනිමින් වඩාත් ආයෝජන සහ නවෝත්පාදන හිතකාමී පරිසරයක් ඇති කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, මේ පනත් කෙටුම්පත යටතේ නිකුත් වන නීති රීති සහ නියමයන් මඟින් මේ වැඩසටහන් නීතිමය ආරක්ෂාවෙන් යුතුව, තරගකාරී බවින් යුතුව, ජාත්‍යන්තර විශ්වාසය ඇති වන පරිදි ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

ඇත්තටම ඒ අර්ථයෙන් ගත්තාම, මේ ඉදිරිපත් කර තිබෙන සංශෝධන මඟින් සිදු වන්නේ අපේ රටේ පෞද්ගලික දත්ත ආරක්ෂණ ක්‍රමවේදයන් ඒ ජාත්‍යන්තර framework එකත් එක්ක සමානුපාතික වන විධියේ, විශේෂයෙන් ඒ දත්ත දායක කරන, තමන්ගේ දත්ත ඉදිරිපත් කරන පුද්ගලයන්ගේ ආරක්ෂාව; ඒ අයගේ පෞද්ගලික ආරක්ෂාව තහවුරු වන විධියේ පනතක් සකස් කිරීමයි. ඒ වාගේම, ඒ පෞද්ගලික ආරක්ෂාව වඩාත් තහවුරු වන සංශෝධන කිහිපයක් තමයි මේ පනත් කෙටුම්පතින් ඉදිරිපත් වෙලා තිබෙන්නේ.

මේ කාරණය පිළිබඳ සමාජ සාකච්ඡාවලදී සමහර වෙලාවට සමහර අය බය වෙනවා, මේ වාගේ දේවලට තමන්ගේ තොරතුරු ඉදිරිපත් කළාම තමන්ගේ පෞද්ගලිකත්වයට බාධාවක්, හානියක් ඇති වනවා කියලා. ඇත්තටම මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතින් කර තිබෙන්නේ මොකක්ද? ලෝකයේ බොහෝ රටවල් කර තිබෙනවා වාගේ මේ පනත් කෙටුම්පතින් කර තිබෙන්නේ ඒ පෞද්ගලික දත්ත ආරක්ෂා කර ගැනීම සඳහා කටයුතු කිරීමයි. ඒ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමේ ක්‍රමවේදයන් සහ නීතිමය කාර්යයන් රටේ digital economy එකේ වර්ධනයට හානියක් නොවන විධියට වැඩි අවකාශයක් සලසමින්, පුද්ගලයන්ට පෞද්ගලික දත්ත, තොරතුරු ඉදිරිපත් කරමින්, නමුත් ඒ අයගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරමින් කටයුතු කිරීමේ අවස්ථාව සකස් කර දීමයි. ඒ අර්ථයෙන් ගත්තාම, විශේෂයෙන් මෙය ජාතික ජන බලවේගය රජය හැටියට අප digital economy එක පිළිබඳව වැඩි අවධානයක් යොමු කර තිබෙන යුගයක්. ඒ නිසා මේ වාගේ පනතක් සංශෝධනය වීම අතිශයින් වැදගත් කියලා මම කල්පනා කරනවා.

බෙහෙවින්ම ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Amila Prasad. You have 11 minutes.

[අ.භා. 12.16]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම මට කලින් කථා කරපු ගරු ඇමතිතුමා කාලයකට පෙර ආචාර්යවරයකු විධියට කැලණිය විශ්වවිද්‍යාලයේදී මට උගන්වා තිබෙනවා. ඒක මට සතුටක්. ගරු ඇමතිතුමනි, ඒ කාලයේ ඔබතුමා ලස්සනට ඉගැන්නුවා. ඒකටත් බොහොම ස්තුතියි. එතුමා කථා කළාට පස්සේ මට කථා කරන්න ලැබීමත් මට සතුටක්.

ලංකාවේ අනාගත ක්‍රියාවලියට ඉතාම වැදගත් වන කාරණයකට අදාළ පනත් කෙටුම්පතක් තමයි අද දෙවැනිවර කියවීමට ඉදිරිපත් කර තිබෙන්නේ. රටේ බහුතර මහජනතාවගේ පෞද්ගලික තොරතුරු, ඒ කියන්නේ තමන් විතරක් මේ දක්වා දැනගෙන ඉන්නා තොරතුරු සමාජයට මුදා හැරීමත් සමඟ ඒ පෞද්ගලික තොරතුරුවල ආරක්ෂාව කොයි තරම් දුරට පවතිනවාද කියන කාරණයට අදාළ ඉතාම වටිනා පනත් කෙටුම්පතක් තමයි අද විවාදයට ඉදිරිපත් කර තිබෙන්නේ.

විශේෂයෙන්ම ලංකාවේ ඉන්න මිනිස්සුන්ට, හුදු මහජනතාවට තිබෙන ප්‍රශ්නයක් තමයි අනෙකාගේ පෞද්ගලිකත්වය, අනෙකාගේ පෞද්ගලික තොරතුරු පිළිබඳව තිබෙන වගවීම. ඒ කියන්නේ වෙන කෙනෙකුගේ පෞද්ගලික තොරතුරු තමන් දැනගන්න ඕනෑද, නැද්ද කියන එක පිළිබඳ නිරවුල් අදහසක් නැති රටක තමයි මේ පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත එන්නේ. විශේෂයෙන්ම තමුන්ගේ ඇඟිලි සලකුණේ ඉඳලා, blood group එක, තිබෙන රෝගාබාධ පිළිබඳ තොරතුරු කියන ඒ සියලු දේවල් මේ කාල සීමාව වෙද්දීත් විවිධ තැන්වලට අපිත් ඇතුළුව සියලුදෙනා දීලා ඉවරයි. මගේ උපන් දිනයේ ඉඳලා මම කැමැති, අකමැති සියලු තොරතුරු එසේ ලබා දුන්නාට පස්සේ, ඒ ආයතන එම තොරතුරු කවර ආකාරයකට භාවිත කරනවාද, මම ලබා දුන් තොරතුරු මගේ අවශ්‍යතාවට පරිබාහිරව භාවිත කරලා වෙනත් කණ්ඩායම්වලට ලබා දෙනවාද, ඒ ආයතන ඒ ලබා ගන්නා තොරතුරු යළි කවර ආකාරයකටද අවභාවිත කරයිද කියන ප්‍රශ්නවලට පිළියමක් ලබා දෙන පනතකට අදාළ කෙටුම්පතක් තමයි අද මේ ඉදිරිපත් කර තිබෙන්නේ. හැබැයි, ඩිජිටල්කරණය කියන ක්‍රියාවලියට අත්‍යවශ්‍ය මේ අණ පනත්, නීති ක්‍රියාත්මක කරන අතරතුර, ඔබේ ආණ්ඩුව විසින් මේ සියල්ලටම පත් කර තිබෙන්නේ මේ රටේ තොරතුරු හුවමාරුවට අදාළව තිබෙන විශාල ආයතනවල ප්‍රධානීන් බවත් මෙතැනදී සඳහන් කරන්න ඕනෑ. එතකොට එතැනින්ම, එම පත් කිරීම් තුළින්ම මේ තොරතුරුවල ආරක්ෂාව පිළිබඳව ගැටලුවක් මතු වෙන බව පෙනෙනවා. එහෙම නම් මෙම පනත් කෙටුම්පත සම්මත කිරීම තුළ ඉතාම තදින් ක්‍රියාත්මක විය යුතු දේ තමයි, අපෙන් ලබා ගන්නා තොරතුරු වෙන කෙනෙකුට දුන්නොත්, අවභාවිත කළොත් ඒ වෙනුවෙන් ගන්න පුළුවන් නෛතික ක්‍රියාමාර්ග. ඒවා මොනවාද කියා සමාජය දැනුවත් කිරීම අත්‍යවශ්‍යයි කියලා මම විශ්වාස කරනවා.

අපි හැම වෙලාවේම විශ්වාස කරන්නේ ආර්ථිකය පෞද්ගලික අංශයට විවෘත වෙන්න ඕනෑය කියලායි. පෞද්ගලික අංශයට

[ගරු අමිල ප්‍රසාද් මහතා]

ආර්ථිකය විවෘත වෙනකොට ආර්ථිකය හසුරුවා ගෙන යෑම සඳහා සමාජයකට, රටකට, ලෝකයට දත්ත, තොරතුරු අතිශය වැදගත්. හැබැයි, රාජ්‍යයේ වගකීම තමයි පෞද්ගලික ආයතන විසින් ලබා ගන්නා අපේ තොරතුරු කවර ආකාරයකටද භාවිත කරන්නේ කියන කාරණය පිළිබඳව සහ ඒවා රඳවා ගන්නා තැන්වල ආරක්ෂාව පිළිබඳව අවධානය යොමු කිරීම. ඒ ගැන අදහසක් ආණ්ඩුවට තිබෙන්න ඕනෑ. ඒවා ආරක්ෂා කිරීමේ වගකීම ආණ්ඩුවට තිබෙනවා කියලා මම විශ්වාස කරනවා.

ඒ වාගේම තමයි අප එකිනෙකා අතර හුවමාරු කරගන්නා පෞද්ගලික තොරතුරු -ඒවා දුරකථන සංවාද වෙන්න පුළුවන්, තරුණ වයසේ ළමයින්ගේ ඡායාරූප හුවමාරු කර ගැනීම් වෙන්න පුළුවන්, වීඩියෝ පට වෙන්න පුළුවන්, වෙනත් පෞද්ගලික තොරතුරක් වෙන්න පුළුවන්- සමාජයට මුදා හරින අවස්ථා තිබෙනවා. මෙවැනි පනත් කෙටුම්පතක් ගැන කථා බහට ලක් වෙන මෙවන් මොහොතක මා සඳහන් කරන්න කැමැතියි, තමන්ගේ පෞද්ගලික තොරතුරක් අවභාවිත වන අවස්ථාවකදී ඒ අය ඒකෙන් ආරක්ෂා කර ගැනීමේ වගකීමත් මේ පනත් කෙටුම්පත සම්මත කිරීමෙන් පසු ක්‍රියාත්මක විය යුතුයි කියා. ඒ හැම එකක් පිළිබඳවම අවධානය යොමු කරමින් යාවත්කාලීන කළ යුතු තොරතුරු පද්ධතියක්, නීතිමය පද්ධතියක් ලෙස මෙය ක්‍රියාත්මක වෙන්න ඕනෑ.

මිනිස්සුන්ගේ ඡායාරූපයේ සිට ඇඟිලි සලකුණු දක්වා වන ඒ හැම පෞද්ගලික තොරතුරක්ම "පෞද්ගලිකයි" කියන අදහසට යටත්ව ආරක්ෂා කිරීමේ වගකීම තමයි රජයට තිබෙන්නේ. නමුත් මෑත කාලයේ අපි දැක්කා, සයිබර් අවකාශයේ සිදුවීම් ගණනාවක් සිද්ධ වුණ බව. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සහ පෞද්ගලික බැංකුවක දත්ත ඒ ආයතනවලට හොර රහසේ වෙනත් කණ්ඩායම් විසින් අරගෙන තිබුණා. ඒ අය ඒ දත්ත තමන්ගේ ව්‍යාපාරවලට, එහෙම නැත්නම් වෙනත් කණ්ඩායම් අතට ලබා දී තිබුණු ආකාරය අපි දැක තිබෙනවා.

ඒ දත්ත භාවිත කරන වෙලාවේ දී ඒ වෙනුවෙන් අපට ගන්න පුළුවන් සහ ආණ්ඩුව පසුගිය මාස කිහිපය තුළ ගත්ත ක්‍රියාමාර්ග මොනවාද කියලා දැන ගන්න කැමතියි. විශේෂයෙන්ම පෞද්ගලික බැංකුවක දත්ත ඉවතට ගියාට පස්සේ, අඩුම තරමින් ඒ පෞද්ගලික බැංකුවේ සේවය ලබා ගත්ත මිනිස්සුවත් බැංකුව විසින් දැනුවත් කළේ නැහැ, මෙන්න මේ දත්ත ටික එළියට ගියා කියලා. ඒක පවා වළක්වලා තිබෙනවා. අපට දීලා තිබුණු මේ තොරතුරු ටික මේ වෙද්දී අපෙන් ගිලිහිලා තිබෙනවා, මේ ගිලිහිලා තිබෙන තොරුතුරු ආශ්‍රිතව ඔබට අවැඩක්, අවාසියක් වෙන්න පුළුවන් කියලා දැනුවත් කිරීමක්වත් මේ දක්වා කරලා නැහැ. මේ පවතින නීති රීතිවලින් ආණ්ඩුව මොනවාද ඒ වෙනුවෙන් ගත්ත ක්‍රියාමාර්ග කියලා මම දැන ගන්න කැමතියි.

ඒ වාගේම මේ ක්‍රියාවලිය අතිශය සංකීර්ණයි. ඩිජිටල්කරණය කියන ක්‍රියාවලියත් එක්ක මේ දත්තවල ආරක්ෂාව වෙනුවෙන් මේ ආණ්ඩුව මේ වෙද්දී අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලාත් මම කරුණු කිහිපයක් ඔස්සේ අහන්න කැමතියි.

විශේෂයෙන්ම පෞද්ගලික දත්ත ආරක්ෂණ අධිකාරිය - PDPA එක - සඳහා අවශ්‍ය servers, data centres, encryption devices වාගේ දේවල් රඳවලා තිබෙන තැන්වල ආරක්ෂාව සහතික වෙලා ද තිබෙන්නේ? ඒ වාගේම පැය 24ම විදුලිය ලබා දීමේ ඉඳලා වෙනත් පරිසර සාධක මතවත් බිඳ වැටීම්වලට ඉඩක් තිබෙනවාද කියලා මම අහන්න කැමතියි. මම එහෙම අහන්නේ අපේ රට විදුලිය පවා පැය 24ම ලබා දෙන්න බැරි රටක් නිසායි. යම් යම් අවස්ථාවල දී අපේ රටේ විදුලිය බිඳ වැටීම් වෙනවා. ඒ නිසා මේ පද්ධතිවල ආරක්ෂාව වෙනුවෙන් ආණ්ඩුව අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලා මම අහන්න කැමතියි. ඒ වාගේම ඇමතිතුමාත් කියපු ආකාරයටම cross-border data transfer කියන ගෝලීය දත්ත ප්‍රවාහනය කරන්න අපට ඉහළම තත්ත්වයේ VPN හෝ MPLS වාගේ systems තිබෙනවාද? මම දන්නා තරමින් අපේ රටේ එවැනි systems නැහැ. ඒ නිසා මේ ඩිජිටල්කරණය කියන ක්‍රියාවලිය ගැන අපි කථාවක් විධියට කිව්වාට, මේ වෙනුවෙන් රටක් විධියට අපි තවම සූදානම්ද? ලංකාවේ තිබෙන රාජ්‍ය ගෙවීම් පද්ධතිය - GovPay system එක - වැඩ ද? ඒ system එක ක්‍රියාත්මක වෙනවාද? පසුගිය කාලයේ RMV එකේ දාලා තිබුණා App එකක්. ඒ App එක මේ වෙද්දී ක්‍රියාත්මක වෙනවාද? තවමත් අපි ඩිජිටල්කරණය කියන ක්‍රියාවලියේ දී ලෝකයේ රටවලට වඩා බොහෝ පසුපසින් සිටින අතරතුරත්, ඩිජිටල්කරණය පිළිබඳ ලොකු විශ්වාසයක් තියා ගෙන සිටින ආණ්ඩුවක් විධියට ඔබතුමන්ලා මේ වෙනුවෙන් අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලා මම අහන්න කැමතියි.

ඒ වාගේම තමයි රාජ්‍ය ගෙවුම් පද්ධතියේ e-payment system එකත් එක්ක බලනකොට, මේ වෙද්දී ඒකේ පවතින යාවත්කාලීන තත්ත්වය කොයි වාගේද? මේ වෙද්දී ගෙවුණු මාස හතක කාලය තුළ ඔබතුමන්ලා කොච්චර ඉදිරියට ඇවිල්ලා තිබෙනවාද? ඊට අමතරව අපි දිගටම කථා කරන දේවල් තිබෙනවා. අපේ Identity Card එකේ chip එකක් තිබෙනවා. Driving licence එකේ chip එකක් තිබෙනවා. ඒ තොරතුරු ග්‍රහණය කර ගන්න පොලිස් ස්ථානවලට, උසාවිවලට ඒ අවශ්‍ය උපකරණ දීලා තිබෙනවාද? මේ උපකරණ ටික නොදී කොයි තරම් මේ Identity Card එක හැදුවත්, licence එක හැදුවත් මේ දේවල් ග්‍රහණය කර ගන්න උපකරණ නැත්නම්, ඒ ආයතනයේ ඉන්න නිලධාරියෙකුගේ පෞද්ගලික දුරකථනයකින් නම් මේ chip එක ග්‍රහණය කර ගන්නේ, එතැනින් පෞද්ගලික තොරතුරු ආරක්ෂා වෙන්නේ නැහැ. ඒ තොරතුරු එතැනින් ඉස්සරහට යනවා. ඒ කියන්නේ වෙන අය අතට පත් වෙනවා. ඒ වෙනුවෙන් ආණ්ඩුව අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලා අහන්න කැමතියි.

ඊළඟ ප්‍රශ්නය තමයි මානව සම්පත් හිඟය. අද ඔබතුමන්ලා කථා කරමින් තිබෙන PDPA එක ක්‍රියාත්මක කරන්න අවශ්‍ය DPOsලා - Data Protection Officersලා - ඉන්නවාද? අපට සයිබර් ආරක්ෂණ විශේෂඥයන් ඉන්නවාද? මේ පද්ධතියට අවශ්‍ය මානව සම්පත අඩුයි. සමහර විටෙක අපට මේ වෙනුවෙන් ගෙවන්න වෙන වැටුප විශාලයි. ඒ ක්‍රියාවලිය ඔබතුමන්ලාගේ රජය තනිවම ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවාද? එහෙම නැත්නම් මේකට පෞද්ගලික අංශයේ අය උදව් කර ගන්නවාද? මේ පිළිබඳ නිරවුල් අදහසක් ආණ්ඩුව පැත්තෙන් ඉදිරිපත් කර තිබෙනවා මම තවමත් දැකලා නැහැ. ඒ නිසා ඒ පිළිබඳවත් ඔබතුමන්ලාගේ අදහස් අහන්නට කැමතියි. ඔබතුමන්ලාට පුළුවන්කමක් තිබෙනවා නම් ඊළඟ කථාවේ දී මේවාට උත්තර දෙන්න.

ඊළඟට, මේ Act එකේ තවත් පොඩි ගැටලු ටිකක් මම දැක්කා. ඒ, මෙන්න මේ වාගේ ගැටලු කිහිපයක්. පළමු එක තමයි PDPA එකේ ඉතිරි කොටස් ක්‍රියාත්මක කරන එක. දැන් ඔබතුමා කිව්වා මාර්තු මාසයේ දිනයක් දීලා, මේ වෙද්දී ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියලා 2022දී සැලසුම් කළා කියලා. 2022දී සැලසුම් කළේ 2025දී ක්‍රියාත්මක වෙන්නයි. නමුත්, 2025දී මේක ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා. ඒකට හේතුව හැටියට රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ මේ පිළිබඳ දැනුවත්භාවය තිබෙන නිලධාරීන්

සහ ඒවා ක්‍රියාත්මක කරන්න අය හිටියේ නැහැ කියන එකයි මගේ අදහස. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කවදාද බලාපොරොත්තු වෙන්නේ මේ ක්‍රියාවලිය අවසන් කරන්න? මේ system එක, මේ පනත මුළුමනින්ම ක්‍රියාත්මක කර ගන්න බලාපොරොත්තු වෙන කාල රාමුවක් හදලා තිබෙනවාද කියලා මම අහන්න කැමතියි. ඒ වාගේම ගෙවුණු අවුරුදු කිහිපය තුළ ගොඩක් සාකච්ඡා වුණා, මෙහි ස්වාධීනත්වය පිළිබඳව. නීතියෙන් ස්වාධීන කරපු, මේ අපි කථා කරන පනත හා සම්බන්ධ ආයතනවල මූල්‍ය ස්වාධීනත්වය පිළිබඳව ආණ්ඩුවේ අදහස කුමක්ද? ආණ්ඩුව විසින් හෝ වෙනත් ආයතනයක් විසින් මේ වෙනුවෙන් මුදල් ලබා දෙනවා නම් මූල්‍ය ස්වාධීනත්වය පිළිබඳ අර්බුදයක් එතැන තිබෙනවා. ඒ වාගේම, මිනිස්සුන්ගේ පෞද්ගලික තොරතුරු තමන් ලබා දුන් වැඩේට අමතරව වෙන වැඩවලට භාවිත කරනවා. එසේ භාවිත කිරීම සම්බන්ධයෙන් "අපි මේ විධියට ගන්නවා, ගන්නද" කියලා අහන්න, ජනතාව දැනුවත් කරන්න නිශ්චිත ක්‍රියාමාර්ගයක් මම මේ පනත ඇතුළේ තවම දැක්කේ නැහැ.

ඊළඟ ප්‍රශ්නය තමයි, පෞද්ගලික තොරතුරුවල තිබෙන වැදගත්කම පිළිබඳව රටේ මිනිසුන්ට අවබෝධයක් නැහැ. මම කථාව පටන් ගත්තේත් එතැනින්. අපේ පෞද්ගලික තොරතුරු කොයිතරම් අපට වැදගත්ද කියලා රටේ ජනතාව තවම දන්නේ නැහැ. ජනතාව මේ පිළිබඳව දැනුවත් කරන්න ඔබ ගන්න බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග මොනවාද? මගේ අදහස නම්, මේ විෂයයන් පාසල් විෂය පද්ධතියට පවා ඇතුළත් වෙන්න ඕනෑ කියන එකයි. අධ්‍යාපනය යාවත්කාලීන වෙනවා කියන්නේ ඒක. යල්පැනගිය කොටස් ඉවත් කරලා, මේ වාගේ අලුත් කරුණු විෂය මාලාවට දැම්මොත් තමයි මේ රටේ ජනතාව මේ පිළිබඳව දැනුවත් වෙන්නේ කියන එකයි මගේ අදහස.

ඒ වාගේම තමයි, අපේ රෝහල්වල labsවල තිබෙන පෞද්ගලික තොරතුරු ඉවතට ගියොත් ඒකෙන් ජීවිත හානි වුණත් සිද්ධ වෙන්න පුළුවන්. මේ පිළිබඳව ඔබතුමන්ලාට අවබෝධයක් තිබෙනවාද? මේ පනත් කෙටුම්පත කියවනකොට මම දැක්කේ නැහැ, ඔබතුමන්ලා සංශෝධනවලදී ඒ පිළිබඳව අවධානය යොමු කර තිබෙන බවක්. ඒ වාගේම තමයි, මේ labsවල තිබෙන තොරතුරු ආරක්ෂා කරන ආයතනවලට ආණ්ඩුවෙන් ලබා දෙන අනුකූලතා වගකීම් සහතිකයක් තිබෙනවාද? එවැනි අනුකූලතා වගකීම් සහතිකයක් තිබෙනවා නම් මිනිසුන් භය නැහැ. අපි ලෑස්තියි ගිහිල්ලා ඒ තැනට අපේ තොරතුරු ටික දෙන්න. මොකද, ආණ්ඩුවත් එක්ක ඒගොල්ලන් බැඳිලා ඉන්නවා. ඒ වාගේම, ඒ අනුකූලතාවලට එකඟව කටයුතු නොකළොත් ඒ වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳවත් ජනතාව දැනුවත් වෙනවා.

ඒ වාගේම මේ කාරණයත් වැදගත්. දැනට දත්ත එකතු කරලා තිබෙන ආයතන තිබෙනවා. ඩයලොග් ආයතනය වෙන්න පුළුවන්, මොබිටෙල් ආයතනය වෙන්න පුළුවන්, එහෙම නැත්නම් අපි කලින් කථා කරපු ලංකා විදුලිබල මණ්ඩලය වෙන්න පුළුවන්, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙන්න පුළුවන්, ජාතික රෝහල් පද්ධතිය වෙන්න පුළුවන්, මේවායේ දැනට දත්ත එකතු කරලා තිබෙනවා. ඒ තොරතුරු මේ පනතට අනුකූලව පවත්වා ගෙන යන්න කාලයක් දෙනවාද? එහෙම නැත්නම් මේ අනුකූලතාව, ඒ කියන්නේ මේ පනතට මේ ටික ඇතුළත් කර ගන්නේ කොහොමද, ඒ ආයතනවලට කොයි තරම් කාලයක් ලබා දෙනවාද යනාදී කාරණා පිළිබඳව මේ පනත් කෙටුම්පත කියැවීමේදී මම දැක්කේ නැහැ. ඒ සම්බන්ධවත් අදහසක් ලෙස ඉදිරිපත් කරන්න පුළුවන් නම් හොඳයි.

ඊළඟ කාරණය මේකයි. දත්ත පවත්වාගෙන යන ආයතන මේ පනතට අනුකූල නොවන පරිදි ක්‍රියාත්මක වුණොත් ඒ වෙනුවෙන් විශාල දඬුවම් පමුණුවනවා කියලා ඇමතිතුමා කියනවා මම දැක්කා. ප්‍රශ්නය තිබෙන්නේ, දඬුවම් පැමිණවීමෙන් පසුව ඒ වෙනුවෙන් අභියාචනයක් ඉදිරිපත් කරන්න ඒ ආයතනවලට අවස්ථාවක් තිබෙනවාද කියන එකයි. ඒ අභියාචනය ඉදිරිපත් කරන්නේ කොහොමද කියලා රටේ ජනතාවත්, ඒ ආයතනත් දැනගත යුතුයි කියලා මම විශ්වාස කරනවා. දැනට තිබෙන තොරතුරු දැනගැනීමේ පනත, සයිබර් ක්‍රියා සම්බන්ධයෙන් වන පනත වැනි ඒවා එක්ක අලුතින් ඉදිරිපත් කරන පනත කොයි තරම් සම්බන්ධද, කොයි තරම් කැපෙනවාද, ඒ ස්ථානවලදී ගැටීම් ඇති වෙන තැන් පිළිබඳව අවධානය යොමු කරලා, ඒ ගැටුම් නිරාකරණය කර ගන්න ඔබ යොමු කරන අවධානය මොකක්ද කියලාත් මම අහන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up now.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
Sir, please give me one more minute.

මේ වාගේ සමපාත වන වෙනත් නීති ලෝකයේ තවත් රටවල තිබෙනවා. මොකද, මේක ගෝලීයකරණය හා සම්බන්ධ පනතක්. මේ පනත ලෝකයේ අනෙක් රටවල් එක්ක ගැට ගැහෙන්නේ කොහොමද කියලා මම දැනගන්න කැමැතියි. ඒක අනෙක් රටවලට සම්බන්ධ වෙලා තිබෙනවාද? මේක ලෝකයේ අනෙක් රටවලට සම්බන්ධ වෙච්ච පනතක්ද? අපිට ඒවායින් barriers තිබෙනවාද? ඒ වාගේම, මේක අවුරුද්දෙන් අවුරුද්දවත් යාවත්කාලීන විය යුතුයි. මොකද, ලෝකය වෙනස් වෙනකොට ප්‍රමුඛතා වෙනස් වෙනවා. ඒ වෙනස්වීමත් එක්ක මේ පනතේ වෙනස්කම් සිදු විය යුතුයි. ඒ පිළිබඳව ඔබේ අවධානය යොමු කර තිබෙනවාද?

අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. දත්ත මැකීම පිළිබඳව අදහසක් ඉදිරිපත් කළා. මේ දත්ත මැකීමේදී තමන්ට අයිතියක් තිබෙන්න ඕනෑ, තමන් ලබා දුන් යම් තොරතුරක් තමන් අකමැති නම් එතැනින් ඉවත් කරගන්න. තමන් මීට කලින් ඉදිරිපත් කරපු දත්ත, සමහර විට ගූගල් ආයතනය වෙන්න පුළුවන්, එහෙම නැත්නම් වෙනත් තැනක් වෙන්න පුළුවන් - සමහර විට හඬක්, නැත්නම් කථාවක්, එහෙමත් නැත්නම් මේ තැන්වල තිබෙන තමන්ගේ මොකක් හෝ තොරතුරක් - තමන් අකමැති නම් එතැනින් ඉවත් කරන්න මහජනතාවට අවස්ථාවක් තිබෙන්න ඕනෑ. ඒක පහසුවෙන් කර ගන්න අවස්ථාව ඔවුන්ට තිබෙන්න ඕනෑ. ඒ වෙනුවෙන් ඔබේ රාජ්‍යයේ මැදිහත්වීම කොයි වාගේද? ඒ වෙනුවෙන් ආයතන නිර්මාණය වෙනවාද? මේ පනතට යටත්ව දත්ත මකා දැමීමේදී මකා දැමිය හැක්කේ කුමන දත්තද? විශේෂයෙන්ම පසුගිය දවස්වලත් අපි දැක්කා, මෙවැනි දේවල්. පෞද්ගලික තොරතුරු හැරුණුකොට දේශපාලනයේ යෙදෙන අයට තමන් කලින් කියපු කථා මකන්නත් මේ දත්ත මකා දැමීමේ නීතිය භාවිත කරන්න පුළුවන්. තමන් කලින් කියන්න පුළුවන් දේවල් ටික ඔක්කෝම කියලා ඒ සියලු දේවල් ටික මකලා, අලුත් මිනිහෙක් බවට පත් වෙන්න උත්සාහ කරන්න පුළුවන්. විශේෂයෙන්ම රාජ්‍ය පාලනය කරන අය සහ රාජ්‍ය පාලනය භාර ගන්න බලාපොරොත්තුවෙන් සිටින අය ඒ දේවල් කරන්න පුළුවන්. ඒ වාගේ කොටස් මකන්නට අවස්ථාවක් නැති වෙන්න ඕනෑ. ඒවා රටේ භාවිත කරන්න පුළුවන්කම තිබෙන්න ඕනෑ. හැබැයි, අපේ පෞද්ගලික තොරතුරු අයින් කරන්න අවශ්‍ය ඕනෑම අවස්ථාවක ඒවා අයින් කරන්නත් මේ පනත හරහා අවස්ථාව පහසුවෙන් ලබා දෙන්න

[ගරු අමිල ප්‍රසාද් මහතා]

අවශ්‍යයි කියන අදහසත් මම ඉදිරිපත් කරනවා. මේ කරුණුවලට ඉතාම සාධනීය පිළිතුරු ආණ්ඩුව පැත්තෙන් ලැබෙයි කියන අපේක්ෂාවෙන් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු ජනක සේනාරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna)

අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

අපි මේ ජීවත් වන යුගය තොරතුරු තාක්ෂණ යුගයක්. දත්ත සහ තොරතුරු මත තීන්දු-තීරණ ගැනීම අපේ රටේ දේශපාලනයට වාගේම අපේ රටේ ආණ්ඩුකරණයට අලුත් දෙයක් වෙමින් පවතිනවා. දත්ත සහ තොරතුරු මත තීන්දු තීරණ ගැනීම අපේ රටේ ආණ්ඩුකරණය නව මානයකට යොමු කරවමින් ඉන්නවා. දත්ත සහ තොරතුරු, ධනය සහ බලය වෙනුවෙන් භාවිත වෙනවා වාගේම ඒවා විකෘති කරමින් අවභාවිතවීමත් සැලකිය යුතු මට්ටමින් සිදු වෙනවා.

මට කලින් කථා කරපු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්න ගණනාවක් යොමු කළා. එතුමාගේ එක ප්‍රශ්නයක් වුණේ මේ සඳහා කාලරාමුවක් කියන්න කියලායි. පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට අපි සංශෝධන 13ක් ගෙනැත් තිබෙනවා. ඒ අතරින් නීතිය බලපැමේ ප්‍රකාශය යටතේ වූ 2වන වගන්තියේ (අ) යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "1 වන වගන්තිය හැර ප්‍රධාන ප්‍රඥප්තියේ අනෙකුත් සියලු විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක දී හෝ දිනවල දී බලාත්මක වීම පිණිස; සහ"

ඒ කියන්නේ, අපේ රටේ තිබෙන තාක්ෂණික යටිතල පහසුකම් පද්ධතිය, ඒ වාගේම අපේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන පද්ධතිය බලාපොරොත්තු වන ඩිජිටල්කරණයට ගෙන යෑමට, එහෙම නැත්නම් මේ පනත ක්‍රියාත්මක කිරීම අරමුණු කරන මට්ටමට සූදානම් කිරීම සඳහා යම්කිසි කාලයක් ගත වෙනවා. ඒකට ගත වෙන්නේ සතියක්ද, මාසයක්ද කියලා හරියටම නිශ්චය කරන්න බැහැ. නමුත්, සම්පූර්ණයෙන්ම මේ පනත ක්‍රියාත්මක කිරීම මාස 6කට නොඅඩු කාලයකින් දීර්ඝ කරන්න කියලා සංශෝධනය කරලා තිබෙනවා. එහෙම නැත්නම් මෙය ක්‍රියාත්මක වෙන්න තිබුණේ 2025 මාර්තු 18වැනි දා ඉඳන්. මට කලින් කථා කළ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමා මේ සම්බන්ධව බොහෝ ප්‍රශ්න ඇහුවා. ඒ ප්‍රශ්නවලට මේ පනත් කෙටුම්පතේම උත්තර තිබෙනවා. සම්පූර්ණයෙන් කියෙව්වොත් එය බලාගන්න පුළුවන්. ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍ය එරංග වීරරත්න මැතිතුමාගේ කථාවේදීත් ඒ ප්‍රශ්නවලට අදාළ නිශ්චිත පිළිතුරු ලබා ගන්න පුළුවන් වෙයි.

2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත බලාත්මක වෙලා තිබෙන්නේ, 2022 මාර්තු 19වැනි දා ඉඳන්. දකුණු ආසියාවේ පළමුවැනි වතාවට තමයි අපේ රටේ එවැනි පනතක් ක්‍රියාත්මක වෙන්නේ. 2019 ජූනි මාසයේ ඉඳලා තමයි ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය යටතේ විවිධ පාර්ශ්වවල අදහස් අරගෙන මේ පනත සකස් කරලා තිබුණේ. ගනුදෙනු සහ සන්නිවේදනයන්හි යෙදෙන දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට අවශ්‍ය නියාමන ක්‍රමවේදයක් ඇතිකිරීමත්, ඩිජිටල් ආර්ථිකය තුළ නවෝත්පාදනය සහ සංවර්ධනය සඳහා පහසුකම් සැලසීමත් තමයි මේ පනතින් අපේක්ෂා කළේ. දකුණු ආසියාවේ අපේ රටට පළමුවරට මේ පනත ගෙනාවේ යුරෝපීය සංගමයේ සාමාන්‍ය දත්ත ආරක්ෂණ නියාමනයන්ගේ ආභාසය ලබාගෙනයි.

පෞද්ගලික දත්ත - personal data - දායකයෙකු, data subject එකක් කියලා හඳුන්වනවා. පෞද්ගලික දත්ත විධියට හඳුන්වන්නේ, දත්ත දායකයෙකු එහෙම නැත්නම් data subject එකක් ලෙසින් හැඳින්වෙන ස්වාභාවික පුද්ගලයෙකු ඍජුව හෝ වක්‍රව හඳුනා ගත හැකි ඕනෑම තොරතුරක්. ඒ කියන්නේ, ස්වාභාවික පුද්ගලයෙකු ඍජුව හෝ වක්‍රව හඳුනා ගත හැකි ඕනෑම තොරතුරක් පෞද්ගලික දත්ත විධියට අර්ථ කථනය කර තිබෙනවා.

අපේ ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා මේ පිළිබඳව දීර්ඝ පැහැදිලි කිරීමක් කළා. 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ 3(1) වගන්තියට අනුව, දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට අදාළව වෙනත් ඕනෑම ලිඛිත නීතියක පවතින ප්‍රතිපාදනයක් මෙම පනතේ ප්‍රතිපාදනවලට පටහැනි වේ නම් එකී වෙනත් ලිඛිත නීතියේ ප්‍රතිපාදන නොතකා මෙම පනතේ විධිවිධාන බලපැවැත්විය යුතුයි කියලා සඳහන් වෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත වාගේ එකකින් මේ පනතේ විධිවිධාන උල්ලංඝනය වෙන්න බැහැ. එතකොට ක්‍රියාත්මක විය යුත්තේ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත හෝ වෙනත් පනතකින් මේ පනතේ ප්‍රතිපාදන උල්ලංඝනය කරන්න බැහැ.

එතකොට තාක්ෂණ ඇමතිවරයා විධියට එවකට හිටපු ජනාධිපතිවරයා විසින් 2023 ජූලි 21 දිනැති අංක 2341/59 දරන අති විශේෂ ගැසට් පත්‍රය නිකුත් කරලා ඒකේ නියෝගයට අනුව දත්ත ආරක්ෂණ අධිකාරියේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය 2023 අගෝස්තු මාසයේ පත් කිරීමට හැකි වන පරිදි 2023 ජූලි 17 දින පනතේ V කොටස, ඒ කියන්නේ දත්ත ආරක්ෂණ අධිකාරිය බලාත්මක වන දිනය ලෙස නම් කර තිබුණා. එතකොට මේ පනත අදියර වශයෙන් බලාත්මක කිරීමටත්, 2025 මාර්තු 18වෙනි දින සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමටත් අපේක්ෂා කර තිබුණා. 2024 ජනවාරි 08වන දින අංක 2366/08

දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් තමයි 2025 මාර්තු 18 වෙනකොට සම්පූර්ණයෙන් මෙම පනත ක්‍රියාත්මක කරන්න ඕනෑය කියන ඒ නියෝගය දීලා තිබුණේ. ඒ වුණත්, ඩිජිටල් ක්‍රමෝපායයන් අනුගමනය කිරීමට රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයෙන්ම එක සමාන ලෙස සහාය දක්වන අනාගත පාලන ක්‍රමවේදයක් තිබීමේ වැදගත්කම හඳුනා ගනිමින් දත්ත විෂයයන් හෙවත් පුරවැසියන් සහ සෙසු ආයතනවල අයිතීන් අර්ථවත්ව සුරක්ෂිත කිරීමේ හැකියාවෙන් යුත් අංග සම්පූර්ණ නියාමන ආයතනයක් පිහිටුවීමට සහායවීමේ අවශ්‍යතාව සලකා බලා පනත සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට පෙර එයට සංශෝධන එක් කිරීමට ඩිජිටල් ආර්ථික අමාත්‍යවරයා ලෙස ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සන්දේශයක් අමාත්‍ය මණ්ඩලය විසින් 2025 පෙබරවාරි 19වන දින අනුමත කළා. ඒ අනුව තමයි මේ සංශෝධන 13 ගෙන එන්නේ.

ඒ වාගේම මේ පනතට අනුකූල වීමට සූදානම්වීමේදී මානව සම්පත් සහ තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට අමතර කාලයක් අවශ්‍ය වෙනවා. ඒ සඳහා පනත බලාත්මක වන දිනය අඩු තරමින් මාස හයකින්වත් දීර්ඝ කිරීමට 2වන වගන්තිය සංශෝධනය කරලා තිබෙනවා. මේ සංශෝධන පනත් කෙටුම්පත 2025 මැයි 08වෙනි දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා, පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරුන්ට අධ්‍යයනය කිරීම සඳහා.

පසුගිය මැයි 27වෙනි දා පාර්ලිමේන්තුවේදී විද්‍යා, තාක්ෂණය සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව රැස්වුණා. එහිදී ආංශික අධීක්ෂණ කාරක සභාව නිරීක්ෂණය කළා, මෙන්න මේ දේවල්. 2022දී පනත සම්මත වුණත්, මේක ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී ගැටලු තිබෙන නිසා ඒවා තවමත් පූර්ණව ක්‍රියාවට නැංවී නොමැති බවත්, මේ සංශෝධන මඟින් ඒ බාධා ඉවත් කිරීමට අපේක්ෂා කරන බවත්. ඒ වාගේම මෙය අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමට ඉඩ සලසා තිබෙන බවත්, ඒ වාගේම දත්ත ආරක්ෂණ අධිකාරිය පිහිටුවා තිබුණත්, එය ක්‍රියාත්මක වීමට අවශ්‍ය 42කින් සමන්විත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ කටයුතු සිදු වෙමින් පවතිනවා. දත්ත ආරක්ෂණ අධිකාරිය විසින් ඔවුන්ගේ පළමුවෙනි කාර්යය විධියට තෝරාගෙන තිබෙන්නේ ජනතාව දැනුවත් කිරීමයි. අර කලින් කථා කළ මන්ත්‍රීතුමාත් ඇහුවා, මේ සම්බන්ධ කාල රාමු සහ මේකට තිබෙන බාධා මොනවාද, දැන් කරමින් ඉන්නේ මොනවාද කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, විපක්ෂයේ කට්ටිය බොහෝ කාලයක් මේ රට පාලනය කළා. ඒ වාගේම පසුගිය කාලයේ මැතිවරණ වේදිකාවලදී එතුමන්ලා "සයිබර් ටෝක්" දුන්නා. එහෙම "සයිබර් ටෝක්" දුන්නාට, මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන ආසනය ගත්තොත්, ඒ සමහර පැති ඉතාම දුෂ්කරයි. හරියට සයිබීරියාව වාගේ. මෙතුමන්ලා අවුරුදු 76ක් තිස්සේ මේ රට පාලනය කළා. කලවාන, පිටිගලකන්ද, අයගම, දුම්බරමානාන වාගේ පැතිවලට Internet තියා mobile phone signalවත් නැහැ. එහෙම රටක් තමයි දැන් ඩිජිටල්කරණයට යොමු වෙලා තිබෙන්නේ. ඒ නිසා මේකට යම්කිසි කාලයක් ගතවනවා. ඒ කාලය නිශ්චිතව කියන්න බැහැ.

"පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" යනුවෙන් මැතිවරණයට කලින් ඉදිරිපත් කරපු අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 130-133 දක්වා පිටුවල "ඩිජිටල් රාජ්‍යකරණයක් ජාත්‍යන්තර හවුල්කාරීත්වයක්" කියන තේමාව යටතේ මේ කාරණා සඳහන් වෙලා තිබෙනවා. අපි එහි මූලධර්ම සහ ක්‍රියාමාර්ග විධියට කාරණා රැසක් ඉදිරිපත් කරලා තිබෙනවා. පුරවැසියන්ට විනිවිදභාවයෙන් හා කාර්යක්ෂම සේවා සැපයීම සඳහා ප්‍රතිචාරාත්මක රාජ්‍ය අංශයක් බිහි කිරීම උදෙසා ප්‍රධාන රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම, බුද්ධිමය දේපළ අයිතිවාසිකම්, දත්ත පෞද්ගලිකත්වය, කම්කරු නීති හා බංකොලොත්භාවය ප්‍රකාශ කිරීම ආදිය සඳහා වන නව නීති පද්ධතියක් හඳුන්වා දීම, 2030 වර්ෂය වන විට තොරතුරු තාක්ෂණ ශ්‍රම බලකාය 200,000 දක්වා ඉහළ නැංවීම සඳහා පුහුණු සහ අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදී වශයෙන් අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඒ ක්‍රියාමාර්ග ගැන සඳහන් වෙලා තිබෙනවා.

මට වෙන් වී තිබෙන කාලය අවසන් නිසා අපේක්ෂා කළ සියලු කාරණා ප්‍රකාශ කරන්න අවස්ථාවක් නැහැ. මා සඳහන් කළ ආකාරයට, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව තමයි අපි මේ සංශෝධන ගෙනැවිත් තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මෙම පනත් කෙටුම්පතට සෘජුවම අදාළ නොවුණත් මේ කාරණයත් කියලා මම කථාව අවසන් කරන්නම්.

අපේ රටේ පසුගිය කාලයේ සමාජ මාධ්‍ය, සමහර ජනමාධ්‍යවලට අයත් සමාජ මාධ්‍ය පිටු, ප්‍රධාන ජනමාධ්‍ය විසින් දත්ත සහ තොරතුරු, ඒ වාගේම පුද්ගල දත්ත, පුද්ගලයන්ගේ ඡායාරූප, වීඩියෝ සමාජයට expose කළා. යම්කිසි සිද්ධියකින් පසුව කිසිදු විමසීමකින් තොරව ඒවා expose කළා. මිථ්‍යා මත සමාජගත කළා. ඒ වාගේම මිනිසුන්ගේ ජන මතය වෙනස් කරන්න ජාතිවාදය, ආගම්වාදය අවුළුවන්න දත්ත සහ තොරතුරු විකෘති කරලා පළ කළා. Dr. Shafieගේ සිද්ධිය, කැලණි ගඟේ නයා මතුවීමේ සිද්ධියේ සිට ලුණු හිඟය මවා පෑම දක්වා සිද්ධි ඊට උදාහරණ ලෙස ගන්න පුළුවන්. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු තුරෛරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[பி.ப. 1.11]

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் விவாதத்திற்கு எடுத்துக்கொள்ளப்பட்டுள்ள தனிப்பட்ட தரவுப் பாதுகாப்பு (திருத்தம்) சட்டமூலத்தை நான் வரவேற்கின்றேன் என்பதைக் கூறிக்கொண்டு, குறிப்பாக முல்லைத்தீவு, மன்னார், வவுனியா மாவட்டங்கள் சம்பந்தமான சில விபரங்களை இச்சந்தர்ப்பத்தில் தெரிவிக்க விரும்புகின்றேன்.

முல்லைத்தீவு மாவட்டத்தில் இந்த வருடத்தில் இதுவரையான காலப்பகுதியில் நீரில் மூழ்கி 17 பேர் உயிரிழந்துள்ளனர். கடந்த 2025.06.01ஆம் திகதியன்று, அதாவது நேற்றுமுன்தினம் முல்லைத்தீவு குமுழமுனைப் பகுதியில் கோவில் தீர்த்தக்கேணியில் மூழ்கி ரஜிதரன்

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

கிருஷிகா, சற்சொரூபநாதன் றஸ்மிலா ஆகிய இரண்டு பாடசாலை மாணவிகள் உயிரிழந்துள்ளனர். இது தவிர, சிலாவத்தை தாமரைக் குளத்தில் பூப்பறிக்கச் சென்ற இராஜசேகர் நிலாந்தன், சிவநேசன் பிரணவன் ஆகிய இருவருமாக நான்கு பேர் நீரில் மூழ்கி உயிரிழந்துள்ளனர். இவர்களில் மூவர் பாடசாலை மாணவர்கள். ஒரேநாளில் இந்த நான்கு பேரும் நீரில் மூழ்கி இறந்துள்ளமையால் முல்லைத்தீவு மாவட்டம் பெரும் சோகமயமாகவுள்ளது. இந்த மாணவர்களுக்கு நீச்சல் தெரியாது. இப்படியாகப் பல மாணவர்கள் உள்ளனர். எனவே, பாடசாலைகளில் - பெரிய பாடசாலைகளில் - நீச்சல் தடாகங்களை அமைத்து நீச்சல் பயிற்சிகளை மாணவச் செல்வங்களுக்கு வழங்கினால் நல்லது என எண்ணுகின்றேன். தயவுசெய்து இந்தக் கருத்துகளைச் சம்பந்தப்பட்டவர்கள் ஏற்றுக்கொண்டு இதற்கான வழிகளைச் செய்யவேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, அண்மையில் முகாமைத்துவ சேவை உத்தியோகத்தர் பதவிக்காகப் புதிய உத்தியோகத்தர்களை நியமிக்கும்பொருட்டுத் தேசிய மட்டத்தில் விண்ணப்பம் கோரப் பட்டுள்ளது. அரசின் இந்த முயற்சியை நான் வரவேற் கின்றேன். வன்னி மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில் எமது மன்னார், வவுனியா, முல்லைத்தீவு மாவட்டங்களின் நிலைமைகளைக் கவனத்திற்கொண்டு ஒரு தகவலைச் சொல்லுகின்றேன். அதாவது, இயன்றளவில் அந்தந்த மாவட்டங்களின் வெற்றிடங்களுக்கு அந்தந்த மாவட்டங்களைச் சேர்ந்தவர்களை நியமிப்பதனால் பின்னர் ஏற்படும் பல சிரமங்களைத் தவிர்த்துக்கொள்ளலாம் என்பது என்னுடைய கருத்து. இதனை உரியவர்கள் கவனத்திற் கொண்டு செயற்படுத்தும்படி வேண்டி நிற்கின்றேன்.

அடுத்து, மன்னார் மாவட்டத்தில் வங்காலைக் கிராமமும் மக்களும் எதிர்நோக்கியுள்ள ஆபத்தான நிலைமைகள் பற்றிய சில குறிப்புகளைத் தெரிவிக்க விரும்புகின்றேன். அவற்றைக் கவனத்திலெடுத்து அந்த மக்களுக்கு உரிய உதவிகள் வழங்கப்பட்டு அவர்களின் வாழ்க்கை காப்பாற்றப்பட வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன். குறிப்பாக, வங்காலைக் கடலரிப்பும் அதன் விளைவுகளும் குறித்துத் தங்களின் கவனத்திற்குக் கொண்டு வருகின்றேன். வங்காலைக் கிராமமானது நான்கு கிராம அலுவலர் பிரிவுகளையும், சுமார் பத்தாயிரம் மக்கள் தொகையையும் கொண்டது. அங்கு விவசாயமும் கடற்றொழிலும் பிரதான தொழிலாக உள்ளது. 450 வெளியிணைப்பு இயந்திரப் படகுகள் மூலமாக மீன்பிடித்தல், கரைவலைத் தொழில் போன்றவற்றில் அதிகமானவர்களின் வாழ்வாதாரம் தங்கியுள்ளது. கடந்த சில ஆண்டுகளாக ஏற்பட்டு வருகின்ற தீவிர கடலரிப்புக் காரணமாக இக்கிராமம் பாரிய நெருக்கடியைச் சந்தித்து வருகின்றது. அதனால் ஏற்பட்ட பாதிப்புக்களில் சிலவற்றை இங்கே குறிப்பிடுகின்றேன். மூன்று பெரிய தென்னந்தோப்புகள் - கிட்டத்தட்ட 2,000 மரங்கள் முற்றாக அழிவடைந்துள்ளன. இதேபோல், பனை மரங்கள், மற்றும் ஏனைய மரங்களையும் கடல் கொண்டு போய்விட்டது. மீன்வாடிகள், குடியிருப்புகள், மீன் சந்தைக் கட்டடம் போன்றவை பாரியளவில் பாதிப்படைந்துள்ளன. பழைய வைத் தியசாலைக் கட்டடம் முழுதாகக் கடலுக்குள் சென்றுவிட்டது. சுமார் 450 இயந்திரப் படகுகளையும் கரையில் பாதுகாப்பாக நிறுத்த முடியாது மீனவர்கள் திண்டாடுகின்றனர். எனவே, பொருத்தமான இடங்களில் கடலணை அமைக்கப்பட்டு மக்களையும் அவர்களின் வாழ்வாதாரத்தையும் பாதுகாக்க உடன் நடவடிக்கை எடுக்க வேண்டும்.

அத்தோடு, அங்கு இடம்பெறுகின்ற சட்டரீதியற்ற டைனமைற் பாவனை, கரையோரக் கண்டல் தாவரங்கள் அழிக்கப்படுதல், மணல் அகழ்வு போன்றவை முற்றாக நிறுத்தப்பட வேண்டும். இந்த விடயங்கள் 2025.05.28ஆம் திகதி நடைபெற்ற மன்னார் மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் விவாதிக்கப்பட்டபோது, ஏற்கனவே இரண்டு தடுப்பணைகளுக்கு நிதி ஒதுக்கப்பட்டிருப்பதாக மாவட்டச் செயலாளரால் தெரிவிக்கப்பட்டது. அந்தக் கூட்டத்தில் கலந்துகொண்ட நான் உட்பட கௌரவ பாராளுமன்ற உறுப்பினர்கள் உபாலி சமரசிங்ஹ, மயில்வாகனம் ஜெகதீஸ்வரன், றிஸாட் பதியுதீன், கே. காதர் மஸ்தான், இஸ்மாயில் முத்து மொஹம்மட் மற்றும் மாவட்டச் செயலாளர் ஆகியோர் வங்காலைப் பகுதிக்குச் சென்று பாதிக்கப்பட்ட இடங்களைப் பார்வையிட்டோம். மேலதிகமாக ஆறு தடுப்பணைகள் அமைக்கப்பட வேண்டுமெனவும் மக்களால் கோரிக்கை முன்வைக்கப்பட்டது. இந்த ஆபத்தான நிலைமைகள்பற்றி உரியவர்கள் கவனத்தில் எடுக்க வேண்டும். ஏனெனில், இவை மக்களின் பாதுகாப்போடு சம்பந்தப்பட்ட பிரச்சினை என்பதனால் உடன் சீர்செய்யப்பட வேண்டும் என்று இந்த உயரிய சபையில் கேட்டுக் கொள்கின்றேன். இதேபோன்று, முத்தரிப்புத்துறைப் பகுதியிலும் சீரற்ற காலநிலை காணப்படுகின்றது. உரியவர்கள் மக்களின் பாதுகாப்பு விடயத்தில் கரிசனையுடன் செயற்பட வேண்டும். அங்கு கடற்கரையோரத்திலுள்ள படையினருக்குத் தடுப்பணை அமைக்கப்பட்டுள்ள அதேநேரம், மக்களுக்குத் தடுப்பணை அமைக்கப்படவில்லை என்பதை இந்தச் சபையிலே நான் தெரிவித்துக் கொள்கின்றேன்.

அடுத்து, முல்லைத்தீவு மாவட்டத்தில் மக்கள் மீள்குடியேற்றப்படாமை பற்றிய விடயத்தைச் சொல்ல வேண்டும். கடந்த சில நாட்களில் முல்லைத்தீவு மாவட்டத்தின் ஒட்டுசுட்டான் பிரதேச செயலாளர் பிரிவில் நான் மேற்கொண்ட கள விஜயத்தின்போது, சில அரச திணைக் களங்கள் நூதனமான முறையில் தமிழ் மக்களின் காணிகளைத் திருடி வருவதை அவதானிக்க முடிந்தது. வனவளத் திணைக்களம், தொல்லியல் திணைக்களம், வன ஜீவராசிகள் திணைக்களம் ஆகியவை நாட்டில் நடைமுறையில் உள்ள சட்டங்களுக்கு முரணாகப் பொதுமக்களின் காணிகளைத் திருடிவருவதாகப் அம்மக்கள் குற்றஞ்சாட்டுகிறார்கள். மக்களின் குடியிருப்புக் காணிகளையும் வயல் நிலங்களையும் சட்டத்துக்கு முரணான வகையில் வன ஒதுக்குப் பிரதேசங் களாக, தொல்லியல் ஒதுக்குப் பிரதேசங்களாக ஒதுக்கீடு செய்து வர்த்தமானி அறிவித்தல்களை வெளியிட்டிருக் கின்றார்கள். அங்குள்ள மக்கள் தமது பூர்வீகக் குடியிருப்புக் காணிகளில் குடியிருக்க முடியாமல், வயல் நிலங்களில் பயிரிட முடியாமல் இத்திணைக்களங்களால் துரத்தியடிக்கப் படுகின்றார்கள். இதனால் அவர்களுடைய வாழ்வாதாரம், அன்றாட உணவுத் தேவை, பிள்ளைகளின் கல்வி என்பவை மறுக்கப்படுகின்றது.

ஒட்டுசுட்டான் பிரதேச செயலாளர் பிரிவின் தண்டுவான் கிராம அலுவலர் பிரிவில் உள்ள AC Farm என்ற கிராமத்தில் 47 குடும்பங்கள் வசித்துவந்த நிலையில், 1997இல் 'ஜெயசிக்குறுய்' இராணுவ நடவடிக்கையின் காரணமாக இவர்கள் இடம்பெயர்ந்தனர். இன்று முல்லைத்தீவு மாவட்டத்தில் மீள்குடியமர்வு நடவடிக்கைகள் யாவும் பூர்த்தியடைந்துவிட்டதாகக் கூறப்படுகின்ற நிலையில் இம்மக்கள் இன்னும் தங்களின் சொந்தக் கிராமத்தில் மீள்குடியேற்றப்படவில்லை. காரணம், 2012ஆம் ஆண்டு இக்கிராமம் 'தண்டுவான் ஒதுக்கக்காடு' என வனவளத் திணைக்களத்தால் சட்டத்துக்கு முரணாக வர்த்தமானிமூலம்

அறிவிக்கப்பட்டிருக்கின்றமையாகும். ஒரு பிரதேசத்தை வன ஒதுக்காக வர்த்தமானி அறிவித்தல் செய்யும் முன், அதுபற்றி அப்பிரதேச மக்களுக்குப் பிரதேசச் செயலாளரூடாக அறிவிக்க வேண்டும்; இது தொடர்பான கருத்துகள் மக்களிடம் பெறப்பட வேண்டும். ஆனால், இவ்வாறு செய்யாமல் இவற்றுக்கு முரணாக இப்பிரதேசம் தண்டுவான் வன ஒதுக்குப் பிரதேசமாக நாட்டில் நடைமுறையில் உள்ள சட்ட விதிகளுக்குப் புறம்பாக வர்த்தமானிமூலம் அறிவிக்கப்பட்டுள்ளது.

இத்திருட்டுத் திணைக்களம் இப்பிரதேசத்தை தண்டுவான் வன ஒதுக்குப் பிரதேசமாக 2012இல் வர்த்தமானியில் அறிவிப்பதற்கு முன்னர், 1979ஆம் ஆண்டில் இப்பிரதேசம் இலங்கை நிலஅளவைத் திணைக்களத்தினால் அளவீடு செய்யப்பட்டு, எல்லைக் கற்கள் நாட்டப்பட்டு நில அளவை வரைபடம் ஒன்றும் தயாரிக்கப்பட்டுள்ளது. 'Top of PP - 66' என்ற வரைபடத் தொகுதியினுள் இவ்வரைபடம் உள்ளது. இந்தக் கிராமத்தைத் திட்டமிட்டுத் திருடும்போது வனவளத் திணைக்களத்துக்கு இது தெரிந்திருக்கவில்லை. அதேபோலத் தான் சட்டத்துக்கு முரணாக வனவளத் திணைக்களமும் தமிழ் மக்களின் காணிகளை வன ஒதுக்குப் பகுதியாக வர்த்தமானிமூலம் அறிவித்து வருகின்றது. அதுபோல், ஒதுக்கக் காட்டில் அமைந்துள்ள சித்தார்த்தன் குளம் எனப்படும் தமிழ் மக்களின் பூர்வீக விவசாய நிலங்களை விடுவிக்க வனவளத் திணைக்களம் இதுவரை இணங்கவில்லை.

வவுனியா வடக்கு பிரதேச செயலாளர் பிரிவில் சிங்கள மக்களுக்கென 'போகஸ்வெவ' என்ற ஒரு குடியேற்றத் திட்டத்தை உருவாக்குவதற்காக 2,000 ஏக்கருக்கு மேற்பட்ட வன ஒதுக்குப் பிரதேசக் காணிகளை வனவளத் திணைக்களம் விடுவித்துள்ளது. ஒட்டுசுட்டான் பிரதேச செயலாளர் பிரிவின் அம்பகாமம் பகுதியில் இலங்கை விமானப் படையின் விமானப் படைத்தளம் அமைப்பதற்கு ஒதுக்கப்பட்ட வனப் பகுதியிலிருந்து 8,000 ஏக்கர் காணி துப்புரவு செய்யப் பட்டுள்ளது. வனவளத் திணைக்களத்தின் அனுமதியின்றி, குறித்த சட்ட ஏற்பாடுகள் எவற்றையும் பின்பற்றாது இந்த அடர் வனப்பகுதி அழிக்கப்பட்டதுடன், இங்குள்ள பெறுமதியான மரங்கள் இரகசியமாக விற்பனை செய்யப் பட்டுள்ளன. ஊழலுக்கு எதிரான கோஷத்துடன் ஆட்சிக்கு வந்துள்ள அரசு, இது தொடர்பில் வெளிப்படையான விசாரணைகளை மேற்கொள்ள வேண்டும்.

சமகாலத்தில் நாம் மிகவும் வேதனைப்பட வேண்டிய விடயம் என்னவெனில், வனவளத் திணைக்களம், வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம் போன்ற திருட்டுத் திணைக்களங்களின் உயரதிகாரிகள் நீதிபதிகளாகவும் மாறிவிட்டிருப்பதுதான். அவர்கள் வடக்கு மாகாணத்திலுள்ள மாவட்டச் செயலகங்கள்தோறும் வன ஒதுக்குப் பிரதேசங்களை விடுவிப்பதாகக் கூறி விசாரணை மேற்கொண்டு வருகின்றார்கள். திருடனே களவு தொடர்பாக விசாரிக்கும் நகைப்புக்கிடமான இந்த நீதி வழங்கும் பொறிமுறையானது, ஊழலுக்கு எதிரான கோஷத்துடன் ஆட்சிபீடம் ஏறிய இந்த அரசுக்குப் பேரவமானமாகும். இவ்விசாரணையை மேற் கொள்ள வரும் அதிகாரிகள் கடந்த அரசாங்கங்களின் காலத்தில் ஊழலில் மூழ்கித் திளைத்தவர்களென மக்கள் சொல்லுகின்றார்கள். இவர்கள் இங்குள்ள வனப்பகுதிகளாகக் கையகப்படுத்தப்பட்ட காணிகளை விடுவிப்பது தொடர்பில் பொய்யான தகவல்களை அரசுக்கு வழங்கி வருவதுடன், மாவட்டச் செயலாளர் உட்படத் தமிழ் அதிகாரிகளையும் இப்பொய்த் தகவல்களை ஏற்றுக்கொள்ளும்படி அதிகாரத் தோரணையில் மிரட்டியும் வருகின்றனர். இவ்வாறு கையகப் படுத்திய வனவளப் பகுதிகளை விடுவிப்பதாகக் கூறி கடந்த 2023.06.01இல் முல்லைத்தீவு மாவட்டச் செயலாளர், பிரதேசச் செயலாளர், வனவளத் திணைக்களத்தின் அதிகாரிகள் ஆகியோருடன் கூட்டம் ஒன்றை ஏற்பாடு செய்த வனவள மற்றும் வனசீவராசிகள் அமைச்சின் மேலதிக செயலாளர் திருமதி சமந்தி அவர்கள், வனவள மற்றும் வனஜீவராசிகள் திணைக்களத்தின் முறையற்ற தீர்மானங்கள் சிலவற்றை ஏற்றுக்கொள்ளுமாறும் அத்தீர்மானங்களை ஏற்றுக் கொள்ளாவிட்டால் ஓர் அங்குல நிலத்தைக்கூட விடுவிக் கமுடியாது எனவும் அச்சுறுத்தியுள்ளார். கடந்த அரசாங்கங்களின் காலத்தில் கடமையாற்றிய இவ்வாறான அதிகாரிகளை இந்த அரசாங்கம் எச்சரிக்கையுடன் கையாளவேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Please give me only one more minute, Madam Chairperson.

வனப் பகுதிகளை விடுவித்துத் தாருங்கள் என்று நாங்கள் கேட்கவில்லை; காடழிப்புக்கு வழிகோலவில்லை. எங்கள் வீடுகளையும் வயல்களையும் தெருக்களையும் விடுவியுங்கள் என்றே கேட்கின்றோம். எமது மக்களின் நிலங்களை விடுவியுங்கள்! அவர்கள் உழைப்புக்குப் பழக்கப்பட்டவர்கள்; உழைத்து வாழ்வார்கள். நிலங்களை விடுவிக்காதவரை அம்மக்களின் அன்றாட வாழ்வுக்கான நிவாரணங்களை வழங்குங்கள்! ஏனெனில், அவர்களின் குழந்தைகள் பசியுடன் இருக்கின்றனர் என்பதைச் சொல்லிவைக்க விரும்புகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චන්දන තෙන්නකෝන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.25]

**ගරු චන්දන තෙන්නකෝන් මහතා**
(மாண்புமிகு சந்தன தென்னக்கோன்)
(The Hon. Chandana Thennakoon)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2022 අංක 09 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සංශෝධනය කිරීම සඳහා වන පනත් කෙටුම්පත විවාදයට ලක් වන්නේ, අපේ රටේ තොරතුරු තාක්ෂණය ඉතාම වේගයෙන් දියුණු වන, ඒ වාගේම අපි පොදුවේත්, පෞද්ගලිකවත් ඉතාම වේගයෙන් දත්ත මවන යුගයකයි. පුද්ගලයන්ගේ පෞද්ගලික දත්ත අධික ලෙස එකතු කරන, ඒ දත්ත භාවිත කරන යුගයක, සමයක තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් වෙන්නේ.

පෞද්ගලික ආයතන, ව්‍යාපාරික ආයතන, රජයේ ආයතන, සමාජ මාධ්‍ය ආයතන හරහා එම දත්ත ඉතාම වේගයෙන් එකතු කරනවා. ඒ එකතු කරන දත්ත වර්තමාන ලෝකයේ විවිධ ආකාරයෙන් භාවිතයට ගන්නවා. අපි දන්නවා තොරතුරු එකතු කරනවා වාගේම ඒ තොරතුරු රඳවා ගන්න බව, ඒ තොරතුරු සකස් කරන බව. තොරතුරු බෙදා හැරීම, සන්නිවේදනය වාගේ කාර්යයන් විශාල ලෙස මෙම ඩිජිටල් ලෝකය ඇතුළේ

[ගරු චන්දන තෙන්නකෝන් මහතා]

ක්‍රියාත්මක වෙනවා. මෙම සෑම අවස්ථාවකදීම නිරන්තරයෙන් අපට දැක ගන්න පුළුවන් දත්ත දායකයාගේ නිසි අනුමැතියක් නොමැතිව වෙනත් පාර්ශ්වයන්ට මෙම දත්ත වේගයෙන් අත්පත් වෙනවා. ඒ පාර්ශ්ව එම දත්ත වෙනස් කිරීම්, ඒවා වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීම්, ඒවා සමාජයට නිරාවරණය කරලා ඒවා තුළින් දත්ත දායකයාගේ හැඟීම්වලට සහ ජීවිතයට බාධා ඇති වෙන විධියට භාවිත කරනවා අපට දැක ගන්න පුළුවන්. ඒ නිසාම තමයි මෙවැනි පෞද්ගලික දත්ත ආරක්ෂණය පිළිබඳ නීති, අණ පනත් ලෝකයට අවශ්‍ය වෙලා තිබෙන්නේ.

අපේ රටේ ග්‍රාමීය ප්‍රදේශවල පවා ගොඩක් අයගේ අදහසක් තිබෙනවා, "පුද්ගලයෙක් ලෙස මට හංගන්න දෙයක් නැහැ" කියන එක. ඒ අනුව පේනවා මෙවැනි පනත් ගැන වැඩි අවධානයක් නැති සමාජයක් අපට තිබෙන බව. හැබැයි, මේ මිථ්‍යා මතයෙන් බැහැර වෙලා අද ලෝකයේ රටවල් 80කට වැඩි ප්‍රමාණයක් පෞද්ගලික දත්ත ආරක්ෂණය පිළිබඳ නීති, අණ පනත් සම්මත කරන්න පටන්ගෙන තිබෙනවා. අපි දකුණු ආසියාවේ පළමුවෙනි රට හැටියට මෙම නීතිය සම්මත කරන්න කටයුතු කළත්, අද දක්වාම එය අපේ රටේ ශක්තිමත් ලෙස භාවිත වන නීතියක් බවට පරිවර්තනය කර ගන්න අපට බැරි වෙලා තිබෙනවා. පුද්ගලයකුගේ නම, ජාතික හැඳුනුම් පත් අංකය, පදිංචි ස්ථානය, දුරකථන අංක, ඊ-මේල් ලිපිනයන්, මූල්‍ය තොරතුරු, වෛද්‍ය තොරතුරු වාගේ ඉතාම සංවේදී පෞද්ගලික තොරතුරු ආරක්ෂා කිරීමේ වගකීමක් මෙම පනත හරහා ඇති වෙනවා. ඒ නිසා මේ පනත ඉතාම වැදගත් පනතක් බව කියන්න පුළුවන්.

මේ පනතින් ආවරණය වන තවත් වැදගත් දෙයක් තමයි පෞද්ගලිකත්වය ආරක්ෂා වීම. අවසරයකින් තොරව දත්ත භාවිතය වළක්වන්න මේ පනත හරහා අපට පුළුවන් වෙනවා. ඒ නිසා මේ පනත ඉතාම වැදගත් කියලා අපට කියන්න පුළුවන්. ඒ වාගේම දත්ත දායකයාගේ අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳව දත්ත දායකයාට යම් අවධානයක්, අවබෝධයක් ලබා දෙන්නත් මේ පනත ඉවහල් වෙනවා. තමන්ගේ දත්ත පිළිබඳව දැනගන්නත්, ඒ දත්ත යොදා ගන්නේ කුමන කාර්යයන් සම්බන්ධයෙන්ද කියන අවබෝධය දත්ත දායකයාට ලබා ගන්නත් මේ පනතේ ප්‍රතිපාදන හරහා ඉඩකඩ ලැබෙනවා. ඒ වාගේම තමයි මෙම පනත හරහා ආයතනවලට දත්ත ආරක්ෂා කිරීමේ වගකීම් පැවරෙනවා. අපි දන්නවා, බොහෝ ආයතන ස්ථාපිත කරද්දී ඒ ආයතන දත්ත දායකයාගේ ආරක්ෂාව පිළිබඳව එතරම්ම සැලකිලිමත් වෙලා නැහැ කියලා.

හැබැයි, මෙම පනත් කෙටුම්පත සම්මත වීමෙන් පසුව රජයේ සහ පෞද්ගලික අංශයේ සියලු ආයතනවලට දත්ත දායකයාගේ දත්ත ආරක්ෂා කිරීමේ වගකීම පැවරෙනවා. ඒක මෙම පනත් කෙටුම්පතේ තිබෙන සාධනීය ලක්ෂණයක් ලෙස අපට සලකන්න පුළුවන්. ඒ වාගේම දත්ත සුරක්ෂිත කර ගැනීම සඳහා ආරක්ෂණ ක්‍රමවේද පිහිටුවීමත් මෙම පනත හරහා අනිවාර්ය කෙරෙනවා. ඒත් එක්කම විදේශිකයන්ගේ හා විදේශීය ආයතනවල දත්ත ද ආරක්ෂා කර අන්තර්ජාතික මට්ටමෙන් විශ්වාසය ගොඩනඟා ගන්න මෙම පනත සම්මත කිරීමත් සමඟම අපට හැකියාව ලැබෙනවා.

පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත 2022 වර්ෂයේදී සම්මත කළත්, එය එදා සිට ක්‍රියාත්මක කර ගන්න නොහැකි වූ බාධා කිහිපයකුත් අපේ සමාජය, අපේ රට ඇතුළේ දැක ගන්න පුළුවන්. ඉන් පළමුවන එක තමයි, අපේ රටේ ජනතාවට ඒ පිළිබඳව තිබෙන අඩු අවබෝධය. අපේ රටේ, අපේ සමාජයේ බොහෝ පුද්ගලයන්ට තමන්ගේ දත්ත අයිතිවාසිකම පිළිබඳව එතරම් අවබෝධයක් නැහැ; ඒ ගැන එතරම් හැඟීමක්, තැකීමක් නැහැ. ඒගොල්ලන්ට තමන්ගේ පෞද්ගලික දත්තවල වටිනාකම සම්බන්ධයෙන් ලොකු අදහසක් නැහැ. ඒ ගැන නිසි අවබෝධයක් නොමැතිකම පනත ක්‍රියාත්මක කර ගන්න බාධාවක් වෙලා තිබෙනවා.

පසුගිය පාලනයන් තුළ අපේ රටේ රජ පවුලේ පුතාලා රටේ ජනතාවගේ මුදල් කෝටි ගණන් නාස්ති කරලා චන්ද්‍රිකා ගුවනට යැව්වාට අපේ රටේ ජනතාවගේ පරිගණක සාක්ෂරතාව තිබෙන්නේ සියයට 40කටත් අඩුවෙන්; අපේ රටේ ග්‍රාමීය ප්‍රදේශවල දරුවන්ගේ පරිගණක ඥානය තිබෙන්නේ ඉතාම පහළින්. අපේ රටේ පස්දෙනෙකු ගත්තොත් දෙදෙනෙකුට තමයි පරිගණක හැකියාව, පරිගණක සාක්ෂරතාව තිබෙන්නේ. ගෙවල් පහක් ගත්තොත්, ගෙවල් දෙකක තමයි පරිගණක යන්ත්‍රයක් තිබෙන්නේ. අපේ රටේ ජනතාව තාක්ෂණය පැත්තෙන්, සන්නිවේදනය පැත්තෙන්, පරිගණක හැකියාව පැත්තෙන් බල ගන්වන්න පසුගිය කාලයේ තිබුණු ආණ්ඩු සමත් වෙලා නැහැ. ඒ සියල්ලේ ප්‍රතිඵල විධියටත්, ජනතාවගේ අවබෝධයේ අඩුකම නිසාත් මෙම පනත මේ රටේ ක්‍රියාත්මක කිරීමට විශාල බාධා ඇති වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපේ ආර්ථික ක්‍රමය තුළ අපේ රට ඇතුළේ මෙවැනි පනත් ක්‍රියාත්මක කිරීමේ පළපුරුද්ද අපේ සමාජයට ඉතා අඩු වශයෙන් තිබෙන්නේ. පනත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත්, පුහුණු කාර්ය මණ්ඩල, තාක්ෂණය තවමත් සම්පූර්ණයෙන් අපි සංවිධානය කරගෙන නැහැ; අත්පත් කරගෙන නැහැ. ඒ දේවල් ද මෙම පනත නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට විශාල බාධාවක් වෙලා තිබෙනවා. හැබැයි, අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව ඩිජිටල්කරණය මේ රටේ වැඩිදියුණු කරන්න විශාල මැදිහත් වීමක් කරනවා. ඒ වෙනුවෙන් විශාල වෙහෙසක්, මහන්සියක් ගන්නවා. ඒ තුළ අපට පුළුවන් වෙයි මෙන්න මේ කියන පනත් ක්‍රියාත්මක කරන්න.

විපක්ෂයෙන් කථා කළ ගරු මන්ත්‍රීවරයෙක් සඳහන් කළා, අපේ රටේ සයිබර් ආරක්ෂාව බිඳ වැටීම සම්බන්ධයෙන්. ඇත්තෙන්ම පසුගිය කාලය පුරා මේ රටේ පැවැති ආණ්ඩු සයිබර් ආරක්ෂාව පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කළේ නැහැ. යල් පැන ගිය තාක්ෂණය තමයි අපේ රජයේ හැම ආයතනයකම භාවිත වෙන්නේ. ඒවාට අවශ්‍ය තාක්ෂණය, යන්ත්‍ර සූත්‍ර හා මෙවලම් කිසිවක් ගෙනැවිත් දීලා නැහැ. එම නිසා අපේ ආයතනවලට සයිබර් ප්‍රහාර පිළිබඳව විශාල තර්ජනයක් තිබෙනවා. රාජ්‍ය අංශයේ සයිබර් ආරක්ෂාව කළමනාකරණය කිරීමට සමත් නිපුණ කාර්ය මණ්ඩලයක් ස්ථාපිත කර ගන්න පසුගිය පාලනයන් අසමත් වෙලා තිබෙනවා. ඒ නිසාම අපේ රටේ සයිබර් ආරක්ෂාව බිඳ වැටීමට ලක් වෙලා තිබෙනවා. එය මැනවින් තේරුම් ගත් අපගේ ආණ්ඩුව ඒ සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන තිබෙනවා.

ඉතාම මෑතකදී අපට පුළුවන් වෙයි සයිබර් ආරක්ෂාව සහිත හොඳ ශක්තිමත් රටක් නිර්මාණය කර ගන්න. ඒක මේ ආණ්ඩුවෙන් කරනවා කියන විශ්වාසය අපට තිබෙනවා. නව රජයේ ඩිජිටල් ආර්ථික ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් රජයේ සයිබර් ආරක්ෂණ ආයතනය වන Sri Lanka CERT ආයතනය විසින් සයිබර් ආරක්ෂාව පිළිබඳව ශ්‍රී ලංකාවේ දෙවැනි ජාතික සයිබර් ආරක්ෂණ මූලෝපාය කෙටුම්පත් කර, අවසන් කර අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙනවා. එහි අනුමැතිය ද ලැබී තිබෙනවා. ඉන් ඉදිරියට ගිහිල්ලා සයිබර් ආරක්ෂණ පද්ධති නිර්මාණය කිරීමටත්, සයිබර් ආරක්ෂණ නීති කෙටුම්පත් කිරීම ආරම්භ කිරීමටත්, සයිබර් ආරක්ෂණ අධිකාරිය පිහිටුවීමටත් මූලික පදනම දමා තිබෙනවා. ඒ සියලු ක්‍රියාමාර්ග හරහා අපට පුළුවන්, අපේ රටේ සයිබර් ආරක්ෂාව තහවුරු කර ගන්න. එහි මූලික පියවර විධියට, පැවැති ඇමතුම් මධ්‍යස්ථානය වඩාත් සක්‍රිය

කර තිබෙනවා. "101" අංකයට දුරකථන ඇමතුමක් දීලා අපට පුළුවන්, සයිබර් ආරක්ෂාව බිඳ වැටීම් පිළිබඳව දැනුවත් කරන්න. රාජ්‍ය ආයතන සඳහා දත්ත ආරක්ෂණ නිලධාරියෙකු පත් කරන්නටත්, දැනුවත් කිරීමේ වැඩමුළු රාශියක් පවත්වා මේ ක්ෂේත්‍රය දියුණු කරන්නටත් අපේ ආණ්ඩුව අද කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම ඩිජිටල් ආර්ථිකය වර්ධනය හා නවෝත්පාදනය අරමුණු කරගත් පහසුකම් සැලසීමේ කාර්යයේදී විශ්වසනීය ඩිජිටල් අවකාශයක් නිර්මාණය කළ යුතුයි. ඒක තමයි අපේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ. ඒ සියල්ල සඳහා මේ පනත ඉතා වැදගත් වන බව, ඉවහල් වන බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.35]

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට - Personal Data Protection Act එකට - සංශෝධන ගෙන ඒම ඉතාම හොඳයි. මොකද, Data Protection Agency එක පත් කරන්න තිබුණේ මීට අවුරුදු කිහිපයකට පෙර. අවාසනාවකට එය සිද්ධ වුණේ නැහැ. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අදත් කියන්නේ, වර්තමාන ජනාධිපතිවරයාත් කියන්නේ, ඒ සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගන්න අවශ්‍යයි කියන එකයි. ඔව්, කාර්ය මණ්ඩලය බඳවා ගන්න අවශ්‍යයි. හැබැයි කාර්ය මණ්ඩලය බඳවා ගන්න රජය ක්‍රියාමාර්ග ගැනීම පරක්කු වන නිසා මේ රටේ ඩිජිටල්කරණ යන්ත්‍රණය පරක්කු කිරීම සාධාරණයි කියලා මම හිතන්නේ නැහැ. ඔබතුමන්ලා හිතනවා නම් ඒ සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම ඉතාම අසීරු කාර්යයක්, ඒ නිසා ඒකට කල් ගන්න ඕනෑ කියලා, ඒක වෙනම කාරණයක්. ඔබතුමන්ලා ඩිජිටල් ආර්ථිකයක් ගැන කථා කරනවා; මේ රට ඩිජිටල්කරණය කරන්න කථා කරනවා. හැබැයි, ඒකට අවශ්‍ය කරන මූලික නීති පද්ධතිය හදලා ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගන්නවත් ආණ්ඩුව කටයුතු කරලා නැහැ.

තවත් පැත්තකින් මම සතුටු වෙනවා, මේ පනත පිළිබඳව ඔබතුමන්ලාගේ ආණ්ඩුවකින්, එනම් ජනතා විමුක්ති පෙරමුණ කේන්ද්‍ර කරගෙන හැදුණු ආණ්ඩුවකින් කථා කිරීම පිළිබඳව. මොකද, මා මෙම මුල් පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන කොට ඔය Data Protection Agency එක පිළිබඳව සහ ඒ පනත් කෙටුම්පත පිළිබඳව ඉතාම විවේචනාත්මකව තමයි ඔබතුමන්ලාගේ පක්ෂය එදා කථා කළේ. හැබැයි ඒ පනතට සංශෝධන ගෙන එන්නත් අද ඔබතුමන්ලා මැදිහත් වෙලා ඉන්නවා. ඒ වාගේම, ඔබතුමන්ලාට සදාචාරාත්මක අයිතියක් තිබෙනවාද, ජනතාවගේ පෞද්ගලිකත්වය පිළිබඳව සහ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම පිළිබඳව කථා කරන්න? මොකද, මැතිවරණ වේදිකාවට දේශපාලනඥයාගේ, රාජ්‍ය නිලධාරියාගේ පමණක් නොව, ඔවුන්ගේ දරුවන්ගේ, ගෙදර ඉන්න සතුන්ගේ, පාරේ ඇවිද ගෙන යන අයගේ ආදී හැම කෙනාගේම පෞද්ගලික කාරණා සියල්ල එකට එකතු කරගෙන පසුගිය කාලයේ දේශපාලනය කළේ ඔබතුමන්ලායි. ඒ තත්ත්වය පසුගිය කාලයේදී අපි දැක්කා, ජනාධිපති අරමුදල පිළිබඳ කාරණයේදීත්. පෞද්ගලික කාරණා පිළිබඳවත් -අර පාසල් දැරියකට වෙච්ච සිද්ධිය සම්බන්ධවත්, ඒ පෞද්ගලික වෛද්‍ය වාර්තා පිළිබඳවත්- ඔබතුමන්ලා පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා මේ පාර්ලිමේන්තුවේදී කථා කළා; මැතිවරණ වේදිකාවේදීත් කථා කළා. එහෙව් පක්ෂයක් පෞද්ගලිකත්වය ආරක්ෂා කරන්න නීති ගෙන එන්න මහන්සි වන එක ගැන මම සතුටු වෙනවා.

මම දැඩි සේ විශ්වාස කරනවා, මේ රටේ ජනතාවගේ පෞද්ගලිකත්වය ආරක්ෂා විය යුතුයි කියලා. ඒ වාගේම, පෞද්ගලික දත්ත පරිහරණය කිරීම සඳහා නියාමනයක් තිබෙන්න ඕනෑ. පෞද්ගලික දත්ත පෞද්ගලික ආයතනයකට හෝ රාජ්‍ය ආයතනයකට ඕනෑ ඕනෑ විධියට පරිහරණය කරන්න බැහැ. ඒ සඳහා යම් නියාමනයක් තිබිය යුතුයි. ඒ නියාමනය සඳහා Data Protection Agency එක ඉතාම කඩිනමින් පත් වෙන්න ඕනෑ. ඒකට කාර්ය මණ්ඩලය බඳවා ගන්න විධියක් නැහැ කියලා ඔබතුමන්ලා කෙඳිරි ගෑවාට වැඩක් වෙන්නේ නැහැ.

පසුගිය කාලයේ UDI - Unique Digital ID - එක පිළිබඳව කථා කළා.

අපට ඉන්දියාවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 80ක grant එකකුත් ලැබුණා. ඒ සඳහා ටෙන්ඩර් එක ක්‍රියාත්මක වෙන්න තිබුණා. නමුත් අපේ ආණ්ඩුව වෙනස් වුණා. ඊට පස්සේ ආපු ආණ්ඩුවත් ඒක කරන්න උත්සාහ කළා. තමුන්නාන්සේලා ඇවිල්ලාත් දැන් මාස 8ක් වෙනවා. අතිගරු ජනාධිපතිතුමන් ඉන්දියාවේ ගරු අග්‍රාමාත්‍යවරයා හමු වුණු වෙලාවේත් ඒ ගැන කථා කළා. නමුත් අද වෙනකල් එහි progress එක පිළිබඳවත්, එහෙම නැත්නම් ඒක ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳවත් තමුන්නාන්සේලා සඳහනක් කරන්නේ නැහැ.

ඒ වාගේම ඩිජිටල් ආර්ථිකයක් ගැන කථා කරනවා. ඩිජිටල් ආර්ථිකයක් ගැන කථා කරන ඔබතුමන්ලා creator economy එකෙන් එන ආදායමට සියයට 15ක බද්දක් ගහනවා. ඩිජිටල්කරණ වැඩ පිළිවෙළ සඳහා තමුන්නාන්සේලා අය වැයෙන් රුපියල් බිලියන 3ක් වෙන් කළා කිව්වා. ඩිජිටල් ආර්ථිකයක් හදන්න හෝ මේ රටේ රාජ්‍ය ආයතන ඩිජිටල්කරණය කරන්න ඒ බිලියන තුනෙන් කොච්චර වියදම් කළාද? Expresswaysවල යනකොට credit card එකෙන් ගෙවන්න පුළුවන් ක්‍රමයක් හැදුවා කියන එක ඔබතුමන්ලා කරපු වැඩක් නොවෙයි. සාමාන්‍යයෙන් ඒක ලෝකයේ ඕනෑම රටක් භාවිත කරන දෙයක්. ඒක අමුතු technology එකක් නොවෙයි. ගරු අග්‍රාමාත්‍යවරියට e-mail එකකින් මරණ තර්ජනයක් ආවා කිව්වා. එච්චරම තමයි ඩිජිටල් වෙලා තිබෙන්නේ. හැබැයි, ඔබතුමන්ලා ඒ බිලියන තුන පාවිච්චි කරලා මොන රාජ්‍ය ආයතනයද ඩිජිටල්කරණය කළේ?

දැන් court automation ගැන කථා කළා. ඒක කරනවා කියලා කිව්වා. ඒකට අනුගමනය කරන පියවර මොකක්ද?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඔබතුමා, ඔබතුමාගේ කාලය අරගෙන කථා කරන්න. මගේ කාලයෙන් එහෙම ගන්න එපා. මට ඔබතුමාගෙන් අහන්නත් තව කාරණයක් තිබෙනවා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඉස්සෙල්ලා මගේ කථාව ඇහුවොත් මට ඔබතුමාට උත්තර දෙන්න පුළුවන්.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මම ඇහුවේ උසාවිය ගැන. ඔබතුමන්ලා හිතාගෙන ඇති, ඔබතුමන්ලාට ඕනෑ විධියට හැම දේම කර ගන්න පුළුවන් කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එම නිසා-

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඔබතුමා ප්‍රශ්නයක් ඇහුවාම උත්තර දෙන්න මට පුළුවන්.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
එහෙම නම්, මයික් එක ඉල්ලාගෙන උත්තර දෙන්න. ඇමතිවරයා වුණා කියලා මයික් එක off කරගෙන කෑ ගැහුවාට හරියන්නේ නැහැ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මේක මගේ විෂයය.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඔබතුමාගේ විෂය වෙන්න පුළුවන්. හැබැයි, මම ඔබතුමා ගැන කනගාටු වෙනවා. මොකද, ඔබතුමා කරපු ප්‍රකාශ අරගෙන බැලුවාම,- *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, යම් නඩු තීන්දුවක් සම්බන්ධයෙන් අධිකරණ ඇමතිවරයා ප්‍රකාශයක් කරනවා, "අපේ ආණ්ඩුව ආපු නිසා තමයි මේ තීන්දුව ලැබුණේ" කියලා. ඔබතුමා නීතිපති දෙපාර්තමේන්තුවේ වැඩ කරපු ඉහළ නිලධාරියෙක්.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හර්ෂණ නානායක්කාර අමාත්‍යතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා edit කරපු videos බලලා මෙතැනට ඇවිල්ලා කියවන්න එපා. ඒ සම්පූර්ණ video එක ඕනෑ නම් මම ඔබතුමාට දෙන්නම්. බොරු කියලා අනුන්ට මඩ ගහන්නේ නැතුව ඔබතුමාගේ වටිනා කාලය මේ පනත් කෙටුම්පත වෙනුවෙන් පාවිච්චි කරන්න.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඔබතුමා හැමදාම කියනවා වාගේ, පිස්සු නැත්නම් හොඳයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, හැබැයි මෙතුමන්ලා හිතාගෙන ඇති, මෙතුමන්ලා බලයට ආවට පස්සේ මේ 159දෙනා පෙන්නලා ඕනෑම දෙයක් කර ගන්න පුළුවන් කියලා. ඔබතුමා එහෙම එකක් කියලා නැත්නම් ඒක මට කියන්න එපා. මොකද, ඔබතුමා තමයි අධිකරණ ඇමතිවරයා. ඒක නිවැරදි කරන්න. මම ඔබතුමාගේ හොඳට කියන්නේ. එහෙම නැතුව මගේ හොඳකට නොවෙයි. ඒක මම කියපු එකක් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, රටේ අධිකරණ ඇමතිවරයා ප්‍රකාශයක් කළාම, ඒ ප්‍රකාශය රටට ගැළපෙන්නේ නැත්නම් ඒ පිළිබඳව එතුමාට මතක් කරලා දෙන්න අපට වගකීමක් තිබෙනවා. මෙතුමා ජ්‍යෙෂ්ඨ නීතිඥයෙක්. එතුමා නීතිපති දෙපාර්තමේන්තුවේ වැඩ කළේ. අධිකරණයෙන් ජීවත් වුණේ. එහෙම කෙනෙක් ගරු විනිශ්චයකාරවරු පිළිබඳව දේශපාලනික වශයෙන් යම් ප්‍රකාශයක් කළ බව අපට හැඟෙනවා නම්, ඒ ගැන කියන්න අපට අයිතියක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ වාගේම,- *[බාධා කිරීමක්]* බලන්නකෝ, අධිකරණ ඇමතිවරයා හැසිරෙන විධිය. අනේ පව්! ගරු අමාත්‍යතුමනි, ඔබතුමා වාඩිවෙන්නකෝ. *[බාධා කිරීමක්]* ඔබතුමා වාඩිවෙන්නකෝ. බොහොම හොඳයි. බොහොම ස්තුතියි, ඔබතුමා වාඩිවීම ගැන.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලක් පමණයි තිබෙන්නේ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මෙතුමා බොරු කියලා මේ සභාව නොමඟ යවනවා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
අනේ! කවුද බොරු කියලා බලයට ආවේ? බොරු කියන්නේ අපිද, ඔබතුමන්ලාද කියන එක කාලය විසින් ඔප්පු කරයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, බිමල් රත්නායක අමාත්‍යවරයා පසුගිය දවස්වල කිව්වා, එතුමන්ලා නැති වෙලාවට මම පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා කරනවා කියලා. මම කථා කරන්නේ මට පාර්ලිමේන්තුවෙන් ලබා දෙන වෙලාවට. ඉස්සර වාගේ නොවෙයි, දැන් ඔබතුමන්ලා දවල්ට කාලා ගෙදර යනවා. මට කථා කරන්න කාලය ලැබෙන්නේ කෑම වේලාවෙන් පස්සේ. ඇමතිතුමා අදත් නැහැ. දවල්ට කාලා ගෙදර ගිහිල්ලා දැන් කියනවා, මම කට්ටිය නැති වෙලාවේ කථා කරනවා කියලා. එහෙම නම් මට පාර්ලිමේන්තුවේ කැන්ටීන් එකේ මේසයක් උඩට නැගලා කථා කරන්න දෙන්න. එතකොට 159දෙනාම ඉන්නවා. එහෙම නැත්නම්, අතිගරු ජනාධිපතිතුමා මේ සභාවේ ඉන්න වෙලාවක මට අවස්ථාව දෙන්න, මම ඇවිල්ලා කථා කරන්නම්. ඒ හින්දා ඔබතුමන්ලාගේ නොහැකියාව වහගන්න මේ රටේ ජනතාව පිට බර පටවලා දේශපාලනඥයාට ඇඟිල්ල දිගු කරලා හරියන්නේ නැහැ. ඔබතුමන්ලා පටන් ගත්තේ 225ම හොරු කියලා. ඔබතුමන්ලා අද ඒ කථාව රාජ්‍ය සේවකයා පිට පටවනවා. රාජ්‍ය සේවකයෝ හොරු කියන තැනට ඔබතුමන්ලා පරිවර්තනය කරනවා. ඒක නිසා මේ system එක හදන්න, අපි උදව් කරන්නම්. අපි පැහැදිලිවම කියන්නේ, digitalize කිරීමේ කටයුත්ත කරන්න.

Digitalization ගැන Act එක ආවා, හරි. එතකොට Data Centres දමන්නේ කොහේද? දන්නවා නම් කියන්න? Personal Data Protection Act එක ගේනවා. ඒක හරි. එතකොට Data Centres කොහේටද යන්නේ? කවුද ඒකේ custodian? කවුද, ඒ data ටික එකතු කරන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මෙතුමන්ලා සැලැස්මක් නැතුව මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ කථා කරනවා.

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු එරංග වීරරත්න නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
අයියෝ! ඔබතුමා වාඩි වෙන්නකෝ.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weerarathna)
මම ඩිජිටල්කරණය ගැන කියලා දෙන්න හැදුවේ. ඇත්තටම එතුමන්ලා ඩිජිටල්කරණය ගැන කථා කරනවා. හැබැයි, මේ රජයෙන් කරන ඩිජිටල්කරණ කටයුතු පිළිබඳව කිසිම අවබෝධයක් නැතුවයි ඔබතුමා කථා කරන්නේ.

ඔය Data Centres කියන ඒවා ගත්තාම, ඉස්සෙල්ලා ආණ්ඩුවලින් කරපු ඒවා දැන් අබලන් තත්ත්වයේ තිබෙන්නේ. මේකට අපි අලුතින් ටෙන්ඩර් එකක් call කරලාත් තිබෙනවා, අලුතින් Government Data Centre එකක්, Cloud Data Centre එකක් ගන්න. ඒක ගන්න ක්‍රියා පටිපාටියක් යනවා.

ඒ වාගේම, Unique Digital ID එක ගැනත් ඔබතුමා කථා කළා. ඒ Unique Digital ID එක ඉස්සෙල්ලා හදලා තිබුණේ ඉන්දියාවට ඕනෑ වෙලාවක අපේ system එකට access තිබෙන්න පුළුවන් විධියට. *[බාධා කිරීම්]* නමුත් ඒ Agreements වෙනස් කරලා - *[බාධා කිරීම්]* ඒ Agreements වෙනස් කරලා අපේ ජාතික දත්ත පද්ධතිය ආරක්ෂා වෙන විධියට වැඩ කරන්න අපි කටයුතු කරනවා. ඒ agreements වෙනස් කරලා අපි ලබන මාසය වෙනකොට ඒ ටෙන්ඩර් එක call කරලා ඒ practice එකට යනවා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මම දන්නේ නැහැ, එතුමා මහාචාර්යවරයෙක්ද, ආචාර්යවරයෙක්ද කියලා. හැබැයි මේ ඩිජිටල්කරණය කියන එක ඔබතුමාගේ ආණ්ඩුවේ විෂයයක් නොවෙයි. මේක අවුරුදු ගණනාවක් තිස්සේ කථා කරගෙන ඇවිල්ලා සැලසුම් හදලා ක්‍රියාත්මක කරපු දෙයක්. හැබැයි දැන් Data Centre එක කොහේද? දැන් ආණ්ඩුවේ Data Centre එකක් තිබෙනවා නේ. *[බාධා කිරීම්]* ඒකේ capacity එක කියන්න. ආණ්ඩුවේ Data Centre එකේ capacity එක කියන්න. ඔබතුමන්ලා මේ විෂයය පිළිබඳ අවබෝධයක් ගන්න. මම දන්නවා, ඔබතුමන්ලාගේ හාන්ස් විජයසූරිය මැතිතුමා හොඳයි. හැබැයි මේකට අවශ්‍ය වැඩ පිළිවෙළක් ජාතික ප්‍රතිපත්තියක් එක්ක ක්‍රියාත්මක කරන්න. ආණ්ඩුවට ඕනෑ වෙලාවට ගේනවා. දැන් කියනවා, ඉන්දියාවට data යනවා ලු. *[බාධා කිරීම්]* එහෙම කොහොමද යන්නේ? *[බාධා කිරීම්]* Data Protection Agency එක හදන්නේ, ඒ Act එක ගෙනාවේ ඒකට. විෂය භාර නියෝජ්‍ය ඇමතිවරයා විධියට ඔබතුමා වගකීමෙන්ද කියන්නේ, පසුගිය කාලයේ තිබුණු විධියට ඉන්දියාවට data යනවා කියලා. ඔබතුමා වගකීමකින්ද කියන්නේ ඒක? *[බාධා කිරීම්]* රජය විධියට ඒ වගකීම භාරගන්න. රජය විධියට ඔබතුමා ඒ වගකීම භාරගන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට මයික් එක දෙන්න. මයික් එක දෙන්න. එතුමාට වගකීම භාරගන්න කියන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ඉතින් මම මොනවා කරන්නද, අනේ? *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා. *[බාධා කිරීම්]*

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
මෙහෙමයි. අපි විවාදය වෙලාවේ කථා කළා, මේ digital ID පද්ධතිය ඉන්දියාවේ සමාගම්වලට access තිබීම, ජාතික දත්තවලට ප්‍රශ්නයක් කියන එක. ඔබතුමන්ලාත් ඇවිල්ලා ඔතැන ඉඳලා ඒ ගැන වාද කළා. ඒ වාද කළේ ඔබතුමන්ලා එදා හදලා තිබුණු Agreement එකේ තිබුණු ප්‍රශ්න නිසා. නමුත්, අපි ඒ දත්ත ආරක්ෂා වන විධියට, ලංකාවේ කට්ටියට පමණක් ඒ දත්ත පද්ධතියට පිවිසෙන්න පුළුවන් විධියට වෙනස් කරලා ඒක හදලා තිබෙනවා. ඒක නිසා මෙතැනින් එහාට දත්ත ආරක්ෂාව ගැන ඔබතුමන්ලා භය වෙන්න අවශ්‍ය නැහැ.

අනෙක් කාරණාව මේකයි. ඔබතුමා Data Centre එකක capacity එක ගැන අහන්න. ඔබතුමාට computersවලින්ද කියන්න ඕනෑ, memory capacity එකෙන්ද, storage එකෙන්ද කියන්න ඕනෑ? ඔබතුමා දන්නවාද capacity එක මොකක්ද කියලා?

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
මම නොවෙයි, නියෝජ්‍ය ඇමති ඔබතුමා නේ. මට මයික් එක දෙන්න. *[බාධා කිරීමක්]*

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
ඔබතුමා ගිහිල්ලා අපි ටෙන්ඩර් එකේ දාලා තිබෙන විස්තර බලන්න. ඒකේ තිබෙනවා, අපට අවශ්‍ය capacity එකයි, ඔක්කොම ටික. ඔබතුමා කියවලා නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබුණු විනාඩි දෙක මේ වෙලාවේ ඉඳලා ගන්න.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිවරයා මගෙන් අහනවා ප්‍රශ්නයට උත්තර. එතුමා නේ නියෝජ්‍ය ඇමති. නියෝජ්‍ය ඇමතිවරයා ප්‍රශ්නයට උත්තරය මගෙන් අහලා වැඩක් නැහැ. ඒ, පළමුවෙනි එක. දෙවෙනි එක තමයි, ඔබතුමන්ලා ඔය කියන බොරුව නිසා අවසානයේ අමාරුවේ වැටෙන්නේ රටේ විදේශ කටයුතු අමාත්‍යවරයා. මොකද, රටේ අමාත්‍යවරයෙක් - ගරු බිමල් රත්නායක ඇමතිතුමා - කියනවා data ටික ඉන්දියාවට යන විධියට ගිවිසුමක් අත්සන් කරලා තිබුණා කියලා. ඔය ප්‍රශ්නය ඇහුවාම උත්තර දෙන්නේ කවුද? ඔය ප්‍රශ්නයට උත්තර දෙන්නේ විදේශ කටයුතු ඇමති. ඒ නිසා කරුණාකරලා අපි මේක බේරා ගනිමු. අපි උදවු කරන්නම්. ඩිජිටල්කරණය සඳහා අපි උදවු කරන්නම්. *[බාධා කිරීමක්]* හැබැයි, බොරු කියන්න එපා. *[බාධා කිරීමක්]* ආ, ඔබතුමා ඇවිල්ලා!

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම කල්පනා කළේ ගෙදර ඉඳලා උත්තර දෙන්නද, පාර්ලිමේන්තුවේ ඉඳලා උත්තර දෙන්නද කියලා.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
දැන් මම උත්තර දෙන්නම්. මට මයික් එක දෙන්න කෝ.

ගරු බිමල් රත්නායක ඇමතිතුමා, ගෙදර ඉඳන් උත්තර දුන්නත්, මෙහේ ඉඳන් උත්තර දුන්නත් මට ප්‍රශ්නයක් නැහැ. මොකද, අපි දෙදෙනා එක ගමේ. ඒක නැති වෙන්න බැහැ. ඔබතුමාගේ තාත්තාත් අපි හඳුනනවා, ඔබතුමාගේ පවුලේ අයත් හඳුනනවා. මේ අනෙක් අයට ඔබතුමා ඒක නොකිව්වත් ඒක හංගන්න දෙයක් නොවෙයි. අපි එක ගමේ හින්දා අපේ දේශපාලනය කරමු. අපට වෛරය වැඩක් නැහැ, ඉරිසියාව නැහැ, තරහකාරයෝ නැහැ. ගමේකම තිබෙනවා, ඤාතිකම් තිබෙනවා. ඒවා වෙනම කාරණා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

**ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ)
(The Hon. Namal Rajapaksa, Attorney-at-Law)
අපේ ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමතිතුමාට මම සුබ පතනවා. ඔබතුමා මහන්සි වෙන්න. බොහොම හොඳයි. මේක ඩිජිටල්කරණය කරන්න. අධිකරණ අමාත්‍යවරයා Zoom තාක්ෂණය, නැත්නම් video conferencing ඔස්සේ සාක්ෂි විමසන්න පනත් කෙටුම්පතක් සම්මත කර ගත්තා. ඒකට technology එක ගෙනැත් දෙන්න. පනත් සම්මත කළාට වැඩක් නැහැ, technology එක එන්නේ නැතිව. ඒක එතුමා කරලා දෙන්න ඕනෑ. අපි ඒවාට සුබ පතනවා. හැබැයි, කරුණාකරලා ඔබතුමා බොරු කියන්න එපා. මොකද, ජාත්‍යන්තර ගිවිසුම් සම්බන්ධයෙන් ඔබතුමා බොරුවක් කිව්වොත් ඒකෙන් අමාරුවේ වැටෙන්නේ විදේශ කටයුතු අමාත්‍යවරයා.

ඔබතුමන්ලා සියලුදෙනාට අපි සුබ පතනවා, මේ කටයුත්ත කරගෙන යන්න. හැබැයි, බොරු කියන්න එපා. ඒ වාගේම ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, මට උදේ වරුවේ කථාවක් කරන්න අවස්ථාව සලසා දෙන්න පුළුවන් නම් හොඳයි. එතකොට ඔබතුමාටත් අහන්න පුළුවන්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් ඉල්ලන්නම්, ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාට උදේ වරුවේ වෙලාවක් දෙන්න කියලා. එතුමා හැම දාම lunch එකෙන් පස්සේ කථා කරන්නේ. එහෙම හොඳ නැහැ නේ. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, මගේ නමත් ගොඩක් අවස්ථාවල කිව්වා. *[බාධා කිරීමක්]* හොයලා බැලුවොත්, ලංකාවේ හැම මනුස්සයෙක්ම නෑදැයෝ. මෙතුමන්ලා තමයි එතුමන්ලාට විරුද්ධව ඔක්කොම කරලා දැන් එකතුවෙලා සභා පිහිටුවන්න හදන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.49]

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, බොහොම ස්තුතියි.

නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා පොඩ්ඩක් අහගෙනම යනවා ද? *[බාධා කිරීමක්]* ඉන්න, පොඩ්ඩක්. කථාව කරලා පනින්නේ නැතිව පොඩ්ඩක් ඉන්න. එන්න, එන්න. ගෙන්වලාම කියන්න ඕනෑ.

අද අපි සාකච්ඡා කරන්නේ පසුගිය කාලයේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව විසින් ඉදිරිපත් කළ පනතකට සංශෝධන. දැන් නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා, ඒ කාලයේ මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අපි විවේචනාත්මකව කථා කළා, හැබැයි, අද ඒ ගැන මෙහෙම කථා කිරීම පිළිබඳව සතුටුයි කියලා. ඔව්, විවේචනයක් තිබෙනවා නම් විවේචනය කරනවා, කථා කරනවා,

ඒක නිවැරදි කර ගන්න. ඒ කාලයේ ඉදිරිපත් කළ පනතේ අඩුපාඩු නිවැරදි කරන්න තමයි, සංශෝධන ඇතුළත් කරලා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න අද අපි කටයුතු කරලා තිබෙන්නේ. සමහර දත්ත - data - ඒ කාලයේ හැංගුවාට දැන් හංගන්න බැහැ. දැන් දත්ත එළියට ඇවිල්ලා තිබෙන්නේ. ඒ කාලයේ හංගාගෙන සෙල්ලම් කළාට, දැන් අපි තමයි කැරම් බෝඩ් එකේ "රෙඩා" පොට් කරන්නේ. "රෙඩා" පොට් කරන්නේ අපි.

ඒ නිසා අපි කියනවා, ඉස්සරහටත් ක්‍රීඩාව හොඳට කෙරීගෙන යනවා කියලා. ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, මේ කාරණය තේරුම් ගන්න. දැන් ඩේටා ඔක්කොම එළියට එන්න පටන් අරගෙන තිබෙනවා. එකෙන් එකෙන් තමයි පොට් වෙවී යන්නේ. ඒ නිසා අපි කියන්න කැමැතියි, මේ රටේ ඉතිහාසයේ, - *[බාධා කිරීමක්]* දැන් පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පතින් එහාට ගිහින් කථා කරපු නිසා අපිත් රට හමුවේ යම් කරුණු ප්‍රමාණයක් දක්වන්න ඕනෑ. මොකද, මෙතැන කථා කරන කරුණු රටට යනවා.

කිසිම දත්තයක් පදනම් කර ගන්නේ නැතිව ඉතිහාසයේ මේ රට පාලනය කරපු නිසා මේ රටේ ජනතාව විඳපු දේවල් මොනවාද කියලා අපි දන්නවා. ඔබතුමාගේ කථාවේදී කිව්වා, සමහර පෞද්ගලික කරුණු හෙළිදරව් කළ නිසා යම් යම් අපහසුතාවලට ලක් වුණා කියලා. ඒවා පෞද්ගලික කාරණා නොවෙයි. මේ රටේ පොදු මහජනතාවගේ දේපළ, මුදල්, බදු මුදල් ආදිය වංචා කළා නම්, ඒ පිළිබඳව මේ රටේ ජනතාවට දැනගන්න අයිතියක් තිබෙනවා. ඒ කාරණා මේ රටේ නීතිය හමුවට පමුණුවන්නත් අයිතියක් තිබෙනවා. ඉතිහාසයේ ඔය බොහෝ දේවල් ඔබතුමන්ලා වහගෙන සිටියා. නීතිය පැත්තකට දාලා වහගෙන හිටියේ. අපට මේ රටේ ජනතාවට බැඳුණු අයිතියක් තිබෙනවා. අපි ජනතාව එක්ක ඇති කරගත් එකඟතාවක් තිබෙනවා. ඒ අනුව දැන් සියලු තොරතුරු, දත්ත එළියට ගන්නවා විතරක් නොවෙයි, ඒ දත්ත පදනම් කරගෙන අපි අනිවාර්යයෙන් කටයුතු කරනවා. අපි ජාතික ජන බලවේගය රජය හැටියට මේ රටේ ජනතාවට පොරොන්දුවක් දීලා තිබෙනවා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" උදාකරනවා කියලා. අපි ඒක අරමුණු කරගෙන මේ රටට නවෝත්පාදනය ගෙනෙන්න, ඩිජිටල්කරණය ගෙනෙන්න ප්‍රධාන ව්‍යාපෘති තුනක් ආරම්භ කළා. Clean Sri Lanka ව්‍යාපෘතිය වාගේම ඩිජිටල්කරණයත් ගෙනාවා. ඒ සඳහා අවශ්‍ය ශක්තිය තමයි අපි මේ අණපනත්වලින් සකස් කර ගන්නේ. ඒවා සකස් කරනකොට ඔබතුමන්ලාගේ කාලයේ වාගේ අකටයුතුකම් කරන්න අපි සූදානම් නැහැ. මේ රටේ ජනතාවගේ පෞද්ගලිකත්වය රකින්න මේ පනත් කෙටුම්පත හරහා අඩු පාඩු සකස් කරලා අදාළ නීති රීති සම්මත කරනවා. මේ රටේ ජනතාවගේ ජීවිත බොහෝ දුක්ඛිත තත්ත්වයට පත් කරපු, මේ රටේ කර්මාන්ත, ව්‍යාපාර අකර්මණ්‍ය කරපු ඒ ඉතිහාසය සම්බන්ධ තොරතුරු තමුන්නාන්සේලා තේරුම් ගන්න ඕනෑකම තිබෙනවා. මේ කටයුත්තට අදාළ කාර්ය මණ්ඩල විතරක් නොවෙයි, අනෙකුත් කාර්ය මණ්ඩලත් අපි පත් කරන්න සූදානම්.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මම පැහැදිලි කිරීමක් කරන්න කැමැතියි. ඔබතුමා මෙතැන තර්කයක් නැඟුවා, මේවා ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කාර්ය මණ්ඩල පත් කළේ නැහැ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඉතිහාසයේ මොකද වුණේ? දේශපාලන වුවමනාවලට සමහර රාජ්‍ය ආයතනවලට සේවකයන් පිරෙව්වා. ඔබතුමන්ලාගේ කාලය තුළ මේ රට ගෙනයන්න අවශ්‍ය රාජ්‍ය සේවය බොහොම අකර්මණ්‍ය කළා. රාජ්‍ය සේවයට තිබුණු ගරුත්වය අහිමි කරලා දැම්මා. මේ රට ගොඩ නහන්න තිබෙන ප්‍රධාන යන්ත්‍රණයක් තමයි රාජ්‍ය සේවය. ඒක දුබල කරලා දැම්මා. ඔබතුමන්ලා දේශපාලනයට වුවමනා විධියට තමයි සේවකයන් බඳවා ගත්තේ. පහළ මට්ටම ශක්තිමත් කළා. කම්කරුවන් ගෙනාවා, මුරකරුවන් ගෙනාවා. ඒ වාගේ දේවල් කළා. හැබැයි, රාජ්‍ය සේවයේ මුදුන සම්පූර්ණ කළේ නැහැ. උඩ මට්ටම සම්පූර්ණ කළේ නැහැ.

ජනාධිපතිතුමා පසුගිය අය වැය ලේඛනය කියනවනකොට කිව්වා, මේ රටේ රාජ්‍ය සේවයට 30,000ක් බඳවා ගන්න අවශ්‍ය ප්‍රතිපාදන මේ අය වැය ලේඛනයෙන් වෙන් කරනවා කියලා. අපි පෙරේදා කරපු සාකච්ඡාවෙන් හෙළිදරව් වුණා, මේ වෙනකොට රාජ්‍ය සේවයට 38,000 ඉක්මවා බඳවා ගන්න කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමැතිය ලබා දීලා තිබෙනවා කියලා. මේ ළඟදී කැබිනට් මණ්ඩලය තීන්දුවක් ගත්තා, රාජ්‍ය සේවයට 15,072ක් බඳවා ගන්න. අත්‍යවශ්‍ය සේවාවලට බඳවා ගන්නවා. ඒ නිසා මේ පනත් කෙටුම්පතට අදාළ කාර්ය මණ්ඩලය බඳවා ගන්නවා කියන එක එච්චර ප්‍රශ්නයක් නොවෙයි කියලා මම ඔබතුමාට පැහැදිලි කරන්න කැමැතියි. ඔබතුමන්ලා බිඳ වට්ටපු රටක් තමයි අපි මේ ගොඩ නහන්නේ. මේ රටේ මිනිසුන්ගේ -මාධ්‍යවේදීන්ගේ වෙන්න පුළුවන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වෙන්න පුළුවන්, මේ රටේ ජනතාවගේ වෙන්න පුළුවන්- පෞද්ගලිකත්වය නැති කළේ ඔබතුමන්ලායි. මේ රට බිඳ වට්ටලා, මිනිසුන්ට කන්න ටික නැති කරලා, තෙල් ටික නැති කරලා, විදුලිය නැති කරලා කටයුතු කරපු ඉතිහාසය මම ඔබතුමාට අමුතුවෙන් මතක් කරන්න ඕනෑ නැහැ. දැන් ඔබතුමා කිඹුල් කඳුළු හෙළ හෙළා අපට උපදෙස් දෙන්න එනවා. උදවු කරන්න සූදානම් කියනවා. ඒක බොහොම හොඳයි. බොහොම ස්තුතියි. හැබැයි, ඔබතුමන්ලාගේ කාලයේ කරපු උදවු අපට අවශ්‍ය නැහැ. ඒ උදවු අපට අවශ්‍ය නැහැ. ඔබතුමන්ලාට මේ රට ගොඩ නැඟීමේ හැකියාව තිබුණා නම්, ඒක ඉතිහාසයේ කරලා පෙන්වන්න තිබුණා. නමුත් එහෙම එකක් කළේ නැහැ. ඒ නිසා මම කියන්න කැමැතියි, මේ රටේ ජනතාවගේ බලාපොරොත්තුවලට තවත් අකුල් හෙළන්න සූදානම් වෙන්න එපා කියලා. මෙතැන යම් යම් කල්ලි, කණ්ඩායම් නිර්මාණය වෙලා මේ යන ගමනට අකුල් හෙළන්න සැලසුම් සහගතව කටයුතු කරමින් සිටින බව අපි දන්නවා. ඒවා පරාජය කරන්න අපි දේශපාලන ව්‍යාපාරයක් හැටියට, රජයක් හැටියට සූදානම් කියන කාරණය මම මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම මම මේ කාරණයත් කියන්න කැමැතියි. ඩිජිටල්කරණය වෙන්න පුළුවන්, "ක්ලීන් ශ්‍රී ලංකා" ව්‍යාපෘතිය වෙන්න පුළුවන්, දිළිඳුකම තුරන් කිරීමේ ව්‍යාපෘතිය වෙන්න පුළුවන්, අපි රටක් හැටියට ඒ සෑම එකකින්ම සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගනිමින් ඉන්නවා. මේ අවුරුද්දේ පළමුවැනි කාර්තුව පිළිබඳව -පළමුවැනි මාස හතරක කාලය පිළිබඳව- පසුගිය දවස්වල මුදල් අමාත්‍යාංශය විසින් එළිදරවු කරනු ලැබුවා. අපි ලොකුවට කියන්නේ නැහැ, තිබුණු තත්ත්වයෙන් මහා ආශ්චර්යක් පෑවා කියලා. නමුත් අපේ රටේ අපනයන ආදායම 2024ට සාපේක්ෂව අපි සියයට 6.8ක වර්ධනයක් අත්පත් කර ගත්තා. මේ රට මේ විධියට නැඟිටින කොට, දලුලන කොට විපක්ෂයේ අයට පොඩි රිදීමක් තිබෙනවා. ඔවුන් ගණන් හැදුවේ ජාතික ජන බලවේගය ආණ්ඩුව මේ විධියට යයි කියලා නොවෙයි. ඔවුන් ගණන් හදාගෙන හිටියේ, මේ ආණ්ඩුව අද වැටෙයි; හෙට වැටෙයි කියන ආකල්පයෙන්. මේ ආණ්ඩුව කර ගන්න බැරි වෙයි කියන ආකල්පයෙන් හිටියේ. මේ රටට ජාත්‍යන්තර සහාය නැති වෙයි කියන අදහසින් හිටියේ. ආයෝජකයන් එන එකක් නැහැ කියන අදහසින් හිටියේ. ඒ හිතපු දේවල් අනෙක් පැත්තට සිදු වෙනකොට රිදීමක් එනවා. රිදීමක් එනකොට කළබල වීමක් වෙනවා. එතකොට කල්ලි කණ්ඩායම් එකතු වීමක් සිදු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි හරියට දත්ත එකතු කරනවා විතරක් නොවෙයි, දත්ත විශ්ලේෂණය කර ගන්නවා විතරක් නොවෙයි, ඒ මත පදනම් වෙලා අපි

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

කාර්යභාරයක් කරනවා. ඊයේ දත්ත විද්‍යාව හරියට පාවිච්චි වුණා. මේ රටේ පළාත් පාලන ආයතන 151ක හොඳ පිරිසිදු බලයක් ජාතික ජන බලවේගය විසින් පිහිටුවනු ලැබුවා. ඉතුරු ඒවාත් ක්‍රමානුකූලව සිදු වෙනවා. නයි, මුගටි වාගේ පෙනුමට හිටපු කට්ටිය පෙනුමට එහෙම හිටියාට එක බඩවැල කඩාගෙන ආපු හොරු රැලක් විධියට තමයි කටයුතු කරන්නේ කියලා අපි දන්නවා. ඒ සියලු දෙනා එකතු වෙලා දැන් සූදානම් වෙනවා, සමහර පළාත් පාලන ආයතනවල බලය ඩැහැ ගන්න. නමුත් අපිත්, ජනාධිපතිතුමාත් තහවුරු කරලා මේ දේ කිව්වා. මේ රටේ බහුතර බලයක් ගත්තේ ජාතික ජන බලවේගය. ලංකාවේ පළාත් පාලන ආයතන 267ක් තිබෙනවා. තව සතියක්, දෙකක් යනකොට බලන්න. ඒ පළාත් පාලන ආයතන 267ම මාලිමාවේ පාලන බලය පිහිටුවනවා කියන එක තමුන්නාන්සේලාට මම මතක් කරන්න කැමැතියි. දැන් විපක්ෂයේ සිටින අය කලබල වෙලා තිබෙනවා. මේ රටේ නීතිය ක්‍රියාත්මක වෙනකොට අධිකරණ ඇමතිතුමා එක්ක කේන්ති අරගෙන වැඩක් නැහැ. අධිකරණ ඇමතිතුමා නඩු අහනවා නොවෙයි. හැබැයි මේ රටේ නීතිය, යුක්තිය ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය කටයුතු අධිකරණ ඇමතිතුමා කරනවා. අනෙක් ඇමතිවරුන් ඔවුන්ගේ කාර්යභාරය කරනවා. මේක යස අපූරුවට අපි කරගෙන යනවා. අපි උදව් ඉල්ලනවා නම් ඉල්ලන්නේ කකුළෙන් ඇදලා ඒ කටයුතුවලට බාධා කරන්නේ නැතුව ඉන්න කියන එක සම්බන්ධයෙන් විතරයි.

එවැනි බාධා සිදු වෙනවා අපි දකිනවා. නමුත් බිම් මට්ටමින් ඒ වැඩ සිදු කරගෙන යනවා. අපි අද ඉදිරිපත් කළේ වැදගත් සංශෝධනයක් කියන එක ඔබතමුන්නාන්සේලාට මතක් කරන්න මම කැමැතියි. මේ රටේ ජනතාවගේ ජීවිතවලට වගකියන ආණ්ඩුවක් හැටියට මේ රටේ ජනතාවට අපි කියනවා, ඔබගේ පෞද්ගලික අතිශයින් සංවේදී දත්ත වෙන මොනයම් හෝ ආයතනයකට, වෙන යම් හෝ පුද්ගලයෙකුට, දේශපාලන කණ්ඩායමකට, මොන යම් හෝ රාජ්‍යයකට, මේ රටට ඔබට හතුරු වෙන විධියට හසුරුවන්න බැරි විධියට වැට කඩුලු බැඳපු පනත් කෙටුම්පතක් අපි හදලා තිබෙන්නේ කියලා.

2020 ලෝක ආර්ථික සමුළුව පවත්වන්න කලින් ඒ අය සමීක්ෂණයක් කළා. ඒ සමීක්ෂණයේදී ලෝකයේ ඉදිරියට එන ප්‍රධාන වෘත්තීන් ඒ අය සමීක්ෂණයෙන් එළිදරව් කළා. ඒ එළිදරව් කරපු වෘත්තීන් අතර ප්‍රධානම වෘත්තිය බවට පත් වුණේ, දත්ත විද්‍යාව සම්බන්ධ වෘත්තීන්. ඉදිරියේදී ඒවා ලෝකයේ ඉදිරිපෙළ වෘත්තීන් බවට පත් වෙනවා කියලා ඔවුන් කිව්වා. ලෝකයේ ප්‍රවණතාවත් සලකලා තමයි අපි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ. දකුණු ආසියාවේම ප්‍රථම වතාවට දත්ත මත පදනම් වෙච්ච පනත් කෙටුම්පතක් අපට ඉදිරිපත් කර ගන්න පුළුවන් වෙච්ච එක ගැන ඔබත්, අපත් සතුටු වෙන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා. ලෝකයේ දියුණු රටවල් එවැනි දත්ත මත පදනම්ව කටයුතු කරනවා.

පසුගිය කාලයේ මේ ආණ්ඩුව ආරම්භ කරනකොටම අපට ප්‍රශ්න ප්‍රමාණයක් ආවා. රටේ සහල් හිඟයක් ආවා. පොල් ප්‍රශ්නය ආවා. ලුණු ප්‍රශ්නය ආවා. අපි අදාළ නිලධාරීන් කණ්ඩායම් කැඳවලා බලනකොට ඒවා පිළිබඳව සාමාන්‍ය දත්තවත් මේ රටේ තිබුණේ නැහැ. නිවැරැදි දත්ත තිබුණේ නැහැ. දත්ත නැතුව රටක් ගෙන යනවා කියන්නේ අඳුරේ අතපත ගානවා වාගේ වැඩක්. ව්‍යාපාර කරන කට්ටිය දන්නවා, කර්මාන්ත කරන කට්ටිය දන්නවා, ඔවුන් දත්ත මත පදනම්ව ව්‍යාපාරය කරගෙන යන්න බැරි වුණොත් ඒ ව්‍යාපාර කඩාගෙන වැටෙනවා; කර්මාන්ත කඩාගෙන වැඩෙනවා කියලා. පසුගිය කාලයේ මේ රටත් කඩා වැටුණේ හිටපු පාලකයන්ට නිසි දත්තයක් තිබුණේ නැති නිසා; හරි ඉලක්කයක් තිබුණේ නැති නිසා; හරි විශ්ලේෂණයක් තිබුණේ නැති නිසා. අපේ නව රජය තවමත් ඒ ප්‍රශ්නවලට මුහුණ දෙමින් ඉන්නවා. අදාළ දත්ත තවම සම්පූර්ණ වෙලා නැහැ. නමුත් අපි රජයක් හැටියට ක්‍රමානුකූලව මේ දත්ත ගොඩනගා ගෙන ලෝකයත් එක්ක තරග කරනවා නම්, ඩිජිටල්කරණයට යනවා නම්, නව උත්පාදනයට යනවා නම්, නව ආර්ථික මංමාවත් සොයනවා නම් අපට ඒ තැන්වලට යන්න වෙනවා.

හැබැයි, ඒක වගකිව යුතු විධියට කරන්න අපි සූදානම් කියන පණිවුඩය මේ රටේ ජනතාවට අපි දෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපට මේ රට වෙනුවෙන් කරන්න විශාල කාර්යභාරයක් තිබෙනවා. අපි විශ්වාස කරනවා, මේ රටේ ජනතාව ඒවා දැන් ක්‍රමානුකූලව තේරුම් ගනිමින් ඉන්නවා කියලා. මේ කණ්ඩායම් බිල්ලෝ මවන්න මහන්සි ගන්නවා, ජනතාව භය කරන්න මහන්සි ගන්නවා. මේ රටේ ජනතාව එක්ක එකතු වෙලා ඒ සියල්ල පරාජය කරන්න රජයක් හැටියට කටයුතු කරන්න අපි සූදානම්.

අපි දන්නවා, මේ රජය භාරගන්නකොට අපට අභියෝග තිබුණා. දැන් ඒ අභියෝග ඔක්කෝම අහවරයි කියලා අපි කියන්නේ නැහැ. අපට මේ අය වැය වුණත් සම්මත කරගන්න හැකි වුණේ මාර්තු මාසයේ 21වැනි දා. දැන් සමහරු අපෙන් අහනවා, කළේ මොනවාද කියලා. අය වැය සම්මත කරගෙන දැන් අපි මේ රටේ ජනතාවගේ ප්‍රශ්න ක්‍රමානුකූලව විසඳාගෙන එනවා. නැති බැරි මිනිස්සුන්ගේ ප්‍රශ්න, සුබසාධන කටයුතු වෙනුවෙන් ගත යුතු පියවර එකින් එක සූදානම් කරගනිමින්, ඒ අයට සහන සලසමින්, මේ රටේ රාජ්‍ය සේවකයා ශක්තිමත් කරමින්, රාජ්‍ය සේවය ශක්තිමත් කරන්න අදාළ බඳවාගැනීම් කරන්න සූදානම් වෙමින් ක්‍රමානුකූලව මේ කෙත අස්වද්දමින් අපි එනවා. ඒ අනුව අපට ක්‍රමානුකූලව අස්වැන්න ලබාගන්න පුළුවන් වෙයි කියා මා විශ්වාස කරනවා.

මා මුලින් මතක් කළා වාගේ, රාජ්‍ය සේවය ශක්තිමත් කරන්න අපි cadre එකට අනුව පුරප්පාඩු සඳහා බඳවාගන්න අදාළ තීන්දු ගනිමින් එනවා. මේ සියලු ශක්තීන් යොදවා අනිවාර්යයෙන්ම ජනතාව බලාපොරොත්තු වන, අප බලාපොරොත්තු වන තැනට අපි මේ රට ගෙනෙනවා. ඒ නිසා එයට සම්මාදම්කරුවන්, කොටස්කරුවන් වෙනවා මිසක කකුලෙන් ඇදලා මේ ගමන නවත්වන්න පුළුවන්කමක් නැහැ. සකලවිධ දුෂ්ට බලවේග එක කඳවුරකට එකතු වීම සම්බන්ධයෙන් අපට සතුටක් තිබෙනවා. මොකද, එතකොට එක මිටකට එක්කහු කරලා ඒක පරද්දන්න, ඒක අඩපණ කරන්න අපට පුළුවන් කියලා අපි දන්නවා. ඒ නිසා තමුන්නාන්සේලා තේරුම් ගන්න, තමුන්නාන්සේලා දත්ත මත පදනම් වෙලා කටයුතු කළා නම් ඔහොම බංකොලොත්භාවයට පත් වෙන්නේ නැහැ කියලා. ඒවා මොකක්වත් නැතිව, කිසිදු පදනමක් නැතිව, කිසිදු එකඟතාවක් නැතිව, සම්මුතියක් නැතිව එදා වේලට එකතුවීම්වලින් මේ රට ගොඩනඟන්නත් බැහැ, ඔබතුමන්ලාට බලයක් ලබා ගන්නත් බැහැ, ලබා ගන්නා බලයක් පවත්වාගෙන යන්නත් බැහැ කියන කාරණයත් අපි මේ මොහොතේ මතක් කරනවා.

අද දෙවැනි වර කියවීමට ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත කෙනෙකුට සාමාන්‍ය විධියට පෙනෙන්න පුළුවන්. කෙනෙකුට මේක විග්‍රහ කරගන්න අමාරු වෙන්න පුළුවන්. හැබැයි, මේ රටේ අනාගතය නිර්මාණය කරන බලවත් පනතක් බවට මේ පනත, මේ සංශෝධන පත් වනවා. අන්න ඒ කාර්යයට ඒ අදාළ ඇමතිවරුන්ට සුබ පැතුම් එක් කරමින් මා නවතිනවා.

අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින්ම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අද කථා කරන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.03]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, අද දවසේ වැදගත් වූ විවාදයකට අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්නට මට කාලය ලබා දීම සම්බන්ධයෙන්. මම හිතන විධියට රටකට, ව්‍යාපාරයකට, ගොවිතැනකට, ඕනෑම දෙයකට වැදගත් වන්නේ දත්ත මත කටයුතු කිරීමයි. දත්ත මත කටයුතු කිරීම තුළින් තමයි හැම දෙයකම පැවැත්ම රඳා පවතින්නේත්, ජයග්‍රහණය සඳහා ගමන් කරන්නට පුළුවන් වන්නේත්. ඒ නිසා විශේෂයෙන්ම රටේ අවශ්‍යතා වෙනුවෙන් දත්ත ඒක රාශි කිරීම, ගබඩා කිරීම, ආරක්ෂා කිරීම ඇතුළු සියලුම කාරණා රාජ්‍ය මට්ටමින් සිදු විය යුතුව තිබෙනවා. රජය අද මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළා වාගේම, එතුමන්ලාට දත්ත ගැන ලොකු උනන්දුවක් තිබෙනවා කියන කාරණය අපි දන්නවා. දත්ත නැතිකම නිසා මෙතුමන්ලාට ප්‍රශ්න එනකොට දත්ත ලබා ගැනීමටත් කටයුතු කළා. මම හිතන විධියට, රිළවු සංගණනය සිදු කළේ ඒ සඳහායි. මෙතුමන්ලා බලයට ආපු ගමන් පොල් පිළිබඳ ගැටලුවකුත් ආවා. ඒ ප්‍රශ්නය විසඳන්නට මේ රටේ රිළවු කොච්චර ඉන්නවාද කියා සංගණනය කරන්න සිදු වුණා. නමුත්, ඒක කරගන්න බැරි වුණා. දත්ත නැති වුණු නිසා තමයි මෙතුමන්ලාට ඒ කටයුත්ත කරගන්න බැරි වුණේ. හදිසියේ -කඩිමුඩියේ- සියලුම කාරණා පසෙකින් තබා ආණ්ඩුව විධියට රිළවු ගණන් කරන්න ලොකු උත්සාහයක් දැරුවා, සංගණනයක් කළා. නමුත් තවම බැරි වුණා, ඒ සංගණනයේ result එක දෙන්න.

අද මේ විධියට දත්ත, දත්ත ආරක්ෂණය, ඩිජිටල්කරණය ගැන විශාල කතිකාවක් ඇති කළාට දැන් කථා කළ උදවිය මොනවාද කිව්වේ? දැන් කථා කරලා ගිය ඇමතිතුමා ලොකු කතන්දර ගොඩක් කිව්වා. හැබැයි, එතුමාට භාර දී තිබෙන අමාත්‍යාංශයට අදාළ tea factories 250ක් වැහිලා ගිහින් තිබෙන බව කියනවා. නමුත්, එතුමා ඒ ගැන කථා කළේ නැහැ. අපේ අපනයන වර්ධනය වෙලා, ආර්ථික වර්ධනය සියයට 6.8කින් වැඩි වුණා කියලා එතුමා කියනවා. අපි එදා සිට කථා කරපු, එතුමාගේ අමාත්‍යාංශයට අදාළ tea factories 250ක් වැහිලා ගිහින් කියලා කියනවා. හැබැයි, එතුමා ඒක අමතක කර යනවා. ඒකත් දත්තයක්. මේ රටේ ආර්ථිකයට විශාල කාර්යභාරයක් ඉෂ්ට කරපු එවැනි tea factories මෙතුමන්ලා ආවාට පසු automatically වැහෙනවා. එතුමන්ලා කාලයක් tea factoriesවලට ගිනි තබමින්, tea factories වහන්න කටයුතු කළා.

අද එතුමන්ලා බලයට ඇවිල්ලා ඉන්නේ. නමුත් එම අමාත්‍යවරයා යටතේ තිබෙන ඒවා කළමනාකරණය කරගන්න බැහැ. අද වන විට tea factories 250ක් පමණ වැහිලා. මේකට හේතුව මොකක්ද කියලා හොයන්නේ නැහැ. එතුමා ඒ ගැන කථා කරන්නේ නැහැ. එතුමා, එතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන දත්ත ගැන කථා කළා නම් බොහොම වැදගත් වෙනවා. රටේ ආර්ථිකයට විශාල සහයෝගයක්, ශක්තියක් දෙන ආයතන විධියට අපේ රටට එදා ඉඳලා තිබුණු එම tea factories වැහෙන එක මහ අපරාධයක්. ඒ නිසා ඒ පිළිබඳව අපි කටයුතු කරන්න ඕනෑ.

සෙවනගල සීනි කර්මාන්තශාලාව අද වැහෙන තැනට පත් වෙලා තිබෙනවා. ඒ ගොවීන්ට උක්වලට වෙනදා ලැබුණු මිල අද ලැබෙන්නේ නැහැ. ඒ ගොවීන් වගා කරපු උක් අස්වැන්න දැන් ගන්නේ නැහැ. ඒවා ට්‍රැක්ටර් උඩ වේළිලා යනවා. ඒකේ රැකියා කරපු අය ඔක්කෝම අනාථ වෙලා. මේ කර්මාන්තශාලාව වැහෙන්න යන නිසා 2,000කට වැඩි පිරිසක් අද රැකියා අහිමි වෙන තත්ත්වයට පත් වෙලා ඉන්නවා. ඒ වුණාට කියනවා, රට හරියට යනවා ලු, රට ගොඩෙන් ගොඩට යනවා ලු. හැබැයි කථා කරනකොට එහෙමයි, කරනකොට මෙහෙමයි. එතුමන්ලා කියපුවා වෙනුවෙන් එතුමන්ලාම පෙනී සිටිනවා ලු. එතුමන්ලා කියපුවා මොනවාද? ජාතික ආරක්ෂාව ගැන කථා කළා. හැබැයි, අද ජාතික ආරක්ෂාව කොතැනද තිබෙන්නේ? දැන් වෙලා තිබෙන්නේ, අද කොතැනද වෙඩිල්ල පත්තු වෙලා තිබෙන්නේ, අද කවුද මැරී තිබෙන්නේ කියලා දවස ගණනේ බලන්නයි. කියපු දේවල් කොහොම වුණත් ඒ තැනට අද රට පත් වෙලා. දත්ත එක්කයි අපට මේවා ගැන කථා කරන්න වෙන්නේ. අපට දත්ත එකතු කරන්න වෙලා තිබෙන්නේ මේ කියන කාරණා නිසායි. දත්ත කළමනාකරණය කිරීමකින් තොරව තමයි මේ කටයුතු කරන්නේ.

අද උදේ මට call එකක් ආවා, අනුරාධපුර දිස්ත්‍රික්කයේ බඩඉරිඟු වගා කරන ගොවීන්ගෙන්. බඩඉරිඟු ගොවීන් වර්ෂාවත් එක්ක වුවත් මේ කන්නයේ වගා කිරීමට විශාල වශයෙන් උනන්දු වුණා; වගා කළා. අවසානයේ මේ රටේ companies එක්ක තරග කරලා සමහර උදවිය බඩඉරිඟු මිලදී ගත්තා. නමුත් සමහර ගොවීන් හිතුවා, තව මිල වැඩි වෙයි කියලා. ඒ අය තමන්ගේ බඩඉරිඟු ටික විකුණන්නේ නැතිව ගබඩා කරගෙන හිටියා. අන්න අද නිෂ්කාසනය වෙනවා, 117ට ආනයනය කරපු බඩඉරිඟු. එතකොට 160ට බඩඉරිඟු මිලදී ගත් අපේ සාමාන්‍ය ව්‍යාපාරිකයා අද අර මිලත් එක්ක fight කරන්නේ කොහොමද? එදා හාල් ටික ගෙන්වනකොට රුපියල් 65ක බද්දක් ගැහුවා. මේ රටේ හැම කෙනෙකුගේම ප්‍රධාන ආහාරය වන්නේ බත්. එදා හාල් ගෙන්වද්දී ඒකට බද්දක් ගහලා, එදා හාල් ගෙන්වපු අය අද කුකුළු ෆාම් හිමියන්ගේ ආරක්ෂණය වෙනුවෙන් අර බඩඉරිඟු ගොවියා අනාථ කර තිබෙනවා. ගොවීන් වෙනුවෙන් කිඹුල් කඳුළු හෙළපු ඔබතුමන්ලා ළඟ බඩඉරිඟු ඔච්චර නිෂ්පාදනය කර තිබෙනවා කියන දත්ත තිබුණා නම්, ඔබතුමන්ලා ඒ ගැන අවධානය යොමු කර තිබුණා නම්, අද මේ ප්‍රශ්නය ඇති වෙන්නේ නැහැ නේ. කොහේද අද ඒ දත්ත තිබෙන්නේ? එහෙම නම් කොහොමද මෙච්චර බඩඉරිඟු ප්‍රමාණයක් ගෙන්වන්නේ? ඇයි, ඒකට බද්දක් ගහන්න උනන්දුවක් නැත්තේ? බඩඉරිඟු ගොවීන්ගේ නිෂ්පාදන ටික වෙළෙඳ පොළට එන වෙලාවේ, ඔබතුමන්ලා ළඟ එම දත්ත තිබුණා නම්, දත්ත කළමනාකරණය කරගන්න ඔබතුමන්ලාට පුළුවන් වුණා නම් ඔබතුමන්ලා මෙහෙම කටයුතු කරනවාද?

ඒ වාගේම ඔබතුමන්ලා වී අස්වැන්න ගැන මහ ලොකුවට කථා කළා. ඔබතුමන්ලා විශාල වශයෙන් වී ටික මිලදී ගන්නවා කියලා ලොකුවට කිව්වා; ඒ සඳහා මෙච්චර සල්ලි වෙන් කර තිබෙනවා කියලාත් කිව්වා. ඔබතුමන්ලාට පුළුවන් වුණාද, ඒ ඉලක්ක කරා යන්න? ඔබතුමන්ලා ඒ වෙනුවෙන් වැඩ කටයුත්තක් සැලැස්වුවාද? ඔබතුමන්ලා කරපු සියලු කටයුතු අසාර්ථක වෙලා තිබෙනවා.

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

පසුගිය වතාවේ මහ වැව් දහසක් හදනවා කියා විශාල නැටුමක් නැටුවා වාගේ ඔබතුමන්ලා මෙවරත් ඇවිල්ලා මහා වික්‍රමයක් කරලා Clean Sri Lanka කියලා එකක් පටන් ගත්තා. දැන් Clean Sri Lanka ගැන කථා වෙනවාද? ඊට අදාළ කරන ආයතන ටික ඊයේ-පෙරේදා පිහිටෙව්වා. හැබැයි, මේ වෙනකොට Clean Sri Lanka ලංකා සිතියමෙන් මැකී ගිහින් ඉවරයි; දැන් Clean Sri Lanka ගැන කථාවක් නැහැ. Clean Sri Lanka ලංකාවේ මහ පොළොවේ ක්‍රියාත්මක කළ යුතු තැනට එන්නේ අදයි. නමුත් ඒ ගැන අද කථාවක් නැහැ. දැන් කථා කරන්නේ මොනවා ගැනද?

ඔබතුමන්ලා පළාත් පාලන ආයතන 151ක් පිහිටෙව්වා ලු. මේ රටේ දේශපාලන සංස්කෘතිය ගැන අපට අලුතින් උගන්වන්න දෙයක් නැහැ නේ. ඔබතුමන්ලා ඒ ගැන ඔක්කෝම දන්නවා නේ. ජනාධිපතිවරණය ඉවර වුණු ගමන් මහ මැතිවරණය ආවා. මේ රටේ සමස්තය ඔබතුමන්ලාට ඡන්දය දුන්නා නේ, තුනෙන් දෙකක් හම්බ වෙන්න. ඒක නේ පොල් ලෙලිත් එක්ක ගහගෙන ආවේ, පාපිස්සකටවත් ඔබින්නේ නැති අය අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා වාඩිවෙලා ඉන්නේ. පාපිස්සකටවත් ගන්නේ නැති මිනිස්සු පාර්ලිමේන්තුවට එන්නේ ජනාධිපතිවරණය ඉවර වෙලා පැය 48කින් පාර්ලිමේන්තුව විසුරුවා මහ මැතිවරණය තිබ්බ නිසා. ඒ නිසා අද ඒ පාපිසි ටිකත් අරගෙන බලය පිහිටෙව්වාට, අන්න දැන් පළාත් පාලන ආයතනවලදී ඔබතුමන්ලා පාපිස්ස යටටම දමලා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටුවපු පළාත් පාලන ආයතන ගැන මම බැලුවා. 19න්, 16ක් ඔබතුමන්ලා ඊයේ පිහිටුවූවා. ඒ 16ම පසුගිය කාලයේ හිටපු ජවිපෙ සෙට් එකට තමයි දීලා තිබෙන්නේ. අර පාපිසි යට ඉන්න අය ආපහු පාපිස්ස යටටම දමලා. දැන් මේ එක්කෙනෙකුටවත් සභාපතිකම් නැහැ. පසුගිය කාලයේ හිටපු ජවිපෙ සෙට් එකටම සභාපතිකම් ටික දීලා. මාලිමාව කියලා ඇවිල්ලා පහුගිය කාලයේ මේ අය ශාප කරන, හොරු කියලා කියන පොහොට්ටුවේ, යූඇන්පී එකේ සෙට් එක එකතු කරගෙන ගිහිල්ලා හැදුවා. සියයට 3 ඉඳිමින් අවුරුදු 60ක් ළතැවුණා. අවුරුදු 60ක් තිස්සේ සියයට 3න් උඩට එන්න බැරි වුණා. එක එක ආණ්ඩු එක්ක දීග කෑවා. දැන් ටිකකට කලින් ඇමතිතුමෙකු කථා කරනකොට කිව්වා, මේ රට විනාශ කරපු කණ්ඩායම කියලා. රට විනාශ කරපු ඒ අයට සහයෝගය දුන්නේ කවුද? චන්ද්‍රිකා මැතිනිය ගෙනාවේ කවුද? මහින්ද රාජපක්ෂ ගෙනාවේ කවුද? මහින්දානන්දලා ඇති කළේ කවුද? ඒ ඔක්කෝම එක්ක එකට ඉඳිමින් දීග කාලා, දැන් අපි ඔක්කෝම එකතු වෙලා ප්‍රාදේශීය සභා - *[බාධා කිරීමක්]*

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
Hon. Presiding Member, I rise to a point of Order.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, point of Order එක මොකක්ද කියලා අහලා අවස්ථාව දෙන්න. කිසි ගැටලුවක් නැහැ, point එකක් තිබෙනවා නම්. *[බාධා කිරීමක්]* ඩිජිටල් දත්ත ගැන තමයි මේ කියන්නේ. *[බාධා කිරීමක්]* ඔබතුමාට අමතක වුණු දත්ත ගැන කියන්නේ. *[බාධා කිරීමක්]* වාඩිවෙන්න මහත්තයෝ, වාඩිවෙන්න. *[බාධා කිරීමක්]* පාපිසි යට නේද, ඔබතුමා ඉන්නේ? ඔබතුමා පාපිස්සක් නේද? ඔබතුමා ජෙප්පෙක් නොවෙයි නේ? ඔබතුමා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නේ. වාඩිවෙන්න, ඔබතුමා වාඩිවෙන්න. *[බාධා කිරීමක්]* පාපිස්ස යට ඉන්න ඕනෑ එක්කෙනෙක්. පාපිස්සේ ඉන්න. *[බාධා කිරීමක්]* පාපිස්ස යට ඉන්න ඕනෑ අය පොල් ලෙලි වාගේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා. ඒ ගැන කියනකොට දුක ඇති. *[බාධා කිරීමක්]* කියනකොට වේදනාව ඇති. *[බාධා කිරීමක්]* මහත්තයෝ වාඩිවෙන්නකෝ. *[බාධා කිරීමක්]* හරි බොහොම ස්තුතියි, ඔබතුමාට. *[බාධා කිරීමක්]*

එතුමාට මයික් එක දෙන්නකෝ. මේ වදේ හරි යන්නේ නැහැ නේ. ඔබතුමා කථා කරන්න මහත්තයෝ. *[බාධා කිරීමක්]* ඔබතුමා කථා කරන්නකෝ. *[බාධා කිරීමක්]* ඔබතුමා කථා කරන්නකෝ. *[බාධා කිරීමක්]* ඔබතුමාට කියන්න දෙයක් තිබෙනවා නම් මයික් එක ඉල්ලාගෙන කථා කරන්න. නැත්නම් එළියට ඇවිල්ලා කථා කරන්න. ඔබතුමා කොහොමද ඔහොම කථා කරන්නේ?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මොකක්ද, කියන්නේ? *[බාධා කිරීමක්]* මෙහෙම කථා කරන්න පුළුවන්ද? [බාධා කිරීමක්] මේ, ඇමති කෙනෙක්ද? අපි දැක්කා, ඔබතුමාගේ චණ්ඩි පාට් ඊයේ. *[බාධා කිරීම්]* අපි දැක්කා, ඔබතුමාගේ චණ්ඩි පාට්. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමන්ලා නිහඬ වෙන්න.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
සභාවක් පිහිටුවන තැනට ගිහිල්ලා චණ්ඩි පාට් දමන්න මෙතුමා කවුද? *[බාධා කිරීම්]* මේ, පසුගිය කාලයේ ලංකාවේ උන්නාද මළාද කියලාවත් දන්නේ නැති කෙනෙක්. මොරටුව මහ නගර සභාව පිහිටුවන්න ගිහිල්ලා චණ්ඩි පාට් දැම්මා. කලින් හිටපු මන්ත්‍රීවරයා කථා කළාම,- *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමන්ලා නිහඬ වෙන්න. ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබතුමිය මට මේක කරගෙන යන්න දෙනවාද? නැත්නම්, මේ චණ්ඩින්ගේ චණ්ඩි පාට් අපි බලන්න ඕනෑද? *[බාධා කිරීම්]* මේ, මොන චණ්ඩිද? අද චණ්ඩි වෙලා දැඟලුවාට ඔබතුමන්ලා කොහේද හිටියේ? ඔබතුමන්ලා පසුගිය කාලයේ කොහේද හිටියේ? පොහොට්ටුවට කඩේ ගිහිල්ලා, කරන්න තිබෙන ඔක්කෝම කරලා, හොරු හදලා, රට බංකොලොත් කරලා අද මාලිමාවේ විලි වහ ගන්න හදන්න එපා. වාඩි වෙන්න. *[බාධා කිරීම්]* ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඕනෑ නම් මයික් එක අරගෙන කියන්න. Point එකක් තිබෙනවා නම් කථා

කරන්න. ඔබතුමා චණ්ඩියා වෙන්න මොරටුවේ මිනිස්සුන්ට. අපිට චණ්ඩි පාට් දමන්න එන්න එපා. අපි චණ්ඩි පාට්වලට භය නැහැ. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න. නිහඬ වෙන්න.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඔබතුමා මොරටුවේ මිනිස්සුන්ට චණ්ඩියා වෙන්න. මොරටුවේ හොරා කාපු මිනිස්සුන්ට චණ්ඩියා වෙන්න. හොරකම් කරපු මිනිස්සු ඉන්නවා නම් අත්අඩංගුවට අරගෙන පෙන්වන්න. ඔබතුමා ඇමතිවරයා නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයට කථා කරන්න. ඔබතුමාට තවත් විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
කථා කරන්නේ කොහොමද?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

වාගේ. පිස්සු නැත්නම් ෂෝක්, මෙතුමන්ලාට. මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

තිබෙන මිනිස්සුත් එක්ක අපිට කථා කළ හැකිද?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඔබතුමිය මට සභාව පාලනය කරලා දෙන්න. *[බාධා කිරීම්]* පිස්සු නැත්නම් ෂෝක්.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමා කථා කරන්න. තවත් විනාඩි දෙකයි තිබෙන්නේ. වැඩිපුර විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
පිස්සු නැත්නම් ෂෝක්. [බාධා කිරීම්] මෙහෙම පුළුවන්ද, මේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එක්ක කථා කරන්න?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමා මූලාසනයට කථා කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
අපි කථා කරනකොට බොහොම වේදනා ඇති. අපි මේ දත්ත එක්ක තමයි කථා කරන්නේ. ඔබතුමන්ලා ළඟ නැති අමතක කරපු දත්ත මේ කියන්නේ. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා අමතක කරපු දත්ත ගැන මේ කියන්නේ. ඔබතුමන්ලා පාපිසිවලට වැටුණාට අපිට කරන්න දෙයක් නැහැ. ඔබතුමන්ලා තුට්ටු දෙකට වැටිලා. *[බාධා කිරීම්]* අපි මේ විධියට කථා කරගෙන යනකොට වේදනා ඇති. අපි මේ කියන්නේ මහ පොළොවේ අපි දකින දේ; ඔබතුමන්ලාගේ අසාර්ථක වීම්. ඔබතුමන්ලා අසාර්ථක වෙලා යයි ගෙවල්වලට. ඔබතුමන්ලාට කිසි ප්‍රශ්නයක් නැහැ. ඔබතුමන්ලා දේශපාලනය වෙනුවෙන් දරදිය ඇදපු මිනිස්සු නොවෙයි. ඔබතුමන්ලා මේ ගරු සභාවට අහම්බෙන් රැල්ලට ගහගෙන ඇවිල්ලා, හුළඟට ගහගෙන ඇවිල්ලා, මේ ගරු සභාවේ වාඩි වෙලා, කයිවරු ගහලා "පොරවල්" වෙන්න හැදුවාට, ඔබතුමන්ලාගේ ඉතිහාසය මතක් කරලා බලන්න. අද කයිවාරු ගහනවා, ආර්ථිකය විනාශ කළාය කියමින්. ආර්ථිකය විනාශ කරන්න ඔබතුමන්ලා දායක වුණේ නැද්ද? Tea factories ගිනි තියපු, බස් ගිනි තියපු, කෝච්චි ගිනි තියපු, ට්‍රාන්ස්ෆෝමර්වලට බෝම්බ ගහපු, බෝක්කු කඩපු ඒ දත්ත ඔබතුමන්ලා ළඟ නැද්ද? ඒවා නිසා ආර්ථිකය වැටුණේ නැද්ද? මේ රටේ අහිංසක මිනිස්සු ඝාතනය වුණු, හමුදාවේ හිටපු දරුවන්ගේ අම්මලා, තාත්තලා මරපු දත්ත ඔබතුමන්ලා ළඟ නැද්ද? දත්ත ගැන තමයි කියන්නේ. *[බාධා කිරීම්]* හිතට වේදනා ඇති; දුක ඇති. ඒවාට ඔබතුමන්ලා දඟලන්න එපා. අපි බොහොම ගෞරවයෙන් මේ කාරණය කියන්නේ. ඔබතුමන්ලා මේ රටට අහම්බයකින් බලයට ආපු කණ්ඩායමක් මිසක් මේකේ හැම දාම අයිතිකාරයෝ නොවෙයි. ආපු රැල්ල තුළ තාවකාලිකව බලයට ආවා මිසක් ඔබතුමන්ලා කයිවාරු ගහන ඒවා මහ පොළොවේ යථාර්ථයක් බවට පත් කරන්න. දත්ත තිබෙනවා නම් ඔබතුමන්ලා කරන්න ආපු දේවල් කරලා පෙන්වන්න. දැන් දත්ත ගැන ගණන් හදන විධිය පෙනෙනවා නේ. දැන් ඇහේ හයියෙන් පළාත් පාලන ආයතනවල බලය පිහිටුවන්න හදනවා. එහෙම කරන්න පුළුවන්ද? මේ රටේ ජනතාව ඡන්දය දුන්නා නම්,-

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
බලය පිහිටුවා තිබෙන්නේ.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඇයි, ඉතුරු 170?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඔබතුමන්ලාට බින්දුවයි,-

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
අපේ බින්දුව අපි බලා ගන්නම්. අපේ බින්දුවත් දවසක එයි,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබුණු කාලය අවසානයි.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ඔය කයිවාරු ගහපු කට්ටිය අවුරුදු 60ක් හිටියා නේ, බිත්දුවේ. *[බාධා කිරීම්]* ඔය කට්ටිය අවුරුදු 60ක් තිස්සේ පිහිටවපු සභාවක් කියන්නකෝ. *[බාධා කිරීම්]* තිස්සමහාරාමය ඇරුණාම ඔබතුමන්ලා අද වනකොට පිහිටවපු එක සභාවක් කියන්නකෝ. *[බාධා කිරීම්]* අද කයිවාරු ගහන්න එපා, ගරු ඇමතිතුමා. ඔබතුමා කයිවාරු ගහන්න එන්නේ කොහේ ඉඳලාද? නමක්වත් දන්නේ නැහැ. ලංකාවේ මිනිහෙක් කොහේද හිටියේ කියලා දන්නේ නැහැ. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි,-

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
මගේ කථාව අවසන් කරන්න දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ කථාව අවසන් කරන්න කියලා මම එක දිගටම කිව්වා. වැඩිපුරත් විනාඩියක කාලයක් ඔබතුමාට ලබා දුන්නා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
එහෙම කොහොමද වෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට වැඩිපුරත් වෙලාව දුන්නා.

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
මගේ වෙලාව දැන් ගන්න එපා. ඔබතුමාට වෙලාව ඇති තරම් හම්බ වුණා නේ, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Madam Presiding Member, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඒ සිදුවීම ඉතාම අශෝභනයි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, point of Order එක කියන්න.

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මගේ point එක ඒක තමයි. මම ඔබතුමියගේ අවධානය යොමු කරවනවා,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමා මොන ස්ථාවර නියෝගය යටතේද කථා කරන්නේ?

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
කථිකයෙක් කථා කරද්දී බාධා කළාම ඔබතුමියට යුතුකමක් තිබෙනවා,- *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
එහෙම ස්ථාවර නියෝග යටතේ නැහැ නේ. ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරු උදේ ඉඳන්ම misinformation තමයි මෙතැන පතුරුවන්නේ.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමනි, ඔබතුමා මුලින්ම කියන්න, කුමන ස්ථාවර නියෝගය යටතේද කථා කරන්නේ කියලා.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ස්ථාවර නියෝග 92. (1)(ඉ) යටතේ මෙසේ සඳහන් වෙනවා:

"වෙනත් මන්ත්‍රීවරයෙකු කථා කරන විට නිශ්ශබ්දතාවය පවත්වා ගත යුතු අතර, කථා කරමින් සිටින මන්ත්‍රීවරයා විසින් ඉඩ දෙනු ලබන්නේ නම් මිස ඊට බාධා කරනු නොලැබිය යුත්තේ ය;"

එතුමා "point of Order" කියලා කිව්වේත් නැහැ. පැය භාගයක් විතර හිටගෙන කෑ ගැහුවා. අර මන්ත්‍රීතුමාට කථා කරන්න ලැබුණේ නැහැ නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මම ඒ වෙනුවට එතුමාට වැඩිපුර විනාඩි දෙකක කාලයක් දීලා තිබෙනවා.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
කොහේද දුන්නේ ඒ වෙනුවට වැඩිපුර වෙලාව? *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.16]

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. දත්ත කියන එක ගැන කථා කරද්දීම misinformation තමයි අද උදේ ඉඳන්ම විපක්ෂයේ ගොඩක් මන්ත්‍රීවරු ප්‍රකාශ කළේ. මම හිතන ආකාරයට තොරතුරු තාක්ෂණය ගැන ප්‍රාමාණික අවබෝධයක් තිබෙන මන්ත්‍රීවරු විපක්ෂයේත් ඉන්නවා. විපක්ෂයේ මේ මන්ත්‍රීවරු ඒ අයගෙනුත් ටිකක් අහලා බලලා විවාදයට ආවා නම් හොඳයි, ඇත්තටම මොකක්ද මේ මාතෘකාව කියලා. මොකද, tea factories 225ක් වහලා කියලා විපක්ෂයේ මන්ත්‍රීවරු කිව්වා. ඒක සම්පූර්ණයෙන්ම අසත්‍යයක් නේ. පසුගිය දශක දෙකක විතර කාලයක් ඇතුළත වෙච්ච සිදුවීමක් තමයි ඒ කියන්නේ. ඒ වාගේ දේවල්වලට කියන්නේ misinformation කියලා. මේ ගරු සභාවේ ඉන්න මන්ත්‍රීවරු ඒ ගැන දන්නවා. තොරතුරු තාක්ෂණය ගැන හොඳට දන්න මන්ත්‍රීවරු විපක්ෂයේ ඉන්නවා. ඔබතුමන්ලා කථා කරන්න කලින් ඒ අයගෙන් පොඩ්ඩක් අහලා එන්න ඇත්තටම මාතෘකාව මොකක්ද කියලා. විශේෂයෙන්ම ගත්තොත් අපට පළාත් පාලන ආයතනවල සභාපතිවරු, නගරාධිපතිවරු පිළිබඳ අර්බුදයක් නැහැ. ඔබතුමන්ලාට තිබෙන අර්බුදය අපි මත දමන්න එපා. අපට එවැනි ප්‍රශ්නයක් නැහැ නේ. අපි තනතුරු බලාගෙන දේශපාලනය කරන්නේ නැහැ. ඒක සුදුස්සාට අපි ලබා දෙනවා. සුදුසු කෙනා ඒ වැඩේ කර ගනීවි. ඔබතුමන්ලාගේ වේදනාව ගැන කියලා ඔබතුමන්ලා අපට කියනවා, අපේ වේදනාව කියලා. ඒ නිසා ඔබතුමන්ලාගේ වේදනාවයි, ඔබතුමන්ලාට තිබෙන අර්බුදයි ඔබතුමන්ලා විසඳා ගන්නේ නැතුව ඒවා අපේ පැත්තට දමන්න එන්න එපා කියලා අපි කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

අද අපි විවාද කරන්නේ 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට සිදු කළ තිබෙන සංශෝධන ගැනයි. විශේෂයෙන්ම අපි ඩිජිටල්කරණය ගැන කථා කළොත්, පරිගණක සහ ඩිජිටල්කරණය කොහොමත් ලෝකයේ සෑහෙන්න ගමනක් ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. තව ඉස්සරහටත් එය වේගයෙන් ඉදිරියට යනවා. එතකොට ලෝකයට ගැළපෙන විධියට අපේ රටේ නීති රීති පද්ධතිය සකස් වෙන්න ඕනෑ. එහෙම නැත්නම් ක්‍රමක්‍රමයෙන් සිදු වන මේ ආර්ථික පරිවර්තන එක්ක, ආයතනවල පරිවර්තනත් එක්ක ඒ අයට අපිත් එක්ක වැඩ කරන්න බැරි වෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, Business Process Outsourcing - BPO - කරන සමාගම්, BPM සමාගම් වෙනත් පාර්ශ්වයන්ගේ දත්ත අරගෙන තමයි සකස් කිරීම් කරන්නේ. එතකොට ඒගොල්ලන් ලංකාවේ ආයෝජනය කරන්න බලාපොරොත්තු වෙනවා නම් ඒ අය බලනවා, ඒ අයගේ clientsලාගේ dataවලට ලංකාව ඇතුළේ තිබෙන ආරක්ෂාව මොකක්ද කියලා. ඒක නිසා පෞද්ගලික දත්ත ආරක්ෂාව පිළිබඳ නීති බලාත්මක කිරීම සහ ලෝකයට ගැළපෙන විධියට අපේ අණපනත්වල සංශෝධන අවශ්‍ය නම් කර ගැනීම සම්බන්ධයෙන් තමයි අපි අද විශේෂයෙන්ම කථා කරන්නේ. මේක අපේ ආර්ථිකයට සම්බන්ධයි. ඒ නිසා තමයි ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයටත් මේක සම්බන්ධවෙලා තිබෙන්නේ. මොකද, අපි නීති රීති හදාගෙන, සංශෝධන හදාගෙන ඒ අයට ගැළපෙන විධියේ background එකක් හදා ගන්නකම් ඒ විදේශ ආයෝජකයෝ වුණත් බලාගෙන ඉන්නේ නැහැ. ඊට පස්සේ ඒ අය තමන්ට ගැළපෙන, ඒ අවශ්‍ය නෛතික පසුබිමක් තිබෙන රටවලට හැරෙනවා. ඒක නිසා ලෝකයේ තොරතුරු තාක්ෂණයේ යම් පංගුවක් අත්පත් කර ගන්න අපි බලාපොරොත්තු වෙනවා නම්, මේ විධියේ සංශෝධන ඉතාම අවශ්‍ය වෙනවා.

විශේෂයෙන්ම තිබෙන පනතකටයි මේ සංශෝධන එකතු කරන්න වෙලා තිබෙන්නේ. මෙතැනදී වැදගත් කාරණාවකුත් මතු වුණා. දැන් මේ සංශෝධන ටික අපි බලාත්මක කළා කියලා අපේ රටේ රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනවලට එක වතාවටම ඒවා apply කර ගන්න බැරි වෙයි. අපේ පනතේ නම් ඩිජිටල්කරණයම විතරක් නොවෙයි, සම්පූර්ණ දත්ත ගැනයි කථා කරන්නේ. නමුත්, මෙතැනදී ටිකක් වැඩිපුර කථා වෙන්නේ ඩිජිටල් දත්ත ගැන. මේක බලාත්මක කළා කියලා මේ ආයතනවලට මේක එකවරම apply කර ගන්න බැරි වෙයි. ඒ නිසා මේ පනත් කෙටුම්පතේ විශේෂ සංශෝධනයකුත් තිබෙනවා, අමාත්‍යවරයාට මේ පනතේ කාරණා අදියර වශයෙන් දියත් කරන්න පුළුවන් කියලා. මොකද, එහෙම නැති වුණොත් මේ regulationsවලට ආයතනවල ව්‍යුහයන් වෙනස් කරන්න වෙනවා. ඒගොල්ලන්ට අලුත් තාක්ෂණික ශිල්පීන් බඳවා ගන්න වෙනවා. ඒගොල්ලන් ළඟ ඉන්න සේවකයන්ගේ capacities build up කරන්න වෙනවා. මානව සම්පත සංවර්ධනය කරන්න වෙනවා. සමහර විට මානව සම්පත වෙනත් තැන්වලින් හොයා ගන්න වේවි. වෙනත් රටවලින් හොයා ගන්නත් වෙන්න පුළුවන්; outsource කරලා ගන්න වෙන්නත් පුළුවන්. ඒ නිසා අපේ රටේ ආයතනවලට මේකට හැඩ ගැහෙන්න යම් කාලයක් අවශ්‍ය වෙනවා. එම නිසා මේ ඩිජිටල්කරණය කරන්නේ කුමන ආණ්ඩුවෙන් ද කියලා නොවෙයි බලන්න ඕනෑ. අපේ ආණ්ඩුවෙන් කරන්නේ ලෝකයට ගැළපෙන විධියට අවශ්‍ය දේවල් සකස් කරන එකයි. ඒක අපේ වගකීම. රටේ නීති පද්ධතියක් තිබෙනවා නම්, ඒක කුමන ආණ්ඩුවෙන් ද ගෙනාවේ, මේ පනත් කෙටුම්පත් ගෙනාවේ කවුද කියලා හොයනවාට වඩා, මේ මොහොතේ ගැටලුසහගත තැන් තිබෙනවා නම් ඒවා නිවැරදි කරමින් ඉදිරියට යෑම තමයි වගකිව යුතු ආණ්ඩුවක ක්‍රියාවලිය. ඒ නිසා තමයි මේ පනතට විශේෂයෙන්ම මේ සංශෝධන ගෙනැල්ලා තිබෙන්නේ.

ඊළඟට, සයිබර් ආරක්ෂණය ගැනත් කථා කරනවා මම දැක්කා. කොහොමත් මේක එකට ගැට ගැහෙනවා. අපට සයිබර් ආරක්ෂණය සම්බන්ධයෙනුත් regulations ඕනෑ වෙලා තිබෙනවා. නමුත්, මෙතැන විශේෂයෙන්ම අපේ දත්ත සම්බන්ධයෙන් තමයි කථා කරන්නේ. මේ සංශෝධන හරහා අපි බලාපොරොත්තු

[ගරු තනුර දිසානායක මහතා]

වෙනවා, මේ ක්‍රියාවලිය වේගවත් කරන්න. ඒ වාගේම, මේ සංශෝධන එකතු වුණාට පස්සේ ක්‍රමයෙන් මේක බලාත්මක වෙනකොට අලුත් ආයතනවලට, එහෙම නැත්නම් startup businessesවලට, ඒ වාගේම කුඩා ව්‍යාපාර කරන අයට මේකේ බලපෑම කොහොම වෙයිද කියලා අපි කල්පනා කරනවා. මොකද, ඒගොල්ලන් ටිකක් අමාරුවෙන් ව්‍යාපාර කරනවා වෙන්න පුළුවන්. ආයෝජනය කරන්න ලොකු මුදලක් නැති වෙන්න පුළුවන්. එතකොට විශේෂඥ දැනුම ලබා ගැනීම සම්බන්ධයෙන් ඒගොල්ලන්ට ප්‍රශ්නයක් එන්න පුළුවන්.

එම නිසා ඒගොල්ලන්ට අවශ්‍ය කරන සේවා outsource කරලා ගන්න පුළුවන් විධියට මෙම සංශෝධන පනතේ කරුණු අන්තර්ගත කර තිබෙනවා. එහෙම නැත්නම් පෞද්ගලික ආයතනවලට දත්ත ආරක්ෂණ නිලධාරියෙක් අවශ්‍ය වනවා, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කරන පසුබිම හදා ගන්න. අපි ඩිජිටල්කරණයට යන්නත් ඕනෑ. ඒ වාගේම ලෝකයට ගැළපෙන විධියට අපේ ආර්ථිකය හසුරුවා ගන්නත් ඕනෑ. ඒ වාගේම අපේ රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන මෙයට ගැළපෙන විධියට අදියර වශයෙන් දියුණු කර ගන්න ඕනෑ; මානව සම්පත සහ ඒ යටිතල පහසුකම්. අපට ගොඩක් feasibility ගැන බලන්න වෙයි. මොකද, technical feasibilities තිබෙනවා, ඒ වාගේම infrastructure තිබෙනවා. ඒ නිසා ඒ හැම එකටම ගැළපෙන විධියට කටයුතු කරන්න වෙනවා. එහෙම නැතුව එක පාරටම මෙය apply කරන්න ගියොත් එම ආයතනවලටත් ඒක දරා ගන්න බැහැ.

අපට මෙම යන්ත්‍රණය ක්‍රියාත්මක කර ගන්න මූලික වශයෙන් අවශ්‍ය වනවා ආයතනයක්. මේ පනතේ මූලිකම දෙයක් තමයි, දත්ත ආරක්ෂණ අධිකාරියක් පිහිටුවීම. මා හිතන්නේ මේ වන විට ඒ අධිකාරිය පිහිටුවලා, හැකියාව සහිත අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගනිමින් තිබෙන්නේ. ඒ වාගේම අපි දැක තිබෙනවා වෙනත් රටවල පෞද්ගලික දත්ත සම්බන්ධයෙන් යම් යම් ආයතනවලින් කටයුතු කර තිබෙන ආකාරය. විශේෂයෙන් ගොඩක් සංවේදී දත්ත. අපට දත්ත හෙළිදරව් නොකර ආයතනයක් එක්ක ගනුදෙනු කරන්න බැහැ. අපි රෝහලකට ගියත් අපේ දත්ත ටික දෙන්න වෙනවා නේ. බැංකුවකටත් අපේ දත්ත ටික දෙන්න වනවා. එහෙම නැත්නම් එම ආයතන එක්ක අපට ගනුදෙනු කරන්න හැකියාවක් නැහැ. අපි දන්නවා mobile connection එකක් ගන්නකොටත් අපේ details ටික නොදී එය ගන්න බැහැ. එතකොට තමයි මේක අපට වැදගත් වෙන්නේ. අපි details ටික දෙනවා නම් අපේ දත්ත ටික ආරක්ෂා කරන්න මොකක්ද අපේ රටේ තිබෙන නෛතික රාමුව? මේකෙදි ඒ ආයතන බැඳී ඉන්නවා මූලික නීතියක් විධියට. හැබැයි, එම ආයතන එය උල්ලංඝනය කරනවා නම් අපට යන්න පුළුවන් නෛතික පියවර මොනවාද? ලෝකයේ එහෙම ගිය අවස්ථා තිබෙනවා, විවිධ තනි පුද්ගලයන් සහ සමාගම් විසින්. ඒ අයගේ පෞද්ගලික දත්ත යම් යම් ආයතන අවභාවිත කරපු අවස්ථා තිබෙනවා. එතකොට ඒවාට එරෙහිව ඒ අය නඩු මාර්ගවලට ගිහිල්ලා වන්දි මුදල් ලබා ගත් අවස්ථා තිබෙනවා. එතකොට මේකෙදි අපට මුලින්ම ඕනෑ වෙන්නේ, මේ විධියේ framework එකක්. එවැනි නෛතික රාමුවක් හැදුවාට පසුව අපේ රටේ දත්ත හසුරුවන්නන් - data processing කරන අය - මේ නීතිය යටතේ ප්‍රමිතිගත කිරීමකට ක්‍රමයෙන් ලක් වනවා. මේකෙදි නෛතිකව ගත්තොත්, යම් ආකාරයකින් දත්ත අවභාවිතයක් වෙලා තිබෙනවා නම් සිවිල් නීතිය යටතේ තමයි නඩු දමන්න පුළුවන් වන්නේ. එතකොට මිලියන 10ක උපරිමයකට යටත් වන්දි මුදලක් ලැබීමට හැකියාව තිබෙනවා. හැබැයි, ආයතනයකට දඩ ගැසීම කියන එක හෝ ආයතනයකට දඬුවම් දීමට වඩා අපට ඕනෑ වෙන්නේ මෙන්න මේ මූලික පදනම හදලා, අපේ රටේ පෞද්ගලික දත්ත ආරක්ෂාව සම්බන්ධයෙන් ඒ දත්ත හසුරුවන්නන්ට විශේෂයෙන් තිබෙන වගකීම ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය කරන මූලික ක්‍රියාවලිය ඉටු කර ගැනීමයි.

මම ඉස්සෙල්ලාත් කිව්වා වාගේ, අපි කවුරු හෝ රෝහලක ලියාපදිංචි වෙලා අපේ සංවේදී දත්ත ඇතුළත් කළාට පසුව ඒගොල්ලන් එම දත්ත අවසරයකින් තොරව වෙනත් ආයතනයකට ලබා දුන්නොත්, ගැටලු සහගත තත්ත්වයක් ඇති වෙන්න පුළුවන්. උදාහරණයක් විධියට කිව්වොත්, රක්ෂණ ආයතනයක් වාගේ තුන්වන පාර්ශ්වයකට ලබා දුන්නොත් ගැටලු සහගත වෙන්න පුළුවන්. එවැනි සිදුවීම් වෙලා තිබෙන බව අපි දැකලා තිබෙනවා. අපි ඩිජිටල්කරණයටත් වේගයෙන් යන නිසා එවැනි දේවල් වළක්වා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය කරන මූලික නීති රාමුවක් සකස් කිරීම තමයි අපි මෙම පනත් කෙටුම්පත හරහා විශේෂයෙන්ම බලාපොරොත්තු වෙන්නේ.

ඒත් එක්කම අපට අමතක කරන්න බැහැ, මෙයත් එක්කම ගැටගැහිලා තිබෙනවා දත්ත ආරක්ෂාවත්. මොකද, පෞද්ගලික දත්ත අවභාවිත කිරීමට එරෙහිව නීතිමය රාමුව බලවත් කිරීම වාගේම අපට ඕනෑ වනවා වෙනත් සිදුවීම්වලිනුත් දත්ත ආරක්ෂා කර ගන්න. මම දැක්කා විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුත් කියනවා. ඒක වැඩිපුරම අයිති වෙන්නේ security breach එකක්, එහෙම නැත්නම් cyber threat එකක් ආවොත්. ඒ කියන්නේ, වෙනත් පාර්ශ්වයක් විසින් පද්ධතියකට බලෙන් ඇතුළත් වෙලා එයට හානි කළොත්. එතකොට අපට සිද්ධ වනවා අපේ රටේ දත්ත පද්ධතිවල ආරක්ෂාව සම්බන්ධයෙනුත් ප්‍රමිතීන් ඉහළ නංවා ගන්න. මේවා ටිකක් ක්‍රමවත්ව සහ අදියර වශයෙන් කරන්න ඕනෑ දේවල්. ඒ නිසා තමයි අපි මේ සංශෝධන ප්‍රමාණයක් මේ පනතට යෝජනා කරලා තිබෙන්නේ. අපි බලාපොරොත්තු වනවා, 2022දී සම්මත වුණු පනත ප්‍රායෝගිකව ක්‍රියාත්මක වෙද්දී ඇති වුණු ගැටලු ටික, බාධා ටික මේ සංශෝධන මඟින් ඉවත් කරගෙන ඉදිරියට මේ ක්‍රියාමාර්ග ටික ගන්න.

මේ කාරණාත් එක්කම මම තව අමතර අදහසක් ඉදිරිපත් කරන්න කැමැතියි. අපට ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා මේ දත්තත් එක්කම ගැට ගැහිච්ච misinformation. මේ පාර්ලිමේන්තුව තුළත් ගොඩක් වෙලාවට දත්ත විකෘති කරලා තමයි ඉදිරිපත් කරන්නේ. ඊට පසුව එළියට ගිහිල්ලාත් දත්ත විකෘති කරනවා. වගකිව යුතු කණ්ඩායමක් විධියට මේ ගැන අපි සදාචාරාත්මකවත් හිතන්න ඕනෑ. තාක්ෂණයත් එක්ක අද ලෝකයේ දත්ත සහ තොරතුරු ඉතාම වේගයෙන් පැතිරෙන තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා අපි හිතනවා, ඒ සම්බන්ධයෙනුත් අපට ඉදිරි ගමනක් යන්න ඕනෑ වෙයි කියලා. එතකොට තමයි ලෝකයට අපිත් එක්ක ගනුදෙනු කරන්න පුළුවන් අවස්ථාවක් අපි හදන්නේ. විශේෂයෙන් ගත්තොත්, 2022 වසරේ මුල් කාලයේ මේ පනත ගෙන ආ දකුණු ආසියාවේ පළමුවැනි රට වන්නේ අපේ රටයි. හැබැයි මේ වෙනකොට ඉන්දියාව කටයුතු කර තිබෙනවා, ඩිජිටල් දත්ත ආරක්ෂණ ක්‍රියාමාර්ග සහ ඒ සම්බන්ධ පනත සඳහා. මේ සංශෝධන ටික අපට අවශ්‍ය වෙනවා, පෞද්ගලික දත්ත ආරක්ෂාව සම්බන්ධයෙන් මූලික ක්‍රියාමාර්ග ටික, ඒ කියන්නේ දත්ත ආරක්ෂණ අධිකාරිය, නියාමන අධිකාරිය සහ ඒ ඉදිරි ක්‍රියාමාර්ග ටික ක්‍රියාත්මක කිරීම සඳහා.

අපේ රජයේ ප්‍රධානතම ක්‍රියාවලි තුනකට අන්තර්ගතයි මේ ඩිජිටල් ආර්ථිකය. ප්‍රධාන වශයෙන් ගත්තොත්, දූෂපත්කම තුරන් කිරීම, ඩිජිටල් ආර්ථිකය නැංවීම සහ Clean Sri Lanka වැඩසටහන. අන්න ඒ වැඩසටහන් තුනෙහි ප්‍රධානම අංගයක් තමයි මේ ඩිජිටල් ආර්ථිකය ඉහළ නංවා ගැනීම. ඒ සඳහා මේ පනත ඉතාම වැදගත්. ලෝකයත් එක්ක ඉස්සරහට යන්න නම්, මෙතැනින් එහාට ක්‍රමයෙන් මේක දියුණු කරමින් අපි ඉදිරියට

යන්න ඕනෑ. මෙම සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. මම හිතුවේ මගේ කථාවට අවස්ථාව තිබෙන්නේ පසුව කියලායි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
පසුව තමයි ඔබතුමාට අවස්ථාව තිබෙන්නේ. ඒ වුණත් මේ වෙලාවේ කථා කිරීමට නියමිත විපක්ෂයේ අනෙක් ගරු මන්ත්‍රීවරු මේ වෙලාවේ සීට්වල නැහැ.

[අ.භා. 2.27]

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියට ස්තුතිවන්ත වෙනවා.

අද දින, 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට ගෙන එන සංශෝධන සම්බන්ධයෙන් විවාදය පැවැත්වෙන අතරේ, ආණ්ඩුව පැත්තෙන් මුලින්ම කථා කරපු අමාත්‍යතුමාත්, තවත් කිහිප දෙනෙකුත් පමණක් ඒ සංශෝධන සම්බන්ධයෙන් ඉතාම පැහැදිලිව කථා කළා. අපට චෝදනා එල්ල කළත් ඇත්තටම අපි දැක්ක විධියට 2022දී ගෙනාපු පනත ගැන තමයි එතුමන්ලා විනාඩි ගණනක් කථා කළේ. සමහර මන්ත්‍රීවරු මම දැක්කා, digitalization ඉක්මන් කරන්නත්, ඩිජිටල් ආර්ථිකයක් ඇති කරන්නත් අපි 2022 දී පනත ගෙන ආවා වාගේ කථාත් කිව්වා. 2022 පනත ඊට කලින් ඇවිල්ලා තිබුණු එකක්. හැබැයි, මේ සංශෝධනය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කළා ඉතාම අඩුයි කියන එක තමයි මගේ හැඟීම. මේ ආර්ථිකය වර්ධනය කරන විධියට, ඩිජිටල් ආර්ථිකයක් ඇති කරන ප්‍රමාණයට මේ සංශෝධනය උදවු වෙන්නේ කොහොමද කියන එක ගැන කවුරුවත් කථා කළේ නැහැ. ආංශික අධීක්ෂණ කාරක සභාවෙන් ලබා දීපු ඒ වාර්තාව කියෙව්වත් අපට ඒකේ පැහැදිලි වෙන්නේ නැහැ, මේ යන ආර්ථිකය වර්ධනය කරගන්න, ඩිජිටල් ආර්ථිකය ඇති කරගන්න, අනෙක් රටවල් සමඟ digital platforms එක්ක තිබෙන ඒ සම්බන්ධතා ඇති කරගන්න, data processing, data controlling සඳහා මේ සංශෝධන උදවු වෙන්නේ කොහොමද කියන එක ගැන. මේ සම්බන්ධයෙන් මුලින්ම කථා කරපු අමාත්‍යතුමා පවා ඒ පැහැදිලි කිරීම සිද්ධ කළේ නැහැ. මෙය කියවද්දී ඉතාම පැහැදිලිව අපට පෙනෙනවා, විශාලම සංශෝධනයක් සිද්ධ වෙන්නේ 20වෙනි Section එක බව. හැබැයි ගරු අමාත්‍යතුමා සියල්ල කියවා ගෙන ගිහිල්ලා 17වන වගන්තියෙන් පසුව 26වන වගන්තියට පැන්නා. 20වෙනි එක කියෙව්වේවත් නැහැ. ඒ නිසා මම කැමැතියි ඒ ගැන මතක් කරන්න. 20වෙනි Section එකේ තමයි තිබෙන්නේ public corporationවලින් Data Protection Officer කෙනෙකු අයින් කිරීම ගැන. ඒ අයින් කරන්නේ ඇයි කියන එක ගැන අපට පැහැදිලි කළේ නැහැ. ඇත්තටම අපි මේකට විරුද්ධ නැහැ. නියෝජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. මේ සම්බන්ධයෙන් අපට විරෝධතාවක් නැහැ. Personal Data Protection Act එක ගැනවත්, අපේ රටේ සංවර්ධනය වෙනුවෙන් සංශෝධන වෙන්න තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන්වත් කිසිම විරෝධතාවක් අපට නැහැ. හැබැයි අපි දැනගන්න කැමැතියි, මේ සංශෝධන ගෙන ඒමේ rationale එක. What is the rationale behind it? There has to be a rationale for any amendment to be brought to this Act.

හැබැයි, Section 20 කියන එක අත් හැරලා තමයි එතුමා ඉස්සරහට ගියේ. Section 20වල, දත්ත ආරක්ෂණ නිලධාරියෙක් පත් කිරීමට අදාළව ඉතාම පැහැදිලිව "රාජ්‍ය සංස්ථාව" කියන එක ඉවත් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, Interpretation Section එක බැලුවොත්, "පොදු අධිකාරිය" කියන එකෙනුත් එය අයින් කර දමා තිබෙනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට පුළුවන් නම් දැන් වුණත් අවස්ථාව තිබෙනවා ඒ ගැන කියන්න. ඒ සඳහා මගේ කාලයෙන් විනාඩියක් ගත්තත් කමක් නැහැ. මට නම් මේක කියවද්දී තිබිච්ච ප්‍රධාන ප්‍රශ්නය ඒකයි.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
මෙහෙමයි, ගරු මන්ත්‍රීතුමා. දත්ත ආරක්ෂණ නිලධාරියා - Data Protection Officer - කියන එක optional කරලා තිබෙන්නේ. මොකද, හැම රාජ්‍ය ආයතනයකටම ඒ වාගේ permanent තනතුරක් තියා ගන්න බැරි වෙයි. එතකොට ඒ තනතුරට අදාළ කාර්යය එළියෙන් - outsource කරලා - කරවා ගන්න පුළුවන් හැකියාව තමයි ඔතැන ඇති කරලා තිබෙන්නේ. මොකද, Personal Data Protection Act එකට comply වෙන්න නම්, අනිවාර්යයෙන්ම ඒ වාගේ Data Protection Officer කෙනෙකුගේ අනුදැනුමත් එක්ක ඒ data protection guideline එක හැදෙන්න ඕනෑ. ඒ නිසා ඇතුළේ permanent කෙනෙක් නැති වුණත් එළියෙන් ලබා ගන්න තමයි අපි ඔය කාරණය මඟින් අවකාශය ඇති කරලා තිබෙන්නේ.

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපි හොඳින්ම දන්නවා, Personal Data Protection Act එක 2022දී ගෙනාවේ EU Act එක අනුව, General Data Protection Regulation අනුව බව. එහෙම නම්, General Data Protection Regulation අනුව හදපු එකේ මේ විධියට තිබෙනවාද නැද්ද කියලාවත් ඔබතුමන්ලා ඒ rationale එකේ පෙන්වලාත් නැහැ. ඒ කියන්නේ, මේක දැන් මේ වෙලාවේ වෙනස් කිරීමේ අවශ්‍යතාව අපට තේරුණේ නැහැ. නමුත් ඔබතුමාගේ උත්තරය මම ඒ විධියට පිළිගන්නවා. ඒකේ ප්‍රශ්නයක් නැහැ.

බලයට පැමිණීමේ කාලය සම්බන්ධයෙනුත් වෙනසක් කරලා තිබෙනවා. මා හිතන විධියට, ඒ සම්බන්ධයෙනුත්, එනම් ඒ සඳහා තිබෙන අවශ්‍යතාව මොකක්ද කියන එක සම්බන්ධයෙනුත් ආණ්ඩුවේ කිසිම කෙනෙක්, අමාත්‍යවරයෙක් කථා කළේ නැහැ. මේ වෙලාවේ මේකෙන් ලැබෙන උදව්ව මොකක්ද, මේකෙන් ලැබෙන තල්ලුව මොකක්ද කියන එක ගැන ඒ කවුරුවත් කථා කළේ නැහැ.

කාර්ය මණ්ඩලයේ හිඟය ගැන කථා වුණා. කාර්ය මණ්ඩලයේ හිඟය කියන එක ප්‍රශ්නයෙන් පැනලා යන්න පුළුවන් උත්තරයක් නොවෙයි. වෙනත් මන්ත්‍රීවරුන් කථා කරද්දී ඒ ඒ ආණ්ඩුවලට

[ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා]

ඇඟිල්ල දිගු කළා මිස කාර්ය මණ්ඩලයේ හිඟය සම්බන්ධයෙන් කරන්නා වූ ප්‍රතිකර්මය මොකක්ද කියන එක ගැනත් කිව්වේ නැහැ. ඇත්තටම මගේ විෂයය වන නීති අංශය ගෙන බැලුවත් අපි හැමදාම උපදේශක කාරක සභාවලදී කථා කරනවා, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ, නීතිපති දෙපාර්තමේන්තුවේ, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලවල stenographersලා වැනි නිලධාරින්ගේ හිඟය කියන ප්‍රශ්නය ගැන. මුළු රටේම පැතිරුණු ප්‍රශ්නයක්, එය. ඒ ප්‍රශ්නයට ලබා දෙන උත්තරය සම්බන්ධයෙනුත් කිසිම හැඳින්වීමක්වත් කළේ නැහැ; ඒ සම්බන්ධයෙන් කිසිම දෙයක් කිව්වේ නැහැ.

දත්ත සම්බන්ධයෙන් කථා කරද්දී, විශේෂයෙන් දත්ත නැති වීම ගැන අපට නොවෙයි බැණුම් අහන්න සිදු වෙලා තිබෙන්නේ, මේ ආණ්ඩුව කරන මිනිසුන්ටමයි. මම ඒ බව ඉතාම ගෞරවයෙන් කියන්න කැමැතියි. මොකද, අපි නොවෙයි දත්ත නැතුව මේ රටේ මිනිසුන්ට බොරු කිව්වේ. දත්ත සම්බන්ධයෙන් කිසිම හැඟීමක් නැතුව මේ රටේ මිනිසුන්ට ස්වර්ග රාජ්‍යයක් මවා පෑවේ අපි නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. සහල් සම්බන්ධයෙන් දත්තයක් තිබුණේ නැහැ, පසුගිය දෙසැම්බර් මාසය වෙද්දී. ලුණු සම්බන්ධයෙන් දත්තයක් තිබුණේ නැහැ. ඔක්කෝම ප්‍රශ්න ඇති වුණාට පස්සේ කර්මාන්ත ඇමතිවරයා මෙතැනට ඇවිල්ලා කාලගුණ වාර්තාවත් සභාගත කළා. කාලගුණ වාර්තාව සභාගත කරන්න ඕනෑ එදා නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. කාලගුණ වාර්තා බලා ඒ දත්ත එක්ක වැඩ කරලා තමයි පුරෝකථනය කරන්න තිබුණේ. හැබැයි කාලගුණ වාර්තාවත් ගෙනැල්ලා සභාගත කළේ, ලුණු ප්‍රශ්නය ඇදුණාට පස්සේ. මට මතකයි, එතුමා දත්ත බලන්නේ නැතුව කට වරද්දා ගත්තා, "කිසිම දවසක ලුණු ගෙනෙන්නේ නැහැ" කියලා. ඒ වාගේම ජනාධිපතිතුමාත් දත්ත බලන්නේ නැතුව කට වරද්දා ගත්තා, "කිසිම දවසක හාල් ගෙනෙන්නේ නැහැ" කියලා. ඒ නිසා මේ දත්ත සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙන්නේ, විශාල වශයෙන් මේ ආණ්ඩුවටයි. දත්ත ගැන කථා කරද්දී මට තේරෙනවා, personal data සහ අනෙක් dataවල තිබෙන වෙනස. නමුත් දත්ත සම්බන්ධයෙන් කථා කරපු නිසා තමයි මා විශේෂයෙන් ඒ කාරණයත් කිව්වේ.

ඊළඟට, misinformation සහ disinformation ගැනත් කථා කළා, දත්ත සම්බන්ධව කථා කරන කොට. කවුද මේ රටේ misinformation ඇති කළේ? Misinformationවලින් ආණ්ඩුව ගත්තේ කවුද? අද ඒකට මිනිස්සු උත්තර දීලා තිබෙනවා නේද, යම් ප්‍රමාණයකින්? අනේ දැන් මගෙන් අහන්න එපා, සභා කීයක් පිහිටෙව්වාද, කීයක් පිහිටුවනවාද කියලා. ඒක අපි හෙට අනිද්දාට බලමු. හැබැයි මේ රටේ ජනතාව ලක්ෂ විසිගණනක් ඡන්ද අඩු කිරීමෙන් misinformationවලට උත්තරය දීලා තිබෙනවා කියන එක මා කියන්න කැමැතියි. Misinformation සම්බන්ධයෙන් කප් ගහපු කට්ටිය තමයි අද misinformation ගැන මේ කථා කරන්නේ. මම කැමැති නැහැ පෞද්ගලිකව මඩ ගහන්න, මගේ කථාවේදී. හැබැයි මම මේ කාරණය කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, තමන්ගේ ජීව දත්ත ටික හරියට හදා ගන්න කියන්න. අපි දන්නවා නේ, ආචාර්ය උපාධි තිබෙනවා කියලා ජීව දත්ත සම්බන්ධවත් බොරු කරපු විධිය. මට කලින් කථා කළ මන්ත්‍රීවරයා misinformation ගැන කථා කළාට අපි දන්නවා, එක්සත් ජනපද ආණ්ඩුවෙන් රටට එන්න කියලා වීසා එකවත් දුන්නේ නැති බව. වීසා එකවත් දුන්නේ නැහැ. මොකද, ඒ දත්ත වැරැදියි; ඒ ජීව දත්ත ටික වැරැදියි. ඒ නිසා තමන්ගේ ජීව දත්ත වාර්තාව හරියාකාරව හදා ගන්න ඕනෑ, රටේ දත්ත ටික හදන්න කලින්. ඒ නිසා බොරුවට misinformation සහ disinformation ගැන අපට කියන්න එන්න එපා. මොකද, ඕවා අපට කියන ඒකේ කිසිම තේරුමක් නැහැ.

මෙම පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත තවත් ඉස්සරහට සංශෝධනය වෙන්න ඕනෑ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. අපි ඒ සම්බන්ධයෙනුත් පෙනී ඉන්නවා. ඔබතුමන්ලා ඩිජිටල් ආර්ථිකයට යන ගමනේදී වෙනස්කම් සිදු වෙන්න ඕනෑ නම් ඒ වෙනස් වෙන්න ඕනෑ තැන් ටික වෙනස් කරන්න. අපි ඒ වෙනුවෙන් පෙනී ඉන්නවා. අපි උදවු කරන්නම්; ඒකට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අපට මේකේ තිබෙන පසුබිම් කථාව කියන්න, මේක වෙන්නේ මේකටයි කියලා කියන්න; ඉන්දියාව සමඟ තිබෙන ඒ සම්බන්ධය ගැන කියන්න, digital ID එකට මොකද වෙන්නේ කියලා කියන්න; මොන දත්ත ද යන්නේ, මොන දත්ත ද process වෙන්නේ, මොන දත්ත ද තියාගන්න පුළුවන් කියලා කියන්න. හැබැයි ඒ රටත් එක්ක වැඩ කරද්දී අපට right to be forgotten යටතේ පාවිච්චි කරන්න පුළුවන් මොන දත්ත ද කියලා කියන්න. මොකද, ඔබතුමන්ලා හොඳින්ම දන්නවා ඉන්දියාවත් එක්ක අත්සන් කළ ගිවිසුම් ටික ගැනවත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැති බව. ඒ නිසායි අප ඒ ගැන අහන්නේ. ඔබතුමන්ලා කිව්වා ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා කියලා. මම එක දවසක් කිව්වා එහෙම නම් මම ඉන්න පාර්ලිමේන්තුවට නොවෙයි වෙන කොහේ හරි පාර්ලිමේන්තුවකට එය ඉදිරිපත් කරන්න ඇති කියලා. ඒත් misinformation, ඒ කිව්වේත් බොරු. එහෙම කරන්නේ නැතිව අපව දැනුවත් කරන්න; කිසි ප්‍රශ්නයක් නැහැ. දැනුවත් කරන්න බැරි නම් කරුණාකරලා කියන්න රටවල් දෙකක් අතර වැඩ කරද්දී එහෙම දැනුවත් කරන්න බැහැ කියලා. ඊයේ පෙරේදා දවසක මන්ත්‍රීවරයෙක් එහෙමත් කියනවා මම දැක්කා. ඒක කියපු එක බොහොම හොඳයි. ඒක තමයි ඇත්ත කථාව. රටවල් දෙකක් - විශේෂයෙන් ඉන්දියාව වාගේ රටක් එක්ක- වැඩ කරද්දී ඒ සියලු ගිවිසුම්ගත කරුණු සම්බන්ධයෙන් එළියේ ඇවිල්ලා කියන්න බැහැ. ඒක අපට තේරෙනවා; අපි මෝඩයෝ නොවෙයි නේ. හැබැයි ඔබතුමන්ලා බොරු කරන්න එපා.

ඔබතුමන්ලා කලින්ම කට වරද්දාගෙන, සියලු දේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා කියපු එකෙන් තමයි misinformation කියන එක පටන් ගත්තේ. ඒ නිසා අපට ඒ කාරණා ගැන කියන්න. Digital ID එක එනවා නම් අපිත් කැමැතියි. මං 2013දී පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙසයි සිටියේ. 2015 අපේ ආණ්ඩුව ආ වෙලාවේ ඔය සම්බන්ධයෙන් පළාත් සභාවේ ඉඳන් පවා මම කථා කළා. අපේ Group Meetingsවලදීත් එවකට අග්‍රාමාත්‍යතුමා හමු වෙලා ඔය සම්බන්ධයෙන් කථා කළා. එවකට හිටපු නියෝජ්‍ය අමාත්‍ය ගරු හර්ෂ ද සිල්වා මැතිතුමා ඒ සම්බන්ධයෙන් ඇස්තමේන්තුවකුත් ඉදිරිපත් කළා, මට මතකයි. ඒ වෙලාවේ මුදල් අඩුයි කිව්වා. මා හිතන විධියට, ගරු චතුර ගලප්පත්ති මන්ත්‍රීතුමාටත් ඒ බව මතක ඇති. අපි මේ කාරණය වෙනුවෙන් පෙනී ඉන්නවා තරුණයන් හැටියට සහ තාක්ෂණය පාවිච්චි කරන අය හැටියට. Digital payment gateway එක සම්බන්ධයෙන් අපි පෙනී ඉන්නවා. හැබැයි බොරු කරලා ඉස්සරහට යන්න හදන්න එපා කියන එක මා විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි.

අවසාන වශයෙන් මම කියන්නේ මේකයි. මේ සංශෝධනයේ අපට පේන්න, තේරෙන යම් ප්‍රමාණයක් තිබෙනවා. හැබැයි, තේරෙන්නේ නැති ප්‍රමාණයකුත් තිබෙනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මම හිතනවා ඒ ප්‍රමාණය ඔබතුමාගේ පිළිතුරු කථාවේදී හෝ පැහැදිලි කරලා, තේරුම් කරලා අපට කියා දෙයි කියලා. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවලදී අපගේ සහයෝගය, උපකාරය, උදව්ව ලබා දෙන්නට සූදානම් බව මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු තනුර දිසානායක මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක? *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මම නම කිව්වේ නැහැ. මම කාගේවත් නමක් කිව්වේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
ඔබතුමා මා ගැනයි කිව්වේ. කලින් කථා කළ කෙනා කියලායි කිව්වේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතුමාත් නීතිඥයෙක් නේ. කලින් කථා කළ කෙනා, මම. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් ඉදිරිපත් කළේත් misinformation. ඕනෑ නම් ගිහින් UK visa branch එකෙන් අහන්න. වීසා එක තිබෙනවා. දවසක් පරක්කු වෙච්ච එක නේ වුණේ. එතකොට වීසා ලැබිලා නැහැ කියලා එකක් නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சித்ரால் பர்னாந்து)
(The Hon. Chithral Fernando, Attorney-at-Law)
මම නමක් කිව්වේ නැහැ.

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)
කලින් කථා කරපු මන්ත්‍රීතුමා කියලා නේ කිව්වේ. එතකොට ඔබතුමා- *[බාධා කිරීමක්]* UK visa එකේ ප්‍රශ්නයක් ඇති වෙලා තිබුණේ නැහැ. වීසා එන්න පරක්කු වීමක් විතරයි වුණේ. ඔබතුමා කිව්වා ජීව දත්ත පත්‍රිකාවේ ප්‍රශ්නයක් නිසා වීසා ලැබුණේ නැහැ කියලා. එහෙම එකක් වෙලා නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු හසාරා ලියනගේ මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.38]

**ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) ஹசாரா லியனகே)
(The Hon. (Mrs.) Hasara Liyanage, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද දවසේ අපි 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට අදාළ සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධව කථා කරමින් සිටින මේ මොහොත, රටක් වශයෙන්, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විධියට නව දේශපාලනික ගමනක්, නව ආර්ථික ගමනක්, නව සමාජයීය ගමනක් යමින් සිටින අවස්ථාවක්.

අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති අතර පළමුවෙන්ම තිබෙන එකක් තමයි "ඩිජිටල්කරණය" කියන්නේ. ඩිජිටල්කරණය තුළ අප විශේෂයෙන් අවධානයට ලක් කළ යුතු දෙයක් බවට පත් වනවා, "දත්ත" කියන එක. මොකද, අද වන විට ලෝකයේ වැඩිම වටිනාකමකට භාජන වෙලා තිබෙන දෙයක් තමයි "දත්ත" කියන්නේ. එම නිසා අද දවසේ මේ පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට සම්බන්ධ වීමට මාහට කාලය ලබා දීම ගැන මම ඔබතුමියට නැවතත් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

දත්ත ආරක්ෂණය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ, දකුණු ආසියාවේ පළමුවෙනි පනත හැටියට තමයි අපි පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත 2022 වසරේදී ලංකාවට හඳුන්වා දුන්නේ. නමුත් 2023 වසරේදී ඉන්දියාව සකස් කළ මේ හා සමගාමී පනතක් තිබෙනවා. 2022 වර්ෂයේ ඉදිරිපත් කළ පනත තමයි අද සංශෝධනයට ලක් වන්නේ. මේ හා සමාන මූලධර්ම යුරෝපයේත් දකින්න තිබෙනවා. ඒ මූලධර්ම මත පදනම් වෙලා තමයි ලංකාවට අපි මේ පනත හඳුන්වා දීලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ පනත් කෙටුම්පතේ විශේෂත්වය තමයි, මේ තුළින් තනි තනි පුද්ගලයන්ගේ වාගේම සමාජයක් විධියට අප සියලුදෙනාගේ දත්ත සම්බන්ධව, තොරතුරු සම්බන්ධව තිබෙන අයිතිවාසිකම් සුරක්ෂණය කිරීමක් සිදු වීම.

විශේෂයෙන්ම අපි මේ පනත් කෙටුම්පතේ පූර්විකාවට අවධානය යොමු කළොත්, මේ මඟින් පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට අදාළව දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් හඳුනා ගැනීම සහ ශක්තිමත් කිරීමත්, දත්ත ආරක්ෂණ අධිකාරියක් පිහිටුවීමත් සිද්ධ කරනවා. පාර්ලිමේන්තුවක් විධියට සහ මහජන නියෝජිතයන් විධියට මේ පාර්ලිමේන්තුව තුළ අපට තිබෙන එක් භූමිකාවක් තමයි රටට වැදගත් වන, සමාජයට වැදගත් වන යම් කිසි පනත් කෙටුම්පතක් සම්බන්ධව සාකච්ඡා කිරීමේදී ඒ පිළිබඳව සමාජය තුළ කතිකාවක් නිර්මාණය කිරීම. විශේෂයෙන් අපි එය කළ යුතුව තිබෙනවා. නමුත් අපට පෙනෙනවා, අද උදෑසන සිටම අපි මේ පනත් කෙටුම්පත පිළිබඳ සාරගර්භ විවාදයක් කරන්නට පැමිණෙමින් සිටින අවස්ථාවක වුවත්, මෙතැන යම් යම් දේශපාලනික මත ගැටුම් අවුස්සමින් මේ විවාදය වෙනම තැනකට අරගෙන යන්න විපක්ෂය උත්සාහ කරමින් සිටින බව. හැබැයි, වෙන දාට වඩා මේ පාර්ලිමේන්තුවේ සජීවී විකාශනය බොහෝ පිරිසක් බලමින් සිටිනවා කියලා මම විශ්වාස කරනවා. ඒ අයට පැහැදිලිව පෙනෙනවා ඇති, අපි මේ තරම් වැදගත් පණිවුඩයක් සමාජගත කරමින් සිටින අවස්ථාවකදී පවා මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ හැසිරීම කොහොමද කියලා. ඒ ගැන අපට වඩා හොඳට එළියේ සිටින මහජනතාව බලමින් සිටිනවාය කියන එක මම මේ මොහොතේ විශේෂයෙන් ප්‍රකාශ කරනවා. මොකද, අපි දත්ත සම්බන්ධයෙන් කථා කරමින් සිටිනකොට, අපේ මහජනතාවට තමයි ඒකේ sensitive බව දැනෙන්නේ. මේකෙන් මොකක්ද වෙන්නේ, තමන්ගේ දත්තවලට මොකක්ද වෙන්නේ, රජයක් විධියට කොහොමද ඒවා ආරක්ෂා කරන්නේ කියන කාරණා හැම දෙයක් ගැනම ජනතාව තමයි සංවේදී වෙන්න ඕනෑ. "පුද්ගල දත්ත" කියන එක ගත්තොත්, අර්ථ නිරූපණ වගන්තිය වන 56වන

[ගරු නිතිඥ හසාරා ලියනගේ මහත්මිය]

වගන්තිය තුළ පැහැදිලි ලෙසම දක්වලා තිබෙනවා, "යම් නාමයක්, හඳුනා ගැනීමේ අංකයක්, කායික, ජානමය, මානසික, සමාජයීය අනන්‍යතාවක්" කියලා. එම නිසා මහජනතාවට අපි විශේෂයෙන් කියන්නට ඕනෑ, අනියත බියක් ඇති කර ගන්න ඕනෑ නැහැ, ඔබගේ දත්ත සුරක්ෂිත කිරීමෙහිලා ආණ්ඩුවක් වශයෙන් අවශ්‍ය සංශෝධන සිදු කරමින් තමයි අද අපි මේ පාර්ලිමේන්තුව තුළ මේ පනත් කෙටුම්පතට සම්බන්ධ විවාදය පවත්වන්නේ.

ඒ වාගේම මේ පනත් කෙටුම්පත හරහා අපි විශේෂයෙන් හඳුනා ගත් දෙයක් තමයි, 2022 වසරේ මේ පනත් කෙටුම්පත රැගෙන ආ අවස්ථාවේ සමාජය මේකට සූදානම්ව සිටියේ නැහැ කියන එක. විශේෂයෙන් අපේ රටට අවශ්‍ය මානව සහ යටිතල පහසුකම් ඒ මොහොතේ අපේ රටට තිබුණේ නැහැ. එම නිසා මේ පනත් කෙටුම්පත අදියර වශයෙන් බලාත්මක කිරීම අපේ අවශ්‍යතාවක් වුණා. විශේෂයෙන්ම දේශපාලන විචාරකයන්, පර්යේෂකයන්, ඒ වාගේ බොහෝ අය මෙය නැවත සමාලෝචනය කළ නිසා තමයි, අපි මේ වන විට අවශ්‍ය සංශෝධන සහිතව මේ පනත් කෙටුම්පත අරගෙන ඇවිත් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි මෙහිදී දත්ත ආරක්ෂණය කිරීම සඳහා අධිකාරියක් පිහිටුවීම සිද්ධ කරනවා. විශේෂයෙන්ම මේ අර්ථ නිරූපණය තුළ එම අධිකාරියට අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, පළාත් පාලන ආයතනයක්, පළාත් සභා කියන මේ සියලු දේවල් අන්තර්ගත වෙනවා. අපේ රටේ පෞද්ගලික අංශයත් එක්ක රාජ්‍ය අංශයත් අරගෙන බැලුවොත්, විශේෂයෙන්ම රාජ්‍ය අංශයට මේ විභවය නැහැ. ඒ නිසා තමයි මේ පනත අදියර වශයෙන් බලාත්මක කළ යුතුයි කියලා මෙම සංශෝධන පනත් කෙටුම්පතේ දක්වලා තිබෙන්නේ. මම මේක විශේෂයෙන් කිව්වේ අද උදේ ඉඳලා අපට මේ සංශෝධනය ගැන උගන්වන්න එන නිසා. ඒ වාගේම මේ පනත ක්‍රියාත්මක විය යුත්තේ කොහොමද කියලා උගන්වන්න එනවා. මුලින් කරන්න ඕනෑ මොකක්ද, පසුව කරන්න ඕනෑ මොකක්ද කියලා උගන්වන්න එනවා. හැබැයි, ඒ හැමෝටම කියන්න තිබෙන්නේ, ඔබතුමන්ලා මේ සංශෝධනය හරියට analyse කරලා, හරියට අධ්‍යයනය කරලා ආවා නම් තේරේවි, පනත් කෙටුම්පතේ තිබෙන දේ තමයි අදියර වශයෙන් බලාත්මක කරන්නේ කියලා. එහෙම නම්, මුලින් step එකක් අරගෙන, ඒක සමාලෝචනය කරලා, ඒ තුළින් තමයි දෙවැනි අදියරට යන්න තිබෙන්නේ. පළමු අදියර විධියට අපට තිබෙන්නේ, සමාජය තුළ මේ ගැන දැනුවත්භාවයක් ඇති කරන එක. අපේ රටේ පරම්පරා ගණනක මිනිස්සු ඉන්නවා. ඒ තුළ සිටින වැඩිහිටි පරම්පරාව ගත්තොත්, button phone එකක්වත් අල්ලලා නැති මිනිස්සු ඉන්නවා. ඒ වාගේම උපතින්ම smart ලෝකයක ඉපදුණු "Z" පරම්පරාව ඉන්නවා. ඒ පරම්පරා දෙකම සිටින රටක් විධියට සහ එම පරම්පරා දෙකම හසුරුවන ආණ්ඩුවක් විධියට අපට තිබෙන පළමු කාර්යය තමයි මේ දේවල් ගැන සමාජය දැනුවත් කරන එක සහ සමාජය තුළ කථිකාවක් හදන එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම මේක විශේෂයෙන් කිව්වේ අද උදේ ඉඳලාම මේ අය අපට lectures දෙන නිසා. හැබැයි, මේ වෙද්දී විපක්ෂයේ බොහෝ පිරිසක් මේ සභාව තුළ නැහැ. ඇයි ඒ? තමන්ගේ කොටස විතරක් කරන්න එනවා. ඇවිල්ලා කථාව කරලා යනවා. මෙතැන අවුලක් හදන්න හදනවා. මාධ්‍ය සංදර්ශනයක් කරන්න හදනවා. හැබැයි, ඒ කිසිවක් valid වෙන්නේ නැහැ. මොකද, ඔය උපදෙස් දෙන්න සිටින සමහර අයට සමහර විට වැලිකඩ ජම්පරේ ඇඳලා උපදෙස් දෙන්න වෙයි. අන්න එදාට ඒ හැම කෙනෙකුටම තේරෙයි, "ළිප ගිනි මොළවන තෙක් දිය සැලියේ, සැපයක් යැයි කකුළුව දිය කෙළියේ" කියලා. දේශපාලනික වශයෙන් ඒ හැම දෙයක්ම කියනවා.

මේ පනත් කෙටුම්පතට විශේෂයෙන්, අන්තර්ජාතික ප්‍රමිතියක් - international standard එකක් - ලබා ගැනීමේ හැකියාව අපට තිබෙනවා. මොකද, ආණ්ඩුවක් විධියට අපි අත්පත් කරගන්න බලාපොරොත්තු වෙන ඒ ආර්ථිකමය පුනරුදය වෙනුවෙන්, විදේශ විනිමය, විදේශ ආයෝජන, සංචාරක කර්මාන්තය අපි විශේෂයෙන්ම මේ මොහොතේදී අවධානය යොමු කරලා තිබෙන ක්ෂේත්‍ර වන නිසා. ඒ නිසා ඒ ක්ෂේත්‍රවලට අදාළව මහජන විශ්වාසය සහ ආයෝජකයන්ගේ විශ්වාසය දිනා ගැනීම සඳහාත් මේ පනත ඉතා වැදගත් පනතක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා තමයි අපි කාලීන අවශ්‍යතාවක් විධියට මේ පනත ප්‍රමිතියට ලක් කරලා, මේ සංශෝධන කරලා තිබෙන්නේ. මේක අවසානය නොවෙයි. මේක නැවත නැවත සමාලෝචනයට ලක් වෙමින් අදියර වශයෙන් බලාත්මක වෙන පනතක් නිසා අපි ආණ්ඩුවක් වශයෙන් ඒ හැම දෙයක්ම නිවැරදිව සිද්ධ කරමින් තිබෙනවා.

විශේෂයෙන්ම ජනතාවට කියන්න ඕනෑ දෙයක් තිබෙනවා. ජාතික ජන බලවේගය විධියට මේ වනවිට පළාත් පාලන ආයතනවල බලයත් සමඟ 4,000ක පමණ මන්ත්‍රීවරු කණ්ඩායමක් අපේ බිමේ යාන්ත්‍රණයේ ඉන්නවා. ඒ වාගේම ජනාධිපතිවරයා ප්‍රමුඛ මේ මන්ත්‍රීවරු 159ක ආණ්ඩුවත් එක්ක අපි මේ රට හදන වැඩේ පටන්ගෙන තිබෙන වෙලාවක, ඒ පටන් ගෙන තිබෙන විප්ලවය, පුනරුදය වෙනුවෙන් අවශ්‍ය නීති, අණපනත් සංශෝධනය කිරීමත් අපි සිද්ධ කරනවා. ඒකට හොඳම උදාහරණයක් තමයි අපි අද මේ සංශෝධනයට ලක් කරලා තිබෙන, මේ විවාදයට ගනිමින් තිබෙන 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත කියන්නේ. ඒ නිසා අපි සියලුදෙනාටම මේ මොහොතේ කරන්න තිබෙන දේ තමයි, ජනතාව දැනුවත් කිරීම. මොකද, අපි දන්නවා මොනවා හරි දෙයක් අලුතින් ගෙනෙනකොට ජනතාව අනිසි බියකට පත්වෙන්න පුළුවන් කියලා. අන්න එවන් අවස්ථාවකදී මේ පාර්ලිමේන්තුව අපි පාවිච්චි කළ යුතුයි, ඒ පිළිබඳ කතිකාවක් ඇති කරලා ජනතාව දැනුවත් කිරීම පිණිස. මම හිතනවා, රටක් විධියට අපට කරන්න තිබෙන පළමුවැනිම වැඩක් කියලා, මේ ජනතාව දැනුවත් කිරීම. ඒ වාගේම තමයි මේත් එක්ක තිබෙන sensitive දත්ත, විශේෂයෙන් සෞඛ්‍ය දත්ත සහ වෙනත් පෞද්ගලික දත්ත පිළිබඳව උපලේඛනවල පැහැදිලිව දක්වලා තිබෙන නිසා, ජනතාව කිසිදු විටෙක අනියත බියක් ඇති කරගත යුතු නැහැ. ඒ නිසා මම මේ විවාදය බලාගෙන සිටින, අහගෙන ඉන්න ජනතාවට කියන්නේ ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විධියට අපි ඔබේ ආරක්ෂාව දරන ආණ්ඩුව වෙනවා කියලා. ඔබ සියලුදෙනාටම අපි ඒ ආරක්ෂාවේ සහතිකය ලබා දෙන අතරේම මේ පනත් කෙටුම්පත තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ ඔබ සියලුදෙනාගේම අයිතිවාසිකම් තහවුරු කිරීමයි. ඒ නිසා නැවත වතාවක් කියන්නේ අර දාන මාධ්‍ය සන්දර්ශන වලට රැවටෙන්න එපා කියලායි. මොකද, ඔය හැම සන්දර්ශනයක්ම තව ටික කාලෙකින් ඉවරයි. අපි ජාතික ජන බලවේගය විධියට, ආණ්ඩුවක් විධියට, මේ පනතත් ඔබ සියලුදෙනාටම ආරක්ෂාව දෙන, අයිතිවාසිකම් තහවුරු කරන තවත් පනතක් බවට පත් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබතුමියට බොහොම ස්තුතියි, මට කාලය ලබා දීම වෙනුවෙන්.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[2.48 p.m.]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

Hon. Deputy Chairperson of Committees, the Personal Data Protection (Amendment) Bill is of national importance. It was an Act that was passed with the intention of modernizing the legal framework for privacy and data governance, aligning Sri Lanka with global best practices, particularly with the European Union's General Data Protection Regulation. It was a forward-looking step. This was brought in 2022. But, for three years, this Act has been dormant and the core enforcement mechanism, which is the Data Protection Authority, is yet to be established.

If you look at it, basically, personal data protection is crucial for individual privacy, as it safeguards against unauthorized access, misuse and disclosure of personal information. Currently, the question that we have to raise is whether that safeguard is available in Sri Lanka under the prevailing Act, whether the Amendment Bill that the NPP Government has brought in deals with these issues and whether individual privacy is being safeguarded. That is the crucial thing.

The United Nations Special Rapporteur on Privacy, in a 2024 report said, I quote:

> "Data subjects find themselves in a position of defencelessness owing to their limited knowledge of the use that third parties make of information concerning them, since in practice they are unable to follow up on or monitor this use. This has repercussions for their ability to control their data - the essence of the fundamental right to personal data protection."

මූලික අයිතිවාසිකම් පිළිබඳ ගැටලුවක් ඇති වනවා කියන එක එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයා කියනවා. Now, the issue is whether your Amendment deals with that part.

This year, in April, 2025, there was a data breach in Sri Lanka; there was a cyber-security breach reported in the Cargills Bank in Sri Lanka. Hackers got through to the system, there was a cyber-security breach and the hackers posted thousands of files - accounts of the Bank, personal data of accountholders, directors, the staff et cetera. That happened once in India also and the Indian High Court took action to ensure that data the was protected. But, in Sri Lanka, what happened? Cargills Bank reportedly informed about the unauthorized entry to their system through the Colombo Stock Exchange because they are listed in the stock market; they went through the Stock Exchange and reported it to them. But, no action was taken to inform the data subjects, that is, their customers, whose accounts were breached and their data became public knowledge and has been shared. The accountholders, the public, whose personal information was released were not informed of what had happened, what security arrangements they should take and what were the losses that would have been caused to them. So, does this Act take consideration of breaches like that? That is the key thing because it is our data, it will be mine, yours and that of all of us. It is our data that will be used there and in the future, there will be other governments, other people who will be looking at our data.

In 2022, when this statute was brought in to Parliament, I think under the Gotabaya Rajapaksa Government, there was a little attention paid because there was chaos in the country: there was the COVID-19 pandemic, there was bankruptcy and people were more worried about inflation, food and petroleum. So, they did not really look at this. Though there was a petition filed by the Young Journalists' Association, the Supreme Court, on a mere technical fault, did not take it up. This tension or confrontation between the State's right to information - we believe that the State has a right to information - and individual data privacy must be handled with sensitivity and care because we need to preserve the democratic individual civic rights of the people. Otherwise, there would be a dictator regime, which would come and misuse this data. Therefore, this Act has to address these things. That is why when this Act was brought in during the Gotabaya Rajapaksa Government, we got up and said that there had to be amendments. And, we believed that the NPP, which is supposed to be a people's Government, would be sensitive to the people's rights. But, I do not see that in the Amendment. That is the issue.

The shortcomings of the Personal Data Protection Act were described very well by a young researcher, Nida Admani, in the "DailyFT" yesterday. She says, I quote:

> "A critical shortcoming of the PDPA therefore is the lack of clarity and resultant inaccessibility by the average citizen to fully comprehend the rights and remedies available under the Act. The power imbalance heavily favours data controllers and processors; citizens are largely unaware of how their data is being used,...."

So, that leaves people vulnerable. Data usage can infringe on ethnicity, religion, race and on a lot of things and data can also be misused. In the European Union and in the United Kingdom, they classify special categories of data which could cause significant risk to individuals' fundamental rights. Madam, this Bill is of a national importance, but there are glaring deficiencies in the framework and the Government's Amendment does not get close to even addressing them. This is shocking to come from the JVP because when you all - when the Hon. President Anura Kumara Dissanayake, the Hon. Vijitha Herath and the Hon. (Dr.) Harini Amarasuriya - were seated in the Opposition, you vehemently condemned the original Bill saying that there should be certain amendments. Here is the opportunity now to bring those amendments, but you all have not incorporated those in it.

If you take the Personal Data Protection Act, to the Data Protection Authority, you would appoint technocrats, business leaders and industry representatives because they all deal with data and have to be special and ingenious with that knowledge. But, what about the appointment of a human rights lawyer, an independent person and a civil society specialist to this Authority? All those appointments would be political appointments. At that time, when we were in the Opposition, we made an

[ගරු කබීර් හෂීම් මහතා]

appeal, a request and a demand - we still take up that position - that the Data Protection Authority must be appointed through the Constitutional Council because that will ensure its independence. Otherwise, if you just make these political appointments, if the President is going to appoint this Authority, then, where is the safeguard for privacy of the citizens of this country? I cannot see how the JVP can change that position because that is not something we can understand.

Secondly, Madam, this Act grants broad exemptions to the public sector. The public sector or the public entities, in the name of national security, could use, misuse, collect or abuse data. For example, if it is the national health sector, if there is some very sensitive private information they have collected about people and if there is a breach and that data gets out, it could harm the dignity of a lot of people and affect their private lives, which is not fair. But, public entities can go without answering any of those questions. For example, the Ministry of Defence. Even in the Ministry of Defence, if there is a breach, then it must be subject to certain rules and regulations. If they make a breach, they should disclose that to the public so that the public is aware that something like that had happened. But, the Act does not address that.

So, if we are committed to protecting privacy, then the Government must be subject to the same standards that the private sector is subject to or if not, to a higher standard.

Next, the Act falls short in empowering certain categories. It does not grant a right to erasure, data portability or the right to challenge decisions made by algorithms. In today's AI-driven world, these omissions could be more than technical; they could become political. But, the Act that you have brought in does not address those issues.

On the other side, in this Act, there is no tribunal or a civil appeal system to enforce or have a mechanism to make sure that the citizens are safeguarded. The citizens must rely solely on the Data Protection Authority. The Data Protection Authority is not appointed by the Constitutional Council; it is not independent and it was appointed by the Government at that time. This Government might be in power this year; next year, there might be another government. Then, the other government that would come, which I think will happen, might use it in a different way. But, if you have an independent Authority, there would not be an issue whichever government comes into power. On a day the JVP sits in the Opposition, you all will talk another language. But, we believe in talking the same language whether we sit on the Opposition benches or Government benches because what is right is right; you cannot change that.

Therefore, Madam, we think that this Amendment has to encompass certain changes. We propose that there must be Parliamentary oversight. We believe that there must be an amendment to the exemption clause to include judicial or Parliamentary oversight on government access to personal data, to establish a Data Protection Tribunal to handle complaints and appeals, for the Data Protection Authority to be appointed through the Constitutional Council to ensure its independence and to include in its representation, legal and civil rights specialists.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
මම විනාඩියකින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

විශේෂයෙන්ම මේකේ තාක්ෂණික පැත්ත ගැන මම කථා කළා. මොකද, මේක තාක්ෂණික විෂයයක් නොවෙයි. අපේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් පිළිබඳව මීට වඩා කථා කරන්න ඕනෑ. එක රජයක් දවසක රජයේ ඉන්න පුළුවන්, ඊළඟ වතාවේ විපක්ෂයේ ඉන්න පුළුවන්. අපි විපක්ෂයට එනකොට, සමහර වෙලාවට අපේ අයිතිවාසිකම් උල්ලංඝනය වනකොට අපට තේරෙනවා, ඒක බරපතළ විධියට අපේ රටේ ජනතාවට බලපාන හැටි. ජනතා විමුක්ති පෙරමුණ දැනට අවුරුද්දකට කලින් විපක්ෂයේ වාඩිවෙලා හිටියා. 2022දී මේ පනත ඉදිරිපත් කරනකොට ජනතා විමුක්ති පෙරමුණ මේකට විරුද්ධව සංශෝධන කිහිපයක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම Data Protection Authority එක අනිවාර්යයෙන්ම ස්වාධීන විය යුතුයි, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හරහා පත් විය යුතුයි කියලා හරයෙන්ම මෙතැන තර්ක කළා. හැබැයි, එහෙම කියපු අය අද රජය විධියට මෙතැනට ඇවිල්ලා ඕක නොකරනවා නම් පුදුමයි. ඔබ බලයට එන්න කලින් ජනතාවට කියපු දේයි, බලයට ආවාට පස්සේ කරන ඒවා ගැනයි බලනකොට මේක සාධාරණ නැහැ. ඔබ මේ ස්ථාවරය ගන්නවා කියන්නේ බරපතළ විධියට අපේ රටේ ජනතාවගේ අයිතිවාසිකම්වලට හානි වෙනවා, බලපෑම් වෙනවාය කියන එක මම මේ ගරු සභාවට කියන්න ඕනෑ.

මට සමහර වෙලාවට හිතෙනවා, JVP එකේ හිටපු අය කලින් ආත්මයේ සර්කස්කාරයෝ ද දන්නේ නැහැ කියලා. මොකද ඔබතුමන්ලා හරි දක්ෂයි, බල්ටි ගහන්න, කරණම් ගහන්න. එක දවසක් එක පැත්තක. ඊළඟ දවසේ වෙන පැත්තකට බල්ටි ගහනවා. ඒ නිසා තමයි මම හිතුවේ මේකේ වැඩි පිරිසක් ඉන්නේ කලින් ආත්මයක සර්කස්කාරයෝ කියලා. ඔබ විපක්ෂය යෝජනා කරපු එම පුරවැසි අයිතිවාසිකම් වෙනුවෙන් දැනුත් පෙනී සිටිය යුතුයි. ඒ සංශෝධන ටික ගෙනෙන්න. අපිත් අත ඔසවලා ඒක සම්මත කරන්න අවශ්‍ය සහයෝගය ලබා දෙන්නම්.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නන්දන මිල්ලගල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.02]

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි ආණ්ඩුවක් - රජයක්- විධියට මේ රටේ ආර්ථිකය පැත්තෙන්, සමාජය පැත්තෙන් ඉදිරි පිම්මක් පනින්න සූදානම් වන මොහොතේ ඒ සඳහා නව පියවරක් ගන්න ඉදිරිපත් කළ ඉතා වැදගත් පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් අද දවසේ කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වනවා. විශේෂයෙන් මේ පනත් කෙටුම්පත 2022දී ඉදිරිපත් වූ එකක්. විපක්ෂය කථා කරන අවස්ථාවේදී විශේෂයෙන් කියැවුණා, මේ පනත් කෙටුම්පත පිළිබඳව හැදෑරීමක් හෝ අධ්‍යයනයක් නැතිව යම් යම් කරුණු ඉදිරිපත් වන බව. විශේෂයෙන් කියන්න ඕනෑ, 2022දී ඉදිරිපත් කළ මේ 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතෙහි ඇති පිටු සියල්ලම අපි පරිශීලනය කළ බව. ඒ වාගේම අපි ඉදිරිපත් කරන සංශෝධනවලට අදාළ වගන්ති 14ක් විතර අපි විශේෂයෙන් විමර්ශනය කළා. ඒවා විමර්ශනය කරලා ඒ මුල් පනතටයි මේ සංශෝධන ඉදිරිපත් කරන්නේ. ඒ නිසා ඒ සංශෝධනවලින් ඉදිරිපත් කරන කරුණු වාගේම ඒ පනත ඇතුළේ තිබෙන යම් යම් සාධනීය කාරණා පිළිබඳව අපට සාකච්ඡා කරන්න සිද්ධ වනවා.

අපි මේ උත්සාහ කරන්නේ නිකම් කොළ කෑලි ටිකකට සම්මුතියක් දෙන්න, එය අනුමත කරන්න නොවෙයි. මේ පනත හරහා මේ රටේ සජීවී සමාජය ඇතුළේ දැවැන්ත පරිවර්තනයක් කරන්න තමයි මේ උත්සාහ කරන්නේ. ඒ උත්සාහය අපට ආවට ගියාට කරන්න බැහැ. වගකීම් සහගත ආණ්ඩුවක් විධියට, දූර දක්නා ආණ්ඩුවක් විධියට අපට මේ හා සම්බන්ධයෙන් ඉතා ගැඹුරින් ප්‍රශස්ත ලෙස සලකා බලා කටයුතු කරන්න සිද්ධ වනවා. ඒ නිසා මේ පනතින් පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු වනවා. ඒ වාගේම ඒ සම්බන්ධයෙන් මීට පෙර කථා කළ සියලුදෙනාගේ අවධානය වැඩිපුර යොමු වුණා කියා මා හිතනවා.

ඒ වාගේම මේ පනතෙන් විශේෂ කාණ්ඩ දත්ත ආරක්ෂා කිරීම පිළිබඳවත් අවධානය යොමු වෙනවා. විශේෂයෙන් මේ සංවේදී දත්ත අතරට ජාතිය පිළිබඳ, වාර්ගිකත්වය පිළිබඳ, විවිධ දේශපාලන මත පිළිබඳ, ආගමික විශ්වාස පිළිබඳ, ලිංගික ජීවිතය සම්බන්ධයෙන්, සෞඛ්‍ය තොරතුරු සම්බන්ධයෙන්, වෘත්තීය සමිති දායකත්වය සම්බන්ධයෙන්, ජානමය හා ජෛවමිතික දත්ත සම්බන්ධයෙන් අවධානය යොමු වෙනවා. අපි රටක් විධියට ඩිජිටල් ආර්ථිකයකට මේ රට පරිවර්තනය කරන්න කටයුතු කරන මොහොතේ මෙන්න මේ සංවේදී දත්ත පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරන එක අපට වැදගත් වෙනවා. මීට පෙර අර විවිධ සංවාද, විසංවාද ඇති වන අවස්ථාවලදී ඔවුන් කථා කළ සමහර කරුණු, ඔවුන් විවේචනය කළ සමහර කරුණු මොනවාද කියා අපි දැක්කා. සමහර ජානමය හා ජෛවමිතික දත්ත චෞරයින් විධියට ඔවුන් එක යුගයක කටයුතු කළ බව අපට මතකයි. ඒ නිසා ඒ දත්ත චෞරයෝ තමයි අද මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අර විධියට විවිධ නිෂේධනාත්මක, ආපස්සට අදින ආකාරයේ විවේචන ඉදිරිපත් කරන්නේ. ඒකට කමක් නැහැ. ආණ්ඩු පක්ෂයේ හිටියත්, විපක්ෂයේ හිටියත් මා විශ්වාස කරනවා, මේක අපේ රට කියලා. අපි මේ මොහොතේ රටක් විධියට නැඟිටින්න උත්සාහ කරනවා. අපි වැටුණු බව මුළු ලෝකයම දැක්කා, මුළු ලෝකයම පිළිගත්තා, මුළු ලෝකයම ඒ නිසා අපේ රට බංකොලොත් රටක් ලෙස හංවඩු ගැහුවා.

එතකොට ඒවාට වගකියන්න ඕනෑ, මීට පෙර හිටපු පාලකයින්. සමහර වෙලාවට ඔවුන් අතින් කිසි දෙයක් සිද්ධ වුණේ නැති විධියට කථා කරන්න ඔවුන් උත්සාහ කළා. මීට පෙර ජානමය හා ජෛවමිතික දත්ත විශාල වශයෙන් නොතකා හරිමින්, බැහැර කරමින්, ඒ පිළිබඳ තොරතුරු සඟවමින් අපේ වනාන්තර පද්ධති, අපේ ජෛව පද්ධති විවිධාකාර විධියට බොහොම ලාභයට විකුණන්න ඔවුන් සැලසුම් සකස් කරලා තිබුණා. ඒ වාගේ කාල වකවානුවක් තමයි තිබුණේ. අපි ගත කරමින් ඉන්න මේ මොහොතේ අපේ ආණ්ඩුව ජගත් පරිසර දිනය වෙනුවෙන් විශේෂ වැඩසටහන් බොහෝ ප්‍රමාණයක් ලංකාව පුරා ක්‍රියාත්මක කරලා තිබෙනවා. පසුගිය කාලයේ බොහොම සැලසුම් සහගත විධියට විකුණා දමන්න, කිසිදු අගයක් නැතිව නොතකා හරින්න කටයුතු කරපු පරිසර පද්ධතියක් වන "නිල්ගල වනය" ඊයේ දිනයේ රක්ෂිතයක් වශයෙන් ප්‍රකාශයට පත් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම මේ කාරණයත් කියන්න ඕනෑ. "බන්දුල පෙතියා" කියන මත්ස්‍යයා දැනට මේ ලෝකයේම සිටින්නේ මා වගකියන කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලපිටමඩ ප්‍රදේශයේ විතරයි. මා හිතන විධියට ලංකාවේ විතරක් නොවෙයි, මුළු ලෝකයේම පළමු වතාවට තමයි එක ජීවියෙකු වෙනුවෙන් - එක් සත්වයෙකු වෙනුවෙන්, මාළුවෙකු වෙනුවෙන් - අභය භූමියක් විධියට කුඩා බිම් කඩක් වෙන් කළේ. අපි එහෙම කළේ ඇයි? එක පැත්තකින් අපි ඒ සත්වයා රැකගන්න ඕනෑ. ඒ වාගේම ජෛවමිතික දත්තවලට ඇතුළත් වන, අපේ ජෛව විවිධත්වය පිළිබඳව ලෝකයට කියාපාන්න, අපේ ඊළඟ සංවර්ධන පියවර තියන්න මෙය වැදගත් සාධකයක් වෙනවා. ඒ නිසා තමයි අපි මේ සත්වයා සංරක්ෂණය කරන්නේ.

අපි නිකම්ම නිකම් කොළ කෑලි ටිකක් විතරක් නොවෙයි පනතක් විධියට අද සම්මත කරන්නේ. ඒ කොළ කෑලි ඇතුළේ තිබෙන්නේ මේ රටේ මිනිසුන්ගේ ජීවිත පිළිබඳ ප්‍රශ්න; මේ රටේ ජෛව විවිධත්වය පිළිබඳ ප්‍රශ්න; මේ රටේ සමාජයේ තිබෙන ඉතා සංවේදී කාරණා පිළිබඳ ප්‍රශ්න යනාදියයි. ආණ්ඩුවක් විධියට මේ පනතට සංශෝධන ගෙනැල්ලා සම්මත කරගෙන අපේ ඩිජිටල් ආර්ථිකය ශක්තිමත් කරන්නයි අපි උත්සාහ කරන්නේ.

විශේෂයෙන් ව්‍යාපාර හෝ ආයතන දත්ත සමඟ වැඩ කරනකොට යුරෝපීය රටවල්, ලෝකයේ නව තාක්ෂණය උපයෝගී කරගෙන දියුණුව කරා යන රටවල් මෙවැනි අණ පනත් ක්‍රියාත්මක කරනවා. මීට පෙර කථා කළ අයගෙන් කියවුණා, ප්‍රධාන වශයෙන් GDPR මූලධර්ම මත පදනම්ව මේ පනත ගොඩනඟන්න උත්සාහ කර තිබෙනවා කියලා. ඒ මූලධර්ම මත පදනම් වෙලා ඒවා ලංකාවට සුවිශේෂ ලෙස හඳුනාගෙන ඉදිරියට පවත්වාගෙන යන්න කටයුතු කරන්න අපි මේ පනත හරහා සූදානම් වෙනවා. විශේෂයෙන් දත්ත හිමියන්ට මේ පනත මඟින් ලැබෙන අයිතිවාසිකම් අතර ප්‍රවේශ වීමේ අයිතිය - තමා පිළිබඳව තිබෙන දත්ත හඳුනා ගැනීමට ප්‍රවේශ වීමට තිබෙන අයිතිය -, ඒ දත්ත වැරදි නම් නිවැරදි කරගැනීමේ අයිතිය, ඒ දත්ත තවදුරටත් පද්ධතිය ඇතුළේ තිබීම අවශ්‍ය නොවේ නම් ඒවා මකා දැමීමට ඉල්ලා සිටීමේ අයිතිය, දත්ත භාවිතයට දෙන කැමැත්ත ආපසු ගැනීමට ඇති අයිතිය, සමහර හේතු මත ඇතැම් දත්ත සැකසීමට විරුද්ධ වීමේ අයිතිය තිබෙනවා. ඒ නිසා දත්ත හිමියන්ට ඩිජිටල් තාක්ෂණය ඇතුළේ තමන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කර ගනිමින් යම් යම් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමට මේ හරහා අවස්ථාව ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, සමස්තයක් විධියට ගත්තාම මේ පනත මඟින් එක් පසෙකින් පෞද්ගලිකත්වය ආරක්ෂා කර ගැනීම සඳහා අවස්ථාව ලැබෙනවා වාගේම අනෙක් පසින් නවෝත්පාදනය සඳහා පවත්නා අවකාශ පුළුල් කරන්න, පවත්නා අවකාශ වඩාත් ආරක්ෂාකාරී ලෙස වාගේම අනන්‍යතා සුරකමින් පුළුල් කිරීම සඳහා අවස්ථාව ලැබෙනවා. ඒ නිසා මේ

[ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා]

දෙපාර්ශ්වයම සමබර කරගෙන රටක් විධියට නැඟිටින්න තමයි මේ පනත ඉදිරිපත්වෙලා තිබෙන්නේ. ඒ නිසා GDPR එක සමඟ පැහෙමින් ලංකාව රටක් විධියට ඉදිරි දසවස, සියවස සඳහා ගමන් කරන්න උත්සාහ කරන මේ අපූරු ප්‍රවේශය පිළිබඳව යම් ඇගැයීමක් කරමින්, ශ්‍රී ලංකාවේ සුවිශේෂී සන්දර්භය තුළ මේ ක්‍රියාත්මක කරන්න උත්සාහ කරන ඩිජිටල් ආර්ථික ප්‍රතිපත්තිය තුළින් මේ රට වඩාත් දියුණු ස්ථානයකට ගෙන යෑම සඳහා මේ පනත උපයෝගී කර ගන්නට අපට හැකි වේවායි කියා ප්‍රාර්ථනා කරමින්, මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියටත් ස්තුති කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

මීළඟට, ගරු කන්දසාමි ප්‍රභූ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.13]

**ගරු කන්දසාමි ප්‍රභූ මහතා**
(மாண்புமிகு கந்தசாமி பிரபு)
(The Hon. Kanthasamy Prabu)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றையதினம் நடைபெறுகின்ற 2022ஆம் ஆண்டின் 9ஆம் இலக்க, தனிப்பட்ட தரவுப் பாதுகாப்பு திருத்தச் சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு முதலில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

2022ஆம் ஆண்டின் 9ஆம் இலக்க, தனிப்பட்ட தரவுப் பாதுகாப்புச் சட்டமானது இலங்கையின் சட்டத்துறை வரலாற்றில் ஒரு மைல்கல் ஆகும். இது தனிப்பட்ட தரவுப் பாதுகாப்புத் தொடர்பில் தெற்காசியாவில் கொண்டுவரப்பட்டுள்ள முதல் சட்டமாகும். மேலும், இது ஐரோப்பிய ஒன்றியத்தின் பொதுத் தரவுப் பாதுகாப்பு ஒழுங்குமுறையால் பெரிதும் ஈர்க்கப்பட்டுள்ளது. இதில் ஒத்த கொள்கைகள் மற்றும் தரநிலைகள் உள்ளன. 2019 யூன் மாதம் முதல் டிஜிட்டல் உட்கட்டமைப்பு அமைச்சின்கீழ் பல சுற்றுப் பங்குதாரர் ஆலோசனைகள் மற்றும் பொது மக்களின் கருத்துகள் பெறப்பட்டு, ஒரு வெளிப்படையான செயன்முறைமூலமே இந்தச் சட்டம் உருவாக்கப்பட்டது. 2022ஆம் ஆண்டின் 9ஆம் இலக்க, தனிப்பட்ட தரவுப் பாதுகாப்புச் சட்டமானது, 19 மார்ச் 2022 அன்று நடைமுறைக்கு வந்தது. இது பல்வேறு பரிவர்த்தனைகள் மற்றும் தகவல்தொடர்புகளில் ஈடுபட்டுள்ள தரவு விடயங்களின் தனிப்பட்ட தரவைப் பாதுகாக்க ஓர் ஒழுங்குமுறைக் கட்டமைப்பை நிறுவுகின்றது. அதேநேரத்தில், அதன் முன்னுரையில் கோடிட்டுக் காட்டப்பட்டுள்ளபடி டிஜிட்டல் பொருளாதாரத்தில் புதுமை மற்றும் மேம்பாட்டை எளிதாக்குவதற்கான ஒரு பொறிமுறையை இது வழங்குகின்றது.

இந்தச் சட்டம் தனிப்பட்ட தரவைச் செயலாக்குவதை ஒழுங்குபடுத்துகின்றது. அதாவது, 'தரவுப் பொருள்' என்று அழைக்கப்படும் ஒரு நபரை நேரடியாகவோ அல்லது மறைமுகமாகவோ அடையாளம் காணக்கூடிய எந்தவொரு தகவலும், பொதுச் சேவை அதிகாரிகள் மற்றும் தனியார் துறை நிறுவனங்கள் இரண்டாலும் சேவைகளை வழங்குவதில் ஏற்படக்கூடிய எந்தவொரு பாதகமான தாக்கத்திலிருந்தும் தரவு விடயங்களின் தனியுரிமையைப் பாதுகாப்பதை இந்தச் சட்டம் உள்ளடக்கியுள்ளது. இந்தச் சட்டத்தின்கீழ் குடிமக்கள் மற்றும் குடிமக்கள் அல்லாதவர்களின் தனிப்பட்ட தரவு சமமாகப் பாதுகாக்கப்படுகிறது. தனிப்பட்ட தரவுப் பாதுகாப்புச் சட்டமானது, 2025 மார்ச் 18க்குள் முழுமையாகச் செயற்படுத்தப்படுமென எதிர்பார்க்கப்பட்டது.

இருப்பினும், டிஜிட்டல் உத்திகளை ஏற்றுக்கொள்வதில் பொது மற்றும் தனியார் துறைகள் இரண்டையும் ஆதரிக்கும் எதிர்கால நிர்வாக அமைப்பைக் கொண்டிருப்பதன் முக்கியத்துவத்தை உணர்ந்து, தரவு விடயங்களின் அதாவது, குடிமக்கள் மற்றும் பிற நிறுவனங்களின் உரிமைகளை அர்த்தமுள்ள வகையில் பாதுகாக்கும் திறன்கொண்ட ஒரு முழுமையான ஒழுங்குமுறை அமைப்பை நிறுவுவதற்கு ஆதரவளிக்க வேண்டியதன் அவசியத்தைக் கருத்திற்கொண்டு, 2025 பெப்ருவரி 19ஆம் திகதியன்று அமைச்சரவையானது, டிஜிட்டல் பொருளாதார அமைச்சராக சனாதிபதியால் சமர்ப்பிக்கப்பட்ட ஒரு குறிப்பாணையை அங்கீகரித்தது. இது முழுமையாகச் செயற்படுத்தப்படுவதற்கு முன்பு சட்டத்தில் திருத்தங்கள் முன்மொழியப்படும். சட்டத்தின் அமுலாக்க விதிகளை முழுமையாகப் பின்பற்ற கூடுதல் காலம் தேவை என்று பொதுத்துறை உட்பட ஏனைய துறைகளும் வெளிப்படுத்தியுள்ளன. குறிப்பாக, அவர்களின் மனித மற்றும் தொழில்நுட்பத் திறன்களை வளர்த்துக்கொள்ள, சட்டத்தின் விதிகளை முழுமையாகப் பின்பற்றுவதற்குத் தம்மைத் தயார்ப்படுத்திக்கொள்ள இதனால் முன்மொழியப்படும் திருத்தங்கள் ஒரு வாய்ப்பை உருவாக்குகின்றன. தனியார் துறையைப் போலவே தொழில்நுட்பத் தேர்வுகளைச் செய்வதில் பொதுத்துறைக்கு அதிக நெகிழ்வுத் தன்மையை வழங்க இந்தச் சட்டத்தில் செயற்கை நுண்ணறிவு - artificial intelligence - அமைப்புகள் போன்றவற்றை ஏற்றுக்கொள்ளும் வகையில் பல பொது நிறுவனங்கள் திருத்தங்களை முன்மொழிந்துள்ளன.

இந்தச் சட்டம் மத்திய அரசின் அமைச்சுக்கள் மற்றும் திணைக்களங்கள், மாகாண சபைகள், உள்ளூராட்சி அமைப்புகள், மாவட்ட மற்றும் பிரதேச செயலகங்கள், கிராம அலுவலர் மட்டத்துக்கும் பொருந்தும் என்பதால், சட்டத்தில் முன்மொழியப்பட்ட திருத்தங்களை முழுமையாக இணைப்பதை உறுதிசெய்வதற்கும், அனைத்துப் பங்குதாரர்களும் முறையாகச் சீரமைக்கப்பட்டு நன்கு தயாராக இருப்பதை உறுதி செய்வதற்கும், அமுலாக்கத் தேதியைக் கூடுதல் காலத்துக்கு நீட்டிக்க வேண்டியதன் அவசியத்தை அரசாங்கம் அறிந்திருக்கிறது.

கடந்த காலப்பகுதியில் எமது நாட்டில் பல வகையிலும் தனிநபர்களின் தரவுகள் அடக்குமுறையின் அடிப்படையில் துஷ்பிரயோகங்களுக்கு உட்பட்டிருந்ததுடன், ஆட்சியாளர்களின் அதிகார வரம்புக்குள் கட்டுப்பட்டு தனிநபர் சுதந்திரம் மிக மோசமாகப் பாதிக்கப்பட்டிருந்ததன் ஊடாக இனங்களுக்கு இடையிலான முரண்பாடுகள் மற்றும் துன்புறுத்தல்கள் சமூக ஊடகங்கள் ஊடாகவும் போலியான முறையில் பரப்பப்பட்டன. அதனால் பல மோசமான நிகழ்வுகள் தற்பொழுது வரை தொடர்ந்துகொண்டு இருக்கின்றன. அவற்றைக் கட்டுப்படுத்தும் ஓர் ஏற்பாடாகவும், இதன்மூலம் சமூகங்களுக்கு இடையிலான போலியான பிரசாரங்களைக் கட்டுப்படுத்தக்கூடிய வகையிலும் குறித்த சட்டமூலத்தில் திருத்தங்களை மேற்கொள்ள நாம் எதிர்பார்த்துள்ளோம்.

தனிநபர் தரவுகள் போலியான முறையில் விமர்சனங்களுக்கு உட்படுவதைக் கட்டுப்படுத்தும் ஒரு சட்டமாகவும், இனங்களுக்கு இடையிலான நல்லுறவை அரசியல் இலாபங்களுக்காகப் போலியான தனிநபர் தகவல்களை வெளியிட்டுச் சீர்குலைத்து, நாட்டில் இனங்களுக்கும் மதங்களுக்கும் இடையில் குழப்பங்களை ஏற்படுத்தும் தனிநபர்களையும் குழுக்களையும் சட்ட ரீதியாகக் கட்டுப்படுத்தும் ஒரு வலுவான சட்டமாகவும் அமையக்கூடிய வகையில் குறித்த சட்டமூலத்தை திருத்தங்களுடன் நிறைவேற்றிக்கொள்ள எமது அரசாங்கம் நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்றது.

கடந்த காலங்களில் இடம்பெற்ற பாரிய அளவிலான மோசடிகள் மற்றும் அதிகார துஷ்பிரயோகங்களில் கூடுதலானவை உரிய தகவல்களைப் போலியான முறையில் பயன்படுத்தி அரசாங்க நிதி மற்றும் வளங்களைப் பாரியளவில் மோசடி செய்வதற்கும் அதிகார துஷ்பிரயோகங்களை மேற்கொள்வதற்கும் வழிவகுத்திருந்தது. அத்துடன், நாட்டு மக்களின் பல தரப்பட்ட பொருளாதார ரீதியான தனிநபர் கணிப்பீடுகள் மற்றும் தகவல்கள் உரிய முறையில் பேணப்படாமையின் விளைவுகளுக்கு அரசாங்க நிறுவனங்கள் மற்றும் அதனுடன் இணைந்து சேவையை வழங்கும் நிறுவனங்களின் நன்மதிப்பு மற்றும் செயற்றிறன் தொடர்பான விமர்சனங்களும் நம்பிக்கையீனங்களும் மிக மோசமான முறையில் விமர்சனங்களுக்கும் கண்டனங்களுக்கும் உட்பட்டிருந்தது. இந்நிலையை மாற்றியமைக்கும் ஒரு சட்டமாக குறித்த சட்டமூலத்தை திருத்தங்களுடன் நிறைவேற்றிக்கொள்ள நாம் எதிர்பார்த்துள்ளோம்.

போலியான தனிநபர் தகவல்கள் ஊடாக மோசடியான முறையில் மேற்கொள்ளப்படும் பிறப்பு மற்றும் விவாகப் பதிவுகள், தேசிய அடையாள அட்டை மற்றும் கடவுச்சீட்டு, காணி ஆவணப் பதிவுகள் போன்றவற்றைக் கட்டுப்படுத்துவதற்காகவும், தனிநபர் தரவுகளைப் போலியாக மாற்றம் செய்து, அதன்மூலம் மேற்கொள்ளப்பட்டுவரும் துஷ்பிரயோகங்களைக் கட்டுப்படுத்துவதற்காகவும், நாட்டின் அரசாங்க சேவையின் நன்மதிப்பை எதிர்காலத்தில் கட்டியெழுப்புவதற்குமான ஒரு சட்டமாக குறித்த சட்டமூலத்தைத் திருத்தங்களுடன் நிறைவேற்றிக்கொள்ள நாம் எதிர்பார்த்துள்ளோம்.

கடந்த காலங்களில் மத்திய கிழக்கு நாடுகளுக்கான வேலைவாய்ப்புக்காக தனிநபர் தரவுகளை மாற்றம்செய்து, போலியான ஆவணங்கள் தயாரிக்கப்பட்டன. அதன் ஊடாக ஆட்கடத்தல் மற்றும் ஆள்மாறாட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டன. அத்தகைய நடவடிக்கைகள் ஊடாக சிறுவர் தொழிலாளர்கள் உருவாக்கப்பட்டதோடு, சிறுவர் துஷ்பிரயோக நடவடிக்கைகளும் மேற்கொள்ளப்பட்டன. மேலும், மத்திய கிழக்கு நாடுகளில் எமது நாட்டுத் தொழிலாளர்கள் துன்புறுத்தல்களையும் எதிர்கொண்டு வருகின்றனர். இப்படியாக தனிநபர் தரவுகளை மோசடியாகப் பயன்படுத்தி அவர்கள் அரச துறைக்கு ஏற்படுத்திக் கொடுத்துள்ள அவப்பெயரை முடிவுறுத்திக்கொள்வதனையும், அதன்மூலம் அரசாங்கத் தகவல் தொடர்பாடல் மற்றும் தொழில்நுட்பத்துறையின் நன்மதிப்பை உயர்ந்த மட்டத்தில் பேணிக்கொள்வதனையும் நோக்காகக்கொண்டு குறித்த சட்டமூலத்தைத் திருத்தங்களுடன் நிறைவேற்றிக்கொள்ள நாம் எதிர்பார்த்துள்ளோம்.

இந்த தனிப்பட்ட தரவுப் பாதுகாப்பு (திருத்தம்) சட்டமூலமானது, தனிநபரின் சுதந்திரத்தைப் பாதிக்கக்கூடிய விதத்தில் அமையக்கூடாது என்பதற்காக அதில் திருத்தங்களை மேற்கொள்ளவேண்டி இருக்கின்றது. தகவல் என்பது தங்கம், வைரம் என்பவற்றைவிட மிகப் பெறுமதியானது. அரசாங்கம் என்ற ரீதியில் அதனைப் பாதுகாக்கவேண்டிய தேவை எங்களுக்கு இருக்கின்றது. அத்தோடு, இந்த நாட்டு மக்களின் குறிப்பாக தனிநபரின் சுதந்திரத்தைப் பாதிக்காத விதத்தில், இந்தச் சட்டமூலத்தை நிறைவேற்றி, நடைமுறைப்படுத்தவேண்டிய தேவையும் இருக்கின்றது. எமது நாட்டு மக்களின் தரவுகளை வெளிநாடுகளுக்குத் தாரைவார்ப்பதோ அல்லது அவற்றில் மாற்றம் செய்வதோ எமது நோக்கமல்ல. ஏனெனில், இணையத்தளத்தினூடாக தகவல்களைப் பரிமாற்றி பல விடயங்களைச் செய்ததன் ஊடாக கடந்த காலங்களில் பல மோசடிகள் இடம்பெற்றதை நாங்கள் அறிவோம். அதனைத் தடுப்பதற்கு இந்தச் சட்டமூலத்தை நிறைவேற்றி, சட்டத்தை நடைமுறைப்படுத்தவேண்டிய தேவை எங்களுக்கு இருக்கின்றது.

நாட்டின் டிஜிட்டல் மயமாக்கல் செயற்பாட்டுக்கு இந்தச் சட்டமூலம் மிகவும் ஆதரவாக அமையும் என்பதால், இதனை வெகுவிரைவாக நிறைவேற்றி, நடைமுறைப்படுத்தி, இந்த நாட்டை டிஜிட்டல் மயப்படுத்தப்பட்ட ஒரு நாடாக மாற்றுவது எங்களது தேவையாகவும் அவசியமாகவும் இருக்கின்றது. இந்த நாட்டை வளர்ச்சியடைந்த ஒரு நாடாக மாற்ற வேண்டுமாக இருந்தால், நிச்சயமாக தொழில்நுட்ப ரீதியாக நவீனமயப்படுத்த வேண்டியது அவசியமாகும். ஆகவே, மாண்புமிகு சனாதிபதி அவர்களின் கொள்கைப் பிரகடனத்தின் அடிப்படையில், இந்த நாட்டை டிஜிட்டல் மயப்படுத்திய ஒரு நாடாக மாற்றுவதற்கு இந்தச் சட்டமூலத்தை நிறைவேற்ற வேண்டுமெனக் கூறிக்கொண்டு, எனது உரையை நிறைவுசெய்கிறேன். நன்றி, வணக்கம்!

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதாரம் மற்றும் வெகுசன ஊடகப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health and Mass Media)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්,* ***ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 3.24]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2018දී දින 52ක කුමන්ත්‍රණකාරී ආණ්ඩුවෙන් පසු මේ රටේ තොරතුරු තාක්ෂණ අමාත්‍යවරයා වන්නට මට අවස්ථාව ලැබුණා. මම ඒ වෙලාවේ රජයේ සහ පෞද්ගලික අංශයේ විශිෂ්ටයන් සමඟ සාකච්ඡා කරලා, මම ඔවුන්ගෙන් විමසා සිටියා, වසරක කාලයක් පමණයි මට මේ ධුරයේ ඉන්න තිබෙන්නේ, දේශපාලන යථාර්ථය ගැන මට අවබෝධයක් තිබෙනවා, මේ කෙටි කාලය තුළ මේ රටේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් කළ යුතු දේවල් මොනවාද කියලා. එවිට ඒ ක්ෂේත්‍රයේ, විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන් මගෙන් ඉල්ලා සිටි කාරණය තමයි, අපේ රටට cyber security law එකක් නැහැ, ඒ වාගේම data protection law එකක් නැහැ, මේ දෙක ගැන අපි දීර්ඝ කාලයක් කථා කරනවා, අවම වශයෙන් කෙටුම්පත් කිරීමවත් ආරම්භ කරන්න බැරි වුණා, ඔබතුමාට හැකියාව තිබෙනවා නම් මේ සඳහා නායකත්වය දෙන්න කියන එක. මම දින කිහිපයක් ඇතුළත මේ පිළිබඳව පුහුණුව ලබපු නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිලධාරින්, මේ පිළිබඳව අධ්‍යයනය කරපු නීතිඥවරුන්, ඒ වාගේම පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන් සමඟ එකතු වෙලා 2019 ජනවාරි 04වැනි දා කමිටු දෙකක් පත් කළා. එක් කමිටුවක්, තොරතුරු ආරක්ෂණ පනත කෙටුම්පත් කිරීමට, අනික සයිබර් ආරක්ෂණ පනත කෙටුම්පත් කිරීමට. මාස 5ක් වාගේ කාලයක් ඇතුළත ඒ කටයුතු අවසන් කරන්න අපට පුළුවන්කම ලැබුණා. මක් නිසාද, වසර ගණනක් තිස්සේ අපේ රටේ රජයේ සහ පෞද්ගලික අංශයේ විශේෂඥයන් මේ ක්ෂේත්‍ර ගැන අධ්‍යයනය කර තිබුණා. යුරෝපීය ප්‍රමිතීන් වන GDPR ප්‍රමිතිය පිළිබඳව ඔවුන් හොඳින් දැන සිටියා, ඒවාට සම්බන්ධ වෙලා තිබුණා, ඒවා කෙටුම්පත් කිරීමටත් ඇතැම් අය සම්බන්ධ වෙලා තිබුණා. ඒ නිසා 2019 ජනාධිපතිවරණය වෙනකොට මේ පනත් දෙකම කෙටුම්පත් කර අවසන් කර, පරිවර්තනත් සිදු කරන්න අපට හැකියාව ලැබුණා.

නමුත්, අවාසනාවකට ජනාධිපතිවරයා වෙනස් වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මාත් එක්ක වැඩ කරපු විශේෂඥයින් ඒ ජනාධිපතිවරයා සමඟත් වැඩ කළා. නමුත්, මේ පනත් කෙටුම්පත් දෙක ඉදිරිපත් කිරීම අතිශයින් ප්‍රමාද වුණා. කෙසේ වෙතත්, වාසනාවකට 2022 අංක 9 දරන පනත හැටියට පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත ඉදිරිපත් කරන්න අපට පුළුවන්කම ලැබුණා. එම පනත වසර දෙකකට වැඩි කාලයක් භාවිත කිරීමෙන් පසුව ඇති වෙලා තිබෙන ප්‍රායෝගික ප්‍රශ්න ගැන සලකා බලා ඒ පනත යාවත්කාලීන කිරීමට ඉදිරිපත් කරන මේ පනත් කෙටුම්පත පිළිබඳ මම පළමුව ස්තුතිවන්ත වෙනවා, දෙවනුව සහාය දක්වනවා. නමුත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තේරුම් ගන්න බැහැ Cyber Security Bill එක පාර්ලිමේන්තුවට තවමත් ඉදිරිපත් නොවුණේ ඇයි කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා මේ සභාවේ සිටින නිසා මම එතුමාගෙන් ඒ ගැන දැනගන්න කැමැතියි. එතුමා මේ විෂය ගැන දන්නා කෙනෙක්. Cyber security කියන්නේ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් පමණක් නොවෙයි. අද ආර්ථික දියුණුව කෙරෙහි අපි වැඩි අවධානයක් යොමු කරනකොට; විශේෂයෙන්ම තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය මේ රටේ සංවර්ධනය උදෙසා ප්‍රධාන උපාය මාර්ගයක් විධියට භාවිත කරන්න පුළුවන් බවට පක්ෂ, පාට භේදයක් නැතිව කවුරුත් එකඟ වන අවස්ථාවක, මේ රටේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය උදෙසා, විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ ව්‍යාපාර දියුණුව උදෙසා, ආර්ථික සංවර්ධනය උදෙසා, ඒ වාගේම ආරක්ෂාව උදෙසා cyber security නීතිය අත්‍යවශ්‍යයි.

මා දන්නවා එය කෙටුම්පත් කිරීමේ කටයුතු සෑහෙන දුරට අවසන් වෙලා තිබෙන බව. නමුත් පුළුවන් තරම් ඉක්මනින් ඒ සයිබර් ආරක්ෂණ නීතිය ගෙන ආ යුතුයි. අපි එය කෙටුම්පත් කර අවසාන කළේ, 2019දී. අද ලෝකය වෙනස් වෙලා, ප්‍රමිති වෙනස් වෙලා. ඒ නිසා එම කෙටුම්පත් කිරීම යාවත්කාලීන කරලා එය ඉක්මනින්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි කියා මම බලාපොරොත්තු වෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඒ ගැන පිළිතුරක් ද බලාපොරොත්තු වෙනවා.

මට මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා. ඒ තමයි, මෙහි 13 වන වගන්තිය යටතේ සඳහන් දත්ත ආරක්ෂණ නිලධාරින් පත් කිරීමට අදාළ ක්ෂේත්‍රවලින් රාජ්‍ය සංස්ථා - public corporations - සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් ඇතුළත් නොවේ කියලා සඳහන් කර තිබීම. දත්ත ආරක්ෂණය පිළිබඳ මේ නීතිය යථාවත් කරන්න නම් රාජ්‍ය සංස්ථා තුළ දත්ත ආරක්ෂණය භාර නිලධාරියෙකු සිටීම අත්‍යවශ්‍යයි. ඒ වෙනුවෙන්ම නිලධාරියෙකු පත් කිරීම අසීරු වෙන්න පුළුවන්. ඒත් වෙනත් නිලධාරියෙකුට හෝ මේ වගකීම පැවරිය හැකියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව වෙලාව අවශ්‍ය ද?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඔව්, මට තව විනාඩි කීපයක් ලබා දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාට තවත් විනාඩි 2ක කාලයක් ලබා දෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉතාම හොඳින් දන්නවා, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත අප ඉදිරිපත් කළ වෙලාවේ ඒ තොරතුරු නිලධාරියා හැටියට රාජ්‍ය සේවයේ ඉන්න නිලධාරියෙකුම පත් කළ බව. ඔහු එය පූර්ණ කාලීනව කරන්න අවශ්‍ය වුණේ නැහැ. මෙම පනත් කෙටුම්පතේ 13වන

වගන්තිය යටතේ දත්ත ආරක්ෂණ නිලධාරියා පත් කිරීමේදී corporations, ඒ කියන්නේ රජයේ සංස්ථා සහ විශේෂයෙන්ම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් ඇතුළත් නොවුණේ ඇයි ද කියන එක මට තේරුම් ගන්න බැරි කාරණයක්. මොකද, අවසාන වශයෙන් මේ පනත් කෙටුම්පතේ අවධානය යොමු වන්නේ පෞද්ගලික අංශයටයි. ව්‍යාපාර කරන අය, රජයේ ඇතැම් සංස්ථා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය සමඟ සම්බන්ධයි. ඒ අය පෞද්ගලික අංශයත් සමඟ වැඩ කරනවා. ඇයි, ඔවුන්ව බැහැර කළේ කියන ප්‍රශ්නය මට තිබෙනවා. මොකද, දත්ත ආරක්ෂණ නිලධාරියා තමයි මෙම ප්‍රමිති ක්‍රියාත්මක කිරීම පිළිබඳව, මේ පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකිව යුතු වන්නේ.

ඩිජිටල් ආර්ථිකයක අවශ්‍යතාව අපි කවුරුත් පිළිගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක තවදුරටත් දේශපාලන ප්‍රශ්නයක් නොවෙයි. කලින් පැවැති 2022 අංක 9 දරන මුල් පනත අනුව ක්‍රියාත්මක වන දත්ත ආරක්ෂණ අධිකාරිය 2025.03.18වන දා වනකොට සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වීම අපේක්ෂා කළා. අපි දන්නවා, ගැටලු මතු වෙලා තිබෙන බව. පත් කිරීම් සමහරක් කර තිබුණත්, මෙය යථාවත් කරගෙන නියමිත දිනයේදී සම්පූර්ණ ක්‍රියාකාරිත්වයට ගන්න අසමත් වෙලා තිබෙනවා. එසේ ප්‍රමාද වුවත් මේ කරන සංශෝධන ඉතා වැදගත් ඒවායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය තුළ විශාල විප්ලවයක් ඇති කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා. අපේ රටේ අනාගතය සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය මතයි. අපේ රටේ ඇතැම් සීමා තිබෙනවා. හැබැයි, අපේ රටේ මානව සම්පත ඉතා වටිනා සම්පතක්. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය තුළ තිබෙන රැකියා අවස්ථා ගැන හිතලා මේ රටේ විශ්වවිද්‍යාල රාශියක් අද වන කොට තොරතුරු තාක්ෂණය, ඒ වාගේම artificial intelligence සහ ඒ හා බැඳුණු තවත් විෂයයන් පිළිබඳව සාමාන්‍ය උපාධි සහ විශේෂ උපාධි පාඨමාලා පවත්වා ගෙන යනවා. ඒ වාගේම, ඒවාට අදාළව උපාධි පාඨමාලා නොවන තවත් පාඨමාලාත් තිබෙනවා. නමුත් අද විශාල ප්‍රශ්නයක් ඇති වී තිබෙනවා. ඒ තමයි, උපාධිය ලබා විශ්වවිද්‍යාලවලින් පිට වන එම ශිෂ්‍යයන්ට ආයතනගත පුහුණුව ලබා ගැනීම සඳහා පවතින අවකාශය බෙහෙවින් සීමිත වීම. අද තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ internship එකක් ගන්නවා කියන එක අතිශය අමාරුයි. වරප්‍රසාද ලත්, ප්‍රධාන පෙළේ, ඉහළම මට්ටමේ විශ්වවිද්‍යාලවලින් පිට වන ශිෂ්‍යයන්ට හැරෙන්නට, ඈත දුෂ්කර ප්‍රදේශවල පිහිටි රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් තොරතුරු තාක්ෂණය පිළිබඳ පාඨමාලා හදාරා පිටවන ශිෂ්‍යයන්ට internship එකක් ලබා ගැනීම බෙහෙවින් දුෂ්කර වෙලා තිබෙනවා. මේ සඳහා රජය මැදිහත් වෙලා යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. ඒවා උපාධි පාඨමාලා තුළටම ඇතුළත් කරලා සිසුන් අනිවාර්යයෙන් ඒ සඳහා යොමු කරන්න අවශ්‍යයි.

මොකද, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය ප්‍රායෝගික විෂයයක්. තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ඉදිරියට යන්න නම් ඒ ප්‍රායෝගික දැනුම අත්‍යවශ්‍යයි. ඒ වාගේම, ඒ පිළිබඳ වෘත්තීය අවස්ථා ලබා ගන්න නම් internship කියන එක විශේෂයෙන්ම තොරතුරු තාක්ෂණයේ අත්‍යවශ්‍ය දෙයක්. තමන්ගේ වැඩ පිළිවෙළ තුළ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ internship ලබා දීම සඳහා යම් විශේෂිත වැඩ පිළිවෙළක් අමාත්‍යාංශය මෙහෙයවා ක්‍රියාත්මක කරන එක වැදගත්. මම දන්නවා අධ්‍යාපන, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට ඒක කරන්න වෙලාවක් නැහැ කියලා. මොකද, ඒ ගොල්ලන්ගේ අවධානය යොමු කළ යුතු තවත් බොහෝ දේ තිබෙනවා. නමුත්, තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයට මෙයට මැදිහත් විය හැකියි; ඒ සඳහා ඉලක්කගත වැඩ පිළිවෙළකට යොමු විය හැකියි. ඒ පිළිබඳවත් මතක් කරමින්, මට කාලය ලබා දීම ගැන ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සඳරුවන් මදරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.34]

**ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට සංශෝධන ඉදිරිපත් කරන මොහොතේ අදහස් කිහිපයක් දැක්වීමට මාහට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා අද වන විට ලෝකයේ බොහෝ රටවල් තාක්ෂණය අතින් විශාල ලෙස ඉදිරියට ගිහින් තිබෙන බව. එය චන්ද්‍රිකා තාක්ෂණය වෙන්න පුළුවන්; පරිගණක තාක්ෂණය වෙන්න පුළුවන්; AI තාක්ෂණය වෙන්න පුළුවන්; එහෙම නැත්නම් data science වෙන්නත් පුළුවන්. ලෝකයේ රටවල් බොහොමයක් ඒ හැම අංශයකින්ම විශාල පිම් පැනලා තිබෙනවා. ඒකේ අවසාන ප්‍රතිඵලය වශයෙන් බොහෝ රටවල් ඩිජිටල්කරණය වූ ආර්ථිකයකට හිමිකම් කියනවා. තවත් සමහර රටවල් තමන්ගේ ආර්ථිකය digitalize කරමින් ඉන්නවා. ඒක ඒ රටවල් අවුරුද්දකින්, දෙකකින් ලබාගත් ජයග්‍රහණයක් නොවෙයි.

දශක ගණනක් තිස්සේ ඒගොල්ලන්ගේ අධ්‍යාපන ප්‍රතිපත්ති, ලෝකයේ නව ප්‍රවණතා එක්ක කරපු අධ්‍යයනවල ප්‍රතිඵල යනාදි සියල්ලෙහි අවසන් ප්‍රතිඵලයක් වශයෙන් තමයි ඒ රටවල් ඒ ජයග්‍රහණ අත්පත් කරගෙන තිබෙන්නේ. එහෙම නම්, එය දශක ගණනක ක්‍රියාන්විතයක ප්‍රතිඵලයක්. හැබැයි, අපේ රටේ තත්ත්වය මොකක්ද? අපේ රටේ මෙච්චර කාලයක් හිටපු පාලකයෝ ලෝකයේ අනාගත ප්‍රවණතාවන් දිහා බලලා රටේ සංවර්ධනය ඒ දිශානතිවලට යොමු කළේ නැහැ. ඒ වාගේම අපි ලෝකයත් එක්ක තාක්ෂණයෙන් ඉස්සරහට ගියේ නැහැ. ලෝකය වේගයෙන් ඉස්සරහට යද්දී අපි ඒ පිටුපසින් ඉබි ගමනින් -හිමින් හිමින්- ගියා. අපි නව ප්‍රවණතාවන්ට ඉඩක් දුන්නේ නැහැ. ඒ වෙනුවට අප කළේ මොකක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, ලෝකයේ රටවල් ඉතා කුඩා මෘදුකාංග තුළට විශාල දත්ත ප්‍රමාණයක් එකතු කළ බව. අපේ රටේ පාලකයෝ දත්ත එකතු කරන්න විශාල ගොඩනැඟිලි හැදුවා; ඒ ගොඩනැඟිලිවලිනුත් හොරා කෑවා. ලෝකයේ රටවල් තමන්ගේ දරුවන්ට කුඩා කාලයේ ඉඳලාම පරිගණක තාක්ෂණය ඉගැන්නුවා; AI තාක්ෂණය ඉගැන්නුවා; නව ප්‍රවණතා පිළිබඳ දැනුමක් ලබා දුන්නා. හැබැයි, අපේ රටේ පාසල් පද්ධතියේ තිබෙන පාසල්වලින් අඩුම තරමින් සියයට 50කටවත් පරිගණක තාක්ෂණය ලබා දෙන්න අසමත් වුණා. අපි ඒ වෙනුවට කළේ මොකක්ද කියලා පසුගිය දශකය දෙස බැලුවාම පෙනෙනවා. විගඩම්කාරී බැලුම් අහසට යැව්වා; චන්ද්‍රිකා අහසට යැව්වා. 2012 වාගේ කාලයේ සිදු වූ සිද්ධියක් ගැන පුවත්පතක පළ වූ ලිපියකින් මම උපුටා දැක්වීමක් කරන්නම්. දවල් වරුවේ කථා කරපු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා කිව්වා, ආණ්ඩුවට අවශ්‍ය නම් උපදෙස් දෙන්නම් කියලා. 2012 නොවැම්බර් මස 18වන දා ඉරිදා "ලංකාදීප" පුවත්පතේ 14වන පිටුවෙන් තමයි මම මේ උපුටා ගැනීම කරන්නේ. එහි සිරස්තලය විධියට තිබෙන්නේ මෙයයි:

"මම ලංකාවේ පළමු අජටාකාශගාමියා වෙනවා"

[ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා]

ඒ යටතේ මෙසේ සඳහන් වනවා:

"ශ්‍රී ලංකාවෙන් බිහිවන පළමු අජටාකාශගාමියා වීමේ ඓතිහාසික වාර්තාව අභියස සිටින රෝහිත සමඟ මේ කතා බහ ඒ සම්බන්ධයෙනි."

එහි තවදුරටත් මෙසේ සඳහන් වනවා:

"නාමල් රාජපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකි. ඒ අනුව ඔහු තෝරාගෙන තිබෙන්නේ භූමියයි. යෝෂිත රාජපක්ෂ නාවික හමුදා නිලධාරියෙකි. ඒ අනුව ඔහු තෝරාගෙන තිබෙන්නේ මුහුදය. රෝහිත රාජපක්ෂ වැදගත් වන්නේ ඒ පසුබිමේය."

ඒ කියන්නේ, ඒගොල්ලෝ මුහුදයි ගොඩබිමයි දෙකම තෝරාගෙන තිබෙනවා.

තවදුරටත් එහි මෙසේ සඳහන් වනවා:

අයියලා දෙන්නා භූමියත්, මුහුදත් තෝරාගෙන තිබියදී රෝහිත තෝරාගෙන තිබෙන්නේ අහසය."

ඒ කියන්නේ, එක පවුලක් මුහුදයි, ගොඩබිමයි, අහසයි තුනම තෝරා ගෙන.

තවදුරටත් එහි මෙසේත් සඳහන් වනවා:

"22 වැනිදා තියෙන ගුවන් ගත කිරීම චීනයේ සමාගමක් හා ලංකාවේ සමාගමක් ඒකාබද්ධවයි කරන්නේ. ලංකාවේ සුප්‍රිම් සැට් කියන සමාගමට මේ චන්ද්‍රිකාවේ අයිතියෙන් බාගයට වැඩි ප්‍රමාණයක් තියෙනවා. අනෙක් සමාගම ඩයින් ග්‍රේට් වෝල් කියන සමාගමයි. මේකේ වැඩි හරියක අයිතිය තිබෙන්නේ අපිට නිසා චන්ද්‍රිකාවේ නම අයිති අපටයි. ඒ අනුව අපි 'සුප්‍රිම් සැට්-1' කියලා මේක නම් කරලා තියෙන්නේ. චීනයේ චී කැන් කියලා සයිට් එකක් තියෙනවා. ඒකේ තමයි මේක කරන්නේ."

මේ, අපේ රටේ පාලකයෝ කෝටි ගණන් මුදල් වියදම් කරපු විධිය. නිෂ්ඵල විධියට මුදල් වියදම් කළා.

අපේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ මේ මාස හය ඇතුළත රජයේ ප්‍රධාන ව්‍යාපෘති තුනක් අපි හඳුන්වා දුන්නා. ඔබ දන්නවා "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන ගැන. ඊළඟ එක, ග්‍රාමීය දුප්පත් බව තුරන් කිරීමේ වැඩසටහන. ඊළඟ වැඩසටහන තමයි, රට ඩිජිටල්කරණය කිරීමේ වැඩසටහන. ඒ කියන්නේ, ඒ ඩිජිටල්කරණය වෙනුවෙන් මේ රජයේ වැඩ පිළිවෙළෙහි සැලකිය යුතු කොටසක් වෙන් කරන්න මේ රජය ආරම්භයේ ඉඳලා මැදිහත් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම අපි අපේ දත්ත විවිධ අයුරින් එළියට ලබා දීම් කරනවා. ඒක රෝහල්ගත වීමකදී වෙන්න පුළුවන්. එහෙම නැත්නම් Facebook, WhatsApp, Instagram වාගේ app එකක් භාවිත කරන එකකදී වෙන්න පුළුවන්. එහෙම නැත්නම් රාජ්‍ය ආයතනයකට, පෞද්ගලික ආයතනයකට ගිහිල්ලා අප යම් කටයුත්තක් කරන අවස්ථාවකදී වෙන්නත් පුළුවන්. එහෙමත් නැත්නම්, අපි ලෝකයේ ආරක්ෂිත කලාපයකට ගියොත් විශේෂයෙන්ම biometric identification එක බලනවා. අපේ ඇස් බලනවා, අපේ fingerprint එක බලනවා. ඒ විධියට අපි අපේ දත්ත බොහෝ අයුරින් එළියට ලබා දීම කරනවා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ විධියට දත්ත එළියට ලබා දුන්නාම ඇති වෙලා තිබෙන ප්‍රශ්නය තමයි, මේ දත්තවල ආරක්ෂාව තහවුරු වෙයිද, නැද්ද කියන කාරණය.

විශේෂයෙන්ම දත්තවල ආරක්ෂාව සම්බන්ධයෙන් අපට ඕනෑ තරම් පුවත් අසන්නට ලැබිලා තිබෙනවා. එකක් තමයි, අපි ලබා දෙන දත්ත සමහර අය අනවසරයෙන් එළියට ලබා ගන්නා එක. ඔවුන් ඒ දත්ත ලබාගෙන පුද්ගලයන්ට තර්ජනය කරනවා. සමහර විට අපේ දත්ත වෙනත් පුද්ගලයන් මඟින් එළියට යවනවා. ඒ වාගේම පරිගණක පද්ධති අකර්මණ්‍ය කරනවා. ඒ විධියට පරිගණක පද්ධතියක් අකර්මණ්‍ය කරලා, නැවත ප්‍රකෘති තත්ත්වයට පත් කරන්න මුදල් ඉල්ලනවා. මෙවැනි තත්ත්වයක් නිසා ගොඩක් දුරට මේ සයිබර් අවකාශය පිළිබඳව අවිනිශ්චිතතාවක් තමයි බොහෝදෙනා අතර ඇති වී තිබෙන්නේ. මේ අවිනිශ්චිතතාව විසින්ම මේ අවකාශය සඳහා පුද්ගලයන් යොමුවීමේ විශාල අඩුවක් ඇති කර තිබෙනවා. ඒ නිසා මේ සයිබර් අවකාශයේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා යම් ආරක්ෂණ පද්ධතියක් මෙම පනත හරහා ගෙන ඒම ඉතාම වැදගත් කොට සලකනවා.

මේ ආරක්ෂාව ඇති කරන්න අපි ආණ්ඩුවක් විධියට, රටක් විධියට අසමත් වුණොත් එය අපේ රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වෙන්න පුළුවන්. ආරක්ෂාව සම්බන්ධ තොරතුරු එළියට ගියොත් අපට තර්ජනයක් වෙන්න පුළුවන්. අනෙක් පැත්තෙන්, අපේ රටේ ආර්ථික වර්ධනයට බාධාවක් වෙන්නත් පුළුවන්. අනෙක් පැත්තෙන්, මහජනයා අලුත් සංස්කෘතීන් එක්ක මුහුවීමේදී ඇතිවන බියත් බාධාවක් වෙන්න පුළුවන්. ඒ වාගේම, ඩිජිටල් තාක්ෂණය ගැන විශ්වාසය විශාල වශයෙන් පලුදුවීමක් වෙන්න පුළුවන්. ඒ නිසා මේ 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත ගෙන ඒම ඉතාම වැදගත් සන්ධිස්ථානයක්. දකුණු ආසියාවේ පළමුවරට මේ පනත ගෙන ඒම අපි සන්ධිස්ථානමය වශයෙන් ලැබූ ජයග්‍රහණයක්. ඒ වාගේම, මෙය යුරෝපීය සංගමයේ සාමාන්‍ය දත්ත ආරක්ෂණ නියාමනයන්ගේ ආභාසය ලබලාත් තිබෙනවා. ඒ නිසා අපි හිතනවා, මේ පනත තුළින් විවිධ ගනුදෙනු සහ සන්නිවේදනයේ නියැලී සිටින ඒ දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට අවශ්‍ය නියාමනයට ක්‍රමයක් හැදෙනවා කියලා. ඒ වාගේම, ඩිජිටල් ආර්ථිකයක් තුළ නවෝත්පාදනය හා සංවර්ධනය සඳහා පහසුකම් සැලසීමත් මේ පනත තුළින් සිද්ධ වෙනවා. ඒ වාගේම, මෙම පනත රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන යන දෙඅංශයෙන්ම සේවා සැපයීමට හැකි වන ආකාරයේ බලපෑමක් දත්ත දායකයන්ට ඇති කරනවා. මෙහි ඊටත් වඩා විශේෂ දෙයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දත්ත වැරදි භාවිතය සඳහා දඬුවම් ලබා දීමේ ක්‍රමයකුත් මේ පනත තුළ තිබෙනවා. ඒ නිසා අපි හිතනවා, අපේ රට ලෝකයත් එක්ක ඉදිරියට යනකොට ඒ අලුත් ප්‍රවණතාවලට මේ පනත බෙහෙවින් ඉවහල් වෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩිජිටල් ශ්‍රී ලංකාවක් කරා යන මාර්ගය පහසු මාර්ගයක් නොවෙයි කියලා අපි දන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)
මම තව තත්පර 30කින් කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඩිජිටල් ශ්‍රම බලකායක් ගොඩ නැගීම දුෂ්කරයි; AI තාක්ෂණය උපයෝගී කර ගැනීම දුෂ්කරයි. ඒ වාගේම, අපේ දරුවන් අතර පරිගණක තාක්ෂණය ප්‍රචලිත කිරීම ඉතාම දුෂ්කරයි. නමුත්, මේ අභියෝගය තමයි අපේ රජය බාරගෙන තිබෙන්නේ. මේ අභියෝග ජය අරගෙන ජන ජීවිතය වැඩිදියුණු කරන්න, මේ තිබෙන අසමානතා දුරු කරන්න, තිරසාර සංවර්ධනයක් ඇති කරන්න මේ පනත මේ රජයට ඉවහල් වෙයි කියලා අපි හිතනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අර්කම් ඉල්යාස් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.44]

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පවත්වන්නේ පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම පිළිබඳ විවාදයයි. මේ පනත් කෙටුම්පත අපේ රටට මීට අවුරුදු ගණනකට කලින් ඉදිරිපත් කරන්න තිබුණු දෙයක්. සංශෝධන කිහිපයක් සහිතව හෝ අපේ ආණ්ඩුවක් යටතේ ඉතාම කෙටි කාලයකදී මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අපට හැකිවීම පිළිබඳව අපි එක පැත්තකින් සතුටු වෙනවා. ඒ වාගේම අපි එක පැත්තකින් දුක් වෙනවා, මෙච්චර කාලයක් අපට මෙවැනි පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර ගන්න බැරි වුණේ ඇයි කියලා. ඇත්තටම බැලුවොත් අද ජාත්‍යන්තර ලෝකය AI තාක්ෂණයෙන්, තොරතුරු තාක්ෂණයෙන් අපට වඩා ගව් ගණනක් ඉදිරියෙන් ඉන්නකොට, අපි ඩිජිටල් යුගයකට, ඩිජිටල් පුනරුදයකට යන මේ පළමුවැනි අවස්ථාවේදී මේ පනත ඉතාම වැදගත් පනතක් ලෙස අපට හඳුන්වන්න පුළුවන්. මේ පනත හරහා පෞද්ගලික දත්තවල සුරක්ෂිතතාව තහවුරු වෙන ගමන්, අදාළ operatorsලාට, එහෙම නැත්නම් data process කරන ආයතනවලට නීත්‍යනුකූල රාමුවක් ඔස්සේ තමන්ගේ කටයුතු පහසුවෙන් කරගෙන යෑමට අදාළ යටිතල පහසුකම් ද අපට සපයන්න පුළුවන් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම දත්ත ආරක්ෂා කරන ගමන් අපට මේ ඩිජිටල් පුනරුදය අනිවාර්යයෙන්ම කර ගන්න වෙනවා. ඒක කර ගන්න නම් දත්ත ආරක්ෂා කර ගන්න ගමන්, ඊට අදාළ ආයතනවලට අවශ්‍ය සහයෝගයත් ලබා දෙන්න ඕනෑ.

මේ දෙකම හරියට balance කර ගනිමින් balanced මාර්ගයක යන්න තමයි අපි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම අපේ පෞද්ගලික දත්ත කියන්නේ අතිශයින්ම වැදගත්, සමහර වෙලාවට රහස් තොරතුරු. ඒවා වැරදි පුද්ගලයන් අතට යෑම ඉතාම අවදානම් කටයුත්තක්. එමඟින් සමහර වෙලාවට ජීවිත හානි, සමහර වෙලාවට සමාගම් බංකොලොත් වීම, සමහර රටවල ජාතික ආරක්ෂාව පාවා තර්ජනයට ලක් වෙලා තිබෙනවා. නමුත්, අප රට තුළ ඒ කටයුතු නියාමනය කිරීම සඳහා වූ ක්‍රමවත් නීති පද්ධතියක් මේ දක්වා ස්ථාපනය කරන්න අපට බැරි වෙලා තිබෙනවා. දියුණු රටවල මෙම විෂයය ඉතාම සංවේදීව සලකා බලනවා. විශේෂයෙන්ම පෞද්ගලිකත්වය වාගේ දේවල් ඉතාම විශේෂ, සංවේදී අවස්ථා විධියට ඒගොල්ලෝ සලකනවා. ඒ වාගේම අපි කවුරුත් පිළිගන්නවා, තොරතුරු තාක්ෂණය පැත්තෙන් ඇමෙරිකා එක්සත් ජනපදය වාගේ දියුණු රටවල් ඉතා ඉහළින්, ඉස්සරහින් ඉන්න බව. ඒ වාගේ රටවල් කොහොමද මේවාට සම්බන්ධ වෙලා තිබෙන්නේ කියලා මම උදාහරණ දෙක තුනක් මඟින් පෙන්වන්න කැමැතියි.

ගොඩක් අය දන්නවා Facebook-Cambridge Analytica data scandal එක ගැන. ඒක සමාජ මාධ්‍ය ආයතනයක්. 2018, 2019 කාලයේ තමන් ළඟ තිබුණු විවිධ පුද්ගලයන්ගේ දත්ත ප්‍රමාණයක් - මිලියන 7ක වාගේ දත්ත ප්‍රමාණයක්- තුන්වන පාර්ශ්වයේ ආයතනයකට ඒගොල්ලන්ගේ දැනුවත් වීමකින් තොරව ලබා දීලා තිබුණා. පෞද්ගලික දත්ත වෙනත් පාර්ශ්වයකට ලබා දීම විශාල වැරැද්දක් විධියට දක්වලා ඒ සම්බන්ධයෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ නීතිය පිළිබඳ ආයතන කටයුතු කරලා අන්තිමට එම ආයතනයට ඩොලර් බිලියන 5ක් දක්වා වන්දියක් ගෙවන්න සිදු වුණා. ඒ වාගේ පුළුල් විෂයයකට අදාළ පනත් කෙටුම්පතක් තමයි අද අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ. ලෝකයේ දියුණු යැයි සම්මත සියලු රටවල, එහෙම නැත්නම් බොහෝ රටවල practise කරන මෙම ප්‍රතිපත්තිය අපේ රටෙත් ක්‍රියාත්මක වීම ඉතා වැදගත් කියලා තමයි අපි හිතන්නේ.

මා කලින් කියපු Facebook-Cambridge Analytica data scandal එකෙන් වාගේම තවත් ප්‍රශ්නයක් වුණා. ඒකත් ඇමෙරිකා එක්සත් ජනපදයේමයි. 2017 වසරේ hackersලා කණ්ඩායමක් විසින් ඒ රටේ ඉන්න පුද්ගලයන් විශාල පිරිසකගේ නම්, social security numbers, උපන්දින, ලිපින, licence numbers වාගේ වැදගත් තොරතුරු කිහිපයක් සමාජ මාධ්‍යවලට, සයිබර් අවකාශයට මුදා හැරියා. අන්තිමට ඒකටත් නීතිමය කටයුතුවලින් පසුව වන්දි ලෙස ඩොලර් මිලියන 700 වාගේ මුදලක් ගෙවන්න සිදු වුණා. මේ වාගේ ගොඩක් උදාහරණ අපට පෙන්වන්න පුළුවන්. British Airwaysවල තිබුණු data breach එක තව උදාහරණයක්. එහිදී ලක්ෂ 5කට වඩා අධික තොරතුරු ප්‍රමාණයක් breach වුණා. අපි හිතනවා මෙන්න මෙවැනි අවදානම් තත්ත්වයක් සමහර වෙලාවට අපේ රටටත් ඇති වෙන්න පුළුවන් කියලා. ඒවාට අපේ පෙර සූදානමක් තිබෙන්න ඕනෑ. පෙර සූදානමක් වාගේම, ඒ වාගේ දේවල්වලට අදාළ නීති කටයුතු අපි හදාගෙන තිබෙන්න ඕනෑ. කාලීන අවශ්‍යතාව අනුව ඒ සඳහා විශේෂිත වූ පනතක් ඉතාම කෙටි කාලයකදී අපට ඉදිරිපත් කිරීමට හැකි වීම පිළිබඳව මා සතුටු වනවා.

මෙම පනත මඟින් අත්‍යවශ්‍යම කාරණා කිහිපයක් ඉටු කර ගන්න අපට අවස්ථාව ලැබිලා තිබෙනවා. 2022දී මුල් වරට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරනකොට කාල රාමු ඉදිරිපත් කළා, මෙන්න මේ දවසට මේ පනත බලාත්මක වනවා කියලා. ඇත්තෙන්ම එහෙම කාල රාමු ඉදිරිපත් කළාට, පනත සම්මත වීමෙන් පසුව කලින් හිටපු ආණ්ඩු අදාළ පහසුකම් රජයේ ආයතනවලට ලබා දීලා තිබුණේ නැහැ. Data processing කරන්න අදාළ ආයතනවලට තොරතුරු තාක්ෂණය පිළිබඳව දැනුමක් තිබෙන මානව සම්පත ලබා දෙන්න බැරි වෙලා තිබෙනවා. ඒකත් එක්කම මේ කටයුතු ගොඩක් දුරට අඩාළ වෙලා තිබුණා. මේ ප්‍රශ්නය අපි හඳුනා ගත්තා. විශේෂයෙන්ම රාජ්‍ය ආයතනවලට වාගේම සමහර පෞද්ගලික ආයතනවලට අප අනිවාර්යයෙන්ම යම් කාලයක් - grace period එකක් - ලබා දෙන්න ඕනෑ මේකට අනුගත වෙන්න. මෙම පනත් කෙටුම්පත හරහා කාලය ලබා දීමේ පහසුකම අපි ලබා දීලා තිබෙනවා.

විශේෂයෙන්ම ස්වයංක්‍රීය පද්ධතියක් හෝ AI තාක්ෂණය ඔස්සේ දැන් ගොඩක් වෙලාවට පුළුවන් සහ අපට පුළුවන් interviewsවලට, එහෙම නැත්නම් loan applications ඉදිරිපත් කරන්න සහ jobsවලට යන්න. ඒත් අපට කවදාකවත් චාන්ස් එකක් ලැබිලා තිබුණේ නැහැ ඒවායින් යම් කෙනෙකුට මොකක් හෝ අසාධාරණයක් සිදු වුණොත් කොහොමද ඒකට අභියෝග කරන්නේ කියලා. මෙම පනත හරහා අපට ඒ අවස්ථාව ලබා දීලා තිබෙනවා. අපි හිතනවා නම් AI තාක්ෂණය ඔස්සේ, එහෙම නැත්නම් ස්වයංක්‍රීය පද්ධතියක් ඔස්සේ මොකක් හෝ අසාධාරණයක් අපට සිද්ධ වුණා කියලා, ඒ වෙනුවෙන් අපට අභියෝග කිරීමේ අවස්ථාවත් මෙම පනත ඔස්සේ ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම රාජ්‍ය ආයතන සඳහා අනිවාර්යය කරලා තිබුණා Data Protection Officer කියන තනතුර. එය අනිවාර්යය කිරීමෙන් ඉවත් කරලා, ඒ නීති ලිහිල් කරලා තිබෙනවා. අපි හිතනවා, Data Protection Authority එක සතු බලතලත් පුළුල් කරලා, මෙය යාවත්කාලීන වෙමින් පවතින්න ඕනෑ පනතක් කියලා. මෙම පනත යටතේ අධිකාරිය සතු බලතලත් පුළුල් කරලා

[ගරු අර්කම් ඉල්යාස් මහතා]

දෙන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ලංකාව තුළ ඇති වෙන්න පුළුවන් මෙවැනි ආකාරයේ data breach එකක් සඳහා නෛතික ක්‍රියාමාර්ගවලට එළඹීමේ නීත්‍යානුකූල පසුබිම මේ හරහා අපට ලැබිලා තිබෙනවා. පසුගිය කාලවල අපි දැක්කා විශේෂයෙන් ලංකාවේ Cargills Bank එකේ data breach එකක්, ඒ වාගේම Department of Pensionsහි සමහර ප්‍රශ්න ඇති වුණ බව. ඒ වාගේ දේවල්වලට නීතිමය පැත්තෙන් ක්‍රියාත්මක වීම සඳහා වූ බලය මේ පනත හරහා අපට ලැබිලා තිබෙනවා.

ඒ අනුව මේ පනත හරහා කාලීන අවශ්‍යතාවක් අපට ලබා දී තිබෙනවා කියලා අපි හිතනවා. තවත් වැදගත්ම දෙයක් තමයි, අපට අපේ දත්ත හුවමාරු වූ ආකාරය පිළිබඳව දැනගැනීමේ අයිතිය තහවුරු කර තිබීම. විපක්ෂයේ සිටින සමහර මන්ත්‍රීවරුත් ඇහුවා, මේ පනත හරහා එය තහවුරු වෙලා තිබෙනවාද කියලා. අනිවාර්යයෙන් ඒක තහවුරු වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, අපි වැදගත් වැඩක, වැදගත් රාජකාරියක සිටින වෙලාවක, වාහනයක් drive කරමින් සිටින වෙලාවක, වැදගත් meeting එකක සිටින වෙලාවක මොකක් හෝ marketing company එකක්, එහෙම නැත්නම් ප්‍රවර්ධන ආයතනයක් මඟින් "ඔබට මෙන්න මේ පහසුකම අවශ්‍යද?" කියලා අහලා අපේ දුරකථනයට ඇමතුමක් ලබා දෙනවා, call එකක් දෙනවා. අපි දන්නේ නැහැ, කවුද අපේ number එක ඒ අයට දුන්නේ කියලා. හැබැයි මේ පනත හරහා අපට හොයාගන්න පුළුවන්, අපේ පෞද්ගලික දත්ත ලබා දුන්නේ කවුද කියලා. මේ තුළින් අපට අනිවාර්යයෙන්ම නෛතික පිළිගැනීමක්, නෛතික උරුමයක් ලැබෙනවා, අපේ data ටික ලබා දුන්නේ කවුද කියලා සොයාගන්න. ඒ වාගේම අපේ අනුදැනුමකින් තොරව මෙවැනි ආයතන සඳහා තොරතුරු ලබා දීමෙන් වළකින ලෙසට අදාළ ආයතනවලට දැනුම් දෙන්නත් අපට පුළුවන්. ඒ ආයතන නීත්‍යානුකූලව බැඳිලා ඉන්නවා, ඒ කටයුතු ඉෂ්ට කරන්න. එහෙම නැත්නම් දැන් අපි පිහිටුවන්න බලාපොරොත්තු වන දත්ත ආරක්ෂණ අධිකාරිය හරහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ගවලට යොමු වෙන්න පුළුවන්. මෙන්න මේ වාගේ ඉතා වැදගත් පනතක් අපේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරගැනීම සඳහා වූ පියවරක් ලෙස අනිවාර්යයෙන්ම අපට අවශ්‍යයි. විදේශ ආයෝජකයන් සහ සංචාරකයන් විශාල ප්‍රමාණයක් අපේ රටට පැමිණෙනවා. මේ පනත දේශීය සහ විදේශීය වශයෙන් ඕනෑම පුද්ගලයෙකුට බලපාන පරිදි අපි සකස් කර තිබෙන නිසා, මේ තුළින් ඒගොල්ලන්ගේ පෞද්ගලික දත්ත පවා ආරක්ෂා කරගන්න පුළුවන් වෙනවා.

මේ පනතත් එක්ක බද්ධ වෙලා යන තවත් පනතක් තමයි සයිබර් ආරක්ෂණ පනත. ඩිජිටල් ආර්ථිකය හරහා ලොකු වැඩ පිළිවෙළක් සකස් කිරීමේදී ඒ පනත් දෙක අපට ඕනෑ වෙනවා. මොකද, ඩිජිටල් ආර්ථිකය පැත්තෙන් අපි ලොකු ප්‍රවර්ධනයක් බලාපොරොත්තු වෙද්දී එහි ආරක්ෂාව අපට අනිවාර්යයෙන්ම වැදගත් වෙනවා. එය පවත්වාගෙන යන්න සයිබර් ආරක්ෂක වැඩ පිළිවෙළත්, පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතත් අපට අනිවාර්යයෙන්ම අවශ්‍ය වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අර්කම් ඉල්යාස් මහතා**
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි ජීවත් වෙන්නේ, තොරතුරු තාක්ෂණය හා කෘත්‍රිම බුද්ධිය රජයන යුගයක. මේ යුගයේදී තොරතුරු සහ දත්ත ගොඩක් වැදගත්. දත්තවලින් තොරව අද කාටවත් පවතින්න බැහැ. ජීවත් වෙන්න අමාරුයි. ඒ වාගේම දත්තවල පෞද්ගලිකත්වයත් අද වෙද්දී ගොඩක් වැදගත්. සමාජ මාධ්‍ය ප්‍රබල වෙද්දී පෞද්ගලිකත්වය සීමා වෙනවා. සමහර අයට සමාජ මාධ්‍ය කියන්නේ, public diary එකක් වාගේ දෙයක්. එතැනදී අපි කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් පෞද්ගලික දත්ත ලෝකයට නිරාවරණය වීමක් සිද්ධ වෙනවා. මෙන්න මේ සංවේදී දත්ත ආරක්ෂා කරන්න නිකම්ම නිකම් පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතක් තිබිලා හරියන්නේ නැහැ. ඒ සඳහා ශක්තිමත් පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතක් ඕනෑ වෙනවා. අන්න ඒක තමයි අද අපි ඉදිරිපත් කර තිබෙන්නේ. දත්ත හැසිරවීම වඩාත් ආරක්ෂිත සහ වගකීම් සහිතව කරන්න මේ සංශෝධන හරහා අපි බැඳිලා ඉන්නවා. ඉතින්, ඒක රාජ්‍ය අංශයට වාගේම පෞද්ගලික අංශයටත් ගොඩක් වැදගත් වෙනවා. විශේෂයෙන්ම ඩිජිටල් ආර්ථිකයට යද්දී පෞද්ගලික දත්ත අවභාවිත නොවීමට අනිවාර්යයෙන් අපි වගබලා ගන්න ඕනෑ. සයිබර් ආරක්ෂණ උපදේශකවරයෙක් පවසා තිබෙනවා, "Privacy is not just about hiding things or keeping them secret. It is about controlling who has access to them" කියලා. අපි කරන්නේ ජනතාවගේ පෞද්ගලික දත්ත, ආයතනික දත්ත විසිරී යාම වළක්වා ඒවා හරිහැටි, නිවැරදි පුද්ගලයන් අතට යැවීම සඳහා වූ වැඩ පිළිවෙළ ඉදිරිපත් කිරීමයි. Privacy is not just a right; it is a responsibility. ඉතින්, රජයක් වශයෙන් අපි අනිවාර්යයෙන්ම ඒ වගකීමෙන් බැඳිලා ඉන්නවා, ඒ සඳහා කටයුතු කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.54]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் நடைபெறுகின்ற தனிப்பட்ட தரவுப் பாதுகாப்பு (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு நான் மிகவும் சந்தோஷம் அடைகின்றேன். இந்தத் திருத்தச் சட்டமூலத்தில் பல்வேறுபட்ட அம்சங்கள் உள்வாங்கப்பட்டு இருக்கின்றன. கடந்த காலங்களில் இந்த நாட்டில் cyber security, AI, IT ஆகியன தொடர்பில் ஏற்பட்ட பிரச்சினைகளுக்குத் தீர்வு காண்பதில் இருந்த காலதாமதம் மிகப் பெரிய குறைபாடாக இருந்தது. அதனால் மக்கள் பல்வேறுபட்ட கஷ்டங்களை எதிர்நோக்கினார்கள். அவர்களுடைய தரவுகளைச் சில நிறுவனங்கள் களவாடி எடுத்துக் கொடுத்தன. அவற்றைத் தடுப்பதற்கு எந்தவொரு பாதுகாப்பு நடவடிக்கையும் இருக்கவில்லை. அதுமாத்திரமல்ல, அவ்வாறான குற்றங்களில் ஈடுபடுபவர்களுக்கு எதிராக எவ்வித நடவடிக்கைகளும் எடுக்கப்படவில்லை. பொலிசார் இவ்வாறான செயற்பாடுகளைத் தடுப்பதற்கான முயற்சிகளை மேற்கொண்டாலும், அவற்றை உரிய முறைப்படி சட்டரீதியாகச் செய்வதற்கான சந்தர்ப்பங்கள் இருக்கவில்லை.

வங்கிகளில் வைப்பிலிடப்பட்டிருந்த பணத்தை தொழில் நுட்பத்தைப் பயன்படுத்தி உரிமையாளருக்குத் தெரியாமல் களவாடிய பல்வேறு சம்பங்கள் இந்த நாட்டில் இடம்பெற்று இருக்கின்றன. அவை குறித்து பொலிஸ் நிலையத்தில் முறைப்பாடு செய்தாலும், உரிய முறையில் விசாரணைகள் இடம்பெறுவதில்லை. ஏனெனில், அவற்றை விசாரிப்பதற்கான சட்ட ஏற்பாடுகள் இல்லை. அதுமாத்திரமன்றி, இவ்வாறான குற்றச்செயல்களில் ஈடுபடுவோரைத் தண்டிப்பதற்கான சட்ட ஏற்பாடுகளும் இல்லை. மேலும், இவ்விடயம் தொடர்பான உபகரணங்களும் - equipment - பொலிஸ் நிலையங்களில் இல்லை. இதனால்தான் இவ்வாறன குற்றச்செயல்கள் அதிகரித்துச் சென்றன. இவ்வாறான குற்றச்செயல்களைக் கட்டுப்படுத்துவதற்காக அரசாங்கம் இந்தச் சபையில் திருத்தச் சட்டமூலமொன்றைச் சமர்ப்பித்திருக்கிறது. இதனை ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸினராகிய நாங்கள் பாராட்டுவதோடு, அரசாங்கத்துக்கு நன்றியையும் தெரிவித்துக் கொள்கின்றோம்.

மாண்புமிகு சனாதிபதி அவர்களின் தலைமையிலான இந்த அரசாங்கம் டிஜிட்டல் மயமாக்கல் - digitalization - என்ற புதிய திட்டத்துக்குக் கொடுக்கின்ற முக்கியத்துவம் உண்மையிலேயே பாராட்டப்படவேண்டிய ஒரு விடயமாகும். எமக்கு அண்மையில் இருக்கின்ற இந்தியா ஒவ்வொரு நிமிடமும் தொழில்நுட்ப ரீதியாக முன்னேறிக்கொண்டு செல்கின்றது. இவ்வாறான நிலையில், நாம் இன்னும் தொழில்நுட்பத் துறைக்குள் முழுமையாகச் செல்லவில்லை. குறிப்பாக, Digitalizationக்குத் தேவையான தரவுகளைச் - data - சேமிப்பதற்கான centres மற்றும் ஏனைய வசதிகள் இல்லை. ஆனால், நாங்கள் இலங்கை முழுவதும் mobile phones உட்பட பல்வேறு உபகரணங்களைப் பயன்படுத்துகின்றோம்; அதற்கான வழிவகைகளைச் செய்கின்றோம்.

இன்று இந்த விடயத்தில் உலகம் எவ்வாறு முன்னேறிக் கொண்டு போகின்றதோ, அதற்கேற்ப எங்களுடைய நாட்டையும் முன்னேற்றவேண்டிய தேவை எங்களுக்கு இருக்கின்றது. இலங்கையில் இந்தத் துறையில் சிறந்து விளங்குகின்ற ஒருவர்தான் Dr. Hans Wijayasuriya அவர்கள்! மாண்புமிகு சனாதிபதி அவர்கள் அவரை இந்த விடயத்துக்குப் பொறுப்பாக நியமித்திருக்கிறார். அவர் மிகச் சிறப்பான முறையில் இந்தத் துறையைக் கட்டியெழுப்புவதற்காகச் செயற்பட்டு வருகின்றார். அதற்காக அவர் முன்னெடுக்கின்ற பணிகளில் ஒன்றுதான் இந்தத் திருத்தச் சட்டம் தொடர்பான விடயம்! இந்த விடயத்தில் சில குறைபாடுகள் இருக்கின்றன. அதற்குத் தேவையான வழிவகைகள் செய்யப்பட வேண்டும். டிஜிட்டல் முறைமையைக் கொண்டுசெல்வதற்குத் தேவையான பாதுகாப்பு வசதிகள் அல்லது தரவுகளை - data - பாதுகாத்து வைப்பதற்கான centres எங்களுடைய நாட்டில் இல்லை. எனவே, அதற்குத் தேவையான வசதிகளைச் செய்ய வேண்டும்; பொறிமுறைகளைக் கையாள வேண்டும்.

Digital மயப்படுத்தும்போது, நாங்கள் தரவுகளை எவ்வாறு பாதுகாக்கப் போகின்றோம் என்பது முக்கியமானதோர் அம்சமாகும். அரச துறையாக இருக்கலாம் அல்லது தனியார் துறையாக இருக்கலாம். அவற்றை digitalize பண்ணும்போது தரவுகளைப் பாதுகாப்பதற்கான system ஒன்றை உருவாக் கவேண்டியது முக்கியமானது. Digitalize பண்ணிய பிறகு ஏற்படக்கூடிய பிரச்சினைகளுக்கு நாங்கள் அவசரமாகத் தீர்வுகளைக் காண வேண்டும். எனவே, அரசாங்கம் இது தொடர்பில் கவனம் செலுத்தி உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும்.

அடுத்து, AI, IT, cyber security என்பன தொடர்பில் நமது மக்களுக்கு அறிவூட்ட வேண்டும். அதற்கான வழிவகைகளை அரசாங்கம் ஏற்படுத்த வேண்டும். கிட்டத்தட்ட 10 வருடங் களுக்கு முன்னர் இருந்த IT syllabusஐத்தான் இன்றும் எமது நாட்டிலுள்ள பல்கலைக்கழகங்களில் கற்பிக்கின்றார்கள். அதனைக்கூட இன்னும் மாற்றவில்லை. இது மிகவும் கவலைக்குரிய விடயமாகும். இன்று உலகில் ஒவ்வொரு நிமிடமும் தொழில்நுட்பம் மாறிக்கொண்டு இருக்கின்றது. இந்தியா உட்பட பல நாடுகளில் தொழில்நுட்பமானது AI, cyber security என மிக வேகமாக வளர்ச்சியடைந்து செல்கின்றது. அந்த நாடுகள் தமது பல்கலைக்கழகங்களில் ஒவ்வொரு வருடமும் அது சார்ந்த syllabusஐ மாற்றுகின்றன. அதுமாத்திரமன்றி, அங்கு அவற்றுக்குத் தேவையான practical centres, practical training போன்றவற்றையும் ஏற்படுத்திக் கொடுக்கின்றார்கள்.

இன்று computers முழுமையாக மாற்றமடைந்து செல்கின்றன. ஆனால், இன்றும் எங்களுடைய பல்கலைக் கழகங்களில் மிகப் பழைமை வாய்ந்த computersதான் கற்றல் மற்றும் கற்பித்தல் செயற்பாடுகளுக்குப் பயன்படுத்தப் படுகின்றன. பல்கலைக்கழகங்களில் IT சார்ந்த பட்டப்படிப்பை முடித்துவிட்டு, பட்டதாரிகளாக வெளியே வருகின்றவர்களால் online workingஐக்கூட - freelance workஐக்கூட - செய்ய முடியாமல் இருக்கின்றது. அதுமாத்திரமன்றி, இன்று சாதாரணமாக இருக்கின்ற AI, cyber security போன்ற புதிய தொழில்நுட்பம் சார்ந்த எந்தவொரு வேலையையும் அவர்களால் செய்ய முடியாது.

SLASSCOM எனப்படுகின்ற Sri Lanka Association for Software Services Companiesஇன் அறிக்கையின்படி, இலங்கைக்கு ஒரு வருடத்துக்கு online work பண்ணுவதற்கான quotaஆக 8,000 வழங்கப்பட்டு இருக்கிறது. எனினும், இலங்கையில் அதற்குத் தகுதியானவர்கள் போதியளவு இல்லை. அதன் காரணமாக, இலங்கையில் இருந்து 600-700 பேர்தான் online jobs செய்வதற்காகத் தெரிவு செய்யப்படுகின்றார்கள். எமது நாட்டிலுள்ள இளைஞர், யுவதிகளுக்கு குறிப்பாக பல்கலைக்கழக மாணவர்களுக்கு AI, cyber security, online working சார்ந்த அறிவையும் பயிற்சிகளையும் கொடுத்து, அந்த 8,000 quotaஐயும் இலங்கை பெற்றுக்கொள்ள முடியுமாக இருந்தால், ஒரு வருடத்தில் கிட்டத்தட்ட 5 பில்லியன் அமெரிக்க டொலர்களை foreign exchangeஆகப் பெற முடியுமென மாண்புமிகு சனாதிபதி அவர்கள் பாராளுமன்றத்தில் உரையாற்றும்போது சொல்லியிருந்தார். அத்தகைய அரிய சந்தர்ப்பத்தை இன்று நாங்கள் இழந்துகொண்டு இருக்கின்றோம்.

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, இந்தச் சந்தர்ப்பத்தைப் பெறுவதற்குரிய நடவடிக்கைகளை நீங்கள் மேற்கொள்ள வேண்டும். அரசாங்கப் பல்கலைக்கழகங்களில் தொழில்நுட்ப அறிவை வழங்க முடியாது என்றால், நீங்கள் தனியார் பல்கலைக்கழகங்களுடன் பேச்சுவார்த்தை நடத்தி, பல்கலைக்கழகத்துக்குத் தெரிவுசெய்யப்படாத GCE (A/L) படித்த மாணவர்களுக்கு அந்தப் பல்கலைக்கழகங்கள் ஊடாக online workingக்குத் தேவையான தொழில்நுட்ப அறிவைப் புகட்ட வேண்டும். அது தொடர்பான நடவடிக்கைகளை அரசாங்கம் மேற்கொள்ள வேண்டும்.

Digitalization - டிஜிட்டல் மயமாக்கல் - என்பது ஒரு சிறிய subject அல்ல. It is not a simple subject. இது ஒரு பாரிய subject. எனவே, இதனை அரச நிருவாகம், நீதிமன்றம், பொலிஸ் நிலையம், பாடசாலை, பல்கலைக்கழகம் என எல்லாத் துறைகளிலும் மேற்கொள்வதற்குப் பொதுமக்கள், அரசாங்க உத்தியோகத்தர்கள் என எல்லோரும் ஒன்றுசேர்ந்து செயற்பட வேண்டும். அதாவது, இதனை நடைமுறைப் படுத்துவதற்கு எல்லோரும் ஒத்துழைக்க வேண்டும்; அதற்கான பங்களிப்பைச் செய்ய வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 4ක අමතර කාලයක් ලැබෙනවා.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

Thank you, Hon. Presiding Member.

டிஜிட்டல் மயமாக்கல் தொடர்பில் அராசங்கம் எடுத்துள்ள முயற்சி உண்மையிலேயே பாராட்டத்தக்கது. மாண்புமிகு சனாதிபதி அவர்கள்கூட, தனது அக்கிராசன உரையில் இது பற்றிக் குறிப்பிட்டிருந்தார். அதாவது, எங்களுடைய இளைஞர்களுக்கு உரிய முறைப்படி digitalization சம்பந்தமான அறிவையும் பயிற்சியையும் கொடுக்க முடியுமாக இருந்தால், ஒவ்வொரு வருடமும் 5 பில்லியன் அமெரிக்க டொலரை foreign exchangeஆகப் பெற முடியும் என்று அவர் சொல்லியிருந்தார். இது எமக்குக் கிடைக்கக்கூடிய மிகப் பெரியதொரு வாய்ப்பு! எங்களுடைய நாட்டுக்குக் கிடைக்கின்ற quotaவில் 700 பேர் மாத்திரம்தான் இங்கிருந்து recruit பண்ணப்படுகின்றார்கள். மிகுதிப் பேர் இந்தியாவிலிருந்து recruit பண்ணப்படுகின்றார்கள். கௌரவ பிரதி அமைச்சர் அவர்களே, எமக்குக் கிடைக்கின்ற மொத்த quotaஐயும் நாங்களே பயன்படுத்திக் கொள்ளவதற்கான முயற்சிகளை நீங்கள் எடுக்க வேண்டும். ඔබතුමාට මම කියන්න කැමැතියි, ඔබතුමා මේ ගැන පොඩ්ඩක් බලා වැඩ කරන්න ඕනෑය කියලා. சிலநேரம் இதனை அரசாங்க பல்கலைக்கழகங்களினூடாகச் செய்ய முடியாமல் போகலாம். ஏனெனில், எமக்கு அதற்கான முதலீடுகள் போதியளவு கிடையாது. எனவே, தனியார் பல்கலைக்கழகங்களினூடாக இதற்கான முயற்சிகளை எடுக்க வேண்டும்.

எங்களுடைய இளைஞர்களுக்கு onlineஇல் வேலைசெய்வதற்கு ஏற்ற விதத்தில், AI, cyber security போன்ற துறைசார்ந்த அறிவை modern syllabus ஊடாக வழங்குவதற்கு SLASSCOM எப்பொழுதும் ஆயத்தமாக இருக்கின்றது. அதனுடைய ஒத்துழைப்பைப் பெற்று, American, Australian, European, Japanese companiesஇல் onlineமூலம் work பண்ணுவதற்கு ஏற்ற வகையில், எங்களுடைய இளைஞர், யுவதிகளுக்குத் தொழில்நுட்ப ரீதியான அறிவையும் பயிற்சியையும் வழங்க முடியுமாக இருந்தால், foreign exchangeமூலம் நாட்டின் பொருளாதாரத்தில் மாத்திரமல்ல, சமூகத்திலும் இளைஞர்கள் மத்தியிலும் மிகப் பெரியதொரு மாற்றத்தை ஏற்படுத்த முடியும். ஏனெனில், இன்று சாதாரண தொழில்களில் ஈடுபடுவதற்கு இளைஞர், யுவதிகளுக்கு விருப்பம் குறைவு!

கடந்த காலங்களில் போன்று விவசாயம், வர்த்தகம் போன்ற துறைகளில் ஈடுபடுவதில் அவர்கள் ஆர்வம் காட்டுவதில்லை. இன்று அவர்களுக்கு இருக்கின்ற ஆர்வம் எல்லாம் தொழில்நுட்பம் சார்ந்த துறைகளில்தான். இன்று இந்தியா தொழில்நுட்பத்தில் வளர்ச்சியடைந்து எங்கேயோ சென்றுவிட்டது. ஒவ்வொரு நிமிடமும் அவர்களுடைய தொழில்நுட்பம் மாறிக்கொண்டுதான் இருக்கின்றது. ஆனால், நாங்கள் இன்னும் பழைய syllabus, system என்பவற்றைப் பயன்படுத்தித்தான் எங்களுடைய மாணவர்களுக்குக் கல்வி கற்பித்து வருகின்றோம். மூன்று அல்லது நான்கு வருடங்கள் பல்கலைக்கழகத்தில் கல்வி கற்று எடுக்கின்ற பட்டத்தைக்கொண்டு, இன்று அவர்களால் பாடசாலைகளில் வெறுமனே IT ஆசிரியர்களாக மாத்திரம்தான் செயற்பட முடியும். அதற்கு அப்பால் சென்று, இந்த நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்புவதற்கு அவர்களால் பங்களிப்புச் செய்ய முடியாது. இவ்வாறான ஒரு நிலையிலே இன்று ஒவ்வொரு IT graduateஉம் இருக்கிறார்கள். எனவே, எமது பல்கலைக்கழகங்களில் கற்பிக்கப்படுகின்ற IT syllabusஇல் மாற்றத்தைக் கொண்டுவர வேண்டும். அதற்குரிய நடவடிக்கைகளை கௌரவ பிரதி அமைச்சர் அவர்கள் கல்வி அமைச்சுடன் இணைந்து மேற்கொள்ள வேண்டும்.

பல்கலைக்கழகங்களிலுள்ள syllabusஐ மாற்றுவது தொடர்பில் UGCக்குக் கடிதம் அனுப்பினால், சில நேரங்களில் ஒரு வருடத்துக்குப் பிறகுதான் அதற்குப் பதில் அனுப்புவதாக நான் அறிகின்றேன். டிஜிட்டல் மயமாக்கல் செயற்பாட்டுக்குப் பூரண ஒத்துழைப்பை வழங்குவதற்கு நாங்கள் ஆயத்தமாக இருக்கின்றோம். அரசாங்கமும் மாண்புமிகு சனாதிபதி அவர்களும் digitalizationக்குக் கொடுக்கின்ற முக்கியத்துவம் உண்மையிலேயே பாராட்டத்தக்கது; வரவேற்கத்தக்கது. இந்தப் பணிகள் என்றோ செய்யப்பட்டிருக்க வேண்டும். டிஜிட்டல் மயமாக்கல் என்பது குறிப்பிட்டதொரு வட்டத் துக்குள் உட்படுகின்ற விஷயமல்ல. மாறாக, பரந்துபட்ட ஒரு விஷயம்! எனவே, நீங்கள் எல்லோருடைய ஒத்துழைப்பையும் பெற்று இத்துறையை வளப்படுத்த வேண்டுமெனவும் இத்துறையிலுள்ள குறைகளை நிவர்த்திப்பதற்கு நடவடிக்கை மேற்கொள்ள வேண்டுமெனவும் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.08]

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට සංශෝධන ගෙන එන වෙලාවේ, විශේෂයෙන්ම තාක්ෂණික කාරණා සම්බන්ධයෙන් ලොකු මැදිහත් වීමක් වෙන වෙලාවේ මම කැමැතියි, මේ සම්බන්ධයෙන් යම් කරුණු ප්‍රමාණයක් ඉදිරිපත් කරන්න.

මේ පනත් කෙටුම්පතේ මූලික අරමුණ වුණේ මොකක්ද? ඇත්තටම පෞද්ගලික දත්ත සැකසීම, නියාමනය සහ එහි ආරක්ෂාව පිළිබඳව අවධානය යොමු කරන්නත්, ඊට අදාළව දත්ත දායක කරනු ලබන පාර්ශ්වයේ අයිතිවාසිකම් හඳුනා ගන්නත්, ඒ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නත් ඒ සඳහා වෙච්ච අධිකාරියක් සහ ඊට අදාළ විධිවිධාන සැලැස්වීමත් තමයි මේ පනත් කෙටුම්පතේ මූලික අරමුණ වෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත සකස් කිරීමේදී ජාත්‍යන්තර මට්ටමේ best practices යොදාගෙන තිබෙනවා.

OECD Privacy Guidelines, APEC Privacy Framework, EU General Data Protection Regulation වාගේ කාරණා පදනම් කරගෙන තමයි මේ පනත ගොඩනැඟෙන්නේ. මේක ලංකාවේ දීර්ඝ කාලයක් තිස්සේ දත්ත ආරක්ෂණය හා පෞද්ගලිකත්වය පිළිබඳව තිබුණු gap එකක්, ඒ ක්ෂේත්‍රයේ තිබුණු හිඩසක් පුරවන්න 2022දී ගෙනාපු

පනතක්. දැන් අපි 2025දී "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" වෙනුවෙන් ජනතාව ලබා දීපු mandate එක මත පදනම් වෙලා ඒ පනත සංශෝධනය කරමින් ඉස්සරහට යන්න බලාපොරොත්තු වෙනවා.

උදාහරණයක් විධියට ගත්තොත් ජනාධිපතිවරයාට ඒ ජන වරම - mandate එක - ලැබුණේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 181වෙනි පිටුවේ, "ජාතික හා පෞද්ගලික දත්ත ආරක්ෂාව, සයිබර් ආරක්ෂාව සහ දත්ත පෞද්ගලිකත්වය" ආණ්ඩුවේ මූල ධර්මයක් විධියට පිළිගත් තත්ත්වයක් යටතේයි. ජන වරම ලැබුණේ ඒකට. මේ ආණ්ඩුව ඒ දිශාවටම ගමන් කරන්න තමයි දැන් මේ සංශෝධන ගෙනෙමින් තිබෙන්නේ. ඒ මත පදනම් වෙමින් තමයි මේ මූලික සංශෝධන ඉදිරිපත් කරමින් තිබෙන්නේ.

ඊළඟට, තර්කනයක් තිබෙනවා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළේ right to privacy, එහෙමත් නැත්නම් personal data protection කියන මූල ධර්මය ආවරණය වෙන්නේ නැහැයි කියලා; එවැනි තර්කනයක් ගොඩනඟලා තිබෙනවා. නමුත් ඇත්තටම ගත්තොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12වෙනි ව්‍යවස්ථාව, 13වෙනි ව්‍යවස්ථාව සහ 14.(1) (අ)හි භාෂණය හා ප්‍රකාශනය පිළිබඳව නිදහස කියන අයිතිවාසිකම් සහ right to privacy සෘජුව නොවුණත් වක්‍රාකාරයෙන් මෙයින් ආවරණය වෙනවා. ඒ අනුව මේ සංශෝධන සහිත පනත් කෙටුම්පතෙන් ඒකට සහාය දක්වනවා. ඒ අනුව සෘජුවම සඳහන් නොවුණා වුණත් මේ නීති පද්ධතිය ශක්තිමත් කිරීම හරහා පෞද්ගලික දත්ත ආරක්ෂණය කියන කාරණය ප්‍රකාශිතවම පනත හරහා තහවුරු වෙනවා. දැන් නව සංශෝධනය මඟින් බලාපොරොත්තු වෙන්නේ මොනවාද? ඒවා ක්‍රියාත්මකවීම සඳහා තවත් කාලයක් ලබා දීලා තිබෙනවා, මේ process එක smooth කර ගන්න. ඊළඟට ව්‍යවස්ථාපිත අයිතීන්ට තර්ජනයක් විය හැකි automated decision-making කියන කොටස පිළිබඳව නැවත අභියාචනා කිරීමේ පුළුල් අයිතිය මේ පනත තුළින් ලබා දීලා තිබෙනවා. දත්ත ආරක්ෂණ නිලධාරින් නම් කිරීම පහසු කරලා තිබෙනවා. විශේෂයෙන් cross-border data transfer කියන කටයුත්තේදී එය පුළුල් බවට පත් කරලා තිබෙනවා. කලින් පනතේ තිබුණු තාක්ෂණික බාධාව ඉවත් කරමින් ඒක ඉස්සරහට යමින් තිබෙනවා.

ඒ වාගේම binding guidelines නිකුත් කිරීම සඳහා අධිකාරිය ලබා දීලා තිබෙනවා, අපේ අවශ්‍යතාවට ගැළපෙන පරිදි. අවසාන විග්‍රහය නම් තමන් නොදැන තමන්ගේ තොරතුරු විකිණෙන එක නැවැත්වීමයි. ඒක තමයි මේ කටයුත්ත. තේරෙන සිංහලෙන් කිව්වොත්, තමන් නොදැන තමන්ගේ තොරතුරු විකිණෙන එක නැවැත්වීම. ඒක එක වාසියක්, මෙහි තිබෙන. ඒ වාගේම ජාත්‍යන්තර ව්‍යාපාර ක්ෂේත්‍රයට අපි එකතු වෙනකොට, ජාත්‍යන්තර වශයෙන් ගිවිසුම්ගත වෙනකොට, business platformsවලදී වඩාත් දියුණු රටවල -යුරෝපා රටවල, ඇමෙරිකාව වාගේ රටවල- ව්‍යාපාර සඳහා තිබෙන විශ්වසනීයත්වයත් මේ හරහා වඩාත් වර්ධනය වෙනවා, දත්ත පිළිබඳව තිබෙන විශ්වසනීයත්වය හේතුකොට ගෙන. ඒ නිසා ආණ්ඩුවක් විධියට, ආණ්ඩුවේ මූලික ප්‍රතිපත්තියක් වන digital transformation පැත්තට විශාල බරක් යොදලා, රුපියල් බිලියන 21.8ක පමණ විශාල මුදලක් අමාත්‍යාංශය හරහා වෙන් කරලා යන ගමනේදී මෙය විශාල ජයග්‍රහණයක් අත්පත් කර ගන්න අවශ්‍ය කරන මූලික පියවරක් විධියට හඳුන්වන්න පුළුවන්කම තිබෙනවා. ඒකට අදාළව GovPay වාගේ ඒවා එනකොට, geospatial data එකතු කරලා ඒවා feed කරනකොට මේ ආරක්ෂාව, මේ ශක්තිමත් නීති පද්ධතිය අපට අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීතුමන්ලා - විශේෂයෙන්ම හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා - දැනට සුළු මොහොතකට කලින් මේ සම්බන්ධයෙන් හොඳ constructive criticism එකක් ගෙනාවා. ඒ වාගේම කළ යුතු දේවල් සම්බන්ධයෙන් කථා කළා. ඒ විවේචනය වඩාත් positive පැත්තට තිබුණේ; හොඳ පැත්තට තිබුණේ. මන්ත්‍රීවරුන් විශාල ප්‍රමාණයක් එවැනි අදහස් දක්වනවා අපි දැක්කා. ශක්තිමත්, බලසම්පන්න, ස්ථාවර ආණ්ඩුවක් තිබෙන වෙලාවක ආණ්ඩුවේ ශක්තිය පමණක් නොවෙයි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේත් සද්භාවය සහිත වුවමනාව, උනන්දුව මේකට එකතු වෙනවා නම් මේ රාජ්‍යය ඉදිරියට අරගෙන යන්න පහසු වෙනවා. ඒක හොඳ ප්‍රවේශයක් බවට පත් වෙනවා. හැබැයි, දත්ත, පෞද්ගලික දත්ත ආරක්ෂාව ඔක්කෝම පටලවා ගත්ත සමහරු හිටියා; එහෙම අයත් හිටියා. ඒගොල්ලන් කථා කළේ වෙන වෙන කරුණු. මේ තාක්ෂණික කාරණා ගැන ගොඩක් දේවල් කථා කළේ නැහැ. මෙවැනි පනත් කෙටුම්පතක් පිළිබඳ විවාදයේදී පවා කථා කරපු කාරණා තුළ එතුමන්ලා මතු කරන්න උත්සාහ කළේ බොරු කියන සංස්කෘතිය. පව සමාජයට අත්හැර සමහරු දැන් කෙබර විපක්ෂය බවට පත් වෙලා ඉන්නවා. අන්න ඒවා තමයි සමහරු මතු කරන්න උත්සාහ කළේ. සමහරුන්ට ඉත්තෑවන්, මොනරු, වඳුරන්, රිළවු ගැන පුදුම දුකක් තිබුණේ. ඒ ගැන කිය-කියා මෙතැන අත්තෙන් අත්තට පැන පැන ඉන්නවා අපි දැක්කා. හැබැයි, අපි කවුරුත් තේරුම් ගන්න ඕනෑ කාරණය තමයි, දැන් ශක්තිමත් ආණ්ඩුවක් තිබෙන බව. මේ මඩ, අවලාද මොනවා නැතුවත් අපේ මේ ආණ්ඩුව රටත්, රටේ ජනතාවත් එක්ක එක පෙළට හිටගෙන මේ රට අරගෙන යමින් තිබෙන්නේ, වඩාත් සාධාරණ අනාගතයක්, පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් අපි වෙනුවෙන් නොවෙයි, අපේ අනාගත දරු පරපුර වෙනුවෙන් ගොඩනඟන්නයි. TV එකේ cut එකට, YouTube slot එකට යන විධියට මෙතැන කථා කළාම පුළුවන්කම තිබෙනවා, ප්‍රචාරක වාසියක් ගන්න; ප්‍රහාරයක් එල්ල කරන්න.

පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරනකොට ඉත්තෑවෝ ගැන කථා කළාම හෙඩිම ගහ ගන්න පුළුවන්, ඒකට හරියන්න. පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරනකොට රිළවු ගැන කථා කළාම රිළා මාතෘකාවක් දමා ගන්න පුළුවන්; ඒක කර ගන්න පුළුවන්. එහෙම කරලා, පොඩි views ටිකක් ගන්න පුළුවන්. හැබැයි, දැන් අපට ඕනෑ කරන්නේ හොඳ ශක්තිමත් ආණ්ඩුවක් වාගේම සද්භාවයෙන් කටයුතු කරන විපක්ෂයක්; රට ඉස්සරහට අරගෙන යන්න පුළුවන් ශක්තිමත් පාලන ක්‍රමයක් හදා ගන්න; රාජ්‍ය පාලනයක් හදා ගන්න. රාජ්‍යය දුර්වල කිරීම ආණ්ඩුව දුර්වල කිරීම කියලා, ආණ්ඩුව දුර්වල කිරීම රාජ්‍යය දුර්වල කිරීම බවට පත් කරන්න විපක්ෂය සූදානම් විය යුතු නැහැ. එවැනි සදාචාරාත්මක අයිතියක් නැහැ. රටේ මහ ජනතාවගේ වුවමනාව වෙනුවෙන් වාගේම ඔවුන්ට ඡන්දය දීපු අය වෙනුවෙන් නම් පෙනී ඉන්නේ, අපි කවුරුත් එකතු වෙලා මේ රට ගොඩනඟන කාර්යය කරන්න ඕනෑ.

අපි ඒ කාර්යය කරන්න ඕනෑ. මැතිවරණ කාලයට ඒ මැතිවරණ කටයුතු කරන්න පුළුවන්. ඕනෑ නම් ඒ කාලයට රිළවු ගැන කියන්න පුළුවන්. මේ පාර්ලිමේන්තුවේ තවදුරටත් රිළා නැටුම් නටන එකේ තේරුමක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා අපි කවුරුත් මැදිහත් වෙලා රට ගොඩනඟන කර්තව්‍යයට ශක්තිය දෙන්න ඕනෑ වාගේම ඒ කටයුත්ත වඩා වැඩියෙන් වර්ධනය කරන්න මැදිහත් වෙන්න වුවමනාව තිබෙනවා. ඒ නිසා මම අපේ රටේ ජනතාවටත්, අපේ රටේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ඉතාම ගෞරවයෙන් ආරාධනා කරනවා, දැන් තිබෙන්නේ රට ගොඩනඟන කාර්යය ඉෂ්ට කරන්න, අපි ඒ වෙනුවෙන් එකට වැඩ කරමු, මහන්සි වෙමු, කැප වෙමු, කැපවෙලා ලස්සන ජීවිතයක් ගත කරන්න පොහොසත් රටක් හදා ගනිමු කියලා. ඒ වෙනුවෙන් ඔබ සියලුදෙනාටම ශක්තිය ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.කේ.එම්. අස්ලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.18]

**ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා**
(மாண்புமிகு எம்.கே.எம். அஸ்லம்)
(The Hon. M.K.M. Aslam)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කාරණා කීපයක් සිංහල භාෂාවෙන් කියලා අද මගේ කථාවේ ඉතුරු කොටස දමිළ භාෂාවෙන් කරන්න මම කැමැතියි. විපක්ෂයේ මන්ත්‍රීවරු වෙන දා හැමදාම උදේට මෙතැනට ඇවිල්ලා කෑ ගහනවා, නටනවා, voice-cuts දෙනවා. නමුත්, අද උදේ අපට ඒ කට්ටිය දකින්න ලැබුණේ නැහැ. ඒ මොකද දන්නේ නැහැ. සමහර විට යාළුවෝ දෙදෙනෙකුට ජම්පර අඳින්න සිදු වුණු නිසා ඒකට භය වෙලාද කියන්න මම දන්නේ නැහැ. ඉස්සරහට තව හොඳ හොඳ දේවල් බලා ගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මම අද දවසේ මාතෘකාවට එන්නම්. පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමේ විවාදය තමයි අද තිබෙන්නේ. මට මතකයි, 2022 වර්ෂයේ මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගේනකොට, එදා විපක්ෂයේ මන්ත්‍රීවරියක් වශයෙන් කටයුතු කළ, අද අපේ ගරු අග්‍රාමාත්‍ය හරිනි සහෝදරිය ඉතාම කාලෝචිත_සංශෝධන ඉදිරිපත් කළා. මගේ මතකය හරි නම් ගරු නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත් ඒ සම්බන්ධයෙන් ප්‍රශංසා කරලා තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදයට එක් වුණු විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් ඇහුවා, මේ පනත් කෙටුම්පත සම්බන්ධ විවාදයේදී අපි කවුරුවත් කොතැනකදීවත් ජනතාවට හෝ රටට ලැබෙන ප්‍රතිලාභ මොනවාද කියලා සඳහන් කළේ නැහැ කියලා. ලාභය, පාඩුව ගණනය කරන්න විපක්ෂයේ මන්ත්‍රීවරු තව ටිකක් දියුණු වෙන්න ඕනෑ කියලා මම හිතනවා. පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත යටතේ ලැබුණු විශාල ජයග්‍රහණ තිබෙනවා. අපි සමහර තැන්වලදී දැකලා තිබෙනවා, ජීවිත පවා අහිමි කරගෙන තිබෙනවා. පෞද්ගලික දත්ත ආරක්ෂා නොවීම හේතුවෙන් suicide කරගෙනත් තිබෙනවා. ආර්ථික වශයෙන් ගත්තොත්, අපේ රටට tourism පැත්තෙන් විශාල ජයග්‍රහණයක් ලබා ගන්න පුළුවන්. ලෝකය ඉදිරියේ අපේ රට දියුණු රටක් හැටියට පරිවර්තනය වෙන්න නම්, මේ වාගේ දියුණු පනත් සංශෝධනය වෙන්න ඕනෑ. එම නිසා අපට මේ පිළිබඳව බොහෝ දේවල් කථා කරන්න පුළුවන්. ඒ නිසා මම හිතන විධියට ඒ මන්ත්‍රීවරු තව දියුණු වෙන්න ඕනෑ. ආර්ථික ප්‍රතිලාභ අපට සෑම විටම සෘජුවම ලැබෙන්නේ නැහැ. හැබැයි, මේ පනත සම්මත කිරීම තුළින් ඒ සියලු අංශවලින් මේ රටටත්, ජනතාවටත් අනිවාර්යයෙන්ම ලාභ ලබා ගන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2020ஆம் ஆண்டு இந்தியாவில் TikTok உட்பட சில apps தடை செய்யப்பட்டன. ஏனென்றால், அவை தேசியப் பாதுகாப்புக்கு அச்சுறுத்தலாக இருந்தன. நிறைய நாடுகள் இது சம்பந்தமாக விழிப்புணர்வுடன் செயற்பட்டதைக் காணக் கூடியதாக இருந்தது. நவீன தொழில்நுட்ப வளர்ச்சியால் ஆபத்தான அல்லது நாட்டுக்குக் கேடு விளைவிக்கக்கூடிய நிறையச் சம்பவங்கள் இன்று உலகில் இடம்பெறுவதைக் காணக்கூடியதாக உள்ளது. எனவே, எமது நாட்டில் டிஜிட்டல் மயமாக்கலைச் செய்யும்போது மிகக் கவனமாக இருக்க வேண்டும். இது தொடர்பில் பொருத்தமான சட்டங்கள் இயற்றப்படுவது, நாட்டினதும் தனி நபர்களினதும் பொருளாதாரப் பாதுகாப்பை உறுதிப்படுத்துவதுடன், நாட்டையும் மக்களையும் சமூகச் சீரழிவுகளிலிருந்தும் பாதுகாக்க வழிவகுக்கும்.

தனிப்பட்ட தரவுப் பாதுகாப்புச் சட்டத்திலுள்ள முக்கியமானதோர் அம்சமாக தரவுப் பாதுகாப்பு அதிகாரசபை அமைந்துள்ளது. அதாவது, இந்தச் சட்டத்தின்மூலம் நிறுவப்படும் மிக முக்கியமானதோர் அமைப்பாக தரவுப் பாதுகாப்பு அதிகாரசபை காணப்படுகின்றது. ஏற்கெனவே, இந்தச் சட்டம் இந்தப் பாராளுமன்றத்தால் இயற்றப் பட்டிருந்தாலும், இந்த நாட்டு மக்களுடைய தரவுகளைப் பாதுகாக்கக்கூடிய வகையில் அதிகாரசபையின் செயற் பாட்டை ஒழுங்கமைக்க முடியாமல் போனது ஒரு துர்ப்பாக்கிய நிலைமை ஆகும்.

இந்த அதிகாரசபையின் குறிக்கோள்களை நான் இங்கு ஞாபகமூட்டுகின்றேன். முதலாவது, இந்தச் சட்டத்தின் ஏற்பாடுகளுக்கு அமைய தனிப்பட்ட தரவுகளின் செயன் முறைப்படுத்தலை ஒழுங்குபடுத்துதல். இரண்டாவது, பகிரங்க மற்றும் தனியார் துறையில் நடைமுறைகள் மற்றும் சேவைகளின் டிஜிட்டல் மயமாக்கலில் இருந்து எழும் எந்தவொரு பாதகமான தாக்கத்திலிருந்தும் தரவுடன் தொடர்புபட்டோரின் பிரத்தியேகத் தன்மையைப் பாதுகாத்தல். மூன்றாவது, டிஜிட்டல் கொடுக்கல்வாங்கல்கள் மற்றும் தொடர்பாடல்களில் ஈடுபட்டுள்ள தரவுடன் தொடர்புபட் டோரின் தனிப்பட்ட தரவுகளின் பாதுகாப்பை உறுதி செய்வதற்கான பொறிமுறைகளுக்கு ஏற்பாடு செய்தல். நான்காவது, டிஜிட்டல் பொருளாதாரத்தில் வளர்ச்சி மற்றும் புத்தாக்கத்துக்கு வசதியளிப்பதற்காக இச்சட்டத்தின் ஏற்பாடுகளுடன் ஒழுங்குறுத்துகை இணக்கப்பாட்டை உறுதி செய்தல். அந்த வகையில், இவ்விடயம் தொடர்பில் ஓர் அநியாயம் நடக்கும்போது அதற்கெதிராக நீதிமன்றத்தை நாடுவதற்கான வாய்ப்பு இந்தச் சட்டத்தின்மூலம் எமக்குக் கிடைக்கின்றது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாங்கள் இவ்வாறான நிகழ்வுகளை நாட்டினுடைய வளர்ச்சியின் indicationஆகத்தான் பார்க்க வேண்டும்.

இன்று ஒரு பக்கம் நாட்டைச் சரிசெய்வதற்காக முன்னேற்றகரமான சட்டங்கள் இயற்றப்படுகின்றன. இன்னொரு பக்கம் கள்வர்கள் சிறையில் அடைக்கப் படுகின்றார்கள். இந்தச் சந்தர்ப்பத்தில் நாங்கள் இன்னொரு மிக முக்கியமான விடயத்தைச் சொல்ல வேண்டும். அதாவது, இன்று எமது நாடு வளம் பெறக்கூடிய ஒரு சூழலை அடைந்துள்ளதை நாங்கள் காண முடிகின்ற அதேநேரம், எமது நாட்டில் இவ்வளவு காலமும் இனவாத அரசியலில் ஈடுபட்ட அரசியல் கட்சிகளினதும் அரசியல் தலைமைகளினதும் எதிர்காலம் கேள்விக்குறியாக மாறியுள்ளதையும் காண முடிகின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் இங்கு இன்னொரு விடயத்தையும் நினைவுபடுத்த விரும்புகின்றேன். அதாவது, 2014ஆம் ஆண்டு தர்கா நகர் இனவெறியர்களால் பாதிப்புக்கு உள்ளானபோது, இந்தப் பாராளுமன்றத்தில் முஸ்லிம் அமைச்சர்களும் அதிகமான பாராளுமன்ற உறுப்பினர்களும் குறிப்பிட்டதொரு கட்சி சார்ந்துதான் இருந்தார்கள். அன்று அவர்கள் மஹிந்த ராஜபக்ஷவோடு கைகோர்த்து இருந்தது எங்களுக்கு நினைவிருக்கிறது. இலங்கையில் மிக மோசமான முறையில் இனவாதச் செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டு, மக்கள் நிம்மதியாக வாழ முடியாத ஒரு சூழல் நிலவிய அந்தக்

காலத்தில்கூட, எமது முஸ்லிம் அரசியல் தலைமைகள் ஒன்றுசேராமல் இருந்தார்கள் என்பதை நான் இங்கு ஞாபகப்படுத்த வேண்டும். அதுமாத்திரமன்றி, இனவாதம் தலைவிரித்தாடிய அந்தக் காலத்தில்கூட, முஸ்லிம் அரசியல் தலைமைகள் தமக்கென தனித்தனி கட்சிகளை அமைத்து பிரிந்து செயற்பட்டதை நாங்கள் காணக்கூடியதாக இருந்தது. அன்று அவர்கள் முஸ்லிம்களைப் பாதுகாப்பதற்காக ஒன்று சேரவில்லை.

இன்று இனவாத அரசியலை ஒழிப்பதற்கு NPP அரசாங்கம் முயற்சி செய்யும்போது, தங்களது எதிர்காலம் கேள்விக் குறியாகியுள்ள நிலையில் ஹிஸ்புல்லாஹ், அதாஉல்லா, றிஸாட் பதியுதீன், ரஊப் ஹகீம் போன்றோர் முஸ்லிம்களை ஒருங்கிணைத்த ஓர் அரசியல் கட்சியை உருவாக்குவோமென்ற இனவாத சிந்தனையில் ஒரே மேடையில் இருந்து பேசிக் கொண்டு இருக்கின்றார்கள். முஸ்லிம்களின் பாதுகாவலர்கள் என்று சொல்லிக்கொண்டு இருப்பவர்கள் அன்று இனவாதம் தலைவிரித்தாடியபோது ஏன் ஒன்று சேரவில்லை?

இன்று தங்களுடைய இனவாத அரசியலுக்கு முற்றுப்புள்ளி வைக்கப்படும்போது, தனிப்பட்ட நலனுக்காக - சுயலாபத் துக்காக - முஸ்லிம்களைக் காட்டிக்கொடுக்கும் பிரிவினராக இவர்கள் மாறிக்கொண்டு இருக்கின்றார்கள். இதற்கான பதிலை எமது முஸ்லிம் சமூகம் நிச்சயமாக வழங்குவார்கள். அதுமாத்திரமன்றி, இதற்கான தண்டனையையும் நிச்சயமாக அல்லாஹுத்தஆலா வழங்குவான். எனவே, நாங்கள் எல்லோரும் ஒன்று சேர்ந்து, இந்த நாட்டின் பாதுகாப்பையும் இருப்பையும் உறுதிப்படுத்தி சிங்கள, முஸ்லிம், தமிழ் மக்களுக்கு இடையில் ஒற்றுமையை உருவாக்குவதற்கான சூழ்நிலையை உருவாக்குவோம்! சிலர் மதபோதகர் என்ற வடிவிலும் இன்னும் சிலர் சமூக செயற்பாட்டாளர் என்ற வடிவிலும் இன்னும் சிலர் அரசியல்வாதிகள் என்ற வடிவிலும் தமது சுயலாபத்துக்காகவும் அரசியல் இலாபத்துக்காகவும் இனவாதத்தை ஏற்படுத்துவதற்கு இன்றும் முயற்சி செய்துகொண்டு இருக்கின்றார்கள்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டை நேசிக்கக்கூடியவர்களாக நாங்கள் இருக்க வேண்டும். மக்களுக்குச் சேவை செய்ய வந்திருக்கின்ற நாங்கள், நிச்சயமாக அவர்களுடைய நலனுக்காகப் பாடுபடுவோம். இன்று இந்தச் சபையின் அங்கீகாரத்துக்காகச் சமர்ப் பிக்கப்பட்டுள்ள மிக முக்கியமான சட்டமூலம் தொடர்பில் எதிர்த்தரப்பினர் நல்ல கருத்துகளைச் சொல்கின்றார்களா? அல்லது இந்தச் சட்டத் திருத்தத்தால் நாடு முன்னேறுமெனப் பயந்து இவர்கள் பின்னால் போய்கொண்டு இருக் கின்றார்களா? இந்த நாட்டில் ஊழலுடன் சம்பந்தப்பட்ட யாராக இருந்தாலும், அவர்களுக்கு மஹிந்தானந்த அளுத் கமகேவுக்கு ஏற்பட்டுள்ள நிலை கட்டாயம் ஏற்படும் என்பதை நாங்கள் இங்கு கூறிக்கொள்கின்றோம். அது சிங்கள அரசியல்வாதியாக இருக்கலாம்; முஸ்லிம் அரசியல்வாதியாக இருக்கலாம்; தமிழ் அரசியல்வாதியாக இருக்கலாம்! அதை மக்கள் எதிர்காலத்தில் காணலாம். ஊழலில் ஈடுபட்ட எந்தவோர் அரசியல்வாதியும் தப்பி ஓட முடியாதவாறு இந்த NPP அரசாங்கம் சட்டத்தையும் நீதியையும் நிலைநாட் டுமெனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.30]

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද උදේ මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වන සාකච්ඡාව ආරම්භ කරලා, මේ වෙනකොට විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ සාකච්ඡාව සාධනීය කරුණු කාරණා මතින් පරිබාහිරට ගිහිල්ලා දේශපාලන සාකච්ඡාවක් බවට පත් වෙලා තිබෙනවා. මෙහි තිබෙන වටිනාකම සහ හරය දැනගෙන සිටියා නම්, අපේ රට අවුරුදු 20ක් පමණ ආපස්සට යන රටක් බවට පත් වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මොකද, ඩිජිටල්කරණයට, ඩිජිටල් තාක්ෂණයට, ඩිජිටල් පද්ධතිවලට රටවල් පරිවර්තනය වීම පසුගිය දශක දෙක ඇතුළත සිදු වුණා. ඒවා, සෑම රටක්ම පාහේ වේගයෙන් ක්‍රියාත්මක කරපු දේවල්.

අපි මේ පනතේ නම ගැන විමසා බලමු. එහි 'පෞද්ගලික', 'දත්ත', 'ආරක්ෂණ' යනුවෙන් වචන තුනක් තිබෙනවා. රටවල් මේ ක්‍රියාවලිය අනුගත කර ගත්තේ ඇයි? ලෝකය මේ ඩිජිටල්කරණයට ලක් වුණාම ඩිජිටල්කරණය හරහා අපගේ දත්ත ඒක රාශි කරනවා. අපගේ දත්තවල කොටස් දෙකක් තිබෙනවා, පෞද්ගලික දත්ත සහ පෞද්ගලික නොවන දත්ත කියලා. පෞද්ගලික දත්තත් sensitive, not sensitive කියලා ආයෙත් බෙදා ගන්න අපට පුළුවන්. පෞද්ගලික දත්ත කියලා ගත්තාම, මගේ නම, ගම, telephone number එක, blood group එක සහ සෞඛ්‍යයට අදාළ දත්ත අනුව මාව වෙනම හඳුනා ගන්න පුළුවන් නම්, අපි ඒවාට කියනවා, පෞද්ගලික දත්ත කියලා. මේ පෞද්ගලික දත්ත අවභාවිත වීමේ අවදානමක් මේ ඩිජිටල්කරණය තුළ ලෝකයේ ඇති වුණා. මා පෞද්ගලික දත්ත ලබා දෙන කාරණයට පරිබාහිරව කවුරු හරි ඒවා භාවිත කරනවා නම් එහිදී දත්ත දායකයෙකු විධියට මට තිබෙන අයිතිය තහවුරු කර ගන්න තමයි මේ නීති රාමු කාලයක් තිස්සේ ලෝකයේ ගොඩනැඟුණේ. මේක ඉවර වෙච්ච තැනක් නැහැ. නමුත් මේ ප්‍රතිපත්ති, නීති රාමු දියුණු වෙමින්, වෙනස් වෙමින් තිබෙනවා. ලංකාව විධියට අපි මේ සම්බන්ධයෙන් බෙහෙවින් සතුටු වෙන්න ඕනෑ. මොකද, එක පැත්තකින් මේ තුළින් අපේ පෞද්ගලික දත්තවල ආරක්ෂාව තහවුරු කරන අතරම ඩිජිටල් ආර්ථිකයකට යන මේ ගමනේ මූලිකාංගයක් බවට මෙය දැන් ලෝකයේ අනුමත වෙලා තිබෙනවා. පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතක් නැතුව, cyber security පනතක් නැතුව ඩිජිටල් ආර්ථිකයක් ගැන අපට ඇත්තටම කථා කළ නොහැකියි.

ඩිජිටල් ආර්ථිකයට යන මේ ගමනේදී අපේ රටත් අනෙකුත් රටවල් එක්ක සමපාත වීම තමයි මේ සංශෝධන පනත් කෙටුම්පත හරහා සිදු වන්නේ. මොකද, අපි cross-border transactions කරන කොට, අපේ දත්ත Cloud technologyවල ගබඩා කරන කොට මේ අන්තර් රටවල් අතර තිබෙන දත්ත හුවමාරුව, දත්ත ගබඩා කිරීම, දත්ත process කිරීම කියන කාරණාවලට අදාළව පොදු සම්මතවලට ආවොත් තමයි අපේ රටත් මේ සමස්ත පද්ධතිය තුළට ඇතුළු වෙන්නේ. ප්‍රමාද වෙලා හෝ ගෙනාපු මේ පනතේ ප්‍රායෝගික ගැටලු කිහිපයක් සමාජය විසින් ගෙනහැර දැක්වූවා. ඒවායෙන් කීපයක් තමයි, මෙහි සඳහන්ව තිබෙන නිර්වචන පිළිබඳ ගැටලුව, නිර්වචනවල අපැහැදිලිකම් පිළිබඳ ගැටලුව, මේ පනත ක්‍රියාත්මක කිරීමේදී ඒ සඳහා අනුගත වීමට ඇති හැකියාව පිළිබඳ ගැටලුව, ඒ සඳහා

[ගරු චතුරංග අබේසිංහ මහතා]

අවශ්‍ය කරන අධිකාරියේ බලතල පිළිබඳව තිබෙන ගැටලුව. දේශීයව, විදේශීයව ඒවා ක්‍රියාත්මක කිරීමට යෑමේදී තිබෙන ප්‍රායෝගික ගැටලු බහුතරයක් සමඟ ඉතාම කඩිමුඩියේ, ජනතාවත් එක්ක, ක්ෂේත්‍රයත් එක්ක සාකච්ඡා නොකර ගෙනාපු පනතක් නිවැරදි කිරීමක් තමයි අද දවසේ සිදු වන්නේ. ඉතින් අපි හිතනවා, මේක ඉදිරිගාමී පියවරක් කියලා. මේ ඉදිරිගාමී පියවරවලදී මේ පනත සම්බන්ධයෙන් අපට ඉදිරියේදීත් තවදුරටත් සංශෝධන එයි.

මේ පනතේ කොටස් දෙකක් තිබෙනවා. දත්ත දායකයා, දත්ත පාලකයා - controller, එහෙම නැත්නම් පාලන අධිකාරිය කියන කාරණා තුන මත තමයි මේ සමස්ත පනතම ක්‍රියාත්මක වෙන්නේ. මෙහි මූලිකාංග පනතේ සඳහන් කරලා තිබුණාට මේකට අවශ්‍ය කරන රෙගුලාසි ඒ පාලන අධිකාරිය හරහා කාලෙන් කාලයට ක්‍රියාත්මක කරන්න දැන් මේ පනත අනුව හැකියාව තිබෙනවා. ඒ එක් එක් රෙගුලාසි පිළිබඳව සාකච්ඡාවක්; කතිකාවක් කරන්න අපට පුළුවන්. ඒ වාගේම ඒවායේ ප්‍රායෝගික බව පිළිබඳ ව්‍යාපාර ක්ෂේත්‍රයට ගැටලුවක් තිබෙනවා නම් ඒවා ගැනත් අපට සාකච්ඡා කරගන්න පුළුවන්. මේ පනතේ තිබෙන වැදගත්කම වාගේම මෙය මහ පොළොවේ ක්‍රියාත්මක කිරීමට තිබෙන අපහසුතාව නිසාම මේ සංශෝධනයත් එක්ක මේ පනත කාලානුරූපව, එහෙම නැත්නම් stage by stage implement කරන්න අවශ්‍යව තිබෙනවා.

තව විශේෂ දෙයක් තමයි, පෞද්ගලික ආයතන, රාජ්‍ය ආයතන සහ විදේශ ආයතන අපේ පෞද්ගලික දත්ත ලබාගෙන ඒවා පරිහරණය කිරීමේදී දත්ත දායකයාට තිබෙන අයිතිය තහවුරු කිරීම සඳහා මේ සමස්ත ක්‍රියාවලිය සිදු වීම. අපි පෞද්ගලිකව ඕනෑම ඩිජිටල් මාධ්‍යයකට ගියොත්, digital application එකක් පාවිච්චි කළොත්, සමාජ මාධ්‍යයක් පාවිච්චි කළොත්, විවිධ අවස්ථාවල අපේ පෞද්ගලික දත්ත ලබා දෙනවා. ඒවායේ breach එකක් සිදු වුණොත්, අවභාවිතාවක් සිදු වුණොත් අපට යන්න තැනක් දැනට නැහැ. නමුත්, ඉදිරියේදී අපට එන process එක තමයි, ඔබ ලබා දුන් දත්තයක් සම්බන්ධයෙන් ඒ දත්තය ලබා දුන් කාරණයට පරිබාහිරව අවභාවිතාවක් වනවා කියලා ඔබට හැඟෙනවා නම්, ඒ දත්ත දීපු තැනෙහි ආරක්ෂාව පිළිබඳ ඔබට ගැටලුවක් තිබෙනවා නම්, ඒ අධිකාරිය වෙත යන්නට ඔබට පුළුවන් වීම. ඊට පස්සේ ඒ අධිකාරිය විසින් ඔබගේ දත්ත තබාගෙන ඉන්න කෙනාගේ - ඒ අදාළ දත්ත controller එහෙම නැත්නම්, processor - පද්ධතිය, ක්‍රියාවලිය, ක්‍රියා පටිපාටිය, දත්ත ගබඩා කරන ස්ථානය ආදි සියල්ල පිළිබඳ විශ්ලේෂණයක් කරලා නිර්ණායක නිකුත් කරන්න පුළුවන්. ඒ වාගේම, එහෙම නිර්ණායක නිකුත් කරලාත් තවදුරටත් එතැනින් වින්දිතයා හානියට පත් වෙනවා නම්, ඒ සඳහා වන්දි ලබා ගැනීමේ හැකියාවකුත් මේ පනත තුළ තිබෙනවා. මූලිකව ගත්තොත්, පෞද්ගලික දත්තවල ආරක්ෂාව සම්බන්ධයෙන් වෙනදාට නොතිබුණු ආරක්ෂිතභාවයක් මේ පනත තුළ අපට තිබෙනවා.

මේ දක්වා පුද්ගලයන් වශයෙන්, ආයතන වශයෙන් අපේ පෞද්ගලික දත්ත විදේශ සමාගම්වල, applicationsවල, softwareවල ගබඩා කරලා තිබෙනවා. විශේෂයෙන්ම Facebook, Google, Amazon වාගේ දත්ත පද්ධතිවලට අපි අපේ දත්ත දුන්නාම ඒ ආයතනවලින් අපේ දත්ත යම්කිසි විධියට අවභාවිතාවක් වුණොත් අපට හඬක් නඟන්නවත් කිසිදු හැකියාවක් නැහැ. නමුත්, මේ අධිකාරිය හරහා අපට ඒ පිළිබඳ විශ්ලේෂණයක්, ගවේෂණයක්, එහෙම දෙයක් වුණා ද කියලා සොයා බලන්න කියලා අඩුම වශයෙන් ඉල්ලීමක් හෝ කරන්න පුළුවන්. පුරවැසියන් වශයෙන් ගත්තාම අපට සෑහෙන ආරක්ෂණයක් මේ ක්‍රියාවලිය තුළ තිබෙනවා.

ඊළඟට මේ පනතේ වඩා වැදගත් කාරණයක් තමයි, compatibility කියන එක. එහෙම නැත්නම්, interoperability කියන එක. ඒ කියන්නේ, අපට පුළුවන් මේ පනත භාවිත කරලා ලංකාව ඩිජිටල් ආර්ථිකයට යන්න සූදානම් රටක් විධියට ලෝකයට ඉදිරිපත් කරන්න. ඒ කියන්නේ වෙනත් රටක් මේ රටත් එක්ක ගනුදෙනු කරන අවස්ථාවකදී, වෙනත් රටක application එකක් මේ රටේ භාවිත වන අවස්ථාවකදී, අපේ රටේ application එකක් වෙනත් රටක භාවිත වන අවස්ථාවකදී අපට මේ පනත අනුව හැකියාව තිබෙනවා, ඒ සමස්ත වෙළෙඳ පොළේ වෙළෙඳ දාමයට, ඩිජිටල් වෙළෙඳ පොළට ඇතුළු වෙන්න.

ඊළඟට, මේ පනත් කෙටුම්පතේ ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා, "දත්ත" කියන්නේ මොනවාද කියලා. ඒක ඩිජිටල් වෙන්නත් පුළුවන්, ඩිජිටල් නොවෙන්නත් පුළුවන්. ඒ වාගේම, ඒ දත්තවල තිබෙන අතිශය පෞද්ගලික දත්ත මොනවාද කියලා නිර්වචනය කරලා තිබෙනවා. මේ ක්‍රියාවලිය ඇතුළේ ජනතාව දැනුවත් වීම වැදගත් වනවා වාගේම පුද්ගලයන්ගේ දත්ත භාවිත කරන ආයතනවලටත් මේ පිළිබඳ හොඳ අවබෝධයකට එන්න පුළුවන් වනවා. එතකොට මේ ක්‍රියාවලිය ඇතුළේ ප්‍රායෝගිකව සිදු වන දෙයක් තිබෙනවා. පෞද්ගලික දත්ත එකතු කරන ආයතන රටේ හැම තැනම තිබෙනවා. ඒක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් වෙන්න පුළුවන්, බැංකුවක් වාගේ ආයතනයක් වෙන්න පුළුවන්, මහා පරිමාණ ව්‍යාපාරයක් වෙන්නත් පුළුවන්. ඒ කවුරු වුණත් පෞද්ගලික දත්ත එකතු කරනවා නම් මේ නීතියට අනුගත විය යුතු වනවා. ඒ නිසා ඒ නීති පද්ධතිය මොකක්ද, ඒකට controller කෙනෙකු, එහෙම නැත්නම් දත්ත පරිපාලකයෙකු - දත්ත පිළිබඳ වග කියන කෙනෙකු- අපේ ආයතනය පත් කර ගන්නේ කොහොමද, එහෙම පත් කර ගන්න තරම් ශක්තියක් අපට නැත්නම් වෙනත් ආයතනයකින් ඒ සේවාව ලබා ගන්නේ කොහොමද, අපි පෞද්ගලික දත්ත එක් රැස් කරනවා නම් අපි ඒ පෞද්ගලික දත්ත දායකයාත් එක්ක වෙන්න ඕනෑ එකඟතාව මොකක්ද ආදි වශයෙන් අපට ඉගෙන ගන්න ගොඩක් දේවල් මේ පනතත් එක්ක තිබෙනවා. ඒ සඳහා කාලයක් මේ පනතින් ලබා දී තිබෙනවා.

අපි මේ ක්‍රියාවලිය ටිකක් විමසා බලමු. විශේෂයෙන්ම ඉදිරියට එන ඩිජිටල්කරණ ක්‍රියාවලිය තුළ සමස්ත රටම ඩිජිටල්කරණයට ලක් වෙනවා. දැන් ආසනවල නැතත් මේ ගරු සභාවේ විපක්ෂය පැත්තේ අප ඉදිරිපසින් සිටින, හිටපු පාලකයන්ට එදා කර ගන්න බැරි වුණු ඩිජිටල්කරණය වේගවත් කිරීමේ පදනම දැමීමක් අද මේ කරන සංශෝධන තුළින් සිදු වනවා. එම නිසා මේ පනත අපට වැදගත් වනවා.

ඒ වාගේම ඉදිරියේදී සයිබර් ආරක්ෂණ - cyber security - පනත් කෙටුම්පත එනවා. පනත් කෙටුම්පත් කිහිපයක් එනවා, අපේ රට ඩිජිටල්කරණයට ලක්කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන හදාගන්න. ඒ වාගේම ඩිජිටල් ආර්ථිකයට යන ආරම්භක ව්‍යාපාර - startups - සඳහා අවශ්‍ය නීතිමය තත්ත්වය මේ වෙනකොට අපේ රටේ සකස් වෙලා නැහැ. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය මේ වෙනකොට ඒ කර්මාන්තයට අවශ්‍ය නීති වෙනස් කිරීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු කරමින් යනවා. අපට ඒ ගැන සතුටුයි. මේ රජය වේගයෙන් සිද්ධ කරගෙන යන්නේ මේ දක්වා ඩිජිටල් ආර්ථිකයේ පිම්මක් ගන්න බැරි වෙලා හිටපු රට,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ දක්වා රජයේ කටයුතු ඩිජිටල් කරගන්න බැරි වෙලා හිටපු රට, මේ දක්වා කර්මාන්ත ව්‍යාපාර ඩිජිටල් කරගන්න බැරි වෙලා හිටපු රට ඩිජිටල් කිරීමට අවශ්‍ය මූලික පදනම වේගයෙන් සකස් කරනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු දැන් දකින්න ඕනෑ, ආර්ථිකය ශක්තිමත්ව ඉදිරියට යනවා, ආණ්ඩුව කාර්යක්ෂමව ඉදිරියට යනවා, යම් යම් අය වංචා දූෂණවලට වැරැදිකරුවන් වෙනවා, ඩිජිටල් තාක්ෂණය වේගයෙන් එනවා, ආයේ කවදාවත් හොරකම් කරන්න බැරි system එකක් මේ ආණ්ඩුව හදාගෙන යනවා කියලා. ඩිජිටල් ක්‍රමය හරහා නැවත හොරකම් කරන්න බැරි system එකක් හැදුවාම, මේ ඉදිරි පෙළ ඉන්න මන්ත්‍රීවරු කාටවත් ආයේ දේශපාලනයට එන්න බැහැ කියලා අපි සහතික වෙනවා. මොකද, ඔබතුමන්ලා දේශපාලනයේ රැඳුණේම හොරකමත් එක්ක; පගාවත් එක්ක; කොමිස් එක්ක. රැඳුණේම ඩිජිටල් ක්‍රමය තිබුණේ නැති නිසා. දැන් ඩිජිටල්කරණය හරහා විනිවිදභාවය, කාර්යක්ෂමතාව සහ auditability එක එනවා. දැන් අපට files හොය හොයා යම් යම් අය කූඩුවට දමන්න කල් යන්නේ ඩිජිටල්කරණය නොතිබුණු නිසායි. රාජ්‍ය පද්ධතිය ඇතුළේ ඩිජිටල්කරණය තිබුණා නම්, COPE, COPA වැනි කමිටුවල පරීක්ෂණ කටයුතු වේගයෙන් ඉවර කර ගන්න තිබුණා. එහෙම වුණා නම් ඇත්තටම ඔක්කොමලා ඇතුළේ. දැන් මෙතැන හිස් නේ. මේ කට්ටියම ඇතුළේ, ඩිජිටල්කරණය ලංකාවේ තිබුණා නම්. අපි අවුරුදු දෙක තුනක් ඇතුළත මේ පද්ධතිය හැදුවාම ඔය දේශපාලනය හාන්සියි. ඒ කියන්නේ ඔය දේශපාලනයට ආයේ මහ පොළොවේ තැනක් නැහැ. මොකද, ඔය දේශපාලනය රැඳුණේම මහජන මුදල් අවභාවිත කරලායි. අපි සංස්කෘතියක් වශයෙන්ම වංචාව දූෂණයට විරුද්ධ දේශපාලන ව්‍යාපාරයක්. මින් පසුව අපට වඩා හොඳ අය පමණක් මේ රට පාලනය කරන පද්ධතියක් - system එකක් - අපි හදනවා. අපේ රටේ ජනතාවගේ බදු මුදල් අවභාවිත නොවන, කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ඇති කළ හැකි, ඵලදායිතාව වැඩි කළ හැකි ඩිජිටල් ආර්ථිකයක් ඇති කරමින්, ඩිජිටල් කර්මාන්තය ඩොලර් බිලියන පහකට ගෙනයන පදනම දමනවා. විපක්ෂයේ මන්ත්‍රීවරුත් මේ රටේ පුරවැසියන් විධියට මේ කටයුත්තට සහාය දීලා දායක වෙයි කියලා අපි හිතනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එරංග වීරරත්න නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.43]

**ගරු එරංග වීරරත්න මහතා (ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எரங்க வீரரத்ன - டிஜிட்டல் பொருளாதார பிரதி அமைச்சர்)
(The Hon. Eranga Weeraratne - Deputy Minister of Digital Economy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මුළු ලෝකයම ඩිජිටල්කරණය අතින් ශීඝ්‍රයෙන් ඉදිරියට යමින් තිබෙනවා. රාජ්‍ය ඩිජිටල්කරණය, බැංකු පද්ධතිවල ගෙවීම් කිරීම, පෞද්ගලික සෞඛ්‍ය දත්ත, ඩිජිටල් හැඳුනුම්පත, e-passport සහ සන්නිවේදන තොරතුරු වැනි ක්ෂේත්‍ර සියල්ලක්ම වාගේ දැන් වේගයෙන් ඩිජිටල්කරණයෙන් ඉදිරියට එමින් තිබෙනවා. ඒ වාගේම තමයි සමාජ මාධ්‍ය. පුද්ගලයන්ගේ සියලු තොරතුරු - දැන හැඳුනුම්කම්, නෑදෑකම් - සමාජ මාධ්‍යයේ තිබෙනවා. අනෙක් කාරණය තමයි AI තාක්ෂණයෙන් කරන agentic AI dvelopment. ඒ කියන්නේ තමන්ගේ හැසිරීම, දැනුම යොදලා කාර්යයන් සාර්ථකව පහසු කර ගැනීමට තමන්ටම කියලා agent කෙනෙක් හදාගන්න පුළුවන්, AI තාක්ෂණය පාවිච්චි කරලා. මේ අනුව බලනකොට අද ඩිජිටල්කරණය අපේ පෞද්ගලික ජීවිතයට ඉතාම ළං වෙලා තිබෙනවා.

අපේ පෞද්ගලික ජීවිතයට අදාළ දත්ත අපේ ඩිජිටල් පද්ධති හරහා තිබෙනවා. මේ වාගේ ඩිජිටල්කරණයක් වෙනකොට ඒ දත්තවල ආරක්ෂාව කියන එක අතිශයින්ම බැරෑරුම් සහ අවශ්‍යම කාර්යයක්. මොකද ඒ දත්ත පද්ධතිය හරියට ආරක්ෂිත නැත්නම් සහ ඒ දත්ත පද්ධතියෙන් ලබා ගන්නා දත්ත ඒ ගත්ත කාරණයට අමතරව, අවසර නොදීපු වෙනත් කාරණාවක් සඳහා පාවිච්චි වෙනවා නම්, ඒකෙන් අපේ පෞද්ගලිකත්වයට හානි වෙන්න පුළුවන්. සයිබර් අවකාශයේ දත්ත ආරක්ෂාවට Cyber Security Bill කියලා සයිබර් ආරක්ෂණ පනත් කෙටුම්පතක් ගෙනෙන්න අපි කටයුතු කරමින් තිබෙනවා. සයිබර් ආරක්ෂාව කියන එක පෞද්ගලික දත්තවලට පමණක් නොවෙයි, ජාතික ආරක්ෂාවටත් දැන් අතිශයින්ම වැදගත්. ජාතික ආරක්ෂාවත් රැකෙන විධියට අපේ ආරක්ෂක අමාත්‍යාංශයත් එකතු කරගෙන, ඒ වාගේම, පෞද්ගලික සහ සිවිල් සයිබර් ආරක්ෂක කටයුතු කරන්න සිවිල් අංශයේ සයිබර් ආරක්ෂණ පනතකුත් ගෙනෙන්න අපි කටයුතු කරමින් තිබෙනවා. ඒ පනත් කෙටුම්පත් හරහා අපට පුළුවන් වෙයි අපේ රටේ සයිබර් අවකාශයේ තිබෙන දත්ත පද්ධතිවල තිබෙන ආරක්ෂාව මීට වඩා බැරෑරුම් ලෙස තර කරන්න. ඒවා ඉතාම ආරක්ෂක පද්ධති බවට පත් කරන්නත්, ආරක්ෂාවට තර්ජනය වෙන යම්කිසි දෙයක් වෙනවා නම්, කඩිනමින් ඒවා සොයා ගන්නත්, ඒවාට විසඳුම් ගෙනෙන්නත් අපට ඒ තුළින් හැකියාව ලැබෙනවා.

අනෙක් එක තමයි අපේ දත්ත ලබා ගැනීම සහ ඒවා පරිහරණය කරන්න තිබෙන වැඩ පිළිවෙළ. රාජ්‍යයෙන් හෝ පෞද්ගලික අංශයෙන් දත්ත එකතු කරනවා නම්, ඒ එකතු කිරීම කරන්න ඕනෑ ඒ පුද්ගලයාගේ අවසරය ඇතුව. ඒ වාගේම ඒ පුද්ගලයා අවසර දීපු කාරණයට පමණයි ඒ දත්ත පාවිච්චි කරන්න පුළුවන්. හරියට ඒ ක්‍රියාවලිය වෙනවා ද කියලා බලන්න නම් අනිවාර්යයෙන්ම දත්ත ආරක්ෂණ පනතක් අවශ්‍යයි; නීතියක් අවශ්‍යයි. ඒකට තමයි මේ අද කථා කරන මේ නීතිය අපි ගෙන එන්නේ. ඒ Personal Data Protection Act එක ක්‍රියාත්මක කරන්න ප්‍රධාන වශයෙන්ම අවශ්‍ය සංශෝධන කිහිපයක් තමයි අද අපි මේ කථා බහට ලක් කරන්නේ. ඒ හරහා අපට පුළුවන් වෙයි, පනත ක්‍රියාත්මක කරලා, බලාත්මක කරලා මේ රටේ දත්ත හරහා සිදුවන සියලු අවදානම් තත්ත්ව මඟ හැරලා ඒවා ආරක්ෂා කර ගන්න.

රජයක් විධියට දත්ත ලබා ගන්නා වැඩ පිළිවෙළ ගොඩක් තිබෙනවා. උදාහරණයක් විධියට අපේ ජාතික හැඳුනුම්පත ගන්න පුළුවන්; e-passport එක ගන්න පුළුවන්, උප්පැන්න සහතිකය ඇතුළු පද්ධති ප්‍රමාණයක දත්ත එක එක තැන්වල විසිරිලා තිබෙනවා. ඒ දත්ත පද්ධතිය එකිනෙකට සම්බන්ධ නැහැ. ඒ නිසා එකම පුද්ගලයාගේ දත්ත ආයතන ගණනාවක් විසින් නැවත නැවත ගැනීමක් සිදු වෙනවා. අපි දත්ත ආරක්ෂාවක් කරා යන ගමනේදී මේ විධියට දත්ත තැනින් තැන විසිරිලා තිබෙන එක සුබ කටයුත්තක් නොවෙයි. ඒ නිසා ඒවා හරියට ආරක්ෂිතව තිබෙන්න ඕනෑ. ඒවා හරියට ආරක්ෂිත දත්ත පද්ධතියක ගබඩා වෙලා තිබෙන්න ඕනෑ. ඒවායේ ආරක්ෂාව ගැන හරි සහතිකයක් තිබෙන්න ඕනෑ. ඒක පද්ධති විශාල ප්‍රමාණයක් එක්ක කරන්න පුළුවන් වැඩක් නොවෙයි. ඒක නිසා අපි ඒ පද්ධති ඔක්කෝම එකට සම්බන්ධ කරන්න ඕනෑ. උදාහරණයක් විධියට ගන්නවා

[ගරු එරංග වීරරත්න මහතා]

නම්, පුද්ගලයෙකුගේ ජෛවමිතික දත්ත පද්ධති ගණනාවකින් ගන්නේ නැතුව, ඒ ජෛවමිතික දත්ත විද්‍යුත් ජාතික හැඳුනුම්පත වාගේ එකකින් අරගෙන, ඒ විද්‍යුත් ජාතික හැඳුනුම්පත හරහා ඒ කරන අනෙක් ගනුදෙනු සඳහා යොදවන්න අපට පුළුවන් වෙන්න ඕනෑ. අපි passport එක ගන්න ගියාම ජෛවමිතික දත්ත දෙනවා. ඒ වාගේම අපි බැංකු account එකක් open කරන්න ගියත් අපට ඒක දෙන්න වෙනවා. EPF, ETFවලටත්, ඉඩමක් විකුණන්න ගියාමත් අපේ ඇඟිලි සලකුණු වාගේ දේවල් දෙනවා.

මේ දත්ත හැම තැනම තිබෙන එක අපේ මේ ඩිජිටල්කරණ වැඩ පිළිවෙළට බාධාවක්. මේ දත්ත ආරක්ෂණයට - data protection සඳහා - අපි වැදගත්කමක් දෙන නිසා තමයි මේවා National Data Exchange වාගේ පද්ධතියක් හරහා ගෙනැල්ලා, ජාතික සැලැස්මක් අනුව ඩිජිටල්කරණය කරන්න මේ රජය මැදිහත් වෙලා තිබෙන්නේ. ඒ වාගේම අපි දත්ත පරිහරණය කරනකොට, ඒ දත්ත පරිහරණය කරන්නේ අදාළ කාරණයට විතරයි කියන එක පිළිබඳවත්, දත්ත ලබා ගැනීමේදී අවශ්‍ය අවම දත්ත ප්‍රමාණය ලබා ගන්නවා කියන එක පිළිබඳවත් අනිවාර්යයෙන්ම සැලකිලිමත් වෙන්න ඕනෑ. මොකද, සමහර සේවා ලබාගන්න ගියාම එයට අත්‍යවශ්‍ය දත්තවලට අමතරව විශාල දත්ත ප්‍රමාණයක් රැස් කරන සේවා තිබෙන බව අපි දන්නවා. දත්ත ආරක්ෂණ පනත අනුව නම් ඒක වැරදියි. මොකද, යම් කිසි ආයතනයක් දත්ත ලබා ගන්නවා නම් ලබා ගන්න ඕනෑ ඒ සේවාව ලබා දෙන්න අවශ්‍ය අවම දත්ත ප්‍රමාණය විතරයි. ඒ වාගේ කාරණා හරියට බලාත්මක කරන්න, හරියට ක්‍රියාත්මක කරන්න මීට ඉස්සරවෙලා පනතක් තිබුණේ නැහැ, නීතියක් තිබුණේ නැහැ. ඒ නීතිය තමයි මේ පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පතින් අපි ගෙනැල්ලා තිබෙන්නේ. මීට පෙර අපේ රටේ පුද්ගලයෙක් ලබාදෙන දත්ත පාවිච්චි කරලා යම් කිසි ආයතනයක් මොකක් හෝ වැරදි ක්‍රියාවක් කළොත්, ඒකට ගන්න පුළුවන් පැහැදිලි ක්‍රියාමාර්ගයක් තිබුණේ නැහැ. පොලිසියට ගිහින් ඔවුන්ට සිදු වුණු අගතිය කියලා ඒකට සහනයක් ලබා ගන්න උත්සාහ කරන්න පුළුවන්. එහෙම නැත්නම් ICTA එක හෝ TRC එක වාගේ ආයතනයකට ඇවිත් කියන්න පුළුවන්. නමුත්, ඒකට හරියටම අවශ්‍ය නීති රාමුවක් තිබුණේ නැහැ. ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වීමට කිසිම අධිකාරියක් තිබුණේ නැහැ. ඒ නිසා තමයි මේ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතින් දත්ත ආරක්ෂණ අධිකාරිය පිහිටුවන්නේ. ඒ අධිකාරියේ ප්‍රධාන කාර්යය වෙන්නේ පුද්ගලයන්ගේ දත්තවල ආරක්ෂාව තහවුරු කරන එක. ඒ වාගේ කරනකොට කිසියම් පුද්ගලයෙකුට මොකක් හෝ අගතියක් වෙලා තිබෙනවා නම් ඔහුට හෝ ඇයට ගිහින් ඒ ගැන complain කරන්න දැන් අධිකාරියක් තිබෙනවා. එතැනදී ඇත්තටම අගතියක් වෙලා තිබෙනවා කියලා හරියට තහවුරු වුණොත් ඒ අධිකාරියට පුළුවන්, ඒ වෙලා තිබෙන වැරැද්ද නිවැරදි කරන්න හෝ ඔවුන්ට දඩුවම් දීලා යම් කිසි compensation එකක් ඒ අගතියට පත් පාර්ශ්වයට ලබා දෙන්න. නමුත්, ඒ අගතියට පත් පාර්ශ්වය එයින් සෑහීමට පත් වෙන්නේ නැත්නම් ඔහුට හෝ ඇයට පුළුවන් මේ පනත හරහා උසාවියට ගිහින් නඩු පවරා ඊට අවශ්‍ය වන්දියක් ලබාගන්න. ඒ සඳහාත් මේ පනතේ අවකාශ තිබෙනවා.

මේ රටේ දත්ත එකතු කරන ආයතන ගොඩක් තිබෙන බව අපි දන්නවා. සමහර වෙලාවට data breach වෙලා, දත්ත කාන්දු වෙලා තිබෙනවා මීට ඉස්සර අපි දැකලා තිබෙනවා. එහෙම දත්ත කාන්දු වන අවස්ථාවල ගොඩක් වෙලාවට එහෙම කාන්දුවක් වෙලා තිබෙනවා කියා අපි දැනගන්නෙත් ඇත්තටම මේ social mediaවලින් හෝ කටින් කට යන පුවත්වලින් විතරයි. එහෙම වුණොත් ඒ ගැන අනිවාර්යයෙන් යම්කිසි ආයතනයකට දන්වන්න ඕනෑ කියා නිවැරදිම නීති මාර්ගයක් තිබුණේ නැහැ. ඒක ඉතාම බැරෑරුම් ආරක්ෂණ ප්‍රශ්නයක්. මොකද, මොකක් හෝ දත්ත කාන්දුවක් වෙලා තිබෙනවා කියනවා නම් ඒ ගැන රජයේ ආයතනයක් අනිවාර්යයෙන් දැනගන්න ඕනෑ. මොකද, ඒකෙන් වෙන damage එක අඩු කරන්න හෝ ඒකට යම් ක්‍රියාමාර්ගයක් ගන්න හෝ තව ආයතනයක් direct කරන්න පුළුවන් රජයේ ආයතනයකට තමයි.

මේ පනතින් අපි විශේෂයෙන් කියා තිබෙනවා, ඒ වාගේ breach එකක් වුණොත් පැය 72ක් ඇතුළත අනිවාර්යයෙන් ඒ ගැන දත්ත ආරක්ෂණ අධිකාරියට දන්වන්න ඕනෑ කියලා. එසේ දත්ත ආරක්ෂණ අධිකාරියට දැන්වූ වහාම ඒ ගැන සොයා බලා ඒකට ගත යුතු ක්‍රියාමාර්ග ගන්න පුළුවන්. ඒ වාගේම, ඒ සිදු වෙලා තිබෙන දත්ත කාන්දුව ඉතාම බරපතළ නම් අනිවාර්යයෙන්ම ඒකෙන් අගතියට පත් පාර්ශ්වවලටත් සඟවන්නේ නැතිව ඒ ගැන දැන්වීම අවශ්‍යයි. මේක ඉතාම වැදගත්. අපි දන්නවා, මේ රටේ ඒ වාගේ practice එකක් තිබුණේ නැති බව. නමුත්, හුඟක් රටවල නම් ඒ වාගේ දත්ත breach එකක් වෙලා තිබෙනවා නම් අනිවාර්යයෙන් ඒ ගැන දැන්වීම කරන්න අවශ්‍යයි.

අපේ ව්‍යවස්ථාවෙන්ම අපට නිදහස ලබා දීලා තිබෙන බව අපි දන්නවා. අපේ අදහස් ප්‍රකාශ කරන්න, භාෂාව පාවිච්චි කරන්න නිදහස දීලා තිබෙනවා. ඒ තිබෙන නිදහස මේ හරහාත් ආරක්ෂා වෙන විධියට Data Protection Authority එක හරහා නීතිය ක්‍රියාත්මක කරනවා. ඒ අනුව යම් කිසි පුද්ගලයෙකුට ඒ තිබෙන නිදහසට අභියෝගයක් වුණොත්, ඒකට විරුද්ධව අභියෝග කිරීමේ නිදහසත් අපි මේ ගෙනෙන සංශෝධන සම්මතවීම හරහා ලැබෙනවා. ඒ අනුව ඕනෑම කෙනෙකුට ඒ තිබෙන නිදහසට බාධාවක් වෙලා තිබෙනවා නම්, ඒ ගැන අභියෝග කරලා තමන් කරන කර්තව්‍යය කරගෙන යන්නත් මේ තුළ අවකාශය තිබෙනවා.

රාජ්‍ය ඩිජිටල්කරණය කියන එක හරියටම කරන්න නම් ජනතාවගේ විශ්වසනීයත්වයත් ඒ සඳහා තිබෙන්න ඕනෑ. ජනතාවගේ විශ්වාසය මේ සඳහා ඉතා වැදගත් වෙනවා. මොකද, digital ID, e-driving licence, e-motoring, e-lands, digital payments, e-invoicing වාගේ ගොඩක් රාජ්‍යකරණ වැඩ කටයුතු ඩිජිටල්කරණය කරනවා නම් අනිවාර්යයෙන්ම ජනතාව ඒ ගැන විශ්වාසයෙන් කටයුතු කරන්න ඕනෑ. ඒ කටයුතු කරනකොට ජනතාවට ඒ ගැන පූර්ණ, පැහැදිලි අවබෝධයක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම තමයි ඒ කටයුතුවලදී ජනතාවගේ දත්ත රජය විසින් ක්‍රමානුකූලව ගබඩා කරනවා කියන එක පිළිබඳව, ඒවා ඒ ඒ කාර්යයන් සඳහා පමණක් පාවිච්චි කරනවා කියන එක පිළිබඳව ජනතාවට අපි සහතික කරන්න ඕනෑ. මේ පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත වීම, දත්තවල ආරක්ෂාව ගැන ජනතාව තුළ විශ්වාසය ඇති කරන්නත් ඉවහල් වෙනවා.

අපි මේ පනත හරියටම ක්‍රියාත්මක කරනවා නම්, කොයිම වෙලාවකවත් අපේ නිර්මාණශීලීත්වය හා නවෝත්පාදනය කියන දේවල්වලට මෙය බාධාවක් නොවිය යුතුයි. AI වාගේ තාක්ෂණයක් තුළින් අපට රට තුළ සෑහෙන දෙයක් කරන්න පුළුවන් බව අපි දන්නවා. නමුත් ඇත්තටම අපි AI තාක්ෂණය යොදා ගෙන තිබෙන්නේ ඉතාම අඩුවෙන්. AI තාක්ෂණය පාවිච්චි කරනවා නම් ඒ කියන platformsවල පෞද්ගලික data process කරන්න අපට හැකියාව තිබිය යුතුයි. එම අවකාශය තබා ගන්නත්, ඒ කියන්නේ AI තාක්ෂණය පාවිච්චි කිරීමේදී සහ AI තාක්ෂණය හරහා පෞද්ගලික දත්ත process කරනවා නම්, පුද්ගල අනන්‍යතාවට සරිලන parameters අයින් කරලා ඒවා process කරන්නත් මේ පනත් කෙටුම්පත සම්මත කිරීම හරහා හැකියාව තිබෙනවා. මොකද, නවෝත්පාදනය සහ ඩිජිටල්කරණයේදී අපේ

මේ රාජ්‍ය කටයුතු කඩිනම් කිරීම සහ ඩිජිටල්කරණය හරහා රාජ්‍ය සේවාව ඉතාම හොඳින් ගෙනියන්න AI තාක්ෂණය අත්‍යවශ්‍ය වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු එරංග වීරරත්න මහතා**
(மாண்புமிகு எரங்க வீரரத்ன)
(The Hon. Eranga Weeraratne)
මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මෙම පනත් කෙටුම්පත සම්මත වීම තුළ අධිකාරියට අවශ්‍ය කාර්ය මණ්ඩලය ස්ථාපිත කරලා එම කටයුතු සිදු කිරීම සඳහා අධිකාරිය සූදානම් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. රාජ්‍ය සහ පෞද්ගලික කියන දෙකොට්ඨාසයම දැනුවත් කරලා මාස 6ක් ඇතුළත මේ පනත ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. විෂයය භාර ඇමතිතුමාට පුළුවන්, ගැසට් එකක් මාර්ගයෙන් මෙය බලාත්මක කරන්න. බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.*
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

*මතු පළවන යෝජනාව සභා සම්මත විය:*
*''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු අනුර කරුණාතිලක මහතා]*
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு அனுர கருணாதிலக்க]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Anura Karunathilaka]*

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත, කාරක සභා අවස්ථාව සහ තෙවන වර කියවීම ඉදිරි දිනයකදී පැවැත්වීම පිණිස කල් තැබිය යුතුය" යි මම යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*ඊට අනුකූලව පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාව කල්තබන ලදී.*
*அதன்படி, சட்டமூலத்தின் குழுநிலை ஒத்திவைக்கப்பட்டது.*
*Committee Stage of the Bill stood adjourned accordingly.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල්තැබීම.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

## කැලණි මිටියාවතේ ගංවතුර පාලනය සඳහා තිරසර විසඳුමක්
## களனிப் பள்ளத்தாக்கில் வெள்ளப்பெருக்கை கட்டுப்படுத்துவதற்கான நிலையான தீர்வு
## SUSTAINABLE SOLUTION FOR FLOOD CONTROL IN KELANI VALLEY

[අ.භා. 5.00]

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව කරනවා:

> "නිරන්තරයෙන් සිදුවන දේශගුණික බලපෑම් තත්ත්වයන් සහ සමාජ ආර්ථික හා පාරිසරික ගැටලු ගණනාවක් තුළ ජීවත්වීමට අප රටේ ජනතාවට සිදු වී ඇත.
>
> කැලණි, කළු, ගිං, නිල්වලා, මහවැලි වැනි තෙත් කලාපයට අයත් ගංගා වසරකට වරක් පමණක් නොව, කිහිප වතාවක්ම අධික වර්ෂාව නිසා පිටාර ගැලීමෙන් ජන ජීවිතයේ ඇතිවන බැඳවැටීම හා එමගින් ආර්ථිකයට ඇතිවන සෘණාත්මක බලපෑම අතිමහත් වේ.
>
> කැලණි මිටියාවතේ වම් ඉවුරේ කොළොන්නාව, කඩුවෙල, හෝමාගම, අවිස්සාවේල්ල හා කැලණිය, බියගම, දොම්පෙ වැනි දකුණු ඉවුරේ මැතිවරණ බල ප්‍රදේශ වැඩි ඡන්දදායකයන් සිටින ප්‍රදේශ වේ. මෙතෙක් බලයට පත් කිසිදු රජයක් මෙම ස්වාභාවික ආපදා තත්ත්වයන්ට පැලැස්තර විසඳුම්වලින් ඔබ්බට කිසිවක් සිදු නොකර තිබූ තත්ත්වයක, වත්මන් ආණ්ඩුව තුළින් තිරසාර විසඳුමක් වෙනුවෙන්, ඊට අදාළ රාජ්‍ය ආයතන, විශේෂඥ දැනුම සහිත කණ්ඩායම් හා මහජන නියෝජිතයින් එකට ඒකාබද්ධ කර ගනිමින් පුළුල් සංවිධානයක් ගොඩනඟා කටයුතු කළ යුතු බව ගරු පාර්ලිමේන්තුවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බොහෝදෙනෙක් ජීවත් වන කැලණි මිටියාවත ආශ්‍රිත ප්‍රදේශය තෙත් කලාපයට අයත් ප්‍රදේශයක්. කැලණි ගඟ, කළු ගඟ, නිල්වලා ගඟ, මා ඔය, ගිං ගඟ, වළවේ ගඟ වැනි සුවිශේෂී වැදගත්කමකින් යුත් ගංගා පද්ධතියක් මේ තෙත් කලාපය තුළ පිහිටා තිබෙනවා. ප්‍රධාන වර්ෂාපතන

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

තුනකින් අපේ රටේ මේ තෙත් කලාපය පෝෂණය වෙනවා. මෝසම් වර්ෂාව ගත්තොත්, ඊසාන දිග මෝසම් වැස්ස දෙසැම්බර් සිට පෙබරවාරි මාසය දක්වාත්, නිරිත දිග මෝසම් වැස්ස මැයි සිට සැප්තැම්බර් මාසය දක්වාත්, අන්තර් මෝසම් වැස්ස මාර්තු සිට අප්‍රේල් මාසය දක්වාත් ලැබෙනවා. මේ විධියට ඇති වෙනකම් වර්ෂාව ලැබෙන අපේ රට ඉතාම සශ්‍රීක රටක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වර්ෂාපතනය විටෙක අපට ආශීර්වාදයක් වාගේම දේශගුණික විපර්යාස තත්ත්වයන් නිසා ඇතිවන අධික වර්ෂාපතනය හේතුවෙන් මේ කලාපයේ ජීවත් වන ජනතාවට හානිකර ප්‍රතිඵලවලට නිරන්තරයෙන් මුහුණ දෙන්නත් වෙනවා.

පෘථිවිය තිබෙන්නේ එක පද්ධතියක් ඇතුළේ. පෘථිවියේ කාබන් ප්‍රමාණය වැඩි වෙනවා, ඒ වාගේම ග්ලැසියර් දිය වෙලා යනවා, වනාන්තර පද්ධතිය එළි පෙහෙළි වෙනවා. මේ එක පද්ධතියක් ඇතුළේ තිබෙන සමතුලිතතාව බිඳ වැටීම නිසා බරපතළ ගැටලු ගණනාවක් මතු වෙලා තිබෙනවා. 2016 වසරේදී අපේ රටේ ඇති වූ ගංවතුර ආපදා තත්ත්වයෙන් හානියට පත්වූවන්ට සහන සැලසීමට රුපියල් බිලියන 53.5ක් වැය වෙලා තිබෙනවා. මෙවැනි තත්ත්වයන් වෙනුවෙන් විශාල වියදමක් අපේ රට දරමින් සිටිනවා වාගේම ඒ වැය බර අපට දරාගන්න බැරි මට්ටමකට පත්ව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කැලණි ගංගාව දෙපස කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක දෙකම නියෝජනය වනවා. අවිස්සාවේල්ල, හෝමාගම, කඩුවෙල, කොළොන්නාව වැනි ප්‍රදේශත්, ඒ වාගේම ගම්පහ දිස්ත්‍රික්කයේ දොම්පෙ, බියගම, කැලණිය වැනි බල ප්‍රදේශත් මේ සඳහා අයිති වෙනවා. ඒ නිසා අපේ යෝජනාව තිබෙන්නේ, කැලණි ගඟේ වාර්ෂිකව ඇතිවන මේ ගංවතුර ආපදා තත්ත්වයෙන් මේ ප්‍රදේශයේ ජනතාව ගලවා ගැනීම වෙනුවෙන් සහනාධාර බෙදමින්, බත් පැකට් බෙදමින්, තාවකාලික පැලැස්තරවලින් මේ සඳහා විසඳුම් සොයනවාට වඩා එහා විසඳුමකට අපි යා යුතුයි කියන එකයි. ඒ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ආරක්ෂක අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, පහත්බිම් සංවර්ධන මණ්ඩලය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යනාදී මේ සියලු රාජ්‍ය ආයතන, මේ විෂය පිළිබඳ දැනුම තිබෙන පුද්ගලයන් සියලුදෙනාම ඒකාබද්ධ කර ගත් තීරණාත්මක වැඩ පිළිවෙළකට අපි යා යුතුයි කියා මා යෝජනා කරනවා. ජන ජීවිත, නිවාස ඇතුළු දේපළ, අධ්‍යාපනය ඇතුළු සමාජමය බිඳවැටීම් විසින් ඇති කර තිබෙන කැලණි මිටියාවතේ ජනතාව මුහුණපාන ආපදා තත්ත්වයෙන් මිදීමට ස්ථිරසාර විසඳුමක් ලබා ගැනීම වෙනුවෙන් වහා අපගේ මැදිහත්වීම වෙනුවෙන් මේ යෝජනාව මා අද ඉදිරිපත් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු අශෝක රන්වල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 2ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.04]

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ ගෙන එන ලද යෝජනාව මම ස්ථිර කරනවා. මේ යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක්. මේ මොහොතේ රටට බලපා තිබෙන මෝසම් වැසි තත්ත්වයත් එක්ක මේ පිළිබඳව ඉතාම හොඳින් විග්‍රහ කර ගන්න පුළුවන් තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම මේ යෝජනාව සම්බන්ධයෙන් අපි කථා කරද්දී, අපට කාරණා කීපයක් ගැන අවධානය යොමු කරන්න වෙනවා. වසර දහස් ගණනක සිට කැලණි ගඟ, කළු ගඟ, ගිං ගඟ වැනි ගංගා ආශ්‍රිත ප්‍රදේශ මේ ආපදා තත්ත්වයට මුහුණදීලා තිබෙනවා. මෙම ගංගා මුහුදට වැටෙන මායිම්වල තමයි ගම්පහ දිස්ත්‍රික්කය, කොළඹ දිස්ත්‍රික්කය පිහිටා තිබෙන්නේ. මේ අවට බොහෝ පහත් බිම් ප්‍රමාණයක් තිබෙන නිසාත්, ජල රැඳවුම් ප්‍රදේශ ප්‍රමාණයක් පවතින නිසාත්, මේ වන විට අධික ජනාවාසකරණයකට ලක්වෙලා තිබෙන මේ දිස්ත්‍රික්කවල ජනතාව අතිශය බැරෑරුම් විධියට මේ ගංවතුර තත්ත්වයෙන් පීඩාවට පත් වෙනවා. වසර ගණනාවක් තිස්සේ මේ ස්වාභාවික ආපදාව වරින් වර උත්සන්න වෙනවා. මේ වන විටත් එම පීඩාවන්ට උත්තර නොලැබුණු තත්ත්වයක් තුළ තමයි සෑම වර්ෂයකම මේ කාලය තුළ නිරිත දිග මෝසම අපේ රටට ඇතුළු වන්නේ.

මේ කාලසීමාව තුළ අපේ රටට ලැබෙන අධික වර්ෂාව හේතුවෙන් කැලණි ගඟ පිටාර ගැලීම නිසා ඒ ආශ්‍රිත පහත්බිම් යට වී ඒ ප්‍රදේශවල වෙසෙන ජනතාව පීඩාවට පත් වනවා. මෙවැනි ආපදාවකදී කාලයක් තිස්සේම ජනතාව අරගළ කළේ රජයෙන් ලැබෙන බත් පැකට් එක ගන්නේ කොහොමද, රජයෙන් ලැබෙන සහනාධාර ගන්නේ කොහොමද, අවතැන් කඳවුරකට ගිහිල්ලා මේකට උත්තර හොයන්නේ කොහොමද කියන දේවල් සම්බන්ධයෙනුයි. ග්‍රාම නිලධාරි මහත්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් වාගේම දිස්ත්‍රික් ලේකම්වරුනුත්, රටේ තිබෙන සහන සේවා බලකා විධියට ත්‍රිවිධ හමුදාව ඇතුළු ආයතනත් බරපතළ උත්සාහයක් ගන්නවා, මේ පීඩාව අවම කරගෙන ජනතාවට යම් සහනයක් ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු අසෝක සපුමල් රන්වල මහතා**
(மாண்புமிகு அசோக சபுமல் ரன்வல)
(The Hon. Asoka Sapumal Ranwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

හැබැයි අපි දැකපු දේ තමයි, එවැනි පැලැස්තර විසඳුම්වලින් පමණක් මෙවැනි ආපදාවලට විසඳුම් සොයා ගන්න අපහසුයි කියන කාරණය. ඒ නිසා දිගින් දිගටම මෙවැනි ආපදා අවස්ථාවලදී රජයේ මුදල් විශාල ප්‍රමාණයක් වියදම් වෙනවා. ඒ වාගේම ජීවිත හානි, දේපළ හානි මෙන්ම ජනතාවගේ බොහෝ වටිනා දේවල් ඔවුන්ට අහිමි වෙනවා. මෙන්න මේකට සැබෑ විසඳුම විධියට එක පැත්තකින් මේ ගංගා නිම්නවල දෙපැත්තේ තිබෙන, දැනටත් පවතින වේල්ල දිගු කරන්න පුළුවන්. හැබැයි එතැනදී මුහුණ දෙන බරපතළ ප්‍රශ්නය තමයි, ඇළ වේලි ටිකට මොකක්ද කරන්නේ කියන එක. ඒ ඇළ වේලිවලට දොරවල් දානවා ද? ඒ ඇළ වේලිවල එක්රැස් වන වතුර නැවත පොම්ප කරන්නේ කොහොමද? එහෙම නම් සැබෑ විසඳුම තමයි, ගංගාධාරවලින් වතුර එළියට දමනකොට ඒ තැන්වලින් වැඩි වෙන වතුර ප්‍රමාණය වෙන පැත්තකට හරවා ගන්න පුළුවන් ද කියලා බලන එක. මේ වෙනකොටත් කළු ගඟ සම්බන්ධව එවැනි යෝජනාවක් ඇවිල්ලා තිබෙනවා. කැලණි ගඟ සම්බන්ධයෙන් මෙවැනි යෝජනාවක් ඉදිරිපත් වෙලා ඒ සාකච්ඡාව අවසන්

කරලා, මීට අවුරුදු 30කට, 40කට ප්‍රථමව මේ පාර්ලිමේන්තුවේ පුස්තකාලය තුළ එම වාර්තා තැන්පත් කර තිබෙනවා. කැලණි ගඟ සහ කළු ගඟ පිටාර ගැලීම නිසා ජනතාව පීඩාවට පත්වීම සම්බන්ධයෙන් අපි සැබෑ විසඳුම් සොයා ගත යුතුයි. ඒ සම්බන්ධයෙන් මේ සභාවේ සිටින සියලු මන්ත්‍රීවරුනුත්, ඒ වාගේම ප්‍රදේශවාසීනුත් එකතු වෙලා කෙටි කාලයක් ඇතුළත මේ යෝජනාව අනුව ජනතාවට සැබෑ විසඳුම් අරන් දෙමු කියන ඉල්ලීම ඉදිරිපත් කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.07]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කල්තැබීමේ යෝජනා කියන්නේ පසුපෙළ ආසනවල සිටින මන්ත්‍රීවරුන්ට තිබෙන විශේෂ වරප්‍රසාදයක්. කොහොම හරි අපි ඒ වරප්‍රසාදය පාවිච්චි කරලා අපේ දැනුමේ හැටියට යම් යම් දේවල් මේ යෝජනාවට එකතු කරමු. මේ අවස්ථාවේදීත් එම බලාපොරොත්තුවෙන් තමයි අදහස් ඉදිරිපත් කිරීමට මා නැඟිටින්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මම කථා කරනකොට සමහර අය හිතනවා ඇති, නැඟෙනහිර පළාතේ ඉඳලා ආපු මන්ත්‍රීවරයකු හිටපු ගමන් බස්නාහිර පළාතේ ජනතාව මුහුණ දෙන ප්‍රශ්නයක් සම්බන්ධයෙන් කථා කරන්නේ ඇයි කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ යෝජනාව ඉදිරිපත් කරපු ගරු මන්ත්‍රීතුමා හරියටම ඒ ප්‍රශ්නය ඉදිරිපත් කළා. මේකට ප්‍රධානම හේතුවක් තමයි ගෝලීය කාලගුණ විපර්යාස - global climatic conditions. ඒ ගෝලීය කාලගුණ විපර්යාසයේ එක ඵලදාවක්, එක විනාශයක් තමයි අපි මේ දකින්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේකට අපි දැන් මුහුණ දෙන්නේ කොහොමද?

සාමාන්‍ය වර්ෂාපතනයට වඩා ඉතා අධික වර්ෂාපතනයක් ලැබීම සහ වර්ෂාපතනය තිබෙන තැන්වල වියළි තත්ත්වයක් ඇතිවීම තමයි ගෝලීය කාලගුණික විපර්යාසයේ තිබෙන ප්‍රධානම ලක්ෂණය. මෙවැනි කාරණාවලට එක පාරටම විසඳුම් සොයන්න අපට අමාරුයි. මම හිතන විධියට, මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තර වශයෙන් එක් එක් සංවිධාන මඟින් මේ ගෝලීය කාලගුණික විපර්යාස හේතුකොටගෙන මේ යෝජනාවට අදාළ වන ලංකාවේ ප්‍රදේශවල පවතින කාලගුණික තත්ත්වයන්හි තිබෙන වෙනස කොහොමද කියලා විද්‍යානුකූලව හොයන්න වෙනවා; දත්ත සොයාගන්න වෙනවා. ඒ සඳහා පසුගිය දශකයක කාලය තුළ මේ ප්‍රදේශයේ සිදුවූ වර්ෂාපතනය, ඊට පෙර දශකයේ තිබුණු වර්ෂාපතනයේ අගය සමඟ ගණනය කරන්න වෙනවා. ඔබතුමන්ලා දන්නවා ඇති, ඔය හේතුව නිසාම මේ පාර්ලිමේන්තුවත් යට වුණු වකවානුවක් තිබුණු බව.

මම දැනට කොළඹ පදිංචි වෙලා ඉන්න ප්‍රදේශයත් එතකොට ජලයෙන් යට වුණා. මට තවමත් මතකයි, එහෙම ජලයෙන් යට වුණු අවස්ථාවක මගේ පුතා මගේ නැන්දම්මාව ඔසවාගෙන තමයි ගෙදරින් එළියට ආවේ. අපේ ගෙදර සම්පූර්ණයෙන් ජලයෙන් යට වෙලා තිබුණේ. කැලණි ගඟ පිටාර ගැලීමෙන් විපතට පත් වුණු පවුලක් තමයි අපිත්.

මම කියන්න හදන්නේ, ඇත්තෙන්ම ඒ විපත අප ආශීර්වාදයක් හැටියට ගන්න ඕනෑ කියන එකයි. There is a great yogi who once said that there are no issues, but new possibilities. යම්කිසි ප්‍රශ්නයක් මතු වුණාම, විපතක් වුණාම ඒ ප්‍රශ්නය, විපත කොහොමද ආශීර්වාදයක් කර ගන්නේ කියන එක ගැන අප බලන්න ඕනෑ. අපේ හිටපු කථානායක ගරු අශෝක සපුමල් රන්වල මන්ත්‍රීතුමා කිව්වා, ගංගා මුහුදට වැටෙන ස්ථානවලට අධික වර්ෂාවක් ඇති වුණාම ඒවා පිටාර ගලනවාය කියලා. එම ගංගා ජලය මුහුදට ගලා යන තැන්වල දැන් තිබෙන පළල මදි, ඒ සියලු ජල කන්දරාව එහෙමපිටින්ම මුහුදට ගලාගෙන යන්න. ඒ වාගේ වෙලාවක අපට සිද්ධ වනවා, to repump this water back to the dams, නැවත පොම්ප කරලා වේලිවල ඒ ජලය තබාගෙන ජල විදුලි බලාගාර හරහා විදුලිය නිෂ්පාදනය කිරීම සඳහා කටයුතු කරන්න. ඒකත් ඉතා වැදගත්.

ගරු මන්ත්‍රීතුමනි, මෙහෙම කියනවාට මට සමාවෙන්න. හැබැයි, මම මෙම යෝජනාවේ පොඩි අඩුපාඩුවක් දකිනවා. අපට බැරිද, මේක යම්කිසි ප්‍රදේශයකට සීමා නොවී ක්‍රියාත්මක කරන්න? ආපදා කළමනාකරණය තිබෙන්නේ ජනතාවට ඇති වුණු ප්‍රශ්න නැති කර ගන්න නේ. නමුත්, පාර්ලිමේන්තුවේ වෙනම අධීක්ෂණ කමිටුවක් පිහිටුවා මේ සම්බන්ධව උනන්දුවක් දක්වන පසුපෙළ ආසන මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් ලබා දුන්නොත්, අපි ඇමතිවරයා හෝ නියෝජ්‍ය ඇමතිවරයා නොවුණත් අපටත් පුළුවන් වනවා, අදාළ අමාත්‍යාංශවල සිටින ලේකම් සහ විශේෂඥයන් ගෙන්වලා මේ පිළිබඳව අපේ දැනුම ඒගොල්ලන්ට ලබා දෙන්න. උදාහරණයක් විධියට, it comes under the sustainable development programme that has been put forward by the UN. එක්සත් ජාතීන්ගේ සංවිධානය -ජාත්‍යන්තර වශයෙන්- කාලගුණ විපර්යාස හේතුවෙන් සිදු වන විපත් අවම කර ගැනීම වෙනුවෙන් සෑහෙන මුදල් ප්‍රමාණයක් ලබා දෙනවා. විපත්වලින් සිදු වන බලපෑම අඩු කිරීම, මුලදී ආපදා තත්ත්ව පිළිබඳව දත්ත දැනගැනීම සහ ඒ සම්බන්ධයෙන් විද්‍යාත්මක පරීක්ෂණ පවත්වන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් සොයා බලන්න අපට විශේෂඥ කමිටුවක් අවශ්‍ය වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම සභාව කල් තැබීමේ යෝජනාවේ සඳහන් ලෙස හුදෙක් යම්කිසි ප්‍රදේශයකට සීමා නොවී මුළු දිවයිනටම බලපාන පරිදි එය ක්‍රියාත්මක කරන්න ඇයි අපට බැරි? මොකද, ගල්ඔය මිටියාවතේ ජීවත් වන අපට මෙම ප්‍රශ්නය බලපානවා. රටේ බොහෝ ප්‍රදේශවලට මෙම ප්‍රශ්නය බලපානවා. මේ ප්‍රශ්නය හේතුකොටගෙන අපේ නැඟෙනහිර පළාතේ කුඹුරුත් යට වෙලා තිබෙන්නේ. මේ හැම දෙයක්ම වෙන්නේ ගෝලීය කාලගුණ විපර්යාසවල එක ප්‍රතිඵලයක් හැටියටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ගරු සභාවට කියා සිටින්නේ මෙයයි. කාලගුණ විපර්යාස හේතුකොටගෙන ජනතාව මුහුණපාන ප්‍රශ්න විසඳීමට, ඒ සම්බන්ධයෙන් කටයුතු යෙදීමට මුළු දිවයිනටම බලපාන පරිදි අධීක්ෂණ කමිටුවක් පිහිටුවන්න ඇයි අපට බැරි? ඒ ඒ ප්‍රදේශවල ඉන්න මන්ත්‍රීවරුන්ටත් තමන්ගේ ප්‍රදේශයේ සිටින ජනතාවගේ ප්‍රශ්නය මතු කිරීමටත්, අනාගතයේදී මේ වාගේ දෙයක් වුණාම ඒක කොහොමද අපි පාලනය කරන්නේ, how do we manage it සහ ඒකට අපි මුහුණ දෙන්නේ කොහොමද කියන කාරණා සම්බන්ධයෙන් කථා කර ගන්නත් ඇයි අපට අධීක්ෂණ කමිටුවක් පත් කරන්න බැරි? විද්‍යා, තාක්ෂණ, ආපදා කළමනාකරණ කියන හැම විෂයයක්ම භාර අමාත්‍යාංශ ලේකම්වරු, අදාළ විශේෂඥයන් ගෙන්වලා ඔවුන්ට උපදෙස් දීම, එහෙම නැත්නම් ඔවුන්ගේ උපදෙස් අපි ලබා ගැනීම, අපේ ජනතාවගේ ප්‍රශ්න ඔවුන්ට ඉදිරිපත් කිරීම සඳහා අපට අවස්ථාවක් ලබා දීම කියන කාරණා ගැන ඔබතුමන්ලාගේ අවධානය යොමු කරවන්න මම කැමැතියි. එහෙම නොවුණොත් මෙම යෝජනාව සාර්ථක ඵලයක් ලබා ගත නොහැකි හුදෙක් නිකම්ම නිකම් යෝජනාවක් වනවා; otherwise, there will be no

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

consequences arising out of it. එම නිසා ගරු සභාවට මම කියන්නේ මේකයි. මේ කටයුත්ත මීට වඩා පුළුල් කරලා, මුළු දිවයිනටම බලපාන ලෙස ආපදා කළමනාකරණය ඇතුළුව ගෝලීය කාලගුණ විපර්යාස තත්ත්වයන්ට මුහුණ දීම පදනම් කරගෙන යම්කිසි අධීක්ෂණ කමිටුවක් හදා ගන්න පුළුවන් නම්, මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තරයේ සහයෝගයත්, ඊට අවශ්‍ය මුදල් ප්‍රතිපාදනත් අපට ලබා ගන්න පුළුවන් වෙයි කියලා මට හොඳටම විශ්වාසයි.

ඒ නිසා මේ යෝජනාව ගෙන ඒම ගැන ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වන අතර මට මේ අවස්ථාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මෙය ප්‍රයෝජනාත්මක වැඩ පිළිවෙළකට අපි යොමු කරමු කියලා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අරුණ ජයසේකර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 2ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.13]

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)
මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද දින ගරු අසිත නිරෝෂණ මන්ත්‍රීතුමා විසින් කැලණි මිටියාවතේ ඇති වන දරුණු ආපදා තත්ත්වය සම්බන්ධයෙන් ගෙනෙන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක් බව මම මුලින්ම කියන්න කැමතියි. ඇත්තටම අපි බලයට පත් වුණාට පසුව ආරක්ෂක අමාත්‍යාංශය වශයෙන් කීප වතාවක් ඒ ඒ මන්ත්‍රීවරු සහ විශේෂඥයින් සමඟ එකතු වෙලා, මේ වෙනුවෙන් ඉතාම හොඳ, ක්‍රමානුකූල, උපායශීලි ක්‍රමවේදයක් හදා ගන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් දීර්ඝ ලෙස සාකච්ඡා කළා. මෙය, දීර්ඝ කාලීනව, සැලසුම්සහගතව කරන්න ඕනෑ අවශ්‍යතාවක් බව අපි හඳුනා ගෙන තිබෙනවා. ඒ වාගේම ඒකට සම්බන්ධ වෙන අනෙක් Line Ministries පවා - වාරිමාර්ග දෙපාර්තමේන්තුව වාගේම අනෙකුත් අමාත්‍යාංශත් - සම්බන්ධ කර ගන්න අපට හැකියාව ලැබී තිබෙනවා. ඇත්තටම කැලණි මිටියාවතේ දකුණු ඉවුරේ ඇති වෙන ආපදා තත්ත්වයට කෙටි කාලීනව මුහුණ දෙන්න ආරක්ෂක අමාත්‍යාංශය වශයෙන් අපි රුපියල් මිලියන 95ක් වෙන් කර දී තිබෙනවා. ඒ ව්‍යාපෘති කෙටි කාලීන වශයෙන් දියත් කරන්න ඉතාම ඉක්මනින් අපි කටයුතු කරනවා. ඒ සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වා ඇස්තමේන්තු පවා ලබා ගන්න අපි කටයුතු කරලා තිබෙනවා.

ඒ වාගේම ආපදා කළමනාකරණය පිළිබඳ ජාතික සභාව තිබෙනවා. එහි ප්‍රධානියා වෙන්නේත් ජනාධිපතිතුමා. එය, එතුමාගේ නායකත්වයෙන් ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් මන්ත්‍රීවරු සහ ඇමතිවරුන්ගෙන් සමන්විත සංකලනයක්. ඉදිරියේදී දිනයක් යොදා ගෙන අපි හමු වෙන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. කැලණි මිටියාවත පමණක් මූලික කරගෙන නොවෙයි, ලංකාවේ හැම තැනම සිදු වෙන ආපදා තත්ත්වයන් සම්බන්ධයෙන් කටයුතු කරන්න විශේෂඥ දැනුම සහිත, හැකියාව තිබෙන ජ්‍යෙෂ්ඨයන් සහ ප්‍රවීණයන් එකතු කරගෙන කමිටුවක් පත් කරලා, ඒ පිළිබඳව ක්‍රියා කිරීමට අපි බලාපොරොත්තු වෙන බව මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.16]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஏனைய பாராளுமன்ற உறுப்பினர்களே, உங்கள் அனைவருக்கும் வணக்கம்! இன்றையதினம் ஒத்திவைப்புப் பிரேரணையைக் கொண்டுவந்த கௌரவ உறுப்பினர் அவர்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். கௌரவ நிசாம் காரியப்பர் அவர்கள் சொன்னதுபோல, ஒத்திவைப்புப் பிரேரணை மீதான விவாதத்தின்போது இவ்வாறு ஒருசில நிமிடங்கள் பேசுவதற்குச் சந்தர்ப்பம் கிடைப்பது எங்களைப் போன்ற பாராளுமன்ற உறுப்பினர்களுக்கு மிகவும் முக்கியமானது.

நான் களனியில் பிறந்து, அங்கு வாழ்ந்திருக்காவிட்டாலும், 2015-2018ஆம் ஆண்டு காலப்பகுதியில் கொழும்பு தெற்கில் வசித்திருக்கிறேன். நான் வசித்த துட்டகைமுனு வீதியிலுள்ள வீட்டில் மழைகாலத்தில் நெஞ்சளவுக்குக்கூட வெள்ளம் வந்திருக்கிறது. கொழும்பு, களனி போன்ற பிரதேசங்களைப் பொறுத்தவரை, அங்கு மழை காலத்தில் அடிக்கடி வெள்ள நிலைமை ஏற்படுவது மிக முக்கியமானதொரு பிரச்சினையாகும். மழை பெய்யும் நேரங்களில் வெள்ள நீரானது குடிமனைகளுக்குள் புகும்போது அங்கிருந்து மக்கள் இடம்பெயரவேண்டிய நிலை ஏற்படுகின்றது.

இடப்பெயர்வு என்று சொல்லும்போது, எங்களுடைய கிளிநொச்சி சம்பந்தமான ஒரு விடயம் ஞாபகத்துக்கு வருகின்றது. இப்போது களனியில் இருக்கின்ற பிரச்சினைபோன்று, கடும் மழை பெய்கின்ற காலத்தில் கிளிநொச்சியிலுள்ள இரணைமடுக் குளத்திலிருந்து வான் பாய்கின்ற நாட்களில் அதனை அண்டி வாழ்கின்ற பெருமளவான மக்கள் இடம்பெயரவேண்டிய நிலை ஏற்படுகின்றது. மழை காலங்களில் இரணைமடுக் குளத்திலுள்ள மேலதிக நீர் கடலுக்குச் சென்று விரயமாகாமல், அதை யாழ்ப்பாணத்துக்குக் கொண்டுசெல்வதற்காக ADB fundingமூலம் 1,350 மில்லியன் அமெரிக்க டொலர் பெறுமதியில் அக்குளத்தின் அணைக்கட்டு 35' இலிருந்து 37' வரை உயர்த்தப்பட்டது. எனினும், இன்றுவரை யாழ்ப் பாணத்துக்கு அந்தக் குளத்திலிருந்து தண்ணீர் செல்லவில்லை. இது பற்றி நாங்கள் DCC meetingஇல் கேட்கும்போது, மீசாலை போன்ற இடங்களுக்கு அக்குளத்திலிருந்து நீர் விநியோகிக்கப்படுவதாகச் சொல்கின்றார்கள். எனினும், இதில் எக்கச்சக்கமான மில்லியன் ரூபாய் பணம் விரயமாக்கப்பட்டு இருக்கின்றது. மழை காலங்களில்

யாழ்ப்பாணத்திலுள்ள நல்லூர் பகுதியில் இருக்கின்ற பாதைகளில் நீர் வழிந்தோடக்கூடிய எந்தவொரு கட்டமைப்பும் இல்லை. இவற்றை எல்லாம் நாம் கடந்த அரசாங்க காலத்தில் நடந்த மிகப் பெரிய ஊழலாகவே பார்க்கின்றோம்.

ஊழல் என்று சொல்லும்போது எனக்கு ஒரு விடயம் ஞாபகம் வருகின்றது. நான் இப்போதுதான் இலஞ்சம் மற்றும் ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவுக்குப் போய்விட்டு அவசர அவசரமாக ஓடி வந்தேன். ஏனென்றால், அந்த ஊழல் விடயமாக இங்கு கதைக்க வேண்டும் என்பதற்காக. யாழ்ப்பாண மாவட்டத்தில் இருக்கின்ற தெல்லிப்பளை ஆதார வைத்தியசாலையில் Oncology Consultantஆகப் பணிபுரிகின்ற டாக்டர் கிருஷாந்தி அவர்கள் கிட்டத்தட்ட 30 மில்லியன் ரூபாய் பெறுமதியான பணத்தை தன்னுடைய சொந்தப் பணம்போல பாவித்து, அங்குள்ள வைத்திய அதிகாரிக்குத் தெரியாமல் cancer வைத்தியசாலைக்கு வழங்கியிருக்கிறார். அதற்கு சுகாதார அமைச்சிடமிருந்து எந்த அனுமதியும் பெறப்படவில்லை. இவ்வாறு அவர் அந்த வைத்தியசாலையைத் தன்னுடைய விருப்பத்துக்கு ஏற்ற வகையில் நிர்வகிக்கின்றார். நான் இது சம்பந்தமாக DCC meetingஇல் கதைக்கும்போது, எனக்கு எதிராக defamation வழக்குகளைப் போடுகின்றார்கள். கிருஷாந்தி அம்மாவின் அந்தப் பணக் கொடுக்கல்வாங்கல் சம்பந்தமாக நான் வைத்தியர் தேவநேசன் அவர்களிடம் கேட்கும்போது, அது பற்றி தனக்குத் தெரியாதெனச் சொல்கிறார். அவருக்கு மேல் இருக்கின்ற RDHS வைத்தியர் கேதீஸ்வரன் அவர்களும் அது பற்றி தனக்குத் தெரியாதெனச் சொல்கிறார். ஆனால், தெல்லிப்பளை ஆதார வைத்தியசாலையில் மில்லியன் கணக்கான ரூபாய் உரிய அனுமதியின்றி பாவிக்கப்படுகின்றது. இது மிகப் பெரிய ஊழலாகும். இந்த ஊழல் தொடர்பாகத்தான் நான் இப்பொழுது இலஞ்சம் மற்றும் ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழுவுக்குப் போய்விட்டு வந்திருக் கிறேன். நான் இங்கு இன்னுமொரு விடயத்தையும் சொல்ல வேண்டும்.

දවස් කිහිපයකට කලින් මම අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයට ගියා, මගේ අර VIP light case එකට අදාළ නඩුවට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නයට අදාළව කථා කළොත් වඩා හොඳයි කියලා යෝජනා කරනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හරි. අදාළ දෙයක් තමයි මේ. එතැනදී මිනිස්සු මට ගෙනැල්ලා දුන්නා ඔප්පුවක්, රුපියල් මිලියන 500ක *ගෙයක්* මිලියන 5ට ලියා තිබෙනවාය කියලා. ඒවා ගැන කවුරුවත් හොයන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් නමක් කියන්න මම කැමැති නැහැ. මම අදාළ පුද්ගලයාට කිව්වා, ඔබතුමා ඒ deed එක ලියා තිබෙනවාය කියලා. මම ඒ ගැන වැඩිපුර කථා කරන්නේ නැහැ. අපි ප්‍රශ්නයට එමු.

மழை காலங்களில் இரணைமடுக் குளத்திலிருந்து வான் பாயும்போது, கிளிநொச்சி மக்கள் மிகவும் பாதிக்கப் படுகின்றார்கள். இந்தப் பிரச்சினை சம்பந்தமாக மாவட்ட ரீதியாக இங்கு தனித்தனியாக ஒத்திவைப்புப் பிரேரணையைக் கொண்டுவர முடியாது. கௌரவ நிசாம் காரியப்பர் அவர்கள் சொன்னதுபோன்று, விசேட committee ஒன்றை அமைத்து, இலங்கை முழுவதிலும் உள்ள இப்பிரச்சினை தொடர்பில் ஆராய வேண்டும். ஏனெனில், இந்தப் பிரச்சினை களனிப் பிரதேசத்தில் மட்டுமல்ல, கிழக்கு மாகாணத்திலும் இருக் கின்றது; அநுராதபுரத்திலும் இருக் கின்றது. இவ்வகையான ஒத்திவைப்புப் பிரேரணைகளைக் குறிப்பிட்டதொரு பிரதேசத்தை மாத்திரம் மையப்படுத்திக் கொண்டுவராமல், இலங்கை முழுவதும் வெள்ள நிலைமையால் அடிக்கடி பாதிக்கப்படுகின்ற பிரதேசங்களை உள்ளடக்கிக் கொண்டுவர வேண்டும். வடக்கு, கிழக்கு மாகாணங்களில் வாழுகின்ற நாங்களும் இலங்கை நாட்டின் சம குடிகளாக மதிக்கப் படுவோம் என்ற நம்பிக்கையோடு, இந்தப் பிரேரணையை ஆதரித்து, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி. வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසිල් රණසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.21]

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගංවතුර පාලනය කිරීම සම්බන්ධයෙන් සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව පිළිබඳ මේ විවාදයේදී ඒ සම්බන්ධයෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සූදානම සහ වැඩ පිළිවෙළ ගැන මම යමක් කියන්න කැමැතියි. ඇත්තටම ගංවතුර නිසා, දේශගුණ විපර්යාස නිසා හොඳටම බැට කන රටක් අපි. අපි දන්නවා, පසුගිය නොවැම්බර් මාසයේ ඉඳලා වැස්ස නිසා හතර වතාවක් අපේ අස්වැන්නට, භෝග වගාවන්ට හානි වෙලා තිබෙන බව. මහ කන්නය ගත්තාම ඇත්තටම වී අස්වැන්න සම්බන්ධවත් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. එක්කෝ වතුර මදි වෙනවා, නැත්නම් වතුර වැඩි වෙනවා. මිනිසුන්ට ගෙවල් දොරවල්වල ඉන්න හිටින්නත් නැති වෙන්න ගංවතුර ගලනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දත්ත අනුව ගත්තාම ගංගා, ඔයවල් 24ක් ආශ්‍රිතව ගංවතුර තත්ත්වයන් ඇති වන බව, තර්ජනයට ලක් වන බව පෙනී ගොස් තිබෙනවා. ඒ වාගේම ගංවතුර පාලනය සඳහා ක්‍රියාමාර්ග ගනිද්දී ප්‍රධාන අවශ්‍යතා කිහිපයක් අපි සම්පූර්ණ කරන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි. පළමුවැනි එක තමයි ඒ සම්බන්ධයෙන් තිබෙන පුරෝකථනයන්; විශේෂයෙන්ම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පුරෝකථනයන්. වැස්ස කොච්චර වැටෙනවාද, මොන ප්‍රමාණයෙන්ද වැටෙන්නේ, කොහේටද වැටෙන්නේ, මොන කාලයේදීද වැටෙන්නේ කියන පුරෝකථනයන් ඕනෑ. ඒ පුරෝකථනයන් සම්බන්ධයෙන් අපට ගැටලුවක් තිබෙනවා. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතු දැනුම සහ තාක්ෂණය ප්‍රමාණවත් මදි, මේ ගංවතුර තත්ත්වයන් කළමනාකරණය කිරීම සඳහා.

දෙවැනි එක තමයි ඒ දත්ත මත පදනම් වන, ඒ පුරෝකථන මත පදනම් වන දැනුවත් කිරීමේ පද්ධතියක්, ඒ සම්බන්ධයෙන් වන අනතුරු ඇඟවීම් පද්ධතියක් - early warning system එකක්- තිබෙන්න ඕනෑ. එහිත් ගැටලුවක් තිබෙනවා. ඊට පසුව මේ ගංවතුර සම්බන්ධයෙන් තිබෙන දත්ත, තොරතුරු, අධ්‍යයන පදනම් කරගෙන, ඇත්තටම ඒවා කළමනාකරණය කිරීම සඳහා

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

ඉදිකිරීම්, වතුර හැරවීම්, ජලාශ ඉදිකිරීම් වාගේ කළමනාකරණ, වාරි ජල කළමනාකරණ කටයුතු සිදු කිරීමත් අවශ්‍යයි; ඒවායේ ප්‍රශ්න තිබෙනවා. මහවැලි ගඟ ගත්තොත්, මහවැලි ගඟ ආශ්‍රිතව ජල ගැලීම්වල, එහෙම නැත්නම් ගංවතුර තත්ත්වයේ අඩුවක් තිබෙනවා, අනෙක් ගංගාවලට සාපේක්ෂව. මොකද, මහවැලි ගඟ සම්බන්ධයෙන් කටයුතු කරන්න වෙනම ආයතනයක් තිබෙනවා, මහවැලි සංවර්ධන අධිකාරිය නමින්. මහවැලි ගඟ හරස් කරලා ජලාශ ඉදිකරලා තිබෙනවා; ඒවායේ ජලය ප්‍රයෝජනයට ගන්නවා; හැරවුම් කරලා තිබෙනවා; ඒ සම්බන්ධව බලනවා; ඒ නිසා මහවැලි ගඟ ආශ්‍රිතව ගංවතුර තත්ත්වයේ අඩුවක් තිබෙනවා. කැලණි ගඟ ගත්තොත්, කැලණි ගඟ සම්බන්ධයෙන් කටයුතු කරන ආයතනත් ගොඩක් තිබෙනවා. නමුත් ඒ සම්බන්ධයෙන් හරියටම වග කියන ආයතනයක් නැහැ. ගංවතුර පාලනය කිරීම සඳහා අපේ වාගේ රටකට ඇත්තටම දැනුම ඕනෑ; අත්දැකීම් ඕනෑ; ඒ සම්බන්ධයෙන් අධ්‍යයනයන් ඕනෑ; මුදල් ඕනෑ; ඒ සම්බන්ධ තාක්ෂණය ඕනෑ.

ඇත්තටම වාරිමාර්ග දෙපාර්තමේන්තුව පැත්තෙන් බැලුවාම පසුගිය අවුරුදු කිහිපය - දශක ගණනාව - තිස්සේ ගංවතුර පාලනය සම්බන්ධයෙන් කරලා නැති දෙයකුත් නැහැ. අධ්‍යයනයන් කරලා තිබෙනවා. විදේශ විශේෂඥ කණ්ඩායම් ඇවිල්ලා අධ්‍යයන කරලා තිබෙනවා. අපේ ඉංජිනේරුවන් අධ්‍යයන කරලා තිබෙනවා. තොරතුරු එකතු කරලා තිබෙනවා. මුදල් වියදම් කරලා තිබෙනවා. විදේශ ආධාර යටතේ ව්‍යාපෘති කරලා තිබෙනවා. ලංකාවේ මුදල් වියදම් කරලා ඉදිකිරීම් කරලා තිබෙනවා. නමුත් ඒවායේ ඒකමිතිකභාවයක් නැති බවක් තිබෙනවා. අපට දැනුම තිබෙනවා. අත්දැකීම් තිබෙනවා. ඉදිකිරීම් කරලා තිබෙනවා. මුදල් වියදම් කරලා තිබෙනවා. නමුත් මේවායේ සම්බන්ධීකරණයේ ගැටලුවක් තිබෙනවා. දැන් මේ වෙනකොටත් CResMPA කියලා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙනවා, ලෝක බැංකු ආධාර මත. ලොකු මුදලක් එතැන තිබෙනවා. ගංවතුර අවදානමට ලක් වෙච්ච ගංගා ද්‍රෝණි 24න් 22ක් ගැන අධ්‍යයනය කිරීම සඳහා මුදල් වෙන් කරලා, ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම කැලණි ගඟ ආශ්‍රිත ගංවතුර තත්ත්වය පාලනය කිරීම සඳහා වී ඔය ජලාශය වාගේම වෙනත් ඉදිකිරීම් කිරීම සඳහා ඔවුන් සැලසුම් සකස් කරලා තිබෙනවා. අධ්‍යයන කරලා තිබෙනවා; ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙලා තිබෙනවා.

නමුත්, මෙතැන තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, මේ දේවල් සිද්ධ වෙලා තිබුණාට ඒවා ඒකමිතිකභාවයකට, එක සැලැස්මකට නොවීම. සම්බන්ධීකරණයේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මේ ගංවතුර පාලනය කිරීම සඳහා වඩාත්ම හොඳ විධියක් අපි හඳුනාගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කරනවා සහ ක්‍රියාත්මක කරමින් ඉන්නවා. අපි හිතමුකෝ කැලණි ගඟ කියලා. කැලණි ගඟ ආශ්‍රිතව සිදුවන ගංවතුර සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට තිබෙන ආයතන -පළාත් පාලන ආයතන වෙන්න පුළුවන්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙන්න පුළුවන්, නාගරික සංවර්ධන අධිකාරිය වෙන්න පුළුවන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙන්න පුළුවන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙන්න පුළුවන්- සියල්ලම එකතු කරගත්ත, එක තැනකින් සම්බන්ධීකරණය වන යම් සාකච්ඡාවක්, කමිටුවක්, යම් ආයතනයක්, විධිමත් වැඩ පිළිවෙළක් අවශ්‍ය වෙනවා. ඒ නිසා අපි ළඟ තිබෙන දැනුම, තාක්ෂණය, මුදල්, වැඩ පිළිවෙළවල් යන සියල්ල එකතු කරගනිමින් අපි එක වැඩ පිළිවෙළක් හැදුවොත් මේ ගැටලුවට අපට මුහුණ දෙන්න හැකි වෙයි. ඒ සඳහා අපි කටයුතු කරමු කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පිළිතුරු කථාව, ගරු අනුර කරුණාතිලක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.26]

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මතකයි අපි පුංචි කාලයේ "කැළණි පාලම" කියලා වේදිකා නාට්‍යයක් තිබුණා. ඒ වේදිකා නාට්‍යයෙන් කියන්නේ, මෝසම් කාලයට කැලණි ගඟේ වතුර වැඩි වුණාම -ගංවතුර තත්ත්වය ඇති වුණාට පසුව- පාලම උඩට ඇවිල්ලා ජීවත් වෙන මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය පිළිබඳවයි. එහෙම බැලුවාම, මේක දශක ගණනාවක් තිස්සේ තිබෙන ප්‍රශ්නයක්. මෝසම් කාලයේදී ජල මට්ටම වැඩි වුණාම කැලණි මිටියාවතේ වම් ඉවුරේ තිබෙන කොළොන්නාව, කඩුවෙල, හෝමාගම, අවිස්සාවේල්ල වාගේ ප්‍රදේශවලත් දකුණු ඉවුරේ තිබෙන කැලණිය, බියගම, දොම්පේ වාගේ ප්‍රදේශවලත් මේ ගංවතුර තත්ත්වය ඇති වෙනවා.

ඒ වාගේම දේශගුණික විපර්යාස තත්ත්වයත්, අවිධිමත්ව සිදු වෙලා තිබෙන නාගරීකරණයත් හේතුවෙන් මේ තත්ත්වය ඉතාම බරපතළ වෙලා තිබෙනවා. කැලණි ගඟ ආශ්‍රිතව ඇති වන ගංවතුර තත්ත්වය පාලනය කිරීම සඳහා අපට දීර්ඝ කාලීන විසඳුමක් අවශ්‍යයි. ඒ දීර්ඝ කාලීන විසඳුම ලබා දෙනකල් කෙටි කාලීන විසඳුම් සඳහා යන්න අපට අවශ්‍ය වෙලා තිබෙනවා. කෙටි කාලීන විසඳුම් දිහා බැලුවාම, දැනටමත් සමහර ආයතන -අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා පැහැදිලි කළා වාගේ- ඒ ජල ගැලීම් තත්ත්වය ආවාට පසුව ඒ ජල ගැලීම් තත්ත්වයෙන් පීඩාවට පත් වන ජනතාවට සිදු වන පීඩාව අවම කර ගැනීම සඳහා සහ ජල ගැලීම් තත්ත්වය කිසියම් විධියකට අඩු කර ගැනීම සඳහා යම් යම් ක්‍රියා මාර්ග ගන්නවා.

විශේෂයෙන් කොළඹ ආශ්‍රිතව නම් අඹතලේ ජල පොම්පාගාරය, නාගලගම් වීදිය ජල පොම්පාගාරය ආදි ජල පොම්පාගාර ක්‍රියාත්මක කරවා ඒ වැඩි වී තිබෙන වතුර නැවත වරක් මුහුදට යවන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් හදනවා. ඒ වාගේම, කඩුවෙල ආශ්‍රිතව, කඩුවෙල නගර සභා බල ප්‍රදේශයේ පිහිටි හෙට්ටිගේ ඔය ජල ද්‍රෝණියේ ජලාපවහන ගැටලුව විසඳීම සඳහා දැනට ශක්‍යතා අධ්‍යයනයක් කර තිබෙනවා. ඉදිරියේදී අපි එය ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම කැලණි ගඟේ දකුණු ඉවර ගත්තොත්, පෑලියගොඩ, වනවාසල, කැලණිය, කිරිබත්ගොඩ, පෙතියාගොඩ, කොහොල්විල ආදි ප්‍රදේශවලට ගංවතුර තත්ත්වය ආවාට පසුව ඒවා පාලනය කිරීම සඳහා දැනට ඔලියමුල්ල ප්‍රදේශයේ ජල පොම්පාගාරයක් ඉදි කරමින් පවතිනවා. අපි විශ්වාස කරනවා මේ අවුරුද්දේ අන්තිම වන කොට ඒ පොම්පාගාරයේ කටයුතු අවසන් කරන්න පුළුවන් වෙයි කියලා. ඒ වාගේම වත්තල, කඩවත, හොරපෙ, රාගම වාගේ ප්‍රදේශවල ගංවතුර තත්ත්වය පාලනය කිරීම සඳහා කළුඔය ආශ්‍රිතව ජලාපවහනය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියකට අදාළ ශක්‍යතා අධ්‍යයනය මේ වන විට අවසන් කර තිබෙනවා. අපි ඒ කටයුත්තත් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ සඳහන් කළ සියල්ල තාවකාලික, කෙටි කාලීන විසඳුම්. ස්ථිරසාර විසඳුමක් මේ කිසිම

එකකින් ලැබෙන්නේ නැහැ. ඒ නිසා අපේ ගරු අසෝක රන්වල මන්ත්‍රීතුමා සඳහන් කළා වාගේ මේ ප්‍රශ්නය විසඳන්න කැලණි ගඟේ ජල මට්ටම අධික ලෙස වැඩි වීම වැළැක්වීම සඳහා අපට කිසියම් ක්‍රමවේදයක් අවශ්‍යයි. දශක ගණනාවක් තිස්සේ කරපු අධ්‍යයන මත ඒ සඳහා යම් යම් යෝජනා ඉදිරිපත් වෙලා තිබෙනවා. නමුත් අවාසනාවකට, ඒවායෙන් එකක්වත් ක්‍රියාත්මක තලයට ඇවිල්ලා නැහැ. අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපේ පාර්ලිමේන්තු පුස්තකාලයේත් මේ පිළිබඳ ව්‍යාපෘති යෝජනා තිබෙනවා.

මේ තත්ත්වය පිළිබඳව අපේ රජයේ අවධානය යොමු කර තිබෙනවා. ඔබතුමාට මතක ඇති, කොළොන්නාව ප්‍රදේශයේ ගංවතුර තත්ත්වය පාලනය කිරීම සඳහා කැබිනට් අනුමැතියත් එක්ක කමිටුවක් පත් කළ බව. නමුත්, ඒ කමිටුවේ අවසාන රැස්වීමේදී අපි තීරණයක් ගත්තා මේ තත්ත්වය කොළොන්නාවට විතරක් සීමා වුණු ප්‍රශ්නයක් නොවන නිසා කැලණි ගං මිටියාවතේම ගංවතුර තත්ත්වය පාලනය කිරීම සඳහා සහ ගංවතුර තත්ත්වය ඇති වීම වැළැක්වීම සඳහා ගරු අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් කාර්ය සාධක බලකායක් පිහිටුවන්න. විශේෂයෙන් මා ඉහතින් සඳහන් කළ ගංවතුර තත්ත්වය බලපාන ප්‍රදේශවල ඉන්න මහජන නියෝජිතයන්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ඒ ඒ දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් ආදි වශයෙන් අදාළ ආයතනවල නියෝජනයක් සහිතව මේ කාර්ය සාධක බලකාය පිහිටුවන්න කැබිනට් අනුමැතිය ලබා ගන්න ඉතාම ඉක්මනින් කටයුතු කරනවා. ඒ වාගේම, පසුගිය කාලයේ ඉදිරිපත් කෙරුණු විවිධ ව්‍යාපෘති යෝජනා ඒ කාර්ය සාධක බලකාය හරහා නැවත වරක් අධ්‍යනය කරලා - study කරලා - ඒ හරහා ස්ථිරසාර විසඳුමක් ලබා දීම සඳහා කටයුතු කරන්න ජාතික ජන බලවේගය ආණ්ඩුව හැටියට අපි කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දශක ගණනාවක් තිස්සේ කැලණි ගං මිටියාවතේ තිබෙන ගංවතුර ප්‍රශ්නය ඊළඟ පරපුරට ප්‍රශ්නයක් හැටියට ඉතිරි කරන්නේ නැතිව අපේ කාලය තුළ අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා.

මට කාලය ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***එකල්හි වේලාව අ. භා. 5.30 වුයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2025 ජුනි 04 වන බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி. ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2025 யூன் 04, புதன்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 5.30 p.m.., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 9.30 a.m. on Wednesday, 04th June, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.